කොවිඩ් ව්‍යාප්තිය



දිනමිණ

The Dinamina | 1909 ඇරැඹී ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ස්වර්ණභූමියේ අතීතාවලෝකනය
අද පත්‍රය සමඟ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ අධි වප් අව තුදුස්වක ලත් ඉරු දින | කාණ්ඩය 111 | පත්‍රය 258 | පිටු 40 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 ඔක්තෝබර් 15 බ්‍රහස්පතින්දා

පාස්කු දා ප්‍රහාරය සිදු වන විට
රටේ ආරක්ෂාව බිඳවැටී තිබුණා

හිටපු අගමැති රනිල් පාස්කු කොමිසමේදී පිළිගනී

සුභාෂිණී සේනානායක

පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය එල්ල වන අවස්ථාව වන විට රටේ ආරක්ෂක අංශවල පැහැදිලි බිඳවැටීමක් සිදුව තිබූ බව තමා පිළිගන්නා බව හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති කොමිසම ඉදිරියේ පෙරේදා (13) කියා සිටියේය. ජාතික ආරක්ෂාවට තර්ජනයක් යැයි පවසමින් හමුදා ප්‍රධානීන් මුස්ලිම් කාන්තාවන් පලඳින නිකාබය තහනම් කිරීමට ජාතික ආරක්ෂක කවුන්සිලයට යෝජනාවක් ගෙනා බව කියා සිටි හිටපු අගමැතිවරයා ඒ සඳහා තමන් විරුද්ධ නොවූ බවත් තමන් කියා සිටියේ මේක කළොත් මුස්ලිම් අන්තවාදීන්ට නැගී සිටින්න අවියක් දීම සහ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් දුර්වල කරන එක යැයිද කොමිසම හමුවේ කියා සිටියේය. පිට 06

ගොවියාට-පාරිභෝගිකයාට සහන ලැබෙන වෙළෙඳපොළක් සකසන්න
ජනපති අවධාරණය කරයි

නුවන් කොඩිකාර

ගොවියාට ඉහළ මිලක් සහ පාරිභෝගිකයාට සහන මිලක් ලැබෙන වෙළඳපොළ නිර්මාණය කිරීමේ අවශ්‍යතාව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඊයේ (14) අවධාරණය කළේය. පිට 06

බ්‍රිතාන්‍යයෙන් ගෙන්වූ කුණු කන්ටේනර් 242ක් ආපසු යවන්න නියෝග
ගෙන්වීමට මුල් වූ සියල්ලන්ට නීතිමය පියවර

නෙල්කා මැදගෙදර

පසුගිය වසරේ බ්‍රිතාන්‍යයෙන් ශ්‍රී ලංකාවට ආනයනය කර කොළඹ වරාය පරිශ්‍රයේ සහ කටුනායක අපනයන සැකසුම් කලාපයේ රඳවා තිබෙන කසළ අඩංගු බහාලුම් 242ක් එරටටම ප්‍රති අපනයනය කිරීමට පියවර ගන්නා ලෙස මධ්‍යම පරිසර අධිකාරියට නියම කළ අභියාචනාධිකරණය එම බහාලුම් මෙරටට ගෙන්වීමට සම්බන්ධ සියලු පාර්ශ්වයන්ට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙස නීතිපතිවරයාට ඊයේ නියම කළේය. පිට 06

CSN බොරු නඩුවක්
යෝෂිත රාජපක්ෂ සාධාරණ පරීක්ෂණයක් ඉල්ලයි

රෝෂන් තුෂාර

ත්‍රීයුගයක්, යහපාලන රජයක් තේමා කරගත් පසුගිය ආණ්ඩුව ප්‍රතිවාදී දේශපාලනඥයින්ගෙන් පමණක් නොව ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ද දේශපාලන පළිගැනීම්වලට ලක් කළ බව ශ්‍රී ලංකා නාවික හමුදාවේ ලුතිනන් යෝෂිත රාජපක්ෂ මහතා දේශපාලන පළිගැනීම් විමර්ශන ජනපති කොමිසමේ විශේෂ පොලිස් ඒකකයට පැමිණිල්ලක් කරමින් සඳහන් කර ඇත. පිට 06

රාමඤ්ඤ මහා නිකාය 20ට විරුද්ධව
කිසිදු ප්‍රකාශයක් නිකුත් කර නෑ
උගව පළාත් මහා නායක නාවිමන නාලක හිමි

ඇම්. නෙල්සන් පියරත්න - කතරගම සමූහ

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය කිසිදු ප්‍රකාශයක් නිකුත් කර නැති බව එම නිකායේ කාරක සංඝ සභික සහ එම නිකායේ උගව පළාත් මහානායක හිමියන් වන දෙවගමුව ජයසුමනාරාමාධිපති නාවිමන නාලක හිමියෝ පවසති. පිට 06

නිරෝධායන ඇඳිරි නීතිය කැඩූ 146ක් අත්අඩංගුවට ගත්තා

පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ පිට 06

ආර්ථිකයට කොරෝනා බලපෑම් කළත් රටේ උද්ධමනය පහළට
ශ්‍රී ලංකා මහ බැංකුව

මහින්ද අලුත්ගෙදර

කොවිඩ 19 හෙවත් නව කොරෝනා වසංගතයේ ව්‍යාප්තිය හේතුවෙන් ආර්ථිකය පසුබෑමකට ලක්ව තිබුණ ද ශ්‍රී ලංකාවේ උද්ධමනය පහළ ගොස් තිබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රකාශ කරයි. ඒ අනුව කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ උද්ධමනය ගත වූ සැප්තැම්බර් මාසයේදී පහළ ගොස් තිබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ නවතම වාර්තාවක් මඟින් පෙන්වා දෙයි. පිට 06

සංචාරක ආකර්ෂණය සහිත රටවල් අතරින් දෙවැනි තැන ශ්‍රී ලංකාවට

මහින්ද අලුත්ගෙදර

සංචාරක ආකර්ෂණයක් සහිත ශ්‍රී ලංකාව ලොව සංචාරය කිරීම සඳහා හොඳම රටවල් අතර දෙවැනි ස්ථානයට පැමිණ තිබේ.
ඒ අනුව 2020 වසරේ දී සංචාරය කිරීමට හොඳම රටවල් අතුරින් දෙවැනි ස්ථානය සඳහා ශ්‍රී ලංකාව තෝරා ගැනීමට "Conde Nast Traveler" නැමැති සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධයෙන් තොරතුරු ගෙන එන සඟරාවේ පාඨකයන් කටයුතු කර තිබෙන බව වාර්තා වෙයි. පිට 06

කොවිඩ් සැබෑ තතු පිළිබඳ ආණ්ඩුව වගකීමෙන් ප්‍රකාශයක් කළ යුතුයි
අකිල විරාජ් කාරියවසම්

පිට 06

රියාඩ්ට ඇප දුන් පිළිවෙත ගැන අභ්‍යන්තර විමර්ශනයක්

බුද්ධි කරුණාරත්න

හිටපු අමාත්‍ය රිෂාඩ් බදියුදීන්ගේ සහෝදරයා වන රියාඩ් බදියුදීන් 2020 අප්‍රේල් 14 දින අත්අඩංගුවට ගෙන මාස පහමාරකට පසු නිදහස් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ සහ ආරක්ෂක ලේකම්වරයාගේ අවධානය යොමු වී මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විමර්ශනයක් සිදු කිරීමට පියවර ගෙන ඇති බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා කීවේය. ඔහු මේ බව ප්‍රකාශ කළේ කොළඹ පොලිස් මූලස්ථානයේ පැවැති මාධ්‍ය හමුවකදීය. පිට 06

20න් ඒකාධිපති පාලකයෙක් බිහි වෙනවා
සමඟි ජන බලවේගය

පිට 06

25,000ක අල්ලසක් ගත්තැයි සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සහකාර සමාන්‍යාධිකාරීවරයෙක් රිමාන්ඩ්

සිරන්ජනි කුමාරි

නිවාස දෙකකට සහාධිපත්‍ය සහතික ලබා දීම සඳහා රුපියල් 25000ක අල්ලස් මුදලක් නිවාස ව්‍යාපෘති හිමිකරුවකුගෙන් ලබා ගැනීමේ සිද්ධියක් සම්බන්ධයෙන් අල්ලස් කොමිසම විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සහකාර සමාන්‍යාධිකාරීවරයකු මේ මස 27 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් මොහොමඩ් මිහාර් මහතා ඊයේ (14) නියෝග කළේය. පිට 06

සෞන්දර්ය සරසවියෙන් ඉවත් කළැයි
සෞම්‍ය-පේෂල උසාවි යති

පිට 10

ඇඳිරිනීති ප්‍රදේශවල දුගී ජනයාට රු.5000 දීමනාව දෙන්නැයි ඉල්ලීමක්

පිට 06

කොළඹට ඇතුළු වන 200ක් අහඹු ලෙස තෝරා ගෙන පීසීආර් පරීක්ෂාවට

සන්ධ්‍යා කරුණාරත්න

කොළඹ නගරයට ඇතුළු වන පුද්ගලයන් 200ක් පමණ අහඹු ලෙස තෝරා ගෙන පී.සී.ආර්. පරීක්ෂාවට ලක් කිරීමට කොළඹ මහා නගර සභාව තීරණය කරයි. පිට 06

ගිනිගත් නැවේ කපිතාන්ට මිලියන 12ක දඩයක්

පිට 06

මිනුවන්ගොඩ පොකුරින් තවත් ආසාදිතයෝ 130ක්

සන්ධ්‍යා කරුණාරත්න

මිනුවන්ගොඩ ඇඟලුම් කම්හල ආශ්‍රිතව කොවිඩ් - 19 වයිරසය ආසාදිත තවත් පුද්ගලයන් 130 ක් ඊයේ (14) වාර්තා වීමත් සමඟ එම පොකුරේ සමස්ත ආසාදිතයන්ගේ සංඛ්‍යාව 1798ක් දක්වා ඉහළ ගොස් තිබේ. පිට 06

CIDය ජනපතිගේ අත්සනත් හොරට යෙදුවාද?
ජනපති කොමිසමෙන් විමර්ශන
හිටපු ජනපති ලේකම්

රෝෂන් තුෂාර

ත්‍රස්තවාදී පනත ප්‍රකාරව සී. අයි. ඩී. ය විසින් හමුදා බුද්ධි නිලධාරීන් රඳවා ප්‍රශ්න කිරීම සඳහා ගත් නියෝගවල ආරක්ෂක ඇමැතිවරයා ලෙස යොදා ඇති අත්සන් හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ අත්සන හා නොසැසඳෙන බව හිටපු ජනපති ලේකම් උදය ආර්. සෙනවිරත්න මහතා දේශපාලන පළිගැනීම් විමර්ශන ජනපති කොමිසම හමුවේ සාක්ෂි දෙමින් ඊයේ (14) පැවසීය. පිට 06

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை
SRI LANKA EXPORT DEVELOPMENT BOARD
Ministry of Trade

2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත 2021 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන නිෂ්පාදකයින්, ඒජන්තවරුන්, බෙදහරින්නන්, ආනයනකරුවන්, බලයලත් අලෙවිකරුවන්, තොග වෙළඳ ආයතන, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ සේවා සපයන්නන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.	**කාර්යාල උපකරණ හා ලිපිද්‍රව්‍ය**	
	1.1	කාර්යාල ලිපිද්‍රව්‍ය - පෑන්, පැන්සල්, ලිපිකවර, ස්ටේපල්, යතුරුලියන කඩදාසි, ඡායාපිටපත් කඩදාසි, කැල්කියුලේටර් සහ පිස්තා ආදිය
	1.2	පරිගණක සහ අනු අයිතම - පරිගණක දෘඩාංග සහ පරිගණක උපාංග, යූපීඑස්, මවුස්, කී බෝඩ්, ආදිය, සර්වර්ස්, ගබඩා, පරිගණක, ලැප්ටොප්, ටැබ්, මොනිටර්, විදුලි අනුවර්තක, ස්කෑනර් ආදිය , මුද්‍රණ යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර උපාංග, ඩොට්මෙට්රික්ස්, ලේසර්ජෙට් ප්‍රින්ටර්, කලර් ප්‍රින්ටර්, ෆොටෝ කන්ඩක්ටර් ආදිය
	1.3	යතුරුලියන, ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, එකතුකිරීමේ යන්ත්‍ර, පැමිණීම සටහන් කිරීමේ යන්ත්‍ර, මුහුණු සහ ඇඟිලි සටහන් සහ වෙනත් උපකරණ ආදිය
	1.4	තොරතුරු තාක්ෂණ ජාලකරණ විසඳුම්, පරිගණක පාරිභෝගික භාණ්ඩ (ප්‍රින්ටර්, ටෝනර්, කාට්රේජස්, රිබන්, පෙන්ඩ්‍රයිව්, සංයුක්ත තැටි : Recordable CDs, DVDs, ආදිය)
	1.5	විදුලි උපකරණ සහ අමතර කොටස් (ශීතකරණ, විදුලි පංකා, වායු සමීකරණ යනාදිය)
	1.6	ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සහ සන්නිවේදන උපකරණ (කැමරා, විඩියෝ කැමරා, ප්‍රොජෙක්ටර් සහ ප්‍රොසෙසින් යන්ත්‍ර, සේයාපටල, ප්ලේවි රෝල්, ගුවන් විදුලි යන්ත්‍ර, කැසට්, දුරකථන පද්ධති සහ දුරකථන උපාංග ආදිය
	1.7	කාර්යාලීය ගෘහ භාණ්ඩ - දැව සහ වානේ (කැබිනට්, අල්මාරි රාක්ක : Shelves මේස, පුටු ආදිය)
	1.8	දින මුද්‍රා, රබර් මුද්‍රා, නාම පුවරු (ඇඇමිනියම් / ප්ලාස්ටික්, පිත්තල ආදිය)
	1.9	නිල ඇඳුම් රෙදි (කමිස රෙදි, කලිසම් රෙදි, සපත්තු සහ මේස්, සාරි)
2.	**කාර්යාල උපකරණ අලුත්වැඩියා හා නඩත්තු කිරීම**	
	2.1	කාර්යාලීය උපකරණ අලුත්වැඩියාව සහ තඩත්තුව (යතුරුලියන, කැල්කියුලේටර්, ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, එකතු කිරීමේ යන්ත්‍ර, පැමිණීම සටහන් කිරීමේ යන්ත්‍ර (මුහුණු සහ ඇඟිලි සටහන්) සහ වෙනත් උපකරණ ආදිය)
	2.2	වායුසමීකරණ අලුත්වැඩියාව සහ සේවා කිරීම
	2.3	පරිගණක, ප්‍රින්ටර්, පරිගණක සර්වර් අලුත්වැඩියාව සහ තඩත්තුව
	2.4	කාර්යාල ගෘහ භාණ්ඩ (දැව/වානේ) අලුත්වැඩියාව
	2.5	දුරකථන අලුත්වැඩියාව
3.	**මෝටර් වාහන අලුත්වැඩියාව සහ අමතර කොටස් සැපයීම**	
	3.1	වාහන සඳහා ටයර්, ටියුබ් සහ බැටරි, විල් එලයින්මන්ට්ස් සහ ඇජෙස්මන්ට්ස්
	3.2	වාහන සහ මෝටර්සයිකල් සඳහා අමතර කොටස්
	3.3	සයිලන්සර්, රේඩියේටර් අලුත්වැඩියාව
	3.4	වාහන අප්හෝස්ටරි වැඩ (වාහන සීට් කුෂන්, සීට් කවර, රබර් කාපට් සහ කැත්වස් කවර)
	3.5	වාහන සේවා (ප්‍රධාන කාර්යාලය සහ පළාත් කාර්යාලය සඳහා එකිනෙක ආයතනවල සිට 10 කිලෝමීටර ඇතුළත, කොළඹ, යාපනය, කුරුණෑගල, මාතර, නුවර)
	3.6	මෝටර් වාහන වායුසමීකරණ අලුත්වැඩියාව
	3.7	වාහන විදුලි අලුත්වැඩියාවන්
	3.8	මෝටර් වාහන ටින්කරිං හා පින්තාරු කිරීම
4.	**දැන්වීම් කටයුතු , ප්‍රචාරණ වැඩ සහ මුද්‍රණ කටයුතු**	
	4.1	ප්‍රචාරණය හා පිටත ප්‍රචාරණය (බැනර්, අත් පත්‍රිකා, LED පැනල, නාම පුවරු, පෝස්ටර් යනාදිය)
	4.2	ශ්‍රව්‍ය/ දෘෂ්‍ය වාර්තා චිත්‍රපට නිෂ්පාදනය
	4.3	ඇඳීම් වැඩ ඩිසයින් කිරීම, සඟරා පොත් පිංච, පෝස්ටර්, ආරාධනා/සුබ පැතුම් කාඩ් යනාදිය සැලසුම් කිරීම සහ මුද්‍රණය (දේශීය/විදේශීය)
	4.4	ප්‍රදර්ශන/සම්මන්ත්‍රණ/වැඩමුළු සඳහා ශබ්ද පද්ධති (මයික්‍රොෆෝන්, රෙකෝඩින් පහසුකම්, ස්පීකර්ස් ආදිය)
	4.5	මුද්‍රණය සහ පොත් බැඳීම (රිසිට් පොත්, පොත් පිංච, පත්‍රිකා, බැනර් සහ පෝස්ටර්)
	4.6	සන්නාමකරණය (ආයතනික / වෙළඳ නියෝජිත සන්නාමකරණය)
	4.7	ප්‍රවර්ධන අයිතම (කුසලාන, ඵලක, පදක්කම්, ටී ෂර්ට්, බෑග්, ත්‍යාග යනාදිය)
5.	**වෙනත් සේවාවන්**	
	5.1	සිද්ධි කළමනාකරුවන්/දේශීය හා විදේශීය වෙළඳ ප්‍රදර්ශන සංවිධානය
	5.2	විද්‍යුත් වාණිජ්‍ය (විද්‍යුත් ව්‍යාපාර, විද්‍යුත් ගෙවීම් පහසුකම්, විද්‍යුත් අලෙවිකරණ පහසුකම් ආදිය)
	5.3	වෙළඳ කුටි ස්ථාපනය හා තඩත්තුව (නිර්මාණකරණය, ස්ථාපනය හා තඩත්තුව)
	5.4	භාෂා පරිවර්තකයින් (ඉංග්‍රීසියෙන් දෙමළට, ජපන්, චීන සහ අනෙකුත් විදේශ භාෂාවන්)
	5.5	කාර්යාල ආරක්ෂක සේවාවන්
	5.6	කාර්යාල අංශ වෙන් කිරීම්, නවීකරණය, අභ්‍යන්තර සැලසුම් කිරීම් : Interior Designing - සහ ඉදිකිරීම් (පින්තාරු කිරීම, පිරිසැකසුම් කිරීම ආදිය)
	5.7	විදුලි හා දුරකථන රැහැන් ඇදීම (සර්කිට්බ්‍රේකර්ස්, බල්බ, ස්විච් බෝඩ් ආදිය)
	5.8	ගොඩනැගිලි/ප්‍රදර්ශන ශාලා ආලෝකකරණය
	5.9	කාර්යාල ප්‍රවාහන සේවා, මෝටර් වාහන කුලී පදනම මත (කාර්, වෑන්, බස් යනාදිය)
	5.10	මෘදුකාංග විසඳුම් සපයන්නන් (මෙහෙයුම් පද්ධති, මෘදුකාංග බලපත්‍ර, ඩේටාබේස්, ඇප්ලිකේෂන් මෘදුකාංග, බිස්නස් ඉන්ටලිජන්ස්, වර්ක් ෆ්ලෝ සොලුයුෂන්ස්, අයි ටී ආරක්ෂණ විසඳුම්, ක්ලවිඩ් සොලුයුෂන් ආදිය)
	5.11	අන්තර්ජාල පහසුකම්, බ්‍රෝඩ්බෑන්ඩ් සේවා, ජංගම විසඳුම්
	5.12	භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් - ගුවන්, මුහුදු හා කුරියර් සේවා (දේශීය හා අන්තර්ජාතික)
	5.13	රංගකලාව (දේශීය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහා තැටුම් කණ්ඩායම් සහ වෙනත් කලා කණ්ඩායම්)
	5.14	කෘමි පාලනය
	5.15	උපදේශන සේවා
	5.16	ආයතන හැඳුනුම්පත් සැකසීම

අයදුම්පත් යොමු කළ යුතු ආකාරය

- සියලුම සැපයුම්කරුවන් ව්‍යාපාර ලියාපදිංචි සහතිකය, පළාත් පාලන ආයතන මගින් නිකුත් කළ ලියාපදිංචි සහතිකය, සමාගමේ විස්තර, පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
- ලියාපදිංචි කිරීම, තක්සේරු කිරීමේ/ඇගයීමේ ක්‍රියා පටිපාටියට යටත්ව සළකා බලනු ලබන අතර, ලබා දෙන ලද තොරතුරු වැරදි හෝ දේෂ සහගත බව සොයා ගනු ලැබුවේ නම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සියලුම අයදුම්කරුවන්ට භාණ්ඩ හා සේවා සැපයුම්කරු ලෙස අවම වශයෙන් වසර 02ක පළපුරුද්ද තිබිය යුතු අතර, වර්තමාන සේවා දායක පදනමේ යොමු ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතුය.
- සැපයුම්කරුවන් විසින් අවම දින 30ක ණය කාලයක් ලබා දීමට එකඟ විය යුතුය.
- 2021 වර්ෂය සඳහා එක් එක් අයිතමය වෙනුවෙන් රු. 500/- ක ආපසු නොගෙවන ලියාපදිංචි වීමේ ගාස්තුවක් ගෙවිය යුතු අතර, අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මුදල් අයකැමි වෙත (රාජකාරී දිනයන්වල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා) මෙය මුදලින් හෝ අපනයන සංවර්ධන මණ්ඩලයේ නමට ලියන ලද චෙක්පතක් මගින් ගෙවීම් කළ හැක. මුදල් ඇණවුම් හාර ගනු නොලැබේ.
- අවසන් දිනය සපුරාලීමට, අපේක්ෂිත මට්ටම සහ ප්‍රමිති පවත්වා ගැනීමට අසමත් වන ලියාපදිංචි සැපයුම්කරුවන් අසාධු ලේඛන ගත කර සමාගමේ සැපයුම්කාර ලැයිස්තුවෙන් ඉවත් කරනු ලැබේ.
- හානි වූ හෝ දූර්වල තත්ත්වයේ අයිතම ආපසු හාර දෙන අතර, ඒවා හැකි ඉක්මණින් ප්‍රතිස්ථාපනය කළ යුතුය.
- ආදර්ශ අයදුම්පත් අපගේ වෙබ් අඩවිය www.srilankabusiness.com වෙත පිවිස "Announcements"යටතේ ලබා ගත හැක.
- සැපයීම් සහ සේවා ලබා ගැනීමේ දී ලියාපදිංචි සැපයුම්කරුවන් / සේවා සපයන්නන්ගෙන් මිල ගණන් කැඳවීම සිදු කරනු ලබයි.
- අවශ්‍යතාවය අනුව ලියාපදිංචි නොවූ වෙනත් සැපයුම්කරුවන් / සේවා සපයන්නන්ගෙන් ද මිල ගණන් කැඳවීම හා සැපයුම් හා සේවා ලබා ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සතුය.
- මුදල් ගෙවූ කුවිතාන්සිය/ චෙක්පත ඉල්ලුම් පත්‍රය සමග අමුණා **"2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"**යනුවෙන් ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සලකුණු කොට 2020 නොවැම්බර් 30 වන දින ප.ව. 3.00 ට පෙර ලැබෙන පරිදි, **සභාපති හා ප්‍රධාන විධායක, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, NDB – EDB ගොඩනැගිල්ල, අංක 42, නවම් මාවත, කොළඹ 02** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලේ එවීම හෝ ගෙනවිත් භාරදීම් කළ යුතුය. (6 වන මහල/ ප්‍රසම්පාදන අංශය)
- වැඩිදුර විස්තර දුරකථන අංක: 011 2300702 ඔස්සේ කනිෂ්ඨ කළමනාකරු/ප්‍රසම්පාදන මගින් ලබා ගත හැක.

සභාපති,
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,
NDB – EDB ගොඩනැගිල්ල, අංක 42, නවම් මාවත, කොළඹ 02.

දුරකථන: 011-2300705-11 ෆැක්ස්: 011-2300715
වෙබ් අඩවිය: www.srilankabusiness.com

ගත වූ දින හතට බියගම 600කට පීසීආර් පරීක්ෂණ

මල්වාන සමූහ මහානාම විතානගේ

බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බල පුදේශයේ ගත වූ දින හතක කාලයේ පුද්ගලයන් හය සීයකට (600) අධික පිරිසකගේ පීසීආර් පරීක්ෂණ සිදුකර තිබේ.

ඉන් පීසීආර් පරීක්ෂණ දෙසීයක පමණ ප්‍රතිඵල ලැබීමට ද තිබේ.

ඊයේ (14) වනවිට එම බල පුදේශයට අයත් බියන්විල , අලුබෝවිල හා පුදීපගම යන ප්‍රදේශවලින් කොරෝනා ආසාදිතයන් තිදෙනකු හමු වී තිබෙන අතර ඉන් දෙදෙනකුම මිනුවන්ගොඩ බැන්ඩික්ස් ඇගලුම් ආයතනයේ සේවිකාවන් ද, සෙසු පුද්ගලයා කොළඹ පුදේශයේ රැකියාවක නිරත තැනැත්තකු ද වෙති.

එම ආසාදිතයන් තිදෙනා කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයකට යවා ඇත .

එම ආසාදිතයන්ගේ ආශ්‍රිතයන් විසි හතරදෙනකු පමණ නිරෝධායනය සඳහා නිරෝධායන මධ්‍යස්ථාන වලට යවා තිබෙන අතර, තවත් අනූදෙනකු පමණ තම නිවෙස්වලම ස්වයං නිරෝධායනයට යොමු තිබේ .

බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී මුදිතා මැණිකේ මහත්මිය හා පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක සමන්ත පෙරේරා මහතා ඇතුළු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු අධීක්ෂණ කටයුතු සිදු කරති.

මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ සේවාවන් යළි දන්වනතුරු නෑ

අමෝදා ජයමහ

මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ සේවා කටයුතු නැවත දැනුම් දෙනතුරු තාවකාලිකව අත්හිටුවා ඇත.

රටේ පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සිය සේවා සැපයීම මෙසේ තාවකාලිකව නවතා දමා ඇති බව මහරගම ජාතික අධ්‍යාපන ආයතනය නිවේදනයක් නිකුත් කර දන්වා ඇති අතර,

මෙම කාලය අතරතුර දී ජනතාවට සිය සේවා අවස්ථා පිළිබඳ විමසීම සඳහා 011-7601601 යන දුරකථන අංකය විවෘත්තව පවතී.

එමෙන්ම ගුරු මාර්ගෝපදේශන www.nie.lk වෙබ් අඩවිය හරහා බාගත කර ගැනීම සිදු කළ හැකි අතර, අධ්‍යාපන විඩියෝ වැඩසටහන් නැරඹීමට සහ බාගත කිරීමට Channel NIE යූ ටියුබ් නාලිකාව සහ Channel NIE මුහුණු පොත හරහා සිදු කරගත හැකි බව එම නිවේදනයෙහි සඳහන් වේ.

SINCE 1978 42nd
OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel

42 වන ඔබ්සවර් - මොබිටෙල්
වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලීය තරඟාවලීන්හි දී තරඟ විදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලීය තරඟාවලීන්හි දී තරඟ විදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : .....
අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐
සමස්ත ලංකා ක්‍රීඩිකාව: .....
(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)
පාසල : .....
ඔබේ නම : .....
ලිපිනය : .....
ජංගම දුරකථන අංකය : .....

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.

ප්‍රථම ත්‍යාගය : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
තෙවන ත්‍යාගය : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

කොන්දේසි :
1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

දිනය 2020-10-17 **අංකය** 32

සංචාරක පක්ෂීන් පැමිණෙන කාලය එළඹෙයි

මානෙල් පුෂ්ප කුමාරි

මේ දිනවල ශ්‍රී ලංකාවට සංචාරක කුරුල්ලන් පැමිණෙමින් සිටින බව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරිනියක් පැවසුවාය.

මේ සංචාරක කුරුල්ලන් අතර රජ සියක්කාරයා, කැෂ්පියන් ටර්න් මුහුදු ලිහිණියා, අව්විවියා ආදී පක්ෂීන් මෙරටට සංචාරයට එන පක්ෂීහු වෙති. මධ්‍යම ආසියාවේ සිට මෙරටට පැමිණෙන මේ පක්ෂීන් යාපනය අර්ධද්වීපයටත් මන්නාරම දිස්ත්‍රික්කයටත් දැකිය හැකිවේ. මොවුන් සැප්තැම්බර් මස - ලබන මැයි මස දක්වා මෙරටට පැමිණේ.

සංචාරක කුරුල්ලන්ගේ අවසන් ගමනාන්තය මෙරට බැවින් එම සංචාරයෙන් අනතුරුව නැවත තම මව්බිම් කරා ගමන් ආරම්භ කරන බවත් එම නිලධාරිනිය කීවාය.

ජයන්ත චන්ද්‍රසිරිගේ රැජින යළි සියතින්

ජාතික තරුණ සේවා සභාව නිශ්පාදනය කළ ජයන්ත චන්ද්‍රසිරි මහතා විසින් රචනා කර අධ්‍යක්ෂණය කළ රැජින ටෙලි නාට්‍යය ඔක්තෝබර් මස 16 වැනි දා සිට රාත්‍රී 8.30ට සියත රූපවාහිනී නාලිකාව හරහා විකාශය වීමට නියමිත ය. රැජින ටෙලි නාට්‍ය පළමු වරට 2000 වර්ෂයේ ජනවාරි මස (1) දින ජාතික රූපවාහිනිය හරහා විකාශනය විය.

ගාමිණී ජයලත්, රවීන්ද්‍ර රන්දෙණිය, යශෝදා විමලධර්ම, බුද්ධදාස විතානාරච්චි, බන්දුල විතානගේ, සයිමන් නවගත්තේගම ඇතුළු නළු නිළියන් රැසක් රංගන දායක වෙති.

කටුගස්තොට ශාන්ත අන්තෝනි බාලිකා විසබීජ හරණයට

අසේල කුරුළුවංශ

ගලගෙදර පොලිස් වසමේ දෙහිඅංග ප්‍රදේශයෙන් හමු වූ කොවිඩ් -19 ආසාදිතයා පහවසර ශිෂ්‍යත්ව විභාගය පැවති දිනයේ කටුගස්තොට ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලය ආසන්නයට පැමිණ තිබෙන බවට තොරතුරු හෙළි වීමත් සමඟ එම බාලිකා විදුහල සම්පූර්ණයෙන් විසබීජ හරණය කිරීමටසෞඛ්‍ය අංශ ඊයේ (14) පියවර ගෙන තිබේ.

ශිෂ්‍යත්ව විභාගයට පෙනීසිටි තම දියණිය පාසලට ඇරලවා කුඩා රත්වත්තේ මාවතේ පිහිටි අවන්හලකට ගොස් තවත් මිතුරන් කිහිප දෙනෙකු සමඟ මෙම පුද්ගලයා මත්පැන් පානය කර තිබෙන බව පරීක්ෂණවලින් අනාවරණය වී ඇත.

ගලගෙදර පොලිස් වසමේ දෙහිඅංග ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන මෙම කොවිඩ් ආසාදිතයා කටුපොත ප්‍රදේශය ටයර් කර්මාන්තශාලාවක සේවකයෙකු බව පොලීසිය පවසයි.

කරන්දෙණියේ රිය අනතුර

උසස් පෙළ සිසුවිය බසයකට යට වී බරපතළයි

ඇල්පිටිය සමූහ සහ කරන්දෙණිය සමූහ

කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය අසලදී අද (14) උදෑසන සිදුවූ බස් අනතුරකින් මෙවර උසස් පෙළ විභාගයට පෙනී සිටීමට පැමිණෙමින් සිටි ශිෂ්‍යාවක බරපතළ තුවාල ලබා ඇල්පිටිය රෝහලට ඇතුලත් කළ බව කරන්දෙණිය පොලීසිය පවසයි.

මෙම අනතුරින් ශිෂ්‍යාවගේ පාද දෙකටම බරපතළ හානි සිදු වී ඇති අතර එක් පාදයක් (වම් පාදය) සිරුරෙන් ඉවත් කිරීමට සිදු වී තිබෙන බවද රෝහල් ආරංචි මාර්ග පවසයි.

මෙසේ අනතුරට පත් වී ඇත්තේ කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන කරන්දෙණිය මහඒදණ්ඩ දූරවත්ත පදිංචි විසිහැවිරිදි සුදුව හේවා ඉෂිණි තිනීෂා ගිමිනදී නමැති ශිෂ්‍යාවකි.

ඇය මෙවර උසස් පෙළ විභාගයට ගණිත අංශයෙන් පෙනී සිටින අතර ඇය නිවෙසේ සිට විද්‍යාලයේ විභාග ශාලාවට පාගමනින් පැමිණෙමින් සිටියදී

ඇල්පිටිය දෙස සිට අම්බලන්ගොඩ බලා ධාවනය වූ පෞද්ගලික බස් රථයකට යටවීමෙන් මෙම අනතුර සිදු වී ඇති බව පොලීසිය කියයි. අනතුර සිදුවී ඇත්තේ එම බස් රථය මගී බස් නැවතුම් පොළේ නතර කිරීමට යෑමේදී බවද පොලීසිය පවසයි.

අනතුරට පත් ශිෂ්‍යාව කරන්දෙණිය රෝහලට ඇතුළත් කිරීමෙන් පසු ඇල්පිටිය රෝහලට මාරුකර එවා ඇති අතර, ඇල්පිටිය රෝහලේදී ඇය සැත්කමට භාජනය කරන බව රෝහල් ආරංචි මාර්ග පැවසීය.

බස් රථ අනතුර සිදු වීමෙන් පසු බස් රථයේ රියැදුරු පලා ගොස් ඇති බවද පොලීසිය පැවසීය.

කරන්දෙණිය පොලීසිය වැඩි දුර පරීක්ෂණ පවත්වයි.

කුඩු-ගිනි අවියක් සමඟ සැකකරුවෙක් දැලේ

රක්ෂණ ශ්‍රියන්ත

හෙරොයින් සහ විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සහ පතොරොම් සමඟ සැකරුවකු වාද්දුව මැලෑගම එල්.ආර්.සී වත්ත නිවෙසකදී වාද්දුව පොලීසිය පෙරේදා (13) අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරු සන්තකයේ තිබූ හෙරොයින් ග්‍රෑම් 2යි මිලි ග්‍රෑම් 740ක් අත්අඩංගුවට ගෙන ඇති අතර, සැකකරුගේ ප්‍රකාශ මත පානදුර මහජන ක්‍රීඩාංගණය පිටුපස සඟවා තිබූ විදේශ රටක නිෂ්පාදිත රිවෝල්වරයක් සහ සජීව පතොරොම් 18ක් ද සොයාගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27ක් වන වාද්දුව මැලෑගම ප්‍රදේශයේ පදිංචිකරුවකු බව පොලීසිය පවසයි.

සැකකරු ඊයේ (14) පානදුර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

වාද්දුව පොලීසිය වැඩිදුර විමර්ශන පවත්වයි.

කුඩු අංජුගේ ගෝලයෙක් ගංජා සමඟ කොටු වෙයි

රක්ෂණ ශ්‍රියන්ත

දැනට විදේශගතව සිටින මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා සංවිධානාත්මක අපරාධකරුවන් වන අමල් සම්න්ද නොහොත් රත්මලාලේ කුඩු අංජු හා ලක්ෂපතියේ ලක්සිරිගේ යන අයගේ සමීපතම ගෝලයකු යැයි පවසන අයකු වියළි ගංජා කිලෝ 1යි ග්‍රෑම් 500ක් සමඟ පෙරේදා (13) විශේෂ කාර්ය බළකායේ සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකය අත්අඩංගුවට ගෙන තිබේ.

පොලිස් විශේෂ කාර්ය බළකාය සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකය නිලධාරීන්ට ලැබුණු තොරතුරක් මත ගල්කිස්ස පොලිස් වසමේ මොරටුව කටුබැද්ද සොයිසාපුර ප්‍රදේශයේ කළ වැටලීමකදී මෙම සැකකරු අත්අඩංගුවට ගත් බව පොලීසිය පවසයි.

අත්අඩංගුවට ගත් සැකකරු වැඩිදුර විමර්ශන කටයුතු සඳහා ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර තිබේ.

ලක්ෂ දෙකක කුඩු සමඟ සැක 32ක් දැලේ

නිමල් රාජපක්ෂ

තොටළඟ, දෙමටගොඩ, වැල්ලම්පිටිය, රාජගිරිය, බොරැල්ල යන ප්‍රදේශවල කළ සෝදිසි මෙහෙයුමකදී මත්ද්‍රව්‍ය ජාවාරමේ නිරත සැකකරුවන් 32කු සමඟින් රුපියල් ලක්ෂ දෙකක් වටිනා හොරොයින් තොගයක් කොළඹ නගරයේ සුරාබදු නිලධාරීන් අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය තොගයේ හෙරොයින් ග්‍රෑම් 9.5ක් තිබූ බව කොළඹ නගරයේ සුරාබදු ස්ථානාධිපති ප්‍රධාන සුරාබදු පරීක්ෂක චානක නානායක්කාර මහතා පැවසීය.

අත්අඩංගුවට ගත් සැකකරුවන් පෙරේදා (13) මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු සැකකරුවන්ට මහේස්ත්‍රාත්වරයා රුපියල් එක්ලක්ෂ හැත්තෑදාහක දඩ මුදලක් ගෙවන ලෙස නියම කෙරිණි.

ශ්‍රීකාන්තගේ ලිපිදූපත

• පාස්කු දවසෙ මරාගෙන මැරිල්ලක් වුණාද කියලත් හිතෙනව සර්, දැන්නෙ රියල් මරාගෙන මැරිල්ල තියෙන්නෙ !
• ඒ කොහොද බං ?
• අයි සර්, කොවිඩ්ගම ඇතුළෙ !

ඇදය නැන්න

අත් හැරෙනා දීගෙ හෙවණැල්ලත් — ඇදය
ඒ උපමාව පහුගිය රජයට — හොඳය
බැඳගත් බෙරේ ගැහුවත් තාලෙට — පදය
බාදකයක් වුණේ මහ පොළොවේ — ඇදය

පෙන්වනු ලබන නවතම සිතුවම් — පටය
අම්මප මරේ මරු - හොඳ පහුවෙන — කොටය
ගැලවෙන නිසා එළිමහනේ — පිරුවටය
මෙය වැඩිපුරම හොඳ වැඩිහිටියන් — හටය

රටේමුල්ලේ මුදන්නායක

ගිරිබාලිය

නරි කුකුල්ලු දීග කාපු කතාව — අන්දමේ
කසාදෙකින් තැළුණේ මනමාල පිරිස — නෙමේ
එක ගෙදරක හිටි කාලෙත් උන්නෙම — ගිනියමේ
දික්කසාද නඩුව ඇහෙයි පාස්කු — කොමිසමේ

ගෘප්මාන් නෝනා

ලොව පුරා කොවිඩ් මරණ

ලක්ෂ 11ට ආසන්න වෙයි

ආසාදිතයෝ 38,364,519යි

මහින්ද අලුත්ගෙදර

කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වයිරසය ආසාදනයවූවන් අතරින් ලොව පුරා මියගිය සංඛ්‍යාව ලක්ෂ 11ට ආසන්න වී තිබේ.

නවතම දත්තවලට අනුව වාර්තා වන මියගිය සංඛ්‍යාව 1,090,811ක් වන අතර මුළු ආසාදිතයන් සංඛ්‍යාව 38,364,519ක් වෙයි. ඒ අතරින් 28,851,704 දෙනෙකු සුවය ලබා තිබෙන බව වාර්තා වේ.

වැඩිම ආසාදිතයන් පිරිස අමෙරිකාවෙන් වාර්තා වන අතර, එම සංඛ්‍යාව 8,090,253ක් වේ. එරට මරණ සංඛ්‍යාව 200,000 ඉක්මවා යාම විශේෂත්වයකි. ඒ අනුව එරට මියගිය සංඛ්‍යාව 220,873ක් වෙයි. මේ අතර ඉන්දියාවේ ආසාදිතයන් 7,239,389ක් සහ බ්‍රසීලයේ ආසාදිතයන් සංඛ්‍යාව 5,114,823ක් ලෙස වාර්තා වන අතර රුසියාව ද ආසාදිතයන් ලක්ෂ 10 ඉක්මවා ගොස් ඇත. පේරු, කොලොම්බියාව, මෙක්සිකෝව, දකුණු අප්‍රිකාව, ස්පාඤ්ඤය, ආර්ජන්ටිනාව, ප්‍රංශය, එක්සත් රාජධානිය, ඉරානය යන රටවල ආසාදිතයන් ප්‍රමාණය 500,000 ඉක්මවා ගොස් ඇත. බ්‍රසීලයේ මරණ සංඛ්‍යාව 151,063ක් වන අතර, අසල්වැසි ඉන්දියාවේ මරණ සංඛ්‍යාව 110,617කි.

ආරක්ෂාවේ වගකීම ඉටුකරමු

අවශ්‍ය සැමවිටම නහය කට වැහෙන සේ මාස්ක්එක හරියට පළඳිමු

සැමවිටම දැත් පිරිසිදුව තබාගනිමු

නිතරම තත්පර 20ක් සබන් ගා අත්දෙක සෝදන්න, නැතිනම් සැනිටයිසර් වලින් අත් පිරිසිදු කරන්න

සැමවිටම මීටරයක පරතරයක් තබාගනිමු

කැස්සට හා කිවිසුමට වැලමිට භාවිත කරමු

කොවිඩ්-19 දුරලීමට අප සැම තිසි සෞඛ්‍ය පුරුදු පිළිපදිමු. නව ජීවන රටාවකට හුරු වෙමු.

www.health.gov.lk

#COVID19 | #beresponsible

වගකියමු. BE RESPONSIBLE නව ජීවන රටාවක් උදෙසා

සෞඛ්‍ය අමාත්‍යාංශය | World Health Organization Sri Lanka | ඉටුකම itukama | රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

දිනමිණ
The Dinamina
1909 ඇරැඹී ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 ඔක්තෝබර් 15 බ්‍රහස්පතින්දා

වයිමා පරාදයි!

බඩු මිල, ජීවන වියදම, ජීවත් වීමේ අමාරුව වැනි මාතෘකා ගැන සිදු වන උණුසුම් සංවාද කඩ පොළේදී, කාර්යාලයේදී හා තවත් තැන්වලදී දැකගත හැකිය. උද්ධමනය ආදි ආර්ථික විද්‍යාවේ පර්යාය පද යොදා ගනිමින් උගතුන් අතර සිදු වන සාකච්ඡා ද මේ විෂයයටම අයත් වේ. කුමන සංවාදයකදී වුව ඇඟිල්ල දිගු වන්නේ ආණ්ඩුව දෙසටය. නැත හොත් ආණ්ඩුවේ නායකයන් දෙසටය. විපක්ෂය ජීවන වියදම් සාධකය යොදා ගන්නේ දේශපාලන වාසිය සඳහා ය. විපක්ෂය හා එහි නායකයන් පාරිභෝගිකයන් අතරට පැන ජීවන වියදම් ගින්න තවත් ඇවිළවීම කවදත් සිදු වෙයි. පවතින ආර්ථික රාමුව යටතේ ආණ්ඩුවකට බඩු මිල සම්බන්ධයෙන් කළ හැක්කේ ඉතා ස්වල්ප වැඩ කොටසක් බව කිසිවකු වටහා ගන්නේ නැත.

ආර්ථික විද්‍යාව ලෝකයේ ඇති හොඳම විද්‍යාව බව එක්තරා පඬිවරයකු කියා ඇත. එය ඇත්තක් යැයි පෙනී යන්නේ ජීවත් වීම සඳහා කරන අරගලයේදීය. එම විද්‍යාවට අනුව ජීවන වියදම පහත හෙළීමට නම් නිෂ්පාදනය වැඩි කළ යුතුය. සැපයුම වර්ධනය කළ යුතුය. නිෂ්පාදනය හා සැපයුම වැඩි කිරීම සැලැසුම් සහගත දිගුකාලීන වැඩපිළිවෙළකි. ආකස්මික ලෙස නිෂ්පාදනය වැඩි කළ හැකි ක්‍රමෝපායක් තවම සොයා ගෙන නැත. ඒ සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගත හැකි ඇලඩින්ගේ පහනක් ද අප ළඟ නැත. එබැවින් ශක්‍රයාගේ පුත්‍රයා වූ වයිමාටවත් බඩු මිල අඩු කළ නොහැකි යැයි තර්කයක් ගොඩනැඟී ඇත. එය බොරුවක් ද නොවේ.

අප ඉහත පූර්විකාව ගෙන ආයේ ජීවන වියදම සම්බන්ධයෙන් පවතින යථාර්ථය වටහා ගනු සඳහාය. නිදහසින් පසු බිහි වූ කිසිදු ආණ්ඩුවකට බඩු මිල ස්ථාවර තත්ත්වයක පවත්වා ගැනීමට හැකි වී නැත. කාලයත් සමඟ ජීවන වියදම ඉහළ යෑම පොදු තත්ත්වයක් ලෙස පවතී. එහෙත් විපත්තිදායක හා අසීරු අවස්ථාවලදී රජය මැදිහත් වී තෝරාගත් භාණ්ඩ කිහිපයක මිල බැස්සවීමට පියවර ගෙන ඇත. වත්මන් ආණ්ඩුව ද එබඳු පියවර ගණනාවක් ගෙන තිබේ. එහි අලුත්ම පියවර වන්නේ ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍ය කිහිපයක බදු අඩු කිරීමට තීන්දුවක් ගැනීමය. එය මේ මොහොතේ ජනතාවට දුන් තාවකාලික සහනයක් සේ සලකන්නට පුළුවන.

පරිප්පු, සීනි, ලොකු ලූනු හා ටින් මාළුවල මිල සැලකිය යුතු මට්ටමකින් අඩු වීමට මෙය හේතුවක් වෙයි. මේවා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලෙස සැලකිය හැකිය. පරිප්පු යනු හැම ගෙදරකම ඉදෙන හොද්දකි. පාන් කෑමටත් පරිප්පු තිබිය යුතුය. බත් කෑමට පමණක් නොව මඟුල් කෑමටත් පරිප්පු තිබිය යුතුය. අවාසනාවකට මෙන් අපේ පොළොවෙහි පරිප්පු හරියන්නේ නැත. තුර්කියෙන් හෝ වෙනත් රටකින් හෝ පරිප්පු ආනයනය කළ යුතුය. ටින් මාළු හා ලොකු ලූනුවල තත්ත්වය ද ඊට වෙනස් නැත. සීනි පරිභෝජන අවශ්‍යතාවෙන් 80%ක් ආනයනය කළ යුතුය. බදු අඩු කිරීම මෙබඳු භාණ්ඩවල මිල පහත බැස්සවීම සඳහා යෙදිය හැකි එක් උපාය මාර්ගයකි. රජයට ආර්ථික පාඩුවක් සිදු වන්නේ වුව එම තීරණය ගෙන තිබේ.

විවෘත ආර්ථික පසුබිම යටතේ පෞද්ගලික ව්‍යාපාරිකයා ක්‍රියා කරන්නේ වෙනස් අභිලාශයන් සහිතවය. ව්‍යාපාරිකයන්ගේ මූලික ඉලක්කය අධික ලාභ ලැබීමය. බඩු මිල ඉහළ යන තරමට ඔහු කැමැතිය. ලාභයට කුමන අයුරකින් හෝ තට්ටු වන තීරණවලට ව්‍යාපාරිකයා කැමැති නැත. ඔහුට අවශ්‍ය වැඩි මිලකට භාණ්ඩ අලෙවි කිරීමටය. මේ සඳහා කෘත්‍රිම භාණ්ඩ හිඟයක් ඇති කිරීමට වුව ව්‍යාපාරිකයා සූදානමිය. අපේ රටේ රාජ්‍ය අංශයට වඩා පෞද්ගලික අංශය ශක්තිමත්ය. මේ වසරේ මුල් කාර්තුව තුළ ආහාර ද්‍රව්‍ය ගණනාවක මිල පහත හෙළීමට අවශ්‍ය තීන්දු තීරණ ආණ්ඩුව විසින් ගනු ලැබුයේ වුව එහි වාසිය පාරිභෝගිකයන් වෙත නිසි අයුරින් ගලා යෑමට ව්‍යාපාරිකයා ඉඩ තැබුවේ නැත. අඩු මිලට බඩු ආණ්ඩුවෙන් ලබා ගන්නැ'යි ඇතැම් ව්‍යාපාරිකයෝ සමච්චල් කළහ.

පවත්නා තත්ත්වය යටතේ පාරිභෝගිකයාට සහන සැලසීමට නම්, කඩා පනින හමුදාවක් ද වෙළෙඳපොළ වෙත යැවිය යුතුය. එසේ නොවුණ හොත් ව්‍යාපාරිකයා කුමන හෝ උප්පරවැට්ටියක් යොදා වැඩි මිලට බඩු විකුණයි. පාරිභෝගික සේවා අධිකාරිය වත්මන් ආණ්ඩුව යටතේ පණ ගසා ඇති බවක් පෙනෙන්න තිබේ. එහි නිලධාරිහු අවදියෙන් සිටිති. නිතර වැටලීම් කරති; නිතර වෙළෙඳපොළට කඩා පනිති. එය සාධනීය ලක්ෂණයක් සේ සැලැකිය හැකිය. වෙළෙඳ පොළ මුළුමනින් ම හැසිරවීමේ හැකියාවක් ආණ්ඩුවකට නැති වුව වෙළෙඳ පොළට බලපෑම් කිරීමේ හැකියාවක් ආණ්ඩුවට ඇත. ඒ බලපෑම කළ යුතුය.

අඩුම්ලට ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ ගැනීමට නම් සතොස වෙත යා යුතුයැයි බොහෝ දෙනා කියති. අසීරු අවස්ථාවලදී රජයක පිහිටට එන්නේ ද සතොස පමණි. එහෙත් සතොස වටා රොක් වී ඇත්තේ මූල්‍ය ශක්තියෙන් හීන සුළු පාරිභෝගික පිරිසක් පමණි. අත-මිට යන්තමින් ඇති සියල්ලෝම සුපර් මාර්කට් කරා ඇදී යති. වෙළෙඳ තරගයේ දී සතොස පසු වන්නේ අන්තිම පේළියේය. එක අතකින් රට පුරා සතොස වෙළෙඳසල් නැත. තව අතකින් ආකර්ෂණීය සේවාවක් හා පෙනුමක් ද ඊට නැත. මේ තත්ත්වය වෙනස් කළ හැකි නම් අපේ දුප්පත් පාරිභෝගිකයාට මීට වඩා හොඳ කාලයක් උදා වනු ඇත.

තත්ත්වය එසේ වුව ආණ්ඩුව ගෙන ඇත්තේ වැදගත් පියවරකි. එය පොදු ජනයාගේ පැත්ත ගෙන ගනු ලැබූ තීරණයක් සේ සැලැකිය හැකිය. පාරිභෝගිකයා ද අවදියෙන් සිට ඉහත සහනය ලබා ගත යුතුය.



වට කර කර තදින් බැන්ද හැම රහැනම	බිඳ
පිට පැනලා යන්න හදයි සමාජයට	වැද
නටවන්නට හිතා කොවිඩ් ගැහුවත් මොන	පද
රැකගමු සුව පුරුදු හෙටට කල් නොදමා	අද

කොවිඩ් සමඟ දෙවැනි සටන
නොසැලකිලිමත් වුණොත් පරාදයි

ලුඑ ලෝකයම කොවිඩ් 19 වසංගතය හමුවේ දණ නමා ඇති මොහොතක, කොරෝනා වයිරසය සාර්ථකව පාලනය කළ රටවල් අතරින් ශ්‍රී ලංකාව දෙවැනි ස්ථානයට පත් වීමට හේතු කාරණා ගණනාවක් බලපා තිබේ. ඒ අතරින් වඩාත් වැදගත්ම කාරණය වන්නේ, වසංගතය මැඩපැවැත්වීම සඳහා ගන්නා ලද සියලු තීන්දු තීරණ ගනු ලැබුයේ, සෞඛ්‍ය විශේෂඥයන්ගේ උපදෙස්වලට යටත්ව වීමයි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රමුඛ රජය රටට බලපාන තීරණ ගැනීමේදී සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස්වලට අවනතව කටයුතු කිරීමම, අන් කිසිදු ජාතියක් මේ ව්‍යසනය හමුවේ ක්‍රියා නොකළ ආකාරයට අප ක්‍රියා කළ බව පෙන්වීමට ඇති හොඳම සාක්ෂ්‍යයයි.

රටේ ජනතාවගේ ආරක්ෂාවට මුල් තැන දෙමින්, එය සුවිශේෂ වගකීමක් සේ සලකමින් රජය කටයුතු කළ අතර, ඉදිරියේදීත් එලෙසම කටයුතු කෙරේ.

මේ වන විට බ්‍රැන්ඩික්ස් පොකුරෙන් මතුවුණු කෙරෝනා ආසාධිතයා සමඟ, වයිරසය වැලඳුණු සහ ඔවුන්ගේ ආශ්‍රිතයන් සියලු දෙනා හඳුනාගෙන පී.සී.ආර් පරීක්ෂණවලට භාජනය කර ඇත. එසේම, බ්‍රැන්ඩික්ස් සාමාජිකයන් සියලු දෙනාත්, ඔවුන්ගේ සම්පතමයන් සියලු දෙනාත් මේ වන විට රෝහල්ගත කර හෝ නිරෝධායන මධ්‍යස්ථානවලට යොමු කර හෝ ඇත. එහෙත්, ඒ මත පිහිටා තත්ත්වය මුළුමනින්ම පාලනය කර ඇති බව අදහස් නොවන අතර, රටේ විවිධ ප්‍රදේශවලින් බ්‍රැන්ඩික්ස් පොකුරෙන් මතුවූ අසාධිතයන් හමුවීම නිසා, ඉදිරි දින කිහිපය තුළ වයිරසයේ හැසිරීම සහ රෝගීන් වාර්තා වීම මත සියයට සියයක්ම තත්ත්වය අප අතට ගැනීමට ඇති හැකියාව තීරණය කරනු ඇත.

මේ වන විට සෞඛ්‍ය අංශ මඟින් තහවුරු කරගෙන ඇති තොරතුරු අනුව, කිසිදු පුද්ගලයෙක් ආශ්‍රිතයකු නොමැතිව කෙරෝනා ආසාදනයට ලක් වී නැත. එමෙන්ම, බ්‍රැන්ඩික්ස් පොකුරෙන් වාර්තා වුණු රෝගීන් වැඩි ප්‍රමාණයක් මිනුවන්ගොඩ සහ දිවුලපිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වනමුත්, ඉන් පරිබාහිර ප්‍රදේශවලට අවදානමක් නොමැති බවට මින් අදහස් නොකරයි. ගෙවෙන සතිය තුළ තත්ත්වය වෙනස් වීමට බැරිකමක් නැත. මේ නිසා අවදානමට පෙර සුදානමට මුල් තැන දෙමින්, සියලු දෙනාම වගකීමෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාව සිහි තබා ගත යුතුය.

අවදානම් කලාප

කොවිඩ් 19 ලෝකය පුරා ශීඝ්‍රයෙන් පැතිර යමින් පවතින නිසා, බොහෝ පිරිසක් එකට එකතු වන, ගැටෙන ස්ථාන අවදානම් කලාප බවට පත්ව තිබේ. කර්මාන්ත ශාලා, එසේම, සමූහයක් නවාතැන් ගන්නා නේවාසිකාගාර මේ අතර ප්‍රධාන වෙයි. එවැනි තැන්වලට විවෘත වුණු පිරිස් තමන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව ගැන වෙනදාටත් වඩා සැලකිලිමත් වීම ඉතා වැදගත්ය.

කොවිඩ් 19 වසංගතය මුළුමනින්ම ලෝකයෙන් තුරන් වීමට තවත් කාලයක් ගතවනු ඇත. මේ නිසා, ඉදිරියටත් අප කටයුතු කළ යුත්තේ කොවිඩ් 19 සමඟ බවට සෞඛ්‍ය අංශ විටින් විට සිහි කැඳවා තිබේ. කෙසේ වෙතත්, මාර්තු මස11 වැනි දින පළමු වන රෝගියා මෙරටින් වාර්තා වීමෙන් පසු අවස්ථා 33කදී පමණ මතුවූ සිදුවීම් සාර්ථකව පාලනය කර, දිගු නිහැඬියාවක් ගත කළ එකම රට ද අපේ රටයි. මෙය එක් අතකින් අපේ ජනතාවගේ කැපවීම සහ සෞඛ්‍ය උපදෙස් කෙරෙහි පවතින අවනත බව පෙන්වන කරුණක් වන නමුත්, එම නිදහසින් යම් අයුතු ප්‍රයෝජනයක් ගත්තේ ද යන ප්‍රශ්නාර්ථය ද පැන නගී. රට යළි විවෘත කිරීමෙන් පසු යම් ප්‍රමාණයකට සෞඛ්‍ය අංශ ලබාදී තිබුණු උපදෙස්වලින් ඇත්ව කටයුතු කරන බවක් පෙනෙන්නට තිබිණි. කෙසේ වෙතත්, කොරෝනා වසංගතය පාලනය කිරීම ජනතාවගේ හැසිරීම මත තීරණය වන කාරණයකි. රජයක් සෞඛ්‍ය විධි විධාන පනවමින් කොපමණ කටයුතු කළත්, තමන් කොවිඩ් ආසාදිතයකු නොවී සහ කොවිඩ් පතුරවන්නකු නොවී කටයුතු කරන්නේ යැයි තමන් තුළ පවතින සහතිකය මත, මුළු රටක්, ජාතියක් මේ ව්‍යසනයෙන් බේරා ගැනීමට ඉහළ වන ප්‍රබලතම සාධකය වනු ඇත.

කෙරෝනා වසංගතය ජය ගැනීම සඳහා රජය මෙතෙක් ගෙන ඇති ක්‍රියා මාර්ග බෙහෝය. ඒ අතරින් සුදුසු ම අවස්ථාවේදී සැක සහිත පුද්ගලයන් පී.සී .ආර්. පරීක්ෂණවලට යොමු කිරීමට කටයුතු කර තිබේ. එය දිනකට අවම වශයෙන් 5000-7000ක් වැනි ප්‍රමාණයකි. එමෙන්ම කොරෝනා පළමු රැල්ල සාර්ථකව මැඩ පැවැත්වීමෙන් පසුව ද සියලුම රෝහල්වලට යොමු කරන රෝගීන්ගෙන් අවම වශයෙන් දිනකට දස දෙනෙක්වත් පී.සී.ආර් සඳහා යොමු කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුම් දී තිබිණි. මේ නිසා බ්‍රැන්ඩික්ස් පොකුරේ පළමු රෝගියා ඉතා ඉක්මනින් හඳුනා ගැනීමට හැකියාව ලැබිණි. ඒ වගේම, වයිරසයේ හැසිරීම ද මේ වන විට යම් තාක් දුරට තහවුරු කර ගැනීමට හැකියාව ලැබී තිබේ. මීට පෙර වාර්තා වුණු තත්ත්වයට වඩා එක් ආසාදිතයකුගේ වැඩි වයිරස් ප්‍රමාණයක් අන්තර්ගත බව එම පරීක්ෂණවලදී තහවුරු වී ඇත. එය මෙතෙක් අපේ රටින් හමු නොවූ කොරෝනාවල වෙනත් ප්‍රභේදයක් ලෙස සෞඛ්‍ය අංශ සැක පළ කරන බවත්, මෙය ප්‍රථම වතාවට වඩා ආක්‍රමණශීලිත්වයෙන් වැඩි බවත්, එය පාලනය කිරීම සඳහා අප ද ඊට වඩා ආක්‍රමණශීලිත්වයෙන් කටයුතු කළ යුතු බවත් වසංගත රෝග විද්‍යාඥ සුදත් සමරවීර මහතා මෙහිදී අවධාරණය කළේය.

කොවිඩ් වසංගතය ලොව පුරා ව්‍යාප්ත වෙමින් පැවැති මොහොතේ, රජය ඒ සඳහා ගත් පෙර සුදානම ඉතා වැදගත්ය. විශේෂයෙන් වයිරසය ශීඝ්‍රයෙන් පැතිරීමේ අවදානමක් මතු වුවහොත්, රෝගීන් සහ පහසුකම් කළමනාකරණය කර ගැනීම සඳහා සෞඛ්‍ය පනුසකම් තර කර ගැනීමට ගත් වඩාත් ප්‍රශස්ත වැඩපිළිවෙළ මේ කාර්තව්‍යයේදී මනා පිටුබලයක් වූ බැවි, යුද හමුදාපති ශවේන්ද්‍ර සිල්වා මහතාගේ අදහසය. විශේෂයෙන් නිරෝධායන මධ්‍යස්ථාන 96ක් පවත්වාගෙන යමින්, විදෙස් රටවලින් පැමිණි 8000ක් පමණ නිරෝධායනය කළ බවත්, ඒ සියලු දෙනාට උපරිම පහසුකම් ලබා දුන් බවත්, රට තුළින් වාර්තා වුණු සියලුම ආසාධිතයන් ජීවිත අවදානමින් ගලවා ගෙන, සෞඛ්‍යාරක්ෂිතව සමාජයට මුදා හැරීමට ක්‍රියා කළ බවත්, 'කළ නොහැක්කක් නොමැත' යන තේමාවේ පිහිටා, කොපමණ අභියෝග මතු වුව ද ඉදිරියටත් කොරොනා මැඬලීමට උපරිම ශක්තිය මුදා හරින බවත් කියා සිටියේය. එමෙන්ම, මේ වන විට පවතින තත්ත්වය සැලකිල්ලට ගෙන තවත් 2000ක පමණ පිරිසක් එකවර නිරෝධායනය කිරීමට ද පහසුකම් සුදානම් කර ඇති බව, යුද හමුදා පතිවරයා පැවසුවේය.

> මේ වන විට සෞඛ්‍ය අංශ මඟින් තහවුරු කරගෙන ඇති තොරතුරු අනුව, කිසිදු පුද්ගලයකු ආශ්‍රිතයකු නොමැතිව කෙරෝනා ආසාදනයට ලක්වී නැත. එමෙන්ම, බ්‍රැන්ඩික්ස් පොකුරෙන් වාර්තා වුණු රෝගීන් වැඩි ප්‍රමාණයක් මිනුවන්ගොඩ සහ දිවුලපිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වනමුත්, ඉන් පරිබාහිර ප්‍රදේශවලට අවදානමක් නොමැති බවට මින් අදහස් නොකෙරේ. ගෙවෙන සතියේ මේ තත්ත්වය වෙනස් වීමට බැරිකමක් නැත.

කොරෝනා මැඬලීමට රජය ගත් වැදගත්ම ක්‍රියාමාර්ගය, සුදුසු මොහොතේ සුදුසුම ක්‍රියාමාර්ග ගැනීමය. ඒ අනුව, වසංගතය මැඬපැවැත්වීම සඳහා කොරෝනා නීතිවලට අවනත නොවී කටයුතු කරන්නන්ගෙන්, රටේ සෙසු ජනතාවට විය හැකි අවදානම මුලිනුපුටා දැමීම සඳහා කොරෝනා නව නීති මාලාවක් ඉදිරි දින කිහිපයේදී ගැසට් කිරීමට කටයුතු කරන බවත්, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව ඒ සඳහා දැනටමත් කටයුතු කරමින් සිටින බවත් පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය සඳහන් කළාය. එනයින් වගකීම් විරහිතව කටයුතු කරමින්, වසංගතය ව්‍යාප්තියට කටයුතු කරන අයකුට මාස රක සිරදඬුවමක් ලබා දීම, වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමට නීති ප්‍රතිපාදන තහවුරු කිරීම , ජනතාව බොහෝ සෙයින් ගැවසෙන ස්ථානවල මීටරයක දුර අනිවාර්ය වීම මෙන්ම, ආයතනයක් පවත්වාගෙන යනවිට, එම ආයතන ප්‍රධානීන් සේවකයන්ගේ සහ සේවාලාභීන්ගේ ශරීර උෂ්ණත්වය මැන බැලීම අනිවාර්ය කිරීම වැනි කාරණා පවා නීතිගත කිරීමට එමඟින් බලාපොරොත්තුවේ. යමෙකුගේ අත්වැරදීමකින්වත් මේ වයිරසය සමාජ ගතවීම වැළැක්වීම සඳහා ජනතාවගේ උපරිම සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීමේ අරමුණින්ම මේ නීති ඉදිරියේදී රටේ නීති පද්ධතියට එකතු කිරීමට රජය බලාපොරොත්තුවේ.

එමෙන්ම මේ වන විට මුළු රටටම බලපවත්වන ඇඳිරි නීතියක් පනවා නොතිබුණ ද, සෞඛ්‍යාරක්ෂාවට තර්ජනයක් ඇති විය හැකි ලෙස ජනතාව ඒකරාශී වීම වැළැක්වීම සඳහා සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව බස් රථවල ගමන් කළ හැකි ප්‍රමාණය 50% කට සීමා කිරීම, ආගමික ස්ථානවලට ඒකරාශී වීම 50%කට සීමා කිරීම, සිනමා ශාලා, කානිවල් තහනම් කිරීම, මත් පැන් අලෙවිසැල් විවෘත කිරීම සියයට 50ක් සීමා කිරීම, හෝටල්, ලැගුම්හල් විවෘත කිරීම සියයට 50කට සීමා කිරීම වැනි අත්‍යවශ්‍ය යැයි හැඟෙන ස්ථානවලට සියලු ආරක්ෂක විධිවිධාන තර කර ඇති අතර, රෝගය තව දුරටත් පැතිරෙන්නේ නම්, එය ජනතාව වගකීම් විරහිතව කටයුතු කරන්නේ ද? නැද්ද? යන්න මත තීරණය වේ.

දැවැන්ත වයිරසයක් මිනිස් ජීවිත බිලි ගැනීම සඳහා හඹා එන මොහොතක, ජනතාව නිරන්තරයෙන් අවදියෙන් සිටීම අත්‍යවශ්‍යයය. ඒ සඳහා රජය දෙන උපදෙස් පිළිපදිමින්, ඊට අවනතව කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව අවධාරණය කළේ පොලිස් මාධ්‍ය ප්‍රකාශක නිතිඥ අජිත් රෝහණ මහතායි. එහිදී හෙතෙම කියා සිටියේ, කොරෝනා තත්ත්වය සම්බන්ධයෙන් සත්‍ය තොරතුරු දැන ගැනීමේ ජනතා අයිතිය රජය සහ ආරක්ෂක අංශය උපරිමයෙන් තහවුරු කර ඇති බවයි. මේ වන විට ලොව පුරා ලක්ෂ 11කගේ ජීවිත අහිමි වෙද්දී, අපේ රටේ මරණ අනුපාතය සියයට 0.3ක් බවට පත්ව ඇත්තේ ජනතාව කොවිඩ් පාලනයට ලබා දුන් අප්‍රතිහත සහාය නිසාය. බ්‍රැන්ඩික්ස් පොකුර ලංකාවේ කොරෝනා 33 වැනි පොකුර වන අතර, එම පොකුර ද සාර්ථකව නිවා දැමීමට ජනතාවගේ සහාය අවශ්‍ය බවත්, ජනතාව කුපිත කරමින්, සමාජ මාධ්‍ය හරහා ජනතාව නොමඟ යවමින් කටයුතු කර මේ ගමන ආපස්සට හැරවීමට කටයුතු නොකරන ලෙසත් ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

අභියෝගය ජය ගැනීම

මේ වන විට අපෝ.ස උසස් පෙළ විභාගය ආරම්භවී ඇති අතර, දරුණු වයිරසයක් පැතිර යමින් පවතින මොහොතක, දරුවන්ගේ අනාගතය අපස්සට ඇද දැමීමට ඉඩ නොදී, උපරිම සෞඛ්‍ය ආරක්ෂාවක් සලසමින් ඒ සඳහා කටයුතු කරන ලෙස රජය විභාග දෙපාර්තමේන්තුවට සහ අධ්‍යාපන අමාත්‍යාංශයට දැනුම්දී තිබේ. විශේෂයෙන් විභාගයට වාඩි වන තම දරුවාගේ ආරක්ෂාව වෙනුවෙන් මව්පියන්ට බරපතළ වගකීමක් පැවරෙන බවත්, යමක් තේරුම් ගැනීමේ වයස් සීමාවක පසුවන මේ දරුවන්ට, ස්වභාව ධර්මයෙන් ලබාදී ඇති මේ අභියෝගයට මුහුණදීමට උපරිම ශක්තිය සහ බුද්ධිමත්භාවය ඇති බවත්, මුඛ ආවරණ පැලඳීම, මීටරයක දුර තබා ගැනීම, පොදු ප්‍රවාහන භාවිතයේදී සහ විභාග ශාලාවේදී සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම , හැකි සෑම අවස්ථාවකම අත් සේදීම ආදිය මඟින්, වයිරසය පැතිරීම සියයට සියයක් පාලනය කළ හැකි බවත් මේ විද්වත් හමුවේදී අවධාරණය කෙරිණි.

කොවිඩ් පාලනය සඳහා දැනට ලොව තහවුරු කර ගත් ඵලදායිතම සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදය සමාජ දුරස්ථභාවයයි. ඊට යටත්ව කටයුතු කිරීමෙන් මේ වයිරසය කෙනකුගෙන් තවත් කෙනකුට සම්ප්‍රේෂණය වීම වළක්වා ගැනීමට හැකියාව ලැබෙයි. එමෙන්ම, අනවශ්‍ය ලෙස ගමන් බිමන් යාමෙන් වැළකී, මේ මොහොතේ ද ජනතාව සෞඛ්‍ය අංශවලට සහය දක්වන්නේ නම්, පවතින තත්ත්වය ඉතා ඉක්මනින් පාලනය කර ගැත හැකි බව මේ සාකච්ඡාවේදී අවධාරණය කෙරිණි. එමෙන්ම ලෝකයේ දරුණු වසංගතයක් පැතිර යන මොහොතක ඇතැම් රටවලින් අසන්නට, දකින්නට ලැබුණු ජනතා ප්‍රතිචාර දෙස බලන විට, ඉතාමත් විනීතව, වගකීමසහගතව සහ සාමුහිකව කටයුතු කර, මුළු ලෝකයටම ආදර්ශයක්දී තිබෙන එකම රට ශ්‍රී ලංකාව බව අසත්‍යක් නොවේ. ඒ ගෞරවය පළුදු කර ගන්නේ නැතිව, ඉදිරියටත් රට ජයග්‍රහණය සඳහා රැගෙන යාමට අත්වැල් බැඳගෙන කටයුතු කරන්නට සැවොම එක් විය යුතුය.

(2020 10.11 වැනි දින අයිටිඑන් රූපවාහිනිය මඟින් විකාශය කළ කොරෝනාවලට එරෙහිව යළි නැඟිටිමු වැඩසටහනට සහභාගි වූ සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා දේවි වන්නිආරච්චි, කොරෝනා මැඬලීමේ ජනාධිපති කාර්ය සාධක බළකායේ සභාපති, යුද හමුදාපති ශවේන්ද්‍ර සිල්වා, පොලිස් මාධ්‍ය ප්‍රකාශක නිතිඥ අජිත් රෝහණ, වසංගත රෝග විද්‍යායතනයේ වසංගත රෝග විද්‍යාඥ සුගත් සමරවීර යන මහත්ම මහත්මීන් විසින් දක්වන ලද අදහස් ඇසුරෙන් මේ ලිපිය සකස් කෙරිණි.)

සකුන්තලා ජයසිංහ

මියයන ජීවිතවලට නොමියෙන වටිනාකමක්

අවයව පරිත්‍යාගය විධිමත් කිරීමට කාලය එළඹ ඇත

මහනුවර ජාතික රෝහලේ අවයව බද්ධ කිරීමේ විශේෂඥ වෛද්‍ය
එච්.පී. හරිස්චන්ද්‍ර

වෛද්‍ය විද්‍යාව දියුණු වීමත් සමඟ රෝගවලින් මරණයට පත් වන සංඛ්‍යාව අඩු කර ගැනීම සඳහා අවයව බද්ධය බෙහෙවින් ඉවහල් වී තිබේ. මෙයට දශක ගණනාවකට පෙර අවයව බද්ධයක් සිදු කර පුද්ගලයකුගේ ජීවිතය බේරා ගැනීම සිහිනයක්ව පැවතිණි. අද වන විට එම තත්ත්වය වෙනස්ව ඇත. ඇස්, වකුගඩු, අක්මා, පෙණහලු, බද්ධයෙන් නොනැවතුණ වෛද්‍ය විද්‍යාවේ දියුණුව හෘදය බද්ධ කිරීම දක්වා මේ වන විට දිගු ගමනක් පැමිණ තිබේ.

වකුගඩු, අක්මාව, පෙණහලු, අග්න්‍යාශය සහ හෘදය වැනි අවයව බද්ධ කිරීම මෙහිදී ප්‍රධාන තැනක් ගනී. ජීවතුන් අතර සිටින පුද්ගලයන්ගෙන් සහ මොළය මිය ගිය පුද්ගලයන්ගෙන් ලබා ගන්නා අවයව තවත් එවැනිම අවයව අකර්මණ්‍ය වූ පුද්ගලයනට බද්ධ කිරීම සිදු කෙරේ. ජීවතුන් අතර සිටින පුද්ගලයකුගෙන් වකුගඩු වැනි අවයව බද්ධ කිරීම සඳහා යොදා ගනු ලැබුවද හෘදය, පෙණහලු වැනි අවයව ජීවතුන් අතර සිටින පුද්ගලයකුගෙන් ලබා ගත නොහැක.

ගැළපුම් අවයව

දිනකට ලොව පුරා ලක්ෂ සංඛ්‍යාත ජනකායක් මෙම අවයව අකර්මණ්‍යතාවට පත් වීම හේතුවෙන් මරණයට පත් වෙති. බටහිර රටවල දශක ගණනකට පෙර සිටම අවයව බද්ධ කිරීමේ කටයුතු සිදු කර ඇත. දශක කිහිපයකට පෙර සිට ශ්‍රී ලංකාවේ අවයව බද්ධ කිරීමද සිදු කරමින් පවති. 1986 වසරේ සිට ජීවතුන් අතර සිටින පුද්ගලයන්ගේ ලබා ගන්නා වකුගඩු බද්ධ කිරීම සිදු කරයි. 2004 වසරේ මොළය මිය යෑමට ලක් වූ පුද්ගලයකුගෙන් ලබා ගත් වකුගඩු යුගළ වකුගඩු අකර්මණ්‍යතාවයෙන් ජීවිතයත් මරණයත් අතර ජීවත් වූ දෙදෙනකුට මහනුවර මහ රෝහලේදී සාර්ථකව බද්ධ කෙරිණි. 2017 වසරේ මොළය මියගිය අයකුගේ හෘදය තවත් හෘදය අකර්මණ්‍යතාවට පත් වූ අයකුට සාර්ථකව බද්ධ කර තිබිණි. මෙරටදී කෙරුණු සියලුම අවයව බද්ධ සාර්ථක වී ඇත.

රෝගියකුගේ ජීවිතයක් බේරා ගැනීමට ජීවත්වන පුද්ගලයන්ගෙන් ලබාගත නොහැකි අවයව මොළය මියගිය පුද්ගලයකුගෙන් ලබා ගැනීම සිදු කෙරේ. අදාළ රෝගියාට ගැළපුම් සහිත අවයවයක් බද්ධ කළ යුතු වුවද මොළය මිය ගිය පුද්ගලයන්ගේ අවයව පරිත්‍යාගය ඉතා අඩු මට්ටමක පවතී. ඒ නිසා තව දුරටත් ජීවත් කළ හැකි පුද්ගලයන් විශාල ප්‍රමාණයක් දින පතා මරණයට පත් වෙති.

මහජනතාව තුළ මේ පිළිබඳව දැනුවත්භාවයක් නොමැති වීමත් ඒ ඒ රටවල පවතින නීති ක්‍රියාදාමත් මෙයට තදින් බලපා ඇත. ස්පාඤ්ඤයේ අවයව ප්‍රදාන සැලකිල්ලට ගැනීමේදි ජනගහනය මිලියනයකට මොළය මියගිය පුද්ගල අවයව ප්‍රදානය 45 ක් පමණ වේ. ශ්‍රී ලංකාවේ එය සැලකිල්ලට ගැනීමේ දී 2%කි. ශ්‍රී ලංකාව වැනි රටක ජනතාව තුළ සංවේදිතාවය ඉතා ඉහළ වුවද අවයව ප්‍රදානය පිළිබඳව මනා අවබෝධයක් නොමැතිකම මෙවැනි තත්ත්වයක් ඇතිවීමට එක් හේතුවකි.

ශ්වසන යන්ත්‍රය

යම් පුද්ගලයකුට සිදුවන හදිසි අනතුරකදි හෝ මොනයම් අවස්ථාවකදි මොළයට වන බරපතළ තුවාලයකදී එම පුද්ගලයාගේ මොළය මිය යෑමට ලක් විය හැකිය. මොළයට ලේ ගැලීමකදි මෙවැනි තත්ත්වයක් ඇති විය හැකිය. ඒ කිනම් හෝ අවස්ථාවකදි වෛද්‍යවරු පරීක්ෂණ ගණනාවක් සිදු කර එම රෝගියාගේ මොළය මිය ගොස් ඇති බවට නිශ්චය කර තහවුරු කළහොත් කුමන ප්‍රතිකර්මයක් කළද එම රෝගියා තව දුරටත් ජීවත් කළ නොහැකිය. මොළය ක්‍රියා විරහිත වුවද තවත් දින දෙක තුනක් සෙසු අවයව ක්‍රියා කරනු ලැබේ. එම අවස්ථාවලදී එකී රෝගියාගේ සමීපතමයන් අදහස් කරනුයේ මේ රෝගියා සුව කළ හැකි බවය. මේ අවස්ථාව වෙනකොට රෝගියා දැඩි සත්කාර ඒකකයක ශ්වසන යන්ත්‍රයක් ආධාරයෙන් ප්‍රතිකාර ලබමින් සිටී. එම රෝගියා සිහි මුර්ඡාවට පත්ව මැෂිමක සවිකරපු පුද්ගලයකු පමණි. රෝගියාගේ මොළය මිය ගොස් ඇති බවත් තව දුරටත් ජීවත් කළ නොහැකි බවත් රෝග විනිශ්චය තහවුරු වීමෙන් පසු වෛද්‍යවරයා විසින් රෝගියාගේ සමීපතමයන්ට දැනුම් දෙයි. මෙය රෝගියාගේ සමීපතමයන්ට දැඩි කම්පිත අවස්ථාවකි. රෝගියාගේ අනෙකුත් අවයව ක්‍රියා කරන බැවින් ඔවුහු එම අවස්ථාවේ නොයෙකුත් මාර්ග ඔස්සේ රෝගියා සුවපත් කර ගැනීමට කල්පනා කරති. නොපෙනෙන බලවේග පසුපස යන පිරිස් ද සිටිති. මේ අතර වාරයේ රෝගියා මිය යෑමට ලක් විය හැකිය. මොළය මිය යෑමට ලක් වූවකු සුවපත් ව නොමැත.

වෛද්‍යවරුන් විසින් එවැනි රෝගියකුගේ සමීපතමයන් දැනුවත් කිරීමෙන් පසු ඔවුන් රෝගියාගේ අවයව ප්‍රදානය කිරීමට කැමැත්ත පළ කළ හොත් අවයව ලබා ගැනීම සිදු කරයි. අනතුරුව තවත් ජීවිත අවදානමේ පසුවන පොරොත්තු ලේඛන ගත කිහිප දෙනෙකුගේ ජීවිත බේරා ගැනීම පිණිස එම අවයව බද්ධ කිරීම සිදුකරයි. අවයව ඉවත් කිරීමේ සැත්කම සහ අවයව බද්ධ කිරීමේ සැත්කම සඳහා වෛද්‍යවරු දින දෙකතුන පවා දැඩි වෙහෙසක් කැපවීමක් කර බද්ධයට ලක් වූ රෝගියා බේරා ගනිති.

මොළය මිය යෑමට ලක් වූ රෝගියකුගේ අවයවවලින් තවත් ජීවිතය අවදානම් තත්ත්වයේ පසු වන රෝගීන් කිහිපදෙනකුගේම ජීවිත බේරා ගැනීමට හැකි වුවද ඒ අවස්ථාව අප රටේ බොහෝ දුරට මගහැරී යයි. මහනුවර ජාතික රෝහලේ එවැනි තත්ත්වයට පත් වන දස දෙනකුට වැඩි ප්‍රමාණයක් මාසිකව මරණයට පත්වුවද අවයව ප්‍රදානයක් සිදු වන්නේ ඉතා කලාතුරකිනි.

> **මොළය මිය යෑමට ලක් වූ රෝගියකුගේ අවයවවලින් තවත් ජීවිතය අවදානම් තත්ත්වයේ පසුවන රෝගීන් කිහිපදෙනකුගේම ජීවිත බේරා ගැනීමට හැකි වුවද ඒ අවස්ථාව අප රටේ බොහෝ දුරට මග හැරී යයි. මහනුවර ජාතික රෝහලේ එවැනි තත්ත්වයට පත් වන දස දෙනකුට වැඩි ප්‍රමාණයක් මාසිකව මරණයට පත්වුවද අවයව ප්‍රදානයක් සිදු වන්නේ ඉතා කලාතුරකිනි.**

විශේෂිත ලියවිල්ල

බොහෝ රටවල විශේෂයෙන් බටහිර රටවල මොළය මිය යන පුද්ගලයන්ගේ කැමැත්ත කලින් ප්‍රකාශ කරන ලදුව මිය ගිය පසු නැවත අවසරයකින් තොරව අවයව ලබා ගැනීමේ ක්‍රමවේද පවති. එම පුද්ගලයා ජීවත්ව සිටින කාලයේ රියැදුරු බල පත්‍රයේ හෝ එවැනි විශේෂිත වූ ලියවිල්ලක තමා මිය ගිය පසු අවයව ලබා දීමට කැමැත්ත පළ කර තමා විසින්ම අස්සන් කොට අනුමැතිය ලබා දීමේ ක්‍රමවේද පවති. එවැනි කැමැත්ත පළ කර තිබෙන අවස්ථාවක රෝගියාගේ සමීපතමයන්ගේ අවසරයකින් තොරව අවයව ලබා ගැනීමේ හැකියාව පවති.

1987 වසරේ අප රටේ පටක අවයව බද්ධ කිරීමේ පනත මගින් මෙරට අවයව බද්ධයක් සිදු කිරීමේ නීති මාලාවක් සකසා ඇත. මෙහි ඇති සීමා තුළ මොළය මිය යෑමට ලක් වුවද අනවසරයෙන් අවයවයක් ගැනීමේ හැකියාවක් නැත. එමෙන්ම කිසියම් පුද්ගලයකුට මුදලකට හෝ වෙනයම් ආකාරයකට තමාගේ අවයවයක් විකිණීමට හෝ අවයවයක් ලබා ගැනීමට අවකාශ නැත. එය වරදක් බව දක්වා ඇත.

මේ සම්බන්ධව පවතින නීති අනුව opting in law සහ opting out law යන දෙයාකාරයක්ද ඇත. opting in law මගින් ජීවත්ව ඉන්න කාලය ඇතුළත තමා මියගිය පසු අවයව පරිත්‍යාග කිරීමට කැමැත්ත හෝ අකමැත්ත ප්‍රකාශ කිරීම ය. මෙය වඩාත් සුදුසු වේ. opting out law මගින් යම් රට වැසියෙක් ජීවත්ව සිටින කාලයේ දී මියගිය පසු අවයව පරිත්‍යාගයට අකැමැත්ත ප්‍රකාශ කර නොසිටියහොත් එම පුද්ගලයා මිය ගිය පසු අවයව ලබා ගැනීමට රජයට හැකියා ව ඇත. ඇතැම් රටවල මෙම නීතිය ක්‍රියාත්මක වෙමින් පවතී.

ස්ථිර වශයෙන් ම මිය යන බවට සහතිකව ශ්වසන යන්ත්‍රයක් ආධාරයෙන් සිටින පුද්ගලයකුගේ අවයව දන්දීමට කැමැත්ත ප්‍රකාශ කිරීම පිණිස රජය මගින් මහජනතාව දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් සැකසීම අත්‍යාවශ්‍ය ය. මෙයට මහජනයාගේ මෙන්ම වෛද්‍යවරුන්ගේ ද කැප වීම අවශ්‍ය ව ඇත.

පොරොත්තු ලේඛනය

බොහෝ රටවල පවතින රියැදුරු බලපත්‍රය හෝ වෙනයම් ලියවිල්ලක තමන් මිය යෑමෙන් පසු අවයව දන් දීමට කැමැත්ත ප්‍රකාශ කිරීමේ ක්‍රමවේදය අප රටේ නොමැත. දෛනිකව හදිසි අනතුරු වැනි දෑ නිසා මොළය මිය යෑමට ලක්ව ජීවිතක්ෂයට පත් වන විශාල පිරිසක් සිටිති. එහෙත් මොළය මියයෑම සහ අවයව දන්දීම පිළිබඳව පවතින අනවබෝධය හේතු කොට ගෙන අවයව දන්දීමේ ප්‍රමාණය ඉතාම අල්ප ය.

කුමන හේතුවක් නිසා හෝ බද්ධ කිරීමක් පමණකින් විනා ජීවිතය බේරා ගැනීමට නොහැකිව නොයෙක් අවයව අකර්මණ්‍යතාවට පත් වූ පුද්ගලයන් සමාජයේ වැඩිවීමක් දක්නට ලැබේ. අවයව බද්ධ කිරීමේ පොරොත්තු ලේඛනවල මේ පුද්ගලයන් සිය දහස් ගණනින් පේළි සැදී සිටින අතර දෛනිකව මෙම පොරොත්තු ලේඛනවලට විශාල රෝගීහු ප්‍රමාණයක් එකතු වෙති. එමෙන්ම පොරොත්තු ලේඛනවල සිටින විශාල සංඛ්‍යාවක් අවයවයක් නොලැබීම හේතුවෙන් දෛනිකව මියයති. මෙය බරපතළ සමාජීය ගැටලුවක් බවට පත්ව ඇත.

හදිසි අනතුරකින් මොළය මිය යෑමට ලක්ව මිය යාමට වීම අනපේක්ෂිත සිදු වීමකි. එය දැඩි කම්පනයක් උපදවන්නකි. මරණය ස්ථිර කොට මෙලොව එළිය දුටු කාට කොතන සිදු වේදැයි කිසිවකුට කිව නොහැකිය. එය දෛවෝපගත සිදු වීමකි. එසේ වුවද තමන් මෙලොව හැර යන විට තවත් ජීවිතයක් මරණයත් අතර දිවි ගෙවන පුද්ගලයකුට හෝ කිහිප දෙනකුට ජීවිත පරිත්‍යාගයක් ලබා දී මෙලොවින් සමුගත හැකි නම් එය කෙතරම් යහපත් වූ කටයුතුතක් ද? ඇත්තේ නොදැනුවත්භාවය සහ එයට නිශ්චිත වූ ක්‍රමවේදයක් නොමැති කමය. ඒ සඳහා රජයෙත් මහජනතාවගෙත් නෙත් විවර විය යුතු කාලය එළඹ ඇත.

ඉන්ද්‍රාණි තෝරදෙනිය
ඡායාරූපය
රුවන් මීගම්මන

නිජබිම් කතිකාව

ශ්‍රී ලංකාවේ "නිජබිම්" සංකල්පය සහ ශ්‍රී ලංකා නාමය පිළිබඳව වර්තමාන දේශපාලන ක්ෂේත්‍රයේ මෙන්ම සමාජීය කතිකාවතක් ගොඩනැගී ඇත. මෙලෙස ගොඩනැගුණු කතිකාව තුළ නිජබිම් සංකල්ප ගැටලු නිරාකරණය කරගැනීම සඳහා යම් පිටුබලයක් ලැබෙන කාර්යයක් ඉටු කළ යුතුව තිබේ. ඒ අනුව ඈත අතීතයේ සිට ශ්‍රී ලංකාව හැඳින්වීම සඳහා භාවිත කළ නාමයන්ගේ ඉතිහාසය හදාරා එය ලේඛනගතකොට සමාජයට දායාද කිරීමට අපි කල්පනා කළෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස ඈත අතීතයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාව හැඳින්වීම සඳහා භාවිතා කරන ලද නම් සංඛ්‍යාව එකසිය හැට එකක් දක්වා (161) වූ දිගු ලේඛනයක් ඉතිහාස අධ්‍යයනය තුළ සොයාගැනීමට හැකි විය.

ශ්‍රී ලංකාවේ ඓතිහාසික මානව විද්‍යාත්මක සබඳතා පිළිබඳ සහ දේශපාලන, සමාජ, ආර්ථික, ආගමික හා අන්තර්ජාතික සබඳතා පිළිබඳ ඉතිහාසය හදාරමින් මෙම ලේඛනය සකස් කිරීමට පෙලඹවිණි. මෙය ඉහත කී ක්ෂේත්‍ර පිළිබඳ අද නොව මතු දිනක පවා යම් හැදෑරීමක් කරන ලොකු කුඩා ඕනෑම කෙනෙකුට ඒ සඳහා වූ පහසුවක් සහ ආලෝකයක් සපයන්නක් බව කිව යුතුව තිබේ.

රටක් හැඳින්වීමට භාවිත කරන ලද නාම, ඉතිහාසය හැදෑරීම ඒ රටේ ඓතිහාසික, භූගෝලීය, දේශපාලනික, සමාජීය හා සංස්කෘතික ඉතිහාසය හැදෑරීම හා සමානය. කාලයෙන් කාලයට හා යුගයෙන් යුගයට ඒ භූමිය තුළ මුල් බැසගන්නා ජන කණ්ඩායම්වල සංස්කෘතීන් හා ඒ රටේ පාරිසරික සාධක මත ඒ භූමියට විවිධ පුද්ගල කණ්ඩායම් විසින් විවිධ නාමයන් ආරෝපණය කෙරේ.

ශ්‍රී ලංකා දිවයින සඳහා ද ඈත අතීතයේ සිට මේ දක්වා ස්වදේශික ජනයා විසින් හා විදේශීය විවිධ ජාතීන් විසින් භාවිත කරන ලද නම් 161 ක් පමණ සොයාගත හැකිය. මේ නාමයෙන් පිළිබඳ ඓතිහාසික විග්‍රහයක් ඉදිරිපත් කළ ග්‍රන්ථයක් නොමැති වීම අඩුවකි. එය සපුරාලීම සඳහා වූ කාර්යය මහත් වෙහෙසක් ගෙන ඉටු කළ අප ඒ සඳහා "ශ්‍රී ලංකාව සඳහා භාවිත නාමයන්ගේ ඉතිහාසය" නමින් ග්‍රන්ථයක් රචනා කරන ලදි. එහි අරමුණ අතර ප්‍රධාන තැනක් ගත්තේ ඉහත කී නාමකරණ ලේඛනයක් නොමැතිකම සපුරාලීම විය.

දේශීය ඉතිහාසය හා සංස්කෘතිය හදාරන සිසුන්ටත් සාමාන්‍ය පාඨකයාටත් මේ තොරතුරු ඒකරාශී කරදීම ඉතා ප්‍රයෝජනවත්ය. රටේ අනන්‍යතාව අනාගත පරපුරට අවබෝධ කරදීම සඳහා මෙමගින් විශාල පිටුබලයක් ලැබෙනු ඇත.

මෙම ලේඛනය පිළියෙල කිරීමේදී අප, හමු වූ නැතිනම් කරුණු එක්රැස් කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී හැකිතාක් දුරට අදාළ මූලාශ්‍රය ම සොයා භාවිත කිරීමට උත්සුක වූ බව සඳහන් කළ යුතුය.

දිවයින සඳහා භාවිත කරන ලද නාම කුමන කාලයක ආරම්භ කරන ලද්දේදැයි සොයාගැනීම අසීරුය. ඒ නිසා ඒ නාමය භාවිත වූ කාලය සඳහන් කිරීමේ දී එය සඳහන් මූලාශ්‍රය බිහි වුණු කාලය පාදක කරගෙන ඇත. ලංකාව හැඳින්වීම සඳහා කකුසඳ, කෝනාගම, කාශ්‍යප යන බුදුන් වහන්සේලාගේ සමයවල ඔජදීප, වරදීප, මණ්ඩදීප ලෙස හඳුන්වන ලද බව සඳහන් වුවත් ඒ කාලය පිළිබඳ ව සඳහන් වන මූලාශ්‍ර සොයාගත නොහැකි හෙයින් ඒ වංශ කථා හා සාහිත්‍ය ග්‍රන්ථ රචනා කළ කාලයට ඒ නම් ඇතුළත් කිරීමට සිදුවීම උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

මෙහි පළමුවන පරිච්ඡේදය නාමයන්ගේ සම්භවය පිළිබඳ කරන විග්‍රහයකට වෙන් කර ඇත. දෙවන පරිච්ඡේදය ක්‍රි.පූර්ව 6 සියවසේ සිට ක්‍රි.ව. 9 සියවස අවසානය දක්වා ඇති මූලාශ්‍ර සඳහා වෙන් කරන ලදි. තෙවන පරිච්ඡේදයේ ක්‍රි.ව. 10 සියවසේ සිට ක්‍රි.ව. 14 සියවස අවසානය දක්වා ඇති කාල පරාසයත් සිවුවන පරිච්ඡේදයේ ක්‍රි.ව. 15 සියවසේ සිට වර්තමානය දක්වා කාලයත් අන්තර්ගත කොට ඇත.

ලංකාව පිළිබඳ භාවිත කළ බොහෝ නාමයන් සඳහන් වන්නේ විදේශීය ලේඛකයන්ගේ වාර්තා හා මූලාශ්‍රය ග්‍රන්ථවලය. එනිසා ඒ ලේඛකයන් පිළිබඳ මනා අවබෝධයක් ලබාදීම සඳහා ඔවුන් පිළිබඳ වතගොත සඳහන් කරමින් කෙටි සටහනක් ලේඛක වගතුග යටතේ දක්වා ඇත.

ලෝකයේ ඕනෑම රටක නම් තැබීමට බලපෑ සාධක ප්‍රධාන වශයෙන් හතරක් තිබේ. භූගෝලීය පිහිටීම, ස්වභාවික සම්පත් හා සොබාදහමේ අසිරිය, වාසය කරන ජනතාව සහ වෙනත් සාධක ඒවායි. අප රටේ භූගෝලීය පිහිටීම පාදක කරගෙන මේ දිවයින හැඳින්වීම සඳහා නම් රාශියක් නිර්මාණය වී ඇත. ලිඛිත සාක්කි අනුව දැනට ශේෂ වී ඇති පැරණිම නාමය ලංකා (Lanka) යන්නය.

දේශීය වශයෙන් අප රට හැඳින්වීමට ලංකා, ලංකාද්වීපය, ලංකාව , ශ්‍රී ලංකාව, ලක්බිම, ලක්පොළොව, ලක, ලක්දිව,ලක්දිවි, සිරිලක, හෙළබිම, හෙළදිව, හෙළය භාවිතාකොට ඇත. චීන භාෂාවෙන් ලංයා, ලංයා සිවු, ලං කියා, ලංයා සෙවු, ලෙන්ග් කියා, ලෙන්ග් කා-ලා යන නම් භාවිතාකොට තිබේ. දෙමළ බසින් ඊලාම්, ඉලංකායි ලෙස නම් කර ඇත.

මෙලෙස අප රට හැඳින්වීමට විවිධ නම් භාවිතා කළ අතර වාසය කරන ජනතාව කේන්ද්‍රකොට නාමකරණය වී සිංහල නම් ජනතාව වාසය කරන ආදිකාලීන භාරතීය ලේඛනවල පවා සඳහන් වී තිබීම සැලකිය යුතු විශේෂත්වයකි. ලංකාව ආර්යයන් විසින් ජනාවාස කිරීමට පෙර ලක්දිව වාසය කළේ යක්ෂ සහ නාග ගෝත්‍රිකයන් බව වංශ කථා පෙන්වා දේ.

මෙයද අපට නාමකරණයේ දී සැලකිල්ලට ගතයුතු කරුණකි. ඊටත් පෙර ශ්‍රී ලංකාව හැඳින්වීමට භාවිත කළ නම් පිළිබඳව සොයාගැනීමට හැකියාව ඇත. එහිදී ද අප රට මහත් සම්පත්වලින් පිරි සුන්දර දිවයිනක් ලෙස නම් කිරීමට පැරන්නෝ ක්‍රියාකොට තිබුණු බව කරුණු අධ්‍යයනයේ දී මනාව වැටහිණි. එය කිසිවකුටත් තර්ක කළ නොහැකි තරමට සත්‍ය බව ද මේ අධ්‍යනයේදීම වැටහුණු තවත් කරුණක් බව සඳහන් කළ හැකිය.



වජිර නාරම්පනාව
හිටපු ලේකම්
රාජ්‍ය භාෂා, ජනමාධ්‍ය, පරිසර හා සුළු අපනයන භෝග සංවර්ධන අමාත්‍යාංශ

ජයසිරි මුණසිංහ

ගොවිසෙත	සුපිරි වාසනා	ලග්න වාසනාව	කෝටිපති කප්රුක	සංවර්ධන වාසනාව	ජයෝදා	ශනිදා වාසනාව	සුපර් බෝල්	ජාතික සම්පත	අද කෝටිපති	වාසනා සම්පත	දරු දිරි සම්පත
2020 - 10 - 13	2020 - 09 - 21	2020 - 09 - 08	2020 - 09 - 27	2020 - 07 - 31	2020 - 09- 09	2020 - 09 - 09	2020 - 09- 27	2020 - 09-30	2020 - 09 - 09	2020 - 09 - 28	2020 - 07 - 30
දිනුම් වාරය - 2569	දිනුම් වාරය - 1537	දිනුම් වාරය - 2916	දිනුම් වාරය - 630	දිනුම් වාරය - 354	දිනුම් වාරය - 1688	දිනුම් වාරය - 3366	දිනුම් වාරය - 1228	දිනුම් වාරය - 1059	දිනුම් වාරය - 1036	දිනුම් වාරය - 1617	දිනුම් වාරය - 013
13 21 44 54	01 33 37 57	21 37 45 59	11 21 45 64	22 23 40	07 31 35 43	31 34 60 64	11 27 35 42	0 0 2 7 9 6	07 12 39 48	37 46 48 58	04 12 33 63
අක්ෂරය G	සුපිරි අංකය -01	ලග්නය-මිතුන විශේෂිත අංක රු 500 තෘග සඳහා-9609	ඉංග්‍රීසි අක්ෂරය-E	දෙවෙ අංකය - 02 අක්ෂරය- L	අක්ෂරය-A	අක්ෂරය - D	අක්ෂරය - Q විශේෂ අංකය -5767	අක්ෂරය -H	අක්ෂරය - K රු 500 තෘග සඳහා-2169	අක්ෂරය - G	අක්ෂරය - U

නිරෝධායන ඇඳිරි නීතිය කඩූ 146ක් අත්අඩංගුවට

පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ

රක්ෂණ ශ්‍රියන්ත

නිරෝධායන ඇඳිරි නීතිය කඩ කළ පුද්ගලයන් පසුගිය පැය විසි හතර තුළ පුද්ගලයන් 11 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක වූකාලය තුළ මේ වන විට ඇඳිරි නීතිය කඩ කළ පුද්ගලයන් 135 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පවසයි.

ඇඳිරි නීතිය ක්‍රියාතමක පොලිස් බල ප්‍රදේශ 18 තුළ ඒ හරහා ගමන් කරන බස් රථ වලට මගීන් එම ප්‍රදේශවල බැස්සවීම සහ නංවා ගැනීම සපුරා තහනම් බව පවසන පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා අපොස උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන් සඳහා කිසිදු අවහිරතාවයක් නොමැතිව ගමන් කිරීමටත් ඇඳිරි නීති සීමාවන් බල නොපැවැත්වෙන බවද සඳහන් කරයි.

ශ්‍රී ලංකාවටම කොවිඩ් අවදානම පවතින හෙයින් ඇඳිරි නීතිය බලපැවැත්වෙන ප්‍රදේශවල අය මෙන්ම අනෙකුත් ප්‍රදේශවල අයද සෞඛ්‍ය සිරිත් අනුගමනය කරන ලෙසත්, මුහුණු ආවරණ පැලඳීම අත් පිරිසිදු කිරීම මෙන්ම රෝග ලක්ෂණ පවතින්නේනම් එය අනාවරණය කරන ලෙසද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ජනතාවගෙන් ඉල්ලීමක් කරයි.

ඇඳිරි නීතිය බල පැවැත්වෙන පොලිස් බල ප්‍රදේශ 18 තුළ ඖෂධ සැල් සහ ආහාර පාන අලෙවි සැල් විවෘත කිරීම පිළිබඳව අද (15) තීරණයක් ගැනීමට නියමිතව ඇති බවද වැඩිදුරටත් සඳහන් කරයි.

කොවිඩ් සැබෑ තතු පිළිබඳ ආණ්ඩුව වගකීමෙන් ප්‍රකාශයක් කළ යුතුයි

හිටපු මන්ත්‍රී අකිල විරාජ් කාරියවසම්

ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ

රට තුළ පැතිර යන කොවිඩ් වසංගතයේ සැබෑ තත්ත්වය පිළිබඳව ආණ්ඩුව පැහැදිළි, වගකීමෙන් යුතු ප්‍රකාශයක් කළ යුතු බව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල විරාජ් කාරියවසම් මහතා පැවසීය.

සිරිකොත පක්ෂ මූලස්ථානයේදී ඊයේ (14) පැවති මාධ්‍ය හමුවකදී ඒ මහතා මේ බව සඳහන් කළේය.

රට පුරා ප්‍රෙදේශවල රෝගය ආසාධනය වූවන්ගේ සංඛ්‍යාව වැඩි වෙමින් පවතින තත්ත්වයක සෞඛ්‍ය ඇමැතිවරිය මේ සම්බන්ධයෙන් පැහැදිළි අනාවරණයක් කර නැතැයි පෙන්වා දුන් කාරියවසම් මහතා කුලියාපිටිය, කුරුණෑගල, කොළඹ ඇතුළු නොයෙකුත් ප්‍රෙදේශවලින් අලුතින් රෝගීන් හඳුනා ගත්තද එම ප්‍රෙදේශවල ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා ආණ්ඩුව විධිමත් පියවර ගෙන නැතැයිද කීය. කොරෝනා දෙවැනි රැල්ල ඇති වූයේ කෙසේදැයි මහජනතාව දැන ගත යුතු බව පැවසූ ඒ මහතා බැන්ඩික්ස් ආයතනයට ඉන්දියාවෙන් පැමිණි කණ්ඩායම නිරෝධායනය නොවුයේ නම් එසේ කිරීමට අවසර දුන්නේ කවුරුන්දැයි හෙළි කළ යුතු බවද කීය.

මීගමුව නගරයෙන් ආසාදිතයෝ 15ක්

සන්ධ්‍යා කරුණාරත්න

මීගමුව නගරයෙන් කොවිඩ් - 19 ආසාදිතයන් 15ක් පසුගිය 6 වැනි දා සිට ඊයේ (14) වන තෙක් දින නවය පුරා හඳුනා ගත් බව මීගමුව පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එස්.ඩී.එල්. වසන්ත මහතා 'දිනමිණ'ට ඊයේ (14) පැවැසුවේය.

ආසාදිතයන් ලෙස හඳුනා ගත් මේ පුද්ගලයන් අංගොඩ බෝවන රෝග ජාතික විද්‍යායතනයට යොමු කර ඇතැයි ද ඒ මහතා කීය.

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කළ පුද්ගලයන් 4ක් ද, මීගමුව පෞද්ගලික රෝහලකින් ප්‍රතිකාර ලබා ගැනීමට ගිය පුද්ගලයකු ද, මෝටර් කාර්මික ශිල්පියකු ද, කටුනායක කලාපයේ නෙක්ස්ට් ආයතනයේ සේවකයන් 3ක් ද ලෙස මීගමුව පදිංචි පුද්ගලයන් 15ක් ආසාදිතයන් ලෙස වාර්තා වී ඇති බව ද ඔහු පැවැසීය.

මීගමුව පිටිපන තලහේන ප්‍රදේශයෙන් 5ක් ද, කටුවාපිටිය, මීගමුව ශාන්ත ජෝසප් විදිය, කොච්චිකඩේ මාර්ෂල්ස් පාර, මුන්නක්කරය යන ප්‍රදේශවලින් මෙම ආසාදිතයන් වාර්තා වූයේ යැයි ද හෙතෙම කීය.

ගිනිගත් නැවේ කපිතාන්ට මිලියන 12ක දඩයක්

කුමුදු හෙට්ටිආරච්චි

නීතිපතිවරයා පවරා තිබූ අධි චෝදනා දෙකටම වරද පිළිගත් ගිනි ගැනීමට ලක් වූ එම්. ටී නිව්ඩයමන්ඩ් බොරතෙල් නෞකාවේ ග්‍රීක ජාතික කපිතාන්වරයාට රුපියල් මිලියන 12ක දඩයක් ගෙවීමට කොළඹ මහාධිකරණ විනිසුරු දම්මික ගනේපොල මහතා ඊයේ (14) නියෝග කළේය.

විවෘත අධිකරණයේදී කපිතාන්වරයාට එරෙහිව නගා තිබූ අධි චෝදනා කියවා දීමෙන් අනතුරුව එම චෝදනාවන්ට කපිතාන්වරයා වරද පිළිගන්නා බව දැනුම් දීමෙන් පසුව එම දඩ මුදල ගෙවීමට නියම කෙරුණි .

තවද දඩ මුදල් ගෙවීමෙන් පසුව කපිතාන්වරයා මුදාහැරීමට ද විනිසුරුවරයා ඊයේ(14) නියෝග කළේය.

සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත යටතේ අධි චෝදනා දෙකක් මත නීතිපතිවරයා විසින් කොළඹ මහාධිකරණය හමුවේ පසුගිය (08) වැනිදා මෙම නඩුව පවරා තිබුණි.

කපිකාන්වරයාගේ නීතීඥවරුන් විසින් කොළඹ මහාධිකරණය හමුවේ මෝසමක් ඉදිරිපත් කරමින් කර තිබූ ඉල්ලීම සලකා බැලූ කොළඹ මහාධිකරණය මෙම නඩුව ඊයේ(14) දින කැඳවන ලදී.

මෙම නඩුව ඉක්මනින් අවසන් කර ගැනීමට අපේක්ෂා කරන බව පවසමින් මෙම මෝසම ඉදිරිපත් කර තිබුණි.

2008 වසරේ සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත හදුන්වාදීමෙන් පසු විදේශ නාවික කපිතාන්වරයකුට එරෙහිව ගොනු කළ පළමු නඩුව මෙය වන බව නඩුව ඊයේ (14) කැඳවූ අවස්ථාවේ නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් දිලීප පීරිස් මහතා පවසා සිටියේය.

තවද නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා දීර්ඝ ලෙස කරුණු දක්වමින් අධිකරණයෙන් ඉල්ලා මෙම සිද්ධියට අදාළව කපිතාන්වරයාට සිද්ධියට අදාළව රුපියල් මිලියන 200ක වන්දියක් ගෙවීමට නියම කරන ලෙසයි.

මේ අවස්ථාවේ වන්දියක් ගෙවීමට නියම කිරීමෙන් දෙපාර්ශ්වයටම අගතියක් සිදුවිය හැකි බව විනිසුරුවරයා එහිදී ප්‍රකාශ කර සිටියේය.

ග්‍රීක ජාතික හිරෝස් හිලියාස් කර්දානි නමැති මෙම කපිතාන්වරයාට සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතේ 26 හා 38 වගන්ති ප්‍රකාරව නීතිපතිවරයා විසින් මෙම නඩුව පවරා තිබුණි.

2020 .09 .03 හා 2020.09.12 අතර කාලයේදී ශ්‍රී ලංකාවේ සංගමන්කන්ද කුඩුවේ සිට නැගෙනහිර දෙසට නාවික සැතපුම් 20ත් 62ත් අතර දුරින් පිහිටි ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයේදී එම්. ටී නිව්ඩයමන්ඩ් නෞකාවේ කපිතාන් ලෙස කටයුතු කරමින් තෙල් මෙට්‍රික් ටොන් 400ත් 480ත් අතර ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයේ මුහුදට පිට කිරීමෙන් 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතේ 26 හා 38 වගන්ති යටතට ගැනෙන වරදි සිදු කළ බවට වෙන් වෙන්ව චෝදනා දෙකක් මත කපිතාන්වරයාට එරෙහිව නීතිපතිවරයා චෝදනා නගා තිබුණි.

නිව් ඩයමන්ඩ් නෞකාවේ කපිතාන්වරයා සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත යටතට ගැනෙන වරදි සිදුකර ඇති බවට අනාවරණය වන බැවින් එම කපිතාන්වරයා සැකකරුවකු ලෙස නම්කර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නොතිසි ලබා ගැනීමට නීතිපතිවරයා රහස් පොලිස් අධ්‍යක්ෂවරයාට පසුගිය 26 වැනිදා උපදෙස් ලබාදී තිබුණි.

ප්‍රවීණ රංගන ශිල්පිනී විශාකා සිරිවර්ධනගේ සැමියා අභාවප්‍රාප්ත වෙයි

ප්‍රවීණ රංගන ශිල්පිනී විශාකා සිරිවර්ධන මහත්මියගේ සැමියා වූ ඩී. ධර්ම සිරිවර්ධන මහතා (75) ඉකුත් (13) අභාවප්‍රාප්ත විය. පරාක්‍රම පෙදෙස, සපුගස්තැන්න කළගෙඩිහේනේ පදිංචිව සිටි ඒ මහතා හදිසියේ මිය ගිය අතර, ගම්පහ දිස්ත්‍රික්කයේ නිරෝධායන ඇඳිරිනීතිය ක්‍රියාත්මක වන බැවින් අවසන් කටයුතු ඊයේ (14) ගම්පහ කසගහවත්ත පොදුසුසාන භූමියේදි සිදුකර ඇත.

කොරෝනා වසංගතයෙන් ලංගමයට මි. 210ක් අහිමි වෙයි

නිමල් රාජපක්ෂ

කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සතියක් තුළ ලංගමට රුපියල් මිලියන 210ක ආදායමක් අහිමි වී ඇතැයි ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (ධාවන) ඒ. එච්. පණ්ඩුක මහතා පැවසීය.

කොරෝනා වසංගතය පැවතිය ද ලංගම බස් රථ ධාවනය කළද පසුගිය 7 වැනි දා සිට ඊයේ (14) දක්වා මිලියන 210ක ආදායමක් අහිමි වී ඇත්තේ මඟී ජනතාව පොදු ප්‍රවාහනයේ ගමන් කිරීමට නොපැමිණීම හේතුවෙන් බවද ඒ මහතා පැවසීය.

ලංගම දෛනිකව අවම වශයෙන් මිලියන හැතැතෑ දෙකක ආදායමක් උපයා තිබිණි. නමුත් කොරෝනා වසංගත තත්ත්වය උදා වීමත් සමඟින් දිනකට රුපියල් මිලියන විසි පහක පමණ ආදායමක් අහිමි වී තිබිණි.

ඇඳිරිනීති ප්‍රදේශවල දුගී ජනයාට රු.5000 දීමනාව දෙන්නැයි ඉල්ලීමක්

ධනුෂ්ක ගොඩකුඹුර

ගම්පහ දිස්ත්‍රික්කයේ නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන මිනුවන්ගොඩ, දිවුලපිටිය, අත්තනගල්ල සහ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ආර්ථික අපහසුතාවලට මුහුණපා ඇති පවුල් 72,345කට රුපියල් පන්දහසේ දීමනාව ගෙවීමට රුපියල් රුපියල් 361,725,000ක් ලබාදෙන්නැයි ගම්පහ දිස්ත්‍රික් ලේකම් සුනිල් ජයලත් මහතා මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර තිබේ.

ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපති බැසිල් රාජපක්ෂ, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගම්පහ දිස්ත්‍රික් නායක හා සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහත්වරුන්ගේ උපදෙස් මත මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිපියක් යොමු කරමින් දිස්ත්‍රික් ලේකම්වරයා මෙම ඉල්ලීම කර ඇත.

මීට අමතරව කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නිවාස තුළ ස්වයං නිරෝධායනයට ලක්ව සිටින පවුල් 2781කට ඖෂධ, අත්‍යවශ්‍ය ආහාර සහ සහන රාජකාරී සඳහාත් රජයෙන් ලබාදුන් රුපියල් ලක්ෂ පනහක මුදල මේ වන විටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස් කර ඇති බවත් එම ලිපියෙහි සඳහන් වේ.

එහෙත් ඔක්තෝබර් මස 04 වැනි දින සිට නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන මිනුවන්ගොඩ, දිවුලපිටිය, අත්තනගල්ල සහ මීරිගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සිටින පවුල් 72,345ක් ආර්ථික අපහසුතා සහ මූලික අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමේ ගැටලුවකට මුහුණපා සිටින බව දිස්ත්‍රික් ලේකම්වරයා සිය ලිපිය මගින් පෙන්වා දී තිබේ.

20න් ඒකාධිපති පාලකයෙක් බිහි වෙනවා

සමගි ජන බලවේගය

ශිවන්ති ප්‍රනාන්දු

යෝජිත විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතෙහි සඳහන් ප්‍රතිපාදන ප්‍රතිපත්තිමය වශයෙන් හොඳ ද නරකද යන්න තීරණය කළ යුතු බවත් එය සම්මත වුවහොත් ජනාධිපතිවරයා වෙත කේන්ද්‍රගත බලය ඔස්සේ ඒකාධිපති පාලනයක් රට තුළ ඇති වනු ඇති බවත් සමගි ජන බලවේගය අවධාරණය කරයි.

සමගි ජන බලවේගයේ මහ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුමබණ්ඩාර මහතාගේ අත්සනින් ඊයේ (14) නිවේදනයක් නිකුත් කරමින් එම පක්ෂය මේ බව පැවැසීය. දේශපාලනීකරණය වූ රාජ්‍ය සේවයක් හා දේශපාලනීකරණය වූ කොමිෂන් සභා ඇති වීම, නව සංශෝධනවලින් පාර්ලිමේන්තුව අඩපණ වීම, විදේශීය රාජ්‍යයන්ට පක්ෂපාතී පුද්ගලයන් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවට තේරී පත් වීම මෙන්ම රටේ ජනාධිපති වශයෙන්ද පත් වීමට ඉඩ ප්‍රස්ථාව ඇති වීම යනාදී කරුණු හේතුවෙන් යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පරාජය කළ යුතු බව සමගි ජන බලවේගය සිය නිවේදනයෙන් පෙන්වා දී තිබේ. ඒ අනුව යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතෙහි යම් යම් වගන්ති පාර්ලිමේන්තුවේ තුනෙන් 2 ශන්දයකට අමතරව ජනමත විචාරණයකින්ද සම්මත විය යුතුය යන පදනම මත ඊට එරෙහිව පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර ඇති කෙටුම්පතෙහි සඳහන් ප්‍රතිපාදන ප්‍රතිපත්තිමය වශයෙන් හොඳ ද නරක ද යන පාර්ලිමේන්තුව තීරණය කළ යුතු බවත් සමගි ජන බලවේගය සිය නිවේදනයෙන් අවධාරණය කර ඇත.

1 පිටුවෙන් ..

CIDය ජනපති අත්සනත්...

හිටපු ජනපති හා ආරක්ෂක ඇමැතිවරයා ලෙස මෛත්‍රීපාල සිරිසේන මහතා යොදන අත්සන තමන්ට දැක පුරුදු බවත්, තමන් සතු ලේඛනවල රැඳවුම් නියෝග මත තබා ඇති අත්සන් හා කිසිසේත් නොගැළපෙන බවත් හෙතෙම අවධාරණය කළේය.

හිටපු ජනපතිවරයාගේ අත්සන දහස් වාරයකට වඩා තමන් ඉදිරියේ යොදා ඇති බවත් පැවසීය.

යහපාලන ආණ්ඩුව පත්වීමෙන් පසුව සැකපිට අත්අඩංගුවට පත්වූ හමුදා බුද්ධි නිලධාරි ඩිලන්ජන් උපසේන මහතා රඳවා ප්‍රශ්න කිරීමේ නියෝගයට යොදා ඇති අත්සන බැලූ බැල්මට මෛත්‍රීපාල සිරිසේන මහතාගේ නොවන බවට මතු වූ සැකයක් මත හිටපු ලේකම්වරයා සාක්ෂියට කැඳවීය.

හිටපු ජනාධිපතිවරයා ඉදිරිපත් කර තිබූ කැබිනට් සංදේශයක හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු රැඳවුම් නියෝග අත්සන් සන්සන්දනය කළ සෙනවිරත්න මහතා එම අත්සන්වල පැහැදිලි වෙනසක් ඇති බව ප්‍රකාශ කළේය.

25000ක අල්ලසක්...

අල්ලස් කොමිසම විසින් ඉකුත් (13) වන දින ජාතික නිවාස සැලසුම් දෙපාර්තමේන්තුවේ දී සැකකරු වන නාවල නුගේගොඩ පදිංචි සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සහකාර සමාන්‍යාධිකාරී හා මෙහෙයුම් නඩත්තු සමාන්‍යාධිකාරී වන ජෙ.ඩෙව්ඩ් චන්ද්‍රපාල දිසානායක යන අය අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු ඊයේ (14) අධිකරණයට ඉදිරිපත් කරමින් අල්ලස් කොමිසම දැන්වුයේ පැමිණිලිකරු ඩිසයින් කන්සල් ව්‍යාපෘතියේ කළමණාකරු ලෙස සේවය කරන බවත් ඔහුගේ නිවාස දෙකකට අධිකාරියේ සැලසුමට අනුකූලව නිවාස ඉදි කර ඇති බව සඳහන් ස්වාධිපත්‍ය සහතිකය ලබා දීම සඳහා සැකකරු රුපියල් 25000 ක අල්ලස් මුදලක් ඉල්ලා ඇති බවය.

නුගේගොඩ ජම්බුගස්මුල්ල මාවතේ 152/7 විජිත දක්ෂිත කරුණාරත්න යන පැමිණිලිකරුගෙන් මෙම අල්ලස් මුදල ඉල්ලා තිබේ.

සිද්ධියට අදාළ විමර්ශන තවමත් අවසන් නොමැති බවට අල්ලස් කොමිසම අධිකරණය හමුවේ කරුණු දැක්විය.

පාස්කු දා ප්‍රහාරය...

එහෙම කළොත් ඔවුන්ට කතාකරන්න මාතෘකාවක් දෙනවා. 83 කෝල්හාලයටත් මුල්වුණේ ඒ දේ. මම එයට විරුද්ධ වුණේ නැහැ. මොකද ඒ ගැන ඡන්දයක් තිබුණේ නැහැ. හැබැයි මම ඒ සම්බන්ධයෙන් අදහස් පළ කළා. ආරක්ෂක අංශ කිව්වේ අදාළ කාලය වන විට ප්‍රංශයෙත් තහනම් කරලා තියෙන්නේ කියලා. මම කිව්වා ප්‍රංශයෙ තහනම් කළාට බ්‍රිතාන්‍යයේ තහනම් නැහැ කියලා. ඉරානයට ගිහින් සටන් කළේ අපි ප්‍රංශය ගියේ නැහැනේ කියලා අමෙරිකාව කිව්වා.එකෙන් වෙන්නේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් දුර්වල කරන එක. ඔවුන් අතරෙන් අන්තවාදීන් ගැන තොරතුරු එන එක නතර වෙනවා යැයි රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය යොමු කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් රනිල් වික්‍රමසිංහ මහතා කියා සිටියේය.

ජනාධිපති කොමිසම හමුවේ පෙරේදා (13) දෙවන දිනටත් සාක්ෂි ලබාදෙමින් හිටපු අගමැතිවරයා කියා සිටියේ ආණ්ඩුවක් ලෙස පැවති යහපාලන රජයේ අඩුපාඩුකම් බොහෝමයක් තිබූ බව තමා පිළිගන්නා බවය.

යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස මේජර් ජනරාල් සුරේෂ් සලේ මහතාගේ දැනුම ගැන ප්‍රශ්නයක් තිබුණේ නැහැ. නමුත් එතුමාගේ ක්‍රියාකලාපය ගැන මට ප්‍රශ්න තිබුණා. මම ඒ විෂය මාධ්‍ය නැතුව කියන්නම් යැයි හිටපු යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස මේජර් ජනරාල් සුරේෂ් සලේ මහතා ඉස්ලාම් අන්තවාදය පිළිබඳ කළ කරුණු දැක්වීම්වලට ඔබ ජාතික ආරක්ෂක කවුන්සිලයේදී විරුද්ධ වුණාදැයි රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය යොමු කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඒ මහතා කියා සිටියේය.

එම ප්‍රකාශය හිටපු අගමැතිවරයා සිදු කිරීමත් සමගම කොමිසම් සභාවෙන් මාධ්‍යවේදීන් ඉවත්ව යන ලෙස කොමිසමෙන් නියෝග කළේය.

අප්‍රේල් 21 මේ රටේ ස්ථාන 08 ක බෝම්බ පුපුරන තෙක් සහරාන්ගේ මේ ප්‍රහාරය ගැන විදෙස් බුද්ධි තොරතුරට අමතර කිසිම තොරතුරක් මේ රටේ රාජ්‍ය බුද්ධි සේවයට ලැබී තිබුණේ නැහැනේ යැයි ජනාධිපති කොමිසම සිදු කළ විමසීමකට පිළිතුරු ලබා දෙමින් හිටපු අගමැතිවරයා කියා සිටියේ පාස්කු ප්‍රහාරය සිදුවන අවස්ථාව වන විට මෙරට බුද්ධි අංශ වල බිඳ වැටීමක් සිදුව තිබූ බව තමන් පිළිගන්නා බවය.

බ්‍රිතාන්‍යයෙන්...

ශ්‍රී ලංකාවට කැළි කසළ ආනයනය කිරීම තහනම් කිරීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා පරිසර යුක්ති කේන්ද්‍රය සහ එහි අධ්‍යක්ෂ හේමන්ත විතානගේ මහතා විසින් ඉදිරිපත් කළ පෙත්සමක් අද (14) කැඳවනු ලැබූ අවස්ථාවේදී අභියාචනාධිකරණ සභාපති විනිසුරු ඒ. එච්. එම්. ඩී. නවාස් සහ සෝභිත රාජකරුණා යන මහත්වරුන්ගෙන් සමන්විත අභියාචනාධිකරණ විනිසුරු මඩුල්ල විසින් මෙම නියෝගය කළේය.

මිනුවන්ගොඩ...

මේ වන විට සමස්ත ආසාදිතයන්ගේ සංඛ්‍යාව ලෙස 5038 ක් වාර්තා වී ඇති බව වසංගත රෝග විද්‍යා අංශය දැනුම්දෙයි.

මිනුවන්ගොඩ කොරෝනා පොකුරට සම්බන්ධ ආසාදිතයන් රට පුරා දිස්ත්‍රික්ක 21කින් වාර්තා වන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාධ්‍ය ප්‍රකාශක, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය ජයරුවන් බණ්ඩාර මහතා පැවැසුවේය.

වයිරසයේ ව්‍යාප්තිය අනුව රෝගීන් වාර්තා වීම තවමත් පාලනය කර ගත හැකි මට්ටමක පවතින බවත් ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාලවකවානුවක් ප්‍රකාශ කළ නොහැකි බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.

ජනතාව නොසැලකිලිමත් ලෙස කටයුතු කළහොත් ග්‍රාමීය වශයෙන් වුවද වයිරසය පැතිර යාමේ අවදානමක් ඇත්තේ යැයි ද, එම නිසා වයිරසය පාලනයට ජනතාවගේ සහාය අඛණ්ඩව අවශ්‍ය යැයි ද හෙතෙම පැවැසුවේය.

1 පිටුවෙන් ..

කොළඹට ඇතුළු වන...

ඒ අනුව පෙරේදා (13) දිනයේදී කොළඹ කොටුව දුම්රිය ස්ථානයේදී අහඹු ලෙස තෝරා ගත් පුද්ගලයන් 215 කගේ නියැදි ලබාගෙන පී.සී.ආර්. පරීක්ෂාවට යොමු කළබව කොළඹ මහ නගර සභාවේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි වෛද්‍ය රුවන් විජයමුණි මහතා 'දිනමිණ'ට ඊයේ (14) පැවැසුවේය.

පසුගිය දින දහයක් තුළ කොරෝනා ආසාදිතයන් හයක් කොළඹ මහ නගර සභා සීමාවෙන් වාර්තා වූ බවත් ඔවුන්ගෙන් හතරදෙනෙක් රිද්දේ ආර්යා ළමා රෝහලේ කොරෝනා වැළඳුණු සුළු සේවිකාවගේ ආශ්‍රිතයන් වන අතර ඉතිරි දෙදෙනා යූනියන් පෙදෙසේ මහල් නිවාස සංකීර්ණයකින් වාර්තා වූ බවත් ඔහු ප්‍රකාශ කළේය.

පසුගිය 06 වැනිදා සිට මේ දක්වා දින 8 ක් පුරා කොළඹ මහ නගර සභාව තුළ පුද්ගලයන් 2884 ක් පී.සී.ආර්. පරීක්ෂාවට ලක් කළ බවත් ඉන් 10 ක් ආසාදිතයන් බවට වාර්තා වූ අතර 3 ක් බොරැල්ල ප්‍රදේශයෙන් ද, ඉතිරි 7 කොල්ලුපිටිය බැන්ඩික්ස් ආයතනයේ සේවකයින් ද බවත් ඒ මහතා කීය.

CSN බොරු නඩුවක්...

වසර තිහක කුරිරු යුද්ධය නිමා කිරීමට කැපවූ තමන් වැනි හමුදා නිලධාරීන්ගෙන් පවා දේශපාලන පළිගැනීම් කළ යහපාලන ආණ්ඩුව තමන් හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මහතාගේ පුත්‍රා වීම හේතුවෙන් බොරු චෝදනා නඟමින් පසුගිය වසර 5 පුරාවටම පළිගැනීම් කළ බව රාජපක්ෂ මහතා සඳහන් කළේය.

ඊයේ (14) දින පුරා පැය දෙකකට ආසන්න කාලයක් පොලිසිය හමුවේ කටඋත්තරයක් ලබාදෙමින් යෝජිත නිලධාරියා සඳහන් කර ඇත්තේ හමුදා නිලධාරියකු ලෙස තමන් කළ සේවය ගැන හෝ නොසළකා දේශපාලන පළිගැනීමට ලක්වූ බවය.

(CSN) කාල්ටන් ස්පෝට් නෙට්වර්ක් ආයතනය ආරම්භ කිරීමේදී මූල්‍ය වංචා හා රජයේ දේපළ භාවිතා කර ඇති බවට බොරු චෝදනා නඟමින් දින 45 ක් රක්ෂිත බන්ධනාගාර ගතකිරීමෙන් මෙම පළිගැනීම් වූ බව රාජපක්ෂ මහතා සඳහන් කර ඇත.

සී. එස්. එන්. ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු කොටස්කරුවකු නොවන පසුබිමක් තුළ යහපාලන රජය පිහිටවූ දූෂණ විරෝධී කමිටුව මඟින් පැමිණිල්ලක් කර පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය හරහා මෙම නීතිවිරෝධී ක්‍රියාව දියත් කළ බවට ද යෝෂිත නිලධාරියා සඳහන් කළේය.

මෙම සී. එස්. එන්. සිද්ධිය යහපාලන රජයේ දේශපාලන පළිගැනීම්වලින් කොටසක් පමණක් බවත් මෙම කරුණු සම්බන්ධයෙන් සාධාරණ යුක්ති සහගත විමර්ශනයක් ජනපති කොමිසමෙන් අපේක්ෂා කරන බවත් සඳහන් කර ඇත.

යෝෂිත රාජපක්ෂ මහතා මීට පෙර දිනකදී කොමිසමට කළ පැමිණිල්ලක් ප්‍රකාරව ඊයේ දින විශේෂ පොලිස් එකකයට කටඋත්තර ලබා දී ඇත.

රාමඤ්ඤ මහා නිකාය...

වැඩි දුරටත් කරුණු දැක්වූ උන්වහන්සේ මෙසේ කීහ.

විසිවැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ශ්‍රී ලංකා මහා රාමඤ්ඤ මහා නිකාය විරුද්ධ බව මාධ්‍ය සාකච්ඡාවකදී නිකායේ ලේකම් නායක හිමියනුත් අධිකරණ නායක හිමියනුත් ප්‍රකාශයක් කරමින් එම සංශෝධනය මඟින් රට ඒකාධිපති වාදයකට ඇද ගෙන යන බව කියා තිබෙනවා.නමුත් අපේ නිකායෙන් එවැනි කිසිදු ප්‍රකාශයක් කොට නැහැ සමහර විට එය එම හිමිවරුන්ගේ පෞද්ගලික මතය වන්න පුලුවන්.

මෙවැනි වැදගත් ප්‍රකාශයක් කිරීමට පෙර එය අප නිකායේ විශේෂ අධිකාරි මණ්ඩලය තුළ සාකච්චා කොට තීරණයක් ගන්නවා ඉන්පසු එය කාරක සංඝ සභාවට යොමු කොට ගත් තීරණය නිකාවේ මාධ්‍ය ප්‍රකාශක වන ආචාර්ය ඔමල්පේ සෝභිත නා හිමියන් විසින් ප්‍රකාශයට පත් කරනවා. මාධ්‍ය ප්‍රකාශකට හැර වෙන කිසිවෙකුට නිකාය වෙනුවෙන් ප්‍රකාශ නිකුත් කරන්න බැහැ.ඊට අමතරව කිව යුත්තේ පසුගිය මස 25 වෙනිදා කාරක සංඝ සභාව රැස

සියලු ආයතනවල කොවිඩ් කමිටු හදන්න ගත් තීරණය ක්‍රියාත්මක කරන්න

නිදහස් වෙළෙඳකලාප පොදුසේවක සංගමය

අනුර ප්‍රේමලාල්

සියලු ආයතනවල කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වසංගතය පැතිරයාම වැළැක්වීමේ කමිටු පිහිටුවන්න ගත් තීරණය දැන්වත් ක්‍රියාත්මක කරන්නැයි නිදහස් වෙළෙඳකලාප පොදුසේවක සංගමයේ ප්‍රධාන ලේකම් ඇන්ටන් මාකස් මහතා ඉල්ලා සිටියි.

සේවකයන් සිටින නේවාසිකාගාර වහාම විෂබීජ හරණයට ලක් කරන ලෙස ද හෙතෙම කියා සිටී .

ඒ මහතාගෙන් සම්බන්ධව 'දිනමිණ' කළ විමසුමකට පිළිතුරුදෙමින් වැඩි දුරටත් මෙසේද කීය.

කොවිඩ්19 හෙවත් නව කොරෝනා වසංගතය නිසා බලපෑමට ලක්වූ රැකියා හා සේවකයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඉකුත් මාර්තු මාසයේදී (10) ජාතික කම්කරු උපදේශක සභා රැස්වීමේදි ගත් තීරණයක් අනුව පත් කළ කාර්ය සාධක බළකායේ පළමු රැස්වීමේදී ගත් එක් තීරණයක් වූයේ සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය සුරක්ෂිත කිරීම සඳහා සියලුම ආයතනවල සේවක නියෝජිතයන්ගෙන් සැදුම්ලත් සෞඛ්‍ය කමිටු පිහිටුවිය යුතුයි යන්නයි.

මෙය ආයතනවල තිබෙන සාමාන්‍ය කමිටු නොවේ. මෙය කොවිඩ්19 හෙවත් නව කොරෝනා වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා ආණ්ඩුව ලබාදුන් විධිවිධාන ඒ ඒ ආයතනවල නියමිත ලෙස ක්‍රියාත්මක වෙනවාද නැද්ද සොයා බැලීම තමයි මේ කමිටු පත් කළේ. මේ කමිටු ක්‍රියාත්මක කිරීමේ වගකීම තිබුණේ කම්කරු දෙපාර්තමේන්තුවටයි. මෙම කමිටු ක්‍රියාත්මක වුණා නම් බ්‍රෑන්ඩික්ස් ආයතනයට සේවකයන්ට අසනීප තත්ත්වය තිබෙද්දී වැඩ ගැනීමේ හැකියාව ලැබෙන්නේ නැහැ. එම සේවකයන් අසනීප වී නිවාඩු ඉල්ලා සිටිද්දීත් නිවාඩු ලැබී නැහැ.

අනෙක් පැත්තෙන් විදේශ රටවල සිට සේවකයන් ගෙනවිත් නිරෝධායනය නොකර සේවයේ යොදවනවා නම් ඒ ගැනත් මේ කමිටුවලට ක්‍රියාත්මක වන්න තිබුණා. පිටරටින් ගෙනාපු රෙදිවලින් මේ වයිරසය පැමිණියා කියලත් චෝදනාවකුත් කරනවානේ ඒ ගැන වුණත් මේ කමිටුවලට සොයා බලන්න තිබුණා. දැන් ප්‍රමාද වී හරි මේ කමිටු පිහිටුවීමේ අවශ්‍යතාවක් තිබෙන බව තමය අප පෙන්වා දෙන්නේ.

ඒ නිසා මේ කමිටු පිහිටුවීමේ වගකීම සෑම අයතනයකම කළමනාකාරිත්වයේ වගකීමක් තියෙනවා.

ආණ්ඩුව මේ වනවිට තීරණයක් අරගෙන තියෙනවා සෑම ආයතනයකම අභ්‍යුදය ලෙස පස්දෙනකුම පීසිආර් පරීක්ෂණ කරන්න. නමුත් එක ප්‍රමාණවත් නැති බව තමයි අපට පෙනී යන්නේ. ඒ නිසා සීයකට පස්දෙනකුවත් පීසිආර් පරීක්ෂණය කළ යුතුයි. එහි අපට තිබෙන ප්‍රවණතාව ගැන සොයා බලන්න පුළුවන්.

ඒ වගේම අප ඉකුත් මාර්තු මාසයේ සිටම පෙන්වා දෙනවා සේවකයන් නැවති සිටින නේවාසිකාගාර විෂබීජ හරණය කිරීමට කටයුතු කරන්න කියා. එහි වගකීම තියෙන්නේ සෞඛ්‍ය නිලධාරීන්ට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයටයි. එවා නොකෙරෙනතාක් කල් මේ වසංගතය වළක්වා ගැනීමේ ගැටලු තියෙනවා.

ඉකුත් (12) කම්කර අමාත්‍යාංශයේ පිහිටුවා තියෙන කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වසංගතය වැළැක්වීමේ බළකාය රැස් වුණා. එහිදී අප මේ ගැටලුව ගැන දීර්ඝ ලෙස සාකච්ඡා කළා. නේවාසිකාගාරවල ප්‍රශ්නයට විසඳුමක් අවශ්‍යයි. එහි ප්‍රමිතිය ගැන බරපතළ ගැටලු තියෙනවා. මේවාගේ පළාත් පාලන ආයතන කියන රෙගුලාසිවත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒවා ගැන සාකච්ඡා කළ අතර, ඒවාට දියහැකි ක්ෂණික විසඳුමක් වන විෂබීජ හරණයවත් සිදු කළ යුතුයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට හා හාම්පුතුනගේ සංගමයේ නිෂ්පාදක අංශයේ ලේකම් නියෝජිතයාට වහාම සෞඛ්‍ය නිලධාරීන්, පළාත්පාලන නියෝජිතයන් හා ව්‍යාත්තීය සමිති නියෝජිතයන් කැඳවා මේ ගැන සාකච්ඡා කරන්න කියා ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා උපදෙස් ලබා දුන්නා .

බ්‍රෑන්ඩික්ස් ආයතනය ගැන සොයන්න කම්කරු දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශයට පවරා තියෙනවා.

පොලීසියට රාජ්‍ය ඇමැති ගොඩහේවාගෙන් මුඛ ආවරණ

ශ්‍රී ලංකා පොලීසියට සෞඛ්‍ය ආරක්ෂිත මුඛ ආවරණ සහ සම්පූර්ණ මුහුණු ආවරණ 5000ක් රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මහතා පරිත්‍යාග කරයි.

පොලිස් මූලස්ථානයේදී පසුගිය දා (12) ආරක්ෂක අංශ , සෞඛ්‍ය අංශ කැපකිරීමකින් සිදුකරන කොවිඩ් මර්දන ක්‍රියාන්විතය අගය කරමින් එහි වත්මන් තත්ත්වය සොයා බැලීමට රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මහතා සහ වැඩබලන පොලිස්පති චන්දන වික්‍රමරත්න මහතා අතර පැවැති සාකච්ඡාවෙන් අනතුරුව මෙම මුඛ ආවරණ පරිත්‍යාග කිරීම සිදුකෙරිණි.

එම සාකච්ඡාවේදී ගම්පහ දිස්ත්‍රික්කයේ කොවිඩ්-19 ව්‍යාප්තියේ වත්මන් තත්ත්වය සහ එය මර්දනය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා පොලීසිය ගන්නා ක්‍රියාදාමය පිළිබඳ සාකච්ඡා විය.

නාගර්කෝවිල්හිදී හොර මත්පැන් සමඟ හයක් කොටු වෙති

මහින්ද අලුත්ගෙදර

යාපනය නාගර්කෝවිල් ප්‍රදේශයේ කළ සෝදිසි මෙහෙයුමක දී නීති විරෝධී මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් 6දෙනකු අත්අඩංගුවට ගෙන තිබේ.

නාවික හමුදාව හා පොලීසිය එක්ව උතුර, උතුරු මැද සහ දකුණ යන නාවික විධානයන් තුල සිදුකල විශේෂ සෝදිසි මෙහෙයුම් මඟින් හෙරෝයින් සහ දේශීය ගංජා සමඟ මේ සැකකරුවන් 6 අත්අඩංගුවට ගැනීමට හැකි වූ බව නාවික හමුදා මාධ්‍ය අංශය පවසයි.

මෙහිදී උතුරු නාවික විධානය මඟින් යාපනය, නගර්කෝවිල් ප්‍රදේශයේ සිදුකල සෝදිසි මෙහෙයුමක දී හෙරෝයින් ග්‍රෑම් 1 මිලිග්‍රෑම් 15ක ප්‍රමාණයක් සමඟ සැකකරුවකු නාවික හමුදා භාරයට ගත් අතර, උතුරු මැද නාවික විධානය හා මන්නාරම කොට්ඨාස දූෂණ මර්දන ඒකකය එක්ව මන්නාරම උප්පුකුලම් ප්‍රදේශයේ දී සැකකරුවන් තිදෙනකු සමඟ හෙරෝයින් මිලිග්‍රෑම් 790ක ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන තිබේ.

ඊට අමතරව දකුණු නාවික විධානය අම්බලන්තොට පොලිස් විශේෂ කාර්ය බළකාය හා එක්ව තණමල්විල, ඌව කුඩාඔය ප්‍රදේශයේ කළ මෙහෙයුමක දී දේශීය ගංජා ග්‍රෑම් 820ක ප්‍රමාණයක් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට ගැනීමෙන් පසු එම සැකකරුගෙන් ලද තොරතුරු මත මීගස්වැව ප්‍රදේශයේ දී දේශීය ගංජා ග්‍රෑම් 850ක ප්‍රමාණයක් සමඟ තවත් සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

මෙලෙස අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 36ත් 53ත් අතර වයසේ පසුවන ඉරුක්කුලම්පිඩ්ඩි, ඌව කුඩාඔය සහ මීගස්වැව යන ප්‍රදේශයන්හි පදිංචිකරුවන් බවට හඳුනාගෙන තිබේ.

සැකකරුවන් සහ මත්ද්‍රව්‍ය වැඩිදුර පරීක්ෂණ කටයුතු සඳහා පලෙයි, මන්නාරම සහ තණමල්විල යන පොලිස් ස්ථාන වෙත භාරදීමට කටයුතු කර තිබේ.

උසස් පෙළ විභාග වංචා ගැන CIDයටත්-ගම්පහ පොලීසියටත් පැමිණිලි කළා

› විභාග කොමසාරිස්

සිතාරා සේනානි

කොළඹ ප්‍රදේශයේ උසස් පෙළ විභාග මධ්‍යස්ථානයක සිදුවූ විභාග වංචාව සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙතත්, ගම්පහ විභාග මධ්‍යස්ථානයක සිදුවූ විභාග වංචාව සම්බන්ධයෙන් ගම්පහ පොලිස් ස්ථානය වෙතත් පැමිණිලි කළ බව විභාග කොමසාරිස් ජනරාල් බී.සනත් පූජිත මහතා පැවසීය.

විභාග දෙපාර්තමේන්තුව, කුමන ආකාරයක හෝ විභාග වංචාවක් සුළු කොට නොසලකන බව කී විභාග කොමසාරිස් ජනරාල්වරයා, එවැනි ක්‍රියාවල යෙදෙන්නන්ට එරෙහිව නීතිමඟින් ක්‍රියාකර උපරිම දඬුවම් ලබා දීමට පියවර ගන්නා බවද සඳහන් කළේය.

දිනමිණ මේ පිළිබඳ කළ විමසුමකදී විභාග කොමසාරිස් ජනරාල්වරයා මේ බව පැවසීය.

ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ පිහිටි විභාග මධ්‍යස්ථානයේදී උසස් පෙළ විභාගයට පෙනී සිටි විභාග අපේක්ෂකයකු නවීන ස්මාට් ඔරලෝසුවක් විභාග මධ්‍යස්ථානයට ගෙනැවිත් භාවිතා කරමින් සිටියදී විභාග පරීක්ෂකයකුට හසුවී තිබූ අතර, කොළඹ වෙස්ලි විද්‍යාලයේ විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටි අපේක්ෂකයකු නවීන ජංගම දුරකතනයක් භාවිතා කරමින් විභාග ප්‍රශ්න පත්‍රය බාහිර පුද්ගලයකු වෙත යවා තිබූ බව හෙළිවී තිබුණි.

එසේම, දිවුලපිටිය ඥානෝදය විද්‍යාලයේ පිහිටි විභාග මධ්‍යස්ථානයේදී මෙවර උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුවකුට කොවිඩ් 19 වෛරසය ආසාදනය වී ඇති බව හඳුනාගැනීමෙන් පසු එම සිසුවා ඉරණවිල රෝහලට ඇතුළත් කර, එහිදී විභාගයට පෙනී සිටීමට අවස්ථාව සලසා දුන් බවද විභාග කොමසාරිස් ජනරාල් සනත් පූජිත මහතා පැවසීය.

කොවිඩ් රටවල් අතුරින් ශ්‍රී ලංකාව 130 වැනි තැනට

මහින්ද අලුත්ගෙදර

කොවිඩ් 19 වෛසරය පාලනය කිරීම අතින් ඉදිරියෙන් සිටින ශ්‍රී ලංකාව ලොකයේ වෛරසය ආසාදනය වූ රටවල ශ්‍රේණිගත කිරීමවලට අනුව 130 වැනි ස්ථානයට පැමිණ තිබේ.

මෙම වසංගත තත්ත්වය හේතුවෙන් දැඩි බලපෑමක් එල්ල වී තිබෙන අමෙරිකා එක්සත් ජනපදය එම ශ්‍රේණිගත කිරීමට අනුව ඉදිරියෙන්ම සිටින අතර අසල්වැසි ඉන්දියාව දෙවැනි ස්ථානයේ හා බ්‍රසීලය තෙවැනි ස්ථානයේ පසුවෙයි.

ඊයේ (14) වනවිට ශ්‍රී ලංකාවේ කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව 5,038ක් වූ නමුත් මරණ සංඛ්‍යාව 13ක් තරම් අවම මට්ටමක පවතින අතර, සම්පූර්ණයෙන්ම සුවය ලැබූ සංඛ්‍යාව 3,328 දක්වා ඉහළ ගොස් තිබේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන්ගේ උපදෙස් හා මඟපෙන්වීම අනුව මෙරට සෞඛ්‍ය අංශය සහ ආරක්ෂක අංශයේ කැපකිරීම් හේතුවෙන් ලෝකයේ අනෙකුත් රටවලට සාපේක්ෂව කොවිඩ් වසංගතයට එරෙහිව ශ්‍රී ලංකාව ජයග්‍රහණ රැසක් ලබා තිබෙන අතර, ඒ වෙනුවෙන් විධිමත් වැඩපිළිවෙළ රැසක් ක්‍රියාත්මක කිරීමට ද පියවර ගෙන ඇත.

ලෝකයේ බලවත් රටවල් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත්ව තිබෙන පසුබිමක ශ්‍රී ලංකාව මේ ආකාරයෙන් වයිරසයේ ව්‍යාප්තිය පාලනය කිරීමට සමත්ව තිබීම සම්බන්ධයෙන් ලෝකයේ සෑම රටක්ම සහ අන්තර්ජාතික සංවිධාන ශ්‍රී ලංකාවට ප්‍රශංසා කරයි.

විදුලිබල මණ්ඩලයට අයත් බලාගාර සේවකයන්ට පීසීආර් පරීක්ෂණ

චන්දිමා කරුණාරත්න

විදුලිබල මණ්ඩලයට අයත් විදුලි බලාගාර සේවක පිරිස පීසීආර් පරීක්ෂණ සඳහා යොමු කරවන්නැයි විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා උපදෙස් දෙයි.

රටේ අත්‍යාවශ්‍ය හා තීරණාත්මක සේවාවක් වන විදුලිබල සැපයුම ගුණාත්මකව හා අඛණ්ඩව පවත්වාගෙන යෑම පවතින තත්ත්වය හමුවේ අභියෝගාත්මක කාරණාවක් වූවද ජනතාව වෙනුවෙන් ඉතා ඉහළ ව්‍යාත්තීය කැපකිරීමක් කරන විදුලිබල සේවකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධව කටයුතු කිරීම ප්‍රමුඛතම කාර්යයක් ලෙස සලකන බව අමාත්‍යවරයා ප්‍රකාශ කළේය.

ඒ අනුව සෞඛ්‍ය අංශ සමඟ ද සාකච්ඡා කිරීමෙන් අනතුරුව විදුලිබලාගාර සේවක පිරිස් ඉදිරි දින කිහිපයේදී නියැදි වශයෙන් PCR පරීක්ෂණ සඳහා යොමුකිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇත.

මේ යටතේ ජාතික විදුලිබල පද්ධතියට විදුලිය සපයන බලාගාර අතරින් නොරොච්චෝල ගල් අඟුරු බලාගාරයේ සහ මන්නාරම සුළං විදුලි බලාගාර සේවකයන් ප්‍රථමයෙන්ම මෙම පරීක්ෂණයට යොමු කිරීමට සැලසුම් කර ඇත.

විදුලිබල අංශයට අදාළ සෙසු සේවක පිරිස්වල සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ සලකා බලා ඔවුන්වද PCR පරීක්ෂණ සඳහා යොමුකිරීමට කටයුතු කරන බව විදුලිබල අමාත්‍යවරයා වැඩි දුරටත් ප්‍රකාශ කළේය.



විදෙස් තොරතුරු ලැබීම මෙරට බුද්ධි තොරතුරු නොලැබීම අපේ බුද්ධි අංශවල වූ අඩුපාඩුවක්

හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ කොමිසමට කියයි

සුභාෂිණී සේනානායක

විදේශීය තොරතුරු ලැබීම සහ අපේ බුද්ධි අංශවලට තොරතුරු නොලැබීම අපේ බුද්ධි අංශවල අඩුපාඩුවක් බව හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා පෙරේදා (13) පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය.

එමෙන්ම ශ්‍රී ලංකා පොලිසිය සහරාන් අත්අඩංගුවට නොගැනීම පිටුපස දේශපාලන බලපෑමක් නොතිබූ බවත් ඒ මහතා කියා සිටියේය.

හිටපු ජනාධිපතිවරයා ඇතුළු පාර්ශ්වය අතර මතගැටුම් නොතිබූ බවද රනිල් වික්‍රමසිංහ මහතා කියා සිටියේය.

වහාබ්වාදය සමහර මුස්ලිම් කොටඨාස පිළිගෙන තිබුණා. සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් සැම කෙනෙක්ම පිළිගෙන තිබෙනවාද කියා තමන් දන්නේ නැතැයි කී හිටපු අගමැතිවරයා පාස්කු ප්‍රහාරය සහ 2018 ආණ්ඩු වෙනස ප්‍රතිත්‍රස්ත පනත ගේන්න බාධාවක් වූ බව ද කීවේය.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - 2015 ට පෙර ආරක්ෂක මණ්ඩල රැස්වීම් තිබුණේ උපදේශක මණ්ඩලයක් ලෙසද?

රනිල් වික්‍රමසිංහ මහතා - හැම වෙලේම උපදේශක මණ්ඩලයක් ලෙස කටයුතු කළා. මම දන්න විදිහට තීරණ ගන්න GOC කමිටුවට බලය දී තිබුණා.

සහරාන් අත්අඩංගුවට නොගැනීම පිටුපස දේශපාලන බලපෑමක් නෑ

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - අගමැතිවරයා ආරක්ෂක මණ්ඩල රැස්වීමට සහභාගි වීම වැදගත් ද?

රනිල් වික්‍රමසිංහ මහතා - කැඳෙව්වා. රටේ තත්ත්වය දැනගන්න. ජනාධිපති තනතුර හිස් වුණොත් දැනගෙන තිබීම අවශ්‍යයි. ඒ තනතුරේ වැඩ බලන්න.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - 2019-10-18 ඔබ ඉවත් කර වෙනත් අයකු අගමැති ලෙස පත්කළා නේද? පාස්කු ප්‍රහාරය තෙක් ඔබ ආරක්ෂක මණ්ඩලයට කැඳෙව්වේ නෑ නේද?

රනිල් වික්‍රමසිංහ මහතා - ඔව්.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - 2015 ට පෙර ආරක්ෂක මණ්ඩල රැස්වීම් සතිපතා රැස්වුණාද?

රනිල් වික්‍රමසිංහ මහතා - ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා සෑම සඳුදාම රැස්කළා. ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා අඟහරුවාදා සවස රැස් කළා. යුද්ධයෙන් පසුව තත්ත්වය මම දන්නේ නැහැ. නමුත් සතියකට වරක් රැස්විය යුතුයි.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ආරක්ෂක මණ්ඩල රැස්වීම තීරණ ගන්න හැකි ඉහළම කණ්ඩායමක් රැස්වන තැනද?

රනිල් වික්‍රමසිංහ මහතා - ඔව්. තීරණ සාකච්ඡා කරන්නේ එතන තමයි.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඔබතුමාගේ පාර්ශ්වයත් සමඟ හිටපු ජනාධිපතිවරයා ඇතුළු පාර්ශ්වය අතර මතගැටුම් සිදුවුණා ද?

රනිල් වික්‍රමසිංහ මහතා - එහෙම මතගැටුම් තිබුණේ නැහැ. සමහර ඇමැතිවරු අමාත්‍යාංශ අතර විවිධ අදහස් තිබුණා. මෛත්‍රීපාල සිරිසේන මහතා අපේ වුණාම වැඩසටහන පොදු එකක් ලෙස ක්‍රියාත්මක වුණා. හුඟක් ඒවා සාකච්ඡා කළා. හැම රජයකම ප්‍රශ්න තිබුණා. කැබිනට් මණ්ඩලය වාදවීම් වුණා. අපේ කණ්ඩායමේත් තිබුණා. තනි රජයක් තිබුණත් ප්‍රශ්න තියෙනවා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - 2015 සිට 2018-10-26 දක්වා තිබූ සෑම ආරක්ෂක මණ්ඩල රැස්වීමකටම සහභාගි වුණා ද?

රනිල් වික්‍රමසිංහ මහතා - රැස්වීමට සහභාගි වෙන්න කියලා දැනුම් දුන්නේ කෙටි කාලයක් තුළයි. පැය 24ක්, පැය 48ක් වගේ කාලයකින් දැනුම් දුන්නාම වැඩක් යොදාගෙන නැතිනම් සහභාගි වුණා. නිශ්චිත දිනයක් තිබුණේ නැති නිසා සහභාගිවීම අපහසු වුණා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - මේ බව ජනාධිපතිට දැනුම් දුන්නේ නැද්ද?

රනිල් වික්‍රමසිංහ මහතා - කීප වතාවක් කිව්වා. බුද්ධි අංශයෙන් වාර්තා කළා. වුවමනා වේලාවට කැඳවනවා කියා. 2015න් පසු සතිපතා රැස්වුණේ නැහැ.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ආරක්ෂක මණ්ඩලය සතිපතා රැස්විය යුතු ද?

රනිල් වික්‍රමසිංහ මහතා - හදිසි යුද අවස්ථාවන් නැති නිසා සති 2කට වරක්වත් රැස්වෙන්න තිබුණා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඉස්ලාම් අන්තවාදය ගැන කතා කළා ද?

රනිල් වික්‍රමසිංහ මහතා - ඉස්ලාම් අන්තවාදය ගැන වගේම ආගමික අන්තවාදයන් ගැනත් ආවා. ඉස්ලාම් අන්තවාදයේ මධ්‍යස්ථ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ට විරුද්ධව ක්‍රමවේදයක් ඇති බව කතා වුණා. වෙනත් ආගම්වල මෙහෙම තිබුණේ නැහැ.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - කාත්තන්කුඩිවල පාරම්පරික මුස්ලිම් අයත් ඉන්නවා ද? එහි මතගැටුම් තිබූ බව දන්නවාද?

රනිල් වික්‍රමසිංහ මහතා - කාත්තන්කුඩි සිට කල්මුණේ දක්වා තිබුණා. පාරම්පරික මුස්ලිම්වරුන් අපට කිව්වා මේ අය ආරක්ෂා කරන්න කියලා. වැඩි බලපෑමක් ආවේ ඒ අය ආරක්ෂා කරන්න කියන එකයි. මම පොලිස්පතිට, අනෙක් අංශවලට මේ බව දැනුම් දුන්නා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - 2017-03-17 අලියාර් හන්දියේ ගැටුමෙන් පසු සහරාන් අත්අඩංගුවට ගන්න විශාල වරෙන්තු නිකුත් කර තිබුණා නේද? ඒත් අත්අඩංගුවට ගන්න පාස්කු ප්‍රහාරය තෙක් බැරි වුණා නේද?

රනිල් වික්‍රමසිංහ මහතා - යුරෝපයට බෝම්බ බලපෑම් එනකොට මම කිව්වා සැලකිල්ලෙන් ඉන්න කියලා. ඉන්ටර්නෙට් හරහා ත්‍රස්තවාදය කරන අය බලන්න කිව්වා. අන්තවාදී විමර්ශන 2018 දී TID යට ගන්න කිව්වා. සහරාන් ඉන්නේ ඉන්දියාවේ කියා බුද්ධි අංශ කිව්වා. එක වේලාවකට කාශ්මීරයේ ඉන්නවා කිව්වා. මම දන්නේ නැහැ මොකක්ද වුණේ කියලා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - සහරාන් ඉන්න තැන් බුද්ධි අංශ කියලා තිබුණා නේද? ඇයි අත්අඩංගුවට ගත්තේ නැත්තේ?

රනිල් වික්‍රමසිංහ මහතා - ඇයි බුද්ධි අංශ නීතිය හා සාමය ඇමැති සමඟ කතා නොකළේ කියන එක ප්‍රශ්නයක්.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඒ බව නීතිය හා සාමය ඇමැතිට කියා තියෙනවානේ ?

වහාබ්වාදය සමහර මුස්ලිම් කොටඨාස පිළිගෙන තිබුණා

රනිල් වික්‍රමසිංහ මහතා - එහෙම නම් පොලිස්පතිට, ජනාධිපතිට කියන්න තිබුණානේ.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ආරක්ෂක මණ්ඩල අවස්ථා 9දී බුද්ධි අංශ සහරාන් ගැන වාර්තා ඉදිරිපත් කර තිබුණා. පියවර නොගත් බවට වාර්තා වී තිබෙනවා?

රනිල් වික්‍රමසිංහ මහතා - සහරාන්ගේ කතා ගැන ක්‍රියාත්මක වෙන්න කිව්වා. ත්‍රස්ත පනත එක යටතේ නියෝග ගන්න ඕනෑ කියලා කිව්වා. බුද්ධි අංශ වගේම පොලීසියත් මේ බව කිව්වා. මම කිව්වා නියෝග ගන්න කියලා ආරක්ෂක මණ්ඩලයට.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - රටේ ජාතික ආරක්ෂාවට ISIS මතවාදය ප්‍රශ්නයක් බව දැන සිටියාද? මේ අය රටේ සිටිය බව දැනුවත් වුණාද ?

රනිල් වික්‍රමසිංහ මහතා - ඔව්. ISIS මතවාදය ඉන්ටර්නෙට් හරහා සිදුකරන බව කිව්වා. ක්‍රියාවේ යොදවන අය ගැන බලන්න තිබුණා. තැත් කිරීම් ගැනයි ඔවුන් කතා කළේ. අන්තවාදී අදහස් තිබුණ නිසා TID කොටසක් දාලා තොරතුරු ගන්න කියලා මම කිව්වා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත්වීමට ඔවුන් කැමැත්තක් දැක්වුවේ නෑ නේද ?

රනිල් වික්‍රමසිංහ මහතා - ISIS ට ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ. සමහර අය අන්තවාදී ක්‍රියාවලටත් ගියා. සමහරු ඡන්දවලට ගිහින් නිශ්ශබ්දව සිටියා. සමහරු මතවාද එක්ක හිටියා. ප්‍රචණ්ඩ ක්‍රියා තිබුණේ නැහැ. සමහරු මතවාද අරන් ප්‍රචණ්ඩ ක්‍රියාවලට ගියා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - 77 විවෘත ආර්ථිකයත් සමඟ මැදපෙරදිග ආභාෂය මුස්ලිම් ඇඳුම් වෙනස් කිරීමට බලපෑවාද?

රනිල් වික්‍රමසිංහ මහතා - 80 - 90 කාලයේ මේ බව දැක්කා. වහාබ්වාදය ලෝකයේ පැතිරුණේ 80 මැද හෝ අන්තිම කාලයේ.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - වහාබ්වාදය ලංකාවේ උගන්වනවා නම් එය අනුමත කරනවාද?

රනිල් වික්‍රමසිංහ මහතා - වහාබ්වාදය සමහර මුස්ලිම් කොටඨාස පිළිගෙන තිබුණා. සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් සැම කෙනෙක්ම පිළිගෙන තිබෙනවාද කියලා මම දන්නේ නැහැ.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - පාස්කු ප්‍රහාරය සහ 2018 ආණ්ඩු වෙනස ප්‍රතිත්‍රස්ත පනත ගේන්න බාධාවක් වුණා ද?

රනිල් වික්‍රමසිංහ මහතා - බාධාවක් වුණා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - එක් ආරක්ෂක මණ්ඩල රැස්වීමකදී හිටපු යුද හමුදා බුද්ධි ප්‍රධානී සුරේෂ් සලේ මහතා ඉස්ලාම් අන්තවාදී කරුණු දැන්වීම ගැන වැඩි සතුටක් දැක්වූයේ නැද්ද ?

රනිල් වික්‍රමසිංහ මහතා - එහෙම දෙයක් තිබුණේ නැහැ. සුරේෂ් සලේගේ දැනුම ගැන එතරම් ප්‍රශ්නයක් තිබුණේ නැහැ. නමුත් එතුමා කළ වැඩකටයුතු ගැන ප්‍රශ්න තිබුණා. මාධ්‍යය ඉදිරියේ කියන්න අමාරුයි.

කොමිසමේ සභාපති විනිසුරුවරයා - මාධ්‍ය මඳකට ඉවතට යන්න.

ආරක්ෂක රැස්වීම්වට සහභාගි වෙන්න කියලා දැනුම් දුන්නේ කෙටි කාලයක් තුළයි. පැය 24ක්, පැය 48ක් වගේ කාලයකින් දැනුම් දුන්නාම වැඩක් යොදාගෙන නැතිනම් සහභාගි වුණා. නිශ්චිත දිනයක් තිබුණේ නැති නිසා සහභාගි වීම අපහසු වුණා

පාස්කු දා ප්‍රහාරය පිළිබඳ සොයා බලන ජනපති කොමිසම

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - නිකාබේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් බවට යෝජනාවක් ආවාද?

රනිල් වික්‍රමසිංහ මහතා - හිටපු යුද හමුදාපති ක්‍රිෂාන්ත ද සිල්වා මහතා අදහසක් ගෙන ආවා. 2016 - 2017 වගේ ප්‍රංශයේ තහනම් කර තිබුණා. මා කිව්වා, මේක කළොත් අන්තවාදීන්ගේ අතට ආයුධයක් දීලා මධ්‍යස්ථවාදීන් සම්පූර්ණයෙන් දුර්වල වෙයි කියලා. 83දී මේක වුණා. තොරතුරු එන එක නැවතුණා. මුස්ලිම් කාන්තාවෝ සාරි ඇඳගෙන මුහුණ වහගෙන ගියේ. ප්‍රංශයේ කළාට එංගලන්තයේ, අමෙරිකාවේ මේක කළේ නැහැ. ඉරානයට ගිහින් සටන් කළේ අප ප්‍රංශය ආවේ නැහැනේ කියලා අමෙරිකාව කිව්වා. 83 අත්දැකීම අනුව අපට එන තොරතුරු නවත්වන්න හොඳ නැහැ. එල්. ටී. ටී. ඊ. යට වෙඩි තිබ්බම අප සේරම ජාතිවාදී කියා තොරතුරු දුන්නේ නැහැ.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඔබ කියන ආකාරයට තොරතුරු ලැබෙයි කියා 21 ප්‍රහාරයට පෙර බලාපොරොත්තුවෙන් හිටියා නේද ?

රනිල් වික්‍රමසිංහ මහතා - බුද්ධි අංශවලට ලැබුණේ නැහැ. මුස්ලිම් අය විටින් විට දැනුම් දී තිබුණා. ක්‍රියා කිරීමයි කළ යුතුව තිබුණේ. විදේශීය තොරතුරක් ලැබී අපේ අයට ලැබී නොතිබීම අපේ බුද්ධි අංශවල අඩුපාඩුවක්.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - අපේ පොලීසියට සහරාන් අත්අඩංගුවට ගන්න බැරි වුණේ දේශපාලන බලපෑම් නිසාද?

රනිල් වික්‍රමසිංහ මහතා - දේශපාලන බලපෑමක් තිබුණේ නැහැ.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - යම් මුස්ලිම් අයට විදේශ මුදල් විශාල ලෙස ලැබී තිබුණා සවුදි අරාබියෙන්. මඩකළපුව විශ්වවිද්‍යාලයට බව කියා තිබුණා. ඒ ගැන රජයක් විදිහට සෙවිවා ද?

රනිල් වික්‍රමසිංහ මහතා - සවුදියෙන් 1990 ඉඳන් මුදල් එනවා. මේකටත් සල්ලි ඇවිත් තිබුණා. විශාල එකක් නිසා මමත් ඇහුවා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - මහ බැංකුව මඟින් විදේශ මුදල් නියාමනය කරන ක්‍රමවේදයක් තිබෙනවා ද?

රනිල් වික්‍රමසිංහ මහතා - FIU එකකයක් තිබුණා. ලෝකයම එකට සම්බන්ධ වෙනවා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - සවුදිය වහාබ්වාදී රටක් නේද?

රනිල් වික්‍රමසිංහ මහතා - වහාබ් මධ්‍යස්ථානයක්.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඉස්ලාම් පුහුණු කඳවුරු තිබුණු බව දන්නවාද? ආයුධ පුහුණුව දී තිබුණා නේද?

රනිල් වික්‍රමසිංහ මහතා - මම දන්නේ නැහැ.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ජනාධිපති අප්‍රේල් 16 රටින් යනවා. වැඩ බලන්න කෙනෙක් පත්කර නැහැ. රටේ ඊළඟ පුරවැසියා ලෙස ඔබට පුළුවන්ද තීරණ ගන්න.

රනිල් වික්‍රමසිංහ මහතා - ඔව්. ඒක සාමාන්‍ය සම්ප්‍රදාය. 93 දී ප්‍රේමදාස ජනාධිපති ඝාතනය කරද්දී අගමැති ඩී. බී. විජේතුංග මහතා සිටියේ ඈත. මම ආරක්ෂක කටයුතු භාර ගත්තා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඒ ජනාධිපති මියගිය විටනේ. විදේශගත වුණාම කරන්න පුළුවන්ද?

රනිල් වික්‍රමසිංහ මහතා - රෝගී තත්ත්වයකට, ශල්‍යකර්මයකට ගියොත් එහෙම කරනවා. සුනාමිය එද්දී චන්ද්‍රිකා හිටියේ එංගලන්තයේ. අගමැති ලෙස මහින්ද ක්‍රියා කළා. ප්‍රහාරය දා අගමැති ලෙස මම තීරණ ගත්තා. මම එන්න කිව්වාම කවුරුත් ආවේ නෑ. ප්‍රශ්නයක් තිබෙන නිසා මම ආරක්ෂක අමාත්‍යාංශයට ගියා. නීතිපති, සොලිසිටර් ජනරාල්, ඇමැතිවරු ගියා. නියෝග ක්‍රියාත්මක කළා. ඇඳිරි නීතිය ජනාධිපතිතුමා සමඟ කතා කර දැම්මා. එතුමා මට කතා කළේ නැහැ. මම එතුමාට කතා කළා. සැන්ග්‍රිලා බෝම්බකරුගේ පාස්පෝට් එකෙන් ඒවෙලේම දෙමටගොඩ නිවෙස හොයා ගත්තා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ප්‍රහාරය ගැන ලැබුණු විදේශ තොරතුර ඔබතුමා දැනගත්තා නම් පියවර ගන්නවා ද?

රනිල් වික්‍රමසිංහ මහතා - වහාම ඇලට එකේ ඉන්න කියනවා. ඉන්දීය මහකොමසාරිස්ට කතා කරලා අදාළ අය ගැන විස්තර ගන්නවා. ගෙනැවිත් ප්‍රශ්න කරනවා. මේ අය පස්සේ යන්න කියනවා. කාදිනල්තුමාව දැනුවත් කරනවා. පූජා පවත්වන එක ඒ අය

පාස්කු ප්‍රහාරය 2018 ආණ්ඩු වෙනස ප්‍රතිත්‍රස්ත පනත ගේන්න බාධාවක් වුණා

නවත්වාවි. බුද්ධි අංශ, පොලිස්පති, ත්‍රිවිධ හමුදා සමඟ කතා කරනවා වගේම ආරක්ෂක මණ්ඩලය හැකි නම් කඩිනමින් කැඳවනවා. ජනාධිපතිතුමා ගුවන් තොටුපළට එන නිසා එතැනට ආරක්ෂාව දැම්මා. මටත් යන්න එපා කිව්වා. මම හෙලිකොප්ටරයෙන් ගිහින් කොච්චිකඩේ පල්ලියට ගියා. පසුව දැනගත්තා එතනත් වැන් රථයක බෝම්බ තිබුණා කියා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඇයි ඔබව හමුවෙන්න එපා කියා ජනාධිපතිතුමා කියා තිබුණේ?

රනිල් වික්‍රමසිංහ මහතා - හිතන්න ඇති මම මෙතන කේන්ද්‍රස්ථානයක් කරයි කියා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඇයි සහරාන් සමාජජාලා හරහා අනුගාමිකයන් අභිප්‍රේරණය කරන බව දැනගත්තම හොයාගන්න බැරි වුණේ?

රනිල් වික්‍රමසිංහ මහතා - ඒක අහන්න ඕනෑ අදාළ අංශවලින්. මට ඒකට පිළිතුරු දෙන්න බැහැ.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - සහරාන්ගේ කණ්ඩායමේ ත්‍රස්තවාදීන් 94 දෙනෙක් හිටියනේ? ඇයි සහරාන් පස්සේ විතරක් ගියේ ?

රනිල් වික්‍රමසිංහ මහතා - මේ සමහර අය එක්ක බුද්ධි අංශ සම්බන්ධකම් තිබුණා. තොරතුරු ගත්තා. ඒක පසුව කියන්නම්.

(නැවතත් මාධ්‍ය කොමිසමෙන් පිටතට යවයි.)

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඉස්ලාම් අන්තවාදීන් මර්දනය කරන්න ඉස්ලාම් සමාජයෙන් සහාය ගත යුතුයි නේද ?

රනිල් වික්‍රමසිංහ මහතා - ඔව්. එහෙම කරන්න තිබුණා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඒ සඳහා රජය අමාත්‍ය මණ්ඩලය විශේෂ දැනුම්වත් කිරීමක් කළ යුතුව තිබුණා නේද?

රනිල් වික්‍රමසිංහ මහතා - ඔව්, එහෙම කරන්න තිබුණා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - රවුෆ් හකීම් කියලා තිබුණා එහෙම දැනුවත් කිරීමක් කළේ නැහැ කියා ?

රනිල් වික්‍රමසිංහ මහතා - මුස්ලිම් අය තමයි අපිට කිව්වේ. මුස්ලිම් අන්තවාදය ගැන අපට වඩා දන්නේ ඔවුන්.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - රවුෆ් හකීම් ඔබේ බිරියගේ සීඩී තැටියකින් සහරාන් ගැන දැනගත්තේ කියලා කිව්වා.

රනිල් වික්‍රමසිංහ මහතා - සමාජජාලවල ගිය එකක් එතුමියට ලැබිලා තිබුණා. ඒක රවුෆ්ට ඇරියා. ඒ වෙනකොට සහරාන් ගැන මමත් දැනගෙන හිටියේ. කොහේද හිටියේ කියලා දැන සිටියේ නැහැ. ඒක දේශපාලනයේ කොටසක්. හැමෝම දන්නවා

හිටපු ජනපති ඇතුළු පාර්ශ්වය සමඟ මතගැටුම් පැවතියේ නැහැ

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයෙන් කොවිඩ් ව්‍යාප්තිය මර්දනයට කරුණු 16ක යෝජනාවලියක්

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 වයිරස ව්‍යාප්තිය මර්දනයට සහ සෞඛ්‍ය ධාරිතාව පාලනය කර ගැනීම සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය කරුණු 16කින් යුත් යෝජනාවලියක් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත බාර දී ඇත.

සෞඛ්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ කොවිඩ් - 19 මෙහෙයුම් මැදිරියක් ආරම්භ කිරීම, කොවිඩ් - 19 රෝගීන් හා ආශ්‍රිතයන් ඒ.පී.එස්. තාක්ෂණය භාවිත කර ව්‍යාප්තිය සිතියම්ගත කිරීම, පීසීආර් පරීක්ෂණ කිරීමට පවතින හැකියාව තවදුරටත් ඉහළ නැංවීම යනාදී කරුණු 16ක් මෙම යෝජනාවලියේ ඇතුළත් බව සංගමයේ ලේකම් වෛද්‍ය සෙනාල් ප්‍රනාන්දු මහතා පැවැසුවේය.

රෝග ව්‍යාප්තිය නිසි ලෙස පාලනය කර ගත හැකි මට්ටමින් මර්දනය කිරීමට අපොහොසත්ව මෙරට සෞඛ්‍ය ධාරිතාව ඉක්මවා යෑමක් සිදු වුවහොත් පසුගිය අවස්ථාවන්වල දී මර්දනය කළ ආකාරයට වයිරසයේ ව්‍යාප්තිය පාලනය කිරීමට නොහැකි වේ යැයි ද කී ඒ මහතා, දේශපාලන නායකත්වය, සෞඛ්‍ය අංශය හා ධාරිතාව, මහජනතාවගේ දායකත්වය යන කාණ්ඩ තුන විසින් ගනු ලබන තීන්දු තීරණ හෝ ක්‍රියාමාර්ග වසංගත රෝගයක් මර්දනයට වඩාත් වැදගත් වන බව ද කියා සිටියේය.

මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොටඨාසයට අයත් රජයේ නිලධාරීන් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල පරිත්‍යාග කිරීමට සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පියවර ගෙන ඇති අතර, ඒ අනුව මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සභාපති කුමාර අරුංගල්ල මහතා අතින් එම ආරක්ෂිත ඇඳුම් කට්ටල නිල වශයෙන් මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම්වරිය වෙත බාරදුන් අයුරු.

සංවර්ධන කටයුතු ප්‍රමාදයන් වැළැක්වීමේ යෝජනාවකට කැබිනට් අනුමැතිය

බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි,

සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී සිදු වන ප්‍රමාදයන් හැකිතාක් අවම කර එම කටයුතු වේගවත් කිරීම සඳහා මුදල් ඇමැතිවරයා වශයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.

ඒ අනුව සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සඳහා පවතින ඇතැම් බාධක වශයෙන් ප්‍රතිපත්තිමය කරුණු හෝ නියාමන අවශ්‍යතාවන් සඳහා නොවන, සාමාන්‍ය කරුණු සඳහා ආයතන කිහිපයකින් සහ අවසානයේ දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ කටයුතු කළ යුතු වීම හා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් වෙත කළ යුතු ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් සංවර්ධන කටයුතුවල ප්‍රමාදයන් සිදු වන අතර ව්‍යාපෘති පිරිවැය ද ඉහළ යෑම හඳුනාගෙන ඇත.

එම ප්‍රමාදයන් හැකිතාක් දුරට අවම කර ගැනීමට හැකි වන අයුරින් සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළව භාණ්ඩාගාරයේ ලේකම්වරයා සහ අනෙකුත් අදාළ බලධාරීන්ගේ අනුමැතිය මත ක්‍රියාත්මක කළ හැකි කාර්යයන් කඩිනමින් ඉටු කර, එම කටයුතු පිළිබඳ වාර්තාවක් මාස 03කට වරක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම, කොන්ත්‍රාත්කරුවන් විසින් නිම කරනු ලබන වැඩ කොටස් සඳහා ප්‍රමාදයකින් තොරව ගෙවීම් කිරීමට හැකි වන අයුරින් ඔවුන්ගේ බැංකු වෙත භාණ්ඩාගාර ඇපකර හෝ පහසුකම් සැලසීමේ ලිපි නිකුත් කිරීම මඟින් ප්‍රමුඛ සංවර්ධන කාර්යයන් සඳහා අඛණ්ඩ මූල්‍ය ප්‍රවාහයක් සලසා දීම තහවුරු කිරීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දීම මේ අනුව සිදු කෙරේ.

අන්තර්ජාතික ආපදා අවම කිරීමේ දිනයට සමගාමීව අවස්ථායික මෙහෙයුම් පද්ධති ක්‍රියාත්මක කිරීමේ පෙරහුරුවක්

උපාලි කරුණාරත්න

අන්තර්ජාතික ආපදා අවම කිරීමේ දිනයට සමගාමීව අවස්ථායික මෙහෙයුම් පද්ධති ක්‍රියාත්මක කිරීම පිළිබඳ පෙරහුරුවක් පෙරේදා (13) මඩකලපුව, ත්‍රිකුණාමලය, කලුතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික් කේන්ද්‍ර කර ගනිමින් පැවැත්විණි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව එක්ව අවස්ථායික මෙහෙයුම් පද්ධති ක්‍රියාත්මක කිරීම පිළිබඳ පෙරහුරුවක් (Table Top Exercise) පැවැත්වූ අතර, මේ සඳහා මඟපෙන්වීම සහ සම්බන්ධීකරණය එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය, අන්තර්ජාතික සාගර විද්‍යා කොමිසම සහ ඉන්දීය සාගර කලාපයේ සුනාමි අනතුරු ඇඟවීමේ පද්ධතිය විසින් ලබා දෙන ලද බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක (මාධ්‍ය) ජනක හඳුන්පතිරාජ මහතා පැවසීය.

කලාපයීය රටවල් 28ක් මෙම කලාපයීය සුනාමි පෙරහුරුව සඳහා සහභාගී විය. ඉන්දීය සාගර කලාපයේ සුනාමි අනතුරු ඇඟවීමේ පද්ධතිය මඟින් තාක්ෂණික වශයෙන් සම්බන්ධ වූ මෙම අවස්ථායික මෙහෙයුම් පද්ධති ක්‍රියාත්මක කිරීම පිළිබඳ පෙරහුරුව සඳහා කොවිඩ් - 19 ව්‍යසන තත්ත්වය හේතුවෙන් මහජනතාව සහභාගී කරවා ගැනීමක් සිදු නොවූ අතර, දිස්ත්‍රික් මට්ටම දක්වා පූර්ව ඇඟයීම් යන්ත්‍රණය පරීක්ෂාවට ලක් කිරීම මෙම වැඩමුළුව මඟින් සිදු කෙරිණි. අන්තර්ජාතික සහ ජාතික වශයෙන් පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදවල පවතින කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීම, ආපදා කළමනාකරණ ක්‍රියාවලිය තුළ කටයුතු කරන පිරිසේ ධාරිතාව පරීක්ෂා කිරීම, ආපදා අනතුරු ඇඟවීමක දී ප්‍රතිචාර දැක්වීම, පූර්ව අනතුරු ඇඟවීම නිවේදනය කිරීමේ දී වඩාත් කාර්ක්ෂම සහ යෝග්‍ය සන්නිවේදන ක්‍රමෝපායන් හඳුනාගැනීම, පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදවල පවතින දුර්වලතා පරීක්ෂා කිරීම, ඉදිරියේ දී වඩාත් යෝග්‍ය ක්‍රමෝපායන් හඳුනා ගැනීම සහ පවතින අඩුපාඩු අතපසුවීම් සහ දුර්වලතා මඟහරවා ගැනීම සඳහා පුහුණුව, ජාතික මට්ටමේ සිට දිස්ත්‍රික් මට්ටම දක්වා සම්මත මෙහෙයුම් පටිපාටි පරීක්ෂා කිරීම මෙම පෙරහුරුවෙන් අපේක්ෂිත අරමුණු වේ.

කොවිඩ් වැලඳීමෙන් මිය ගිය විදෙස් ශ්‍රමිකයන්ට වන්දි

අනුර ප්‍රේමලාල්

කොවිඩ් වැලඳීමෙන් මිය ගිය ශ්‍රමිකයන් වෙනුවෙන් රක්ෂණ වන්දි පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මේ වන විට පියවර ගෙන තිබේ. ඒ අනුව මියගිය අය අතුරින් 14දෙනකු වෙනුවෙන් අදාළ ලිපි ගොනු දැනටමත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත යොමු කොට තිබේ.

එම මියගිය 14දෙනා අතරට පිරිමි ශ්‍රමිකයන් 12 දෙනෙකු හා කාන්තා ශ්‍රමිකයන් දෙදෙනකු ඇතුළත් වේ. ඔවුන්ගෙන් 9දෙනකු සෞදි ආරාබියේදී මියගොස් ඇති අතර, තවත් සිවිදෙනකු කුවේට් හා එක් අයකු ඩුබායිහීදී මිය ගොස් තිබේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අතර, විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් ඇති කරගත් රක්ෂණ ගිවිසුමට අනු

අහස්ගව්ව

විඳ්දනීය සිනමාවේ වර්තමාන කියවීම

සිහින ගඟෙහි පීනා පීනා
කිමිඳි රිදී දියේ...
සිනිඳු ළවැලි අතරේ...
සෙව්ව මැණික ඔබ ප්‍රියේ...

සඳුගෙ සිසිල පානා පානා
කරුණා දයා ගුණේ..
ගිමන නිවන ගමනේ...
සුවැති සෙවණ හමු වුණේ...

චිත්‍රපටය
මහ රෑ හමු වූ ස්ත්‍රිය



හැන්දෑවේ හමු වූ සන්ධ්‍යා

කවුරුදෝ මා තනි කළේ

දෙනෝ දාහක් නුවන් අතරේ
කවුරුදෝ මා
තනි කළේ
තනි කළේ
පාසල් බිමේ

සිනා කෙළිලොල් තෙපුල් රහසේ
දෙඩූ තැන් අද ගොළු වෙලා
සොඳුරු පාසල් පියස
කඳුළින් බොඳ වෙලා
කැදැල්ලෙන් ඔබ වෙන් වෙලා

නිබඳ ඔබ මා ඇවිද ගිය තැන්
සෙවණ දුන් ගහ කොළ පුරා
බිමට බර වුණු කැකුළු
අතු ඉති මැලවිලා
දුකින් හදවත ගොළු වෙලා

දෙනෝ දාහක් නුවන් අතරේ...

චිත්‍රපටය - වජිරා
ගී පද - කුලරත්න ආරියවංශ
ගායනය - නන්දා මාලිනී
සංගීතය - වික්ටර් රත්නායක

සිංහල සිනමාවේ 473 චිත්‍රපටය ලෙස සිංහල සිනමා කර්මාන්තය ආරම්භ වී 34 වසරකට පසු රිදී තිරයට ආ "වජිරා" චිත්‍රපටයෙන් පාසල් ප්‍රේමයත් හිරිමල් යෞවනයත් හරි අපූර්ව ආකාරයෙන් මවන්නට මහාචාර්ය සුනිල් ආරියරත්නට පුළුවන් වෙලා තියෙනවා. ගීතයක් ලියන එකයි ගීතයක් ලියැවෙන එකයි දෙකක්. වැඩියෙන් ම ගීත, නිසඳැස් ලියැවෙන්නේ මිනිසුන්ගේ සතුටට වඩා දරා ගන්නට අපහසු තරම් වේදනාවන් දැනුනු වෙලාවට.

අපේ රටේ පාසැල් අධ්‍යාපනය ලැබූ සෑම ගැහැනියක පිරිමියෙකුගේම ප්‍රථම ප්‍රේමය පාසල් ජීවිතෙන් ආ බව රහසක් නොවේ. වයස අවුරුදු හයේ ඉඳන් පාසල් යන අපේ රටේ ප්‍රේමණීය හැඟීමක් ඇති වුණේ ප්‍රථම වතාවට කවදාදැයි කල්පනා කරනවා විනා හරිම උත්තරයක් දීම පහසු වෙන්නේ නෑ.පාසල් ජීවිතය එතරම් ම මිහිරියි.

එනිසාම පාසල ගැන පාසැල් ජීවිතය ගැන පාසල් ප්‍රේමය ගැන ගීත නාට්‍ය චිත්‍රපට නවකතා නිර්මාණය වෙනකොට නොදැනීම එම නිර්මාණ මිනිසුන් අතරේ ජනප්‍රිය වීමත් සමාජගත වීමක් වැළැක්විය නොහැකියි. ගොළු හදවත, ගැහැනු ළමයි ආදී නිර්මාණ කොයි කාලෙත් අපේ රටේ මිනිසුන්ගේ මතකයේ තියෙන්නෙ ඒ හින්දා.

"වජිරා" චිත්‍රපටයත් ඒ වගේම පාසල් යෞවන ප්‍රේමය ගැන බොහොම සුන්දරව නිර්මාණය වූවක්. "වජිරා" චිත්‍රපටයේ පාසැල් පෙම්වතුන් ලෙස භාව ප්‍රකාශනයෙන් ප්‍රේක්ෂකයා උමතු කරවන තරමේ යථාර්ථවාදී රංගනයෙන් පොහොසත්ව අමරසිරි කලංසූරිය නිමල් ලෙසත් නදීකා ගුණසේකර වජිරා ලෙසත් රංගනයට අපුරු සාදරනයක් ඉෂ්ටකර තිබෙනවා. වික්ටර් රත්නායකගෙ සංගීතයෙන් සහ නන්දා මල්ලිගේ මාලනීගේ ස්වර ගායනයෙන් තමයි "දෙනෝදාහක් නුවන් අතරේ" ගීතය නිර්මාණය වෙලා තියෙන්නේ.

"වජිරා" චිත්‍රපටයේ අධ්‍යක්ෂවරයා වන මහාචාර්ය සුනිල් ආරියරත්න කුලරත්න ආරියවංශ ය ගීත රචකයාට පවසන්නේ මේ චිත්‍රපටයේ මවිපිය බලපෑමෙන් වජිරා සහ නිමල් වෙන් වීමෙන්, නිමල් නොමැති හුදකලාවෙන් වියෝගයෙන් සිටින වජිරාගේ හිතේ නළියන අතීතයේ මතක වේදනාව වචනයෙන් කිව නොහැකි දහසකුත් දේ ගීත පද කීපයකින් ලියා ගන්නට උවමනාය කියලා.

මේ ගීතය සම්බන්ධයෙන් කුලරත්න ආරියවංශ පවසන්නේ එම චිත්‍රපටයේ බලපුළුවන්කාර වජිරාගේ දෙමවිපියන් දරිද්‍රතාවයෙන් පෙලෙන නිමල්ට කරන බලපෑම චිත්‍රපටයේදී පැහැදිලිව පෙන්නුම් කරන බවත් එමෙන්ම මේ දෙදෙනාගේ ප්‍රේමය යෞවන පාසල් ප්‍රේමයක් නිසා කුඩා දරුවන්ට අඬන්න කියලා දෙන්න ඕන නෑ වගේ පාසල් ප්‍රේමයේ වෙන්වීම, හුදෙකලාව, පාළුව කාන්සිය ගැන අමුතුවෙන් ඉතාම ලියැවුණු බවයි. ලියූ ගීතයකට වඩා ලියැවුණු චිත්‍රපට ගීතයක් වුවත් අවශ්‍යතාවය මත ලියැවුණු ගීතයක් තමයි දෙනෝදාහක් නුවන් අතරේ ගීත වජිරා පාසලේ තනිවීම, නිමල්ව මතක් වීම, වියෝගය සම්මිශ්‍රණය වී ඇති අයුරු ගීත රචනාවේ ඉතා සියුම්ව හා පොදු අනුමැතියක් ලෙස සරලව ලියවී ඇති අතර සුනිල් ආරියරත්න ගේ ඉල්ලීම මත ආරියවංශ සංවේදී හැඟීම් අතරේ කිමිදී ඇත්තා සේය.

ජෝන් දිනේෂ සඳරුවන්

රසමුසු තැන් පිරි ඔබේ සිනමා ලිපි අපට යොමු කරන්න

"අහස්ගව්ව" දිනමිණ
ලේක් හවුස්,
අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත,
කොළඹ 10.
ahasgawwa@lakehouse.lk

ලාංකේය සිනමාවට සිංහලකම රඟෙන ආ සිරිසේන විමලවීර මහතා තමන් නිෂ්පාදනය කරන්නට යන "රොඩී කෙල්ල" චිත්‍රපටයේ ප්‍රධාන චරිතයට අලුත් නිළියක අවශ්‍ය වූ සමයකි. ඔහු ඒ වෙනුවෙන් කොටහේන ප්‍රදේශයේ පදිංචිව සිටි ඉවෝන් පෙරේරා නමැති තරුණිය තම චිත්‍රපටය සඳහා තෝරා ගත්තේය. චිත්‍රපටයේ වැඩ කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විමලවීර මාස්ටර්ට ඉවෝන් ව හමු වූයේ සැඳෑ කාලයකදී නිසා ඔහු ඇයට අපූරු නමක් තැබුවේය. ඒ සන්ධ්‍යා කුමාරි යන නමයි. එතැන් සිට ඇය තම ජීවිතයේ අවසාන සමය තෙක් භාවිත කළේ එම නමයි.

"රොඩී කෙල්ල" චිත්‍රපටය ආරම්භයත් සමඟම එහි අවසානය ද සිදුවූයේ සන්ධ්‍යාට බලවත් කලකිරීමක් ඇති කරමිනි. සිනමාස් සමාගම නිපදවන චිත්‍රපටයකට නිළියන් අවශ්‍ය යැයි යන දැන්වීමක් පුවත්පත්වල පළ වූ යේ මේ දිනවල ය. දුටුවන් වශී කරවන්නට සමත් දෙනෙතක් ඇය සතු වීම නිසා "සැපත සොයා" චිත්‍රපටයේ නිළියක් ලෙසින් ඇය ඒ සඳහා එක්කරගැනීමට අධ්‍යක්ෂවරයා කටයුතු කළේය. එහෙත් එය ප්‍රදර්ශනය වීමට පෙර ඇය දෙවෙනි වරට රඟපෑ "අදට වැඩිය හෙට හොඳයි" චිත්‍රපටය තිරගත කෙරිණි. මේ සිදුවීම හරිහැටි නොදත් බොහෝ දෙනෙකු සන්ධ්‍යා කුමාරි පිළිබඳ විස්තර සඳහන් කිරීමේ දී ඇය රඟපෑ ප්‍රථම චිත්‍රපටය ලෙසින් සඳහන් කරන්නේ "අදට වැඩිය හෙට හොඳයි" චිත්‍රපටයයි. කොළඹ කොටහේන ප්‍රදේශයේ උපත ලබා යහපත් එඩේරාගේ කන්‍යාරාමයේ ඉගෙනුම ලැබූ ඇය පාසල් විවිධ ප්‍රසංගයන්හි ද කැපී පෙනෙන ශිෂ්‍යාවක් වූවාය.

අදට වැඩිය හෙට හොඳයි චිත්‍රපටය සිනමා නාමාවලියේ 85 වැනි චිත්‍රපටය වන අතර එය තිරගත වී ඇත්තේ 1963 මාර්තු 26 වැනිදාය. "සැපත සොයා" චිත්‍රපට නාමාවලියේ 108 වන චිත්‍රපටය වන අතර තිරගත වී ඇත්තේ 1965 ජනවාරි 15 වැනි දා ය. එහි අධ්‍යක්ෂවරයා වූයේ එම අවදියේ සැණකෙළි පැවැත්වූ ව්‍යාපාරිකයකු වූ නන්දසේන කුරේය. මෙකී කාල සමයේ මස්තාන්ගේ මෙහෙයවීම යටතේ තිරයට එන නවක නිළියන්ට විශාල ඉල්ලුමක් තිබුණි. 1963 සිට අඛණ්ඩව 1988 දක්වා විවිධ අන්දමේ ප්‍රධාන චරිත නිරූපණය කළ ඇය මෝටර් රථ ධාවන ශූරයකු වූ උපාලි පෙරේරා සමඟ විවාහ වීමෙන් පසු සිනමාවට ආයුබෝවන් කීවාය.

සන්ධ්‍යා මා සමඟ එවක පුවත්පතක් වෙනුවෙන් සාකච්ඡාවක් පැවති අවස්ථාවක ඇයගේ වඩාත්ම කැමැති චිත්‍රපටය "ධීවරයෝ" බව සඳහන් කළාය. එහි රඟපෑ රොසලින් සිනමා ලෝලීන්ගෙන් ජනප්‍රිය චරිතයක් බවට පත්විය. චිත්‍රපට සියයකට ආසන්න ප්‍රමාණයකට රංගනයෙන් සම්බන්ධ වූ ඇය තම ප්‍රියතම චිත්‍රපට අතර අලි බබා සහ හොරු හතළිහ, උඩරට මැණිකේ, දීපශිකා, පටාචාරා, කතරක හැටි, හිතක මහිම, යටගිය දවස ,අල්ලපු ගෙදර, ශත පනහ, සැනසුම කොතැනද, මහ රෑ හමු වූ ස්ත්‍රිය, සිහින හතක්, සුදෝ සුදු, සූර චෞරයා, පිනිබිඳු, අක්කා නගෝ, බයිසිකල් හොරා, නාරිලතා, හරිමඟ සහ සුරයන්ගේත් සුරයා දැක්විය හැක.

1986 ඔක්තෝබර් 14 වැනිදා හදිසි අනතුරකින් සැමියා මිය යාමෙන් පසු තම දියණියන් දෙදෙනා සමඟ ඇය තනි වූවාය. දියණියන් දෙදෙනා විවාහ වීමෙන් නිවසේ හුදෙකලාව සිටි සන්ධ්‍යා තම නිවෙස විකුණා දැමීමට පුවත්පත් දැන්වීමක් පළ කළ අතර එය මිළදී ගැනීමට පැමිණි තරුණයාට හිත ගිය ඇය ඔහු සමඟ ටික කලක් පැවති ප්‍රේම සම්බන්ධයෙන් පසු 1992 දෙවැනි වරට විවාහ වූවාය.

උපාලි මියයාමෙන් පසුව ඈ රඟපෑ චිත්‍රපට අතර නිලා, සකුන්තලා, අනුපමා, හිතක සුවඳ, අලි බබා සහ හොරු හතළිහ තුළින් නැවත දස්කම් පෑවා ය. අක්කා නගෝ චිත්‍රපටය මිලට ගෙන නැවත ප්‍රදර්ශනය කිරීමටද ඇය දායක වූයේ තම සැමියාගේ ද ඉල්ලීම අනුවය. ප්‍රථම විවාහය සේම දෙවන විවාහයේදී ද ඉතාමත් ප්‍රීතිමත් ජීවිතයක් ගතකරමින් සිටි සන්ධ්‍යා හදිසියේ රෝගාතුර වීමෙන් ටික දිනකින් නොසිතූ අන්දමින් මිය ගියාය.

මිය යන විට 49 වැනි වියේ පසුවූ සන්ධ්‍යා දක්ෂකම හෝ ජනප්‍රියත්වයෙන් හිස උදුම්මා නොගත් නිරහන්කාර නිහතමානී නිළියක් වූවාය. ඇය මියගොස් පසුගිය ජූනි 21 වැනිදාට වසර විසිහයක් සපිරිණි.

එච්.ජී.මෙන්ඩිස්

විජය යාපනයට යන්නට පෙර රඟන කළ ගීතය

සිනමාවෙන් ඔබ්බට ගිහින් ඊටත් එහා දෙයක් තමන්ගේ ජීවත් වෙන රට වෙනුවෙන් කරන්න උත්සාහ දරපු පුද්ගලයෙක් තමයි විජය කුමාරතුංග කියන්නෙ. ඔබට මතක ඇති එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් සමඟ සාකච්ඡාවකට පවා ඔහු උතුරු පළාතට ගියා.

මෙන්න මේ උතුරේ ගමන යන්න ඉස්සෙල්ලා දවසෙත් විජය හිටියෙ චිත්‍රපට රූගත කිරීමකට සම්බන්ධ වෙලා. චිත්‍රපටය තමයි 'ඔබටයි ප්‍රියේ ආදරේ'. අතිශය ජනප්‍රිය වුණු මේ චිත්‍රපටය එද රූගත කිරීම් කරලා තිබුණේ කොම්පඤ්ඤ විදියේ කාසල් කියන අවන් හලේ. මේ කියන දවසේ චිත්‍රපටය පටිගතකිරීම්වලට සූදානම් කරල තිබුණේ එහි ජනප්‍රියම ගීතයක් වුණු ආශාවේ පායා ගීතය.

කොහොම හරි එද මෙහි රූගත කිරීම් ආරම්භ කරලා තිබුණේ උදේ තමයට විතර වුණත් ඒක පහුවෙනිදා පාන්දර දෙක පමණ දක්වා ඇදෙමින් තිබුණා. ඒකට හේතුව තමයි රූගත කිරීම් කළ කාසල් හෝටලයට විජය වෙනුවෙන් දුරකතන ඇමතුම් රාශියක් ලැබීම. ඒ බොහෝ දුරකතන පණිවුඩ විතාඩි තිහ තිස් පහක් දක්වා ඇදෙමින් පැවතියා. මේ නිසාම එයට සමගාමීව රූගත කිරීම් කාලයත් දීර්ඝ වුණා. මේ සියලු දුරකතන ඇමතුම් ලැබුණේ පහුවෙනිදා සිදු වන විජයගේ යාපනය ගමන සම්බන්ධයෙන්.

එම ගීතයේ රූගත කිරීම් සියල්ල නිම වුණාට පසු චිත්‍රපටය අධ්‍යක්ෂණය කරපු සුනිල් සෝම පීරිස් විජයගෙන් අහල තියෙනවා "විජය ඔයා ඔය ගමන යන්නම ඕනද?" කියලා. ඒ මොහොතේ සුපුරුදු සැහැල්ලුවෙන් විජය කියලා තියෙන්නෙ.

"ඇයි මල්ලි උඹලා හිතුවද මම මැරෙයි කියලා? මම පරිස්සමින් ගිහින් එන්නම් මම මැරෙන්නෙ නෑ" කියලා.

කොහොමින් කොහොම හරි පහුවෙනිදා උදේ රූගත කිරීම් නිමා කරපු විජය එදම එල්.ටී.ටී.ඊ. නුස්තවාදීන් සමඟ සාකච්ඡා කරන්න යාපනයට ගියා. එද රූගත කරපු "ඔබටයි ප්‍රියේ ආදරේ" විජය මිය යන මොහොත වෙනකොට තිර ගත වෙමින් තිබුණේ. මේ නිසා විජයගේ ඝාතනයත් එක්කම චිත්‍රපටයේ ජනප්‍රියත්වයත් අතිශය ඉහළ මට්ටමට පැමිණියා.

නිරෝධායන ප්‍රදේශවලින් අලුතින් ආසාදිතයෝ 194ක්

යුද හමුදාපති ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා

නුවන් කොඩිකාර

කොරෝනා ආසාදිතයන් 194 දෙනකු පෙරේදා (13) දිනයේ වාර්තා වූ බවත් ඔවුන්ගෙන් 80 දෙනකු නිරෝධායන මධ්‍යස්ථාන වලින් හඳුනාගත් බවත් යුද හමුදාපති ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පවසයි. එලෙස පෙරේදා (13) හමු වූ 194 දෙනාගෙන් ඉතිරි 114 දෙනා දැනට නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශවලින් හඳුනාගත් බව හමුදාපතිවරය ඊයේ (14) කීවේය.

ඇඳිරි නීතිය පනවා නොමැති හොරණ, අනුරාධපුර, රාගම, ගනේමුල්ල, රත්නපුර, කළුතර, සීදුව, කැලණිය, කොළඹ, කුරුණෑගල, පොළොන්නරුව, මිගමුව, රත්මලාන, නුගේගොඩ, කඩව සහ හැටන් යන ප්‍රදේශ වලින් කොරෝනා වෛරසය ආසාදිතවූ පුද්ගලයන් වාර්තා වූ බව හමුදාපතිවරයා කියා සිටියේය.

මෙම පුද්ගලයන්ගේ PCR පරීක්ෂණ කිරීමේදී ඔවුන් ලබාදී තිබෙන ලිපිනයන් අනුව මෙම වාර්තා වීමී සිදු වුවද ඇතැම් විට ඔවුන් ලබාදුන් ලිපිනයන් වල පදිංචිව නොමැතිව රැකියා කිරීමට තාවකාලික නවාතැන් ගෙන සිටින නේවාසිකාගාර වල සිටිය හැකි බව ශවේන්ද්‍ර සිල්වා මහතා පැවසීය.

ඒ නිසා PCR පරීක්ෂණයක් සිදුකළ පුද්ගලයෙක් නම් ඒ ගැන තමන්ගේ නේවාසිකාගාරයේ සිටින සෙසු පිරිස් වෙත දැනුවත් කර වාර්තාව එනතුරු ඔවුන් සිටින ස්ථානවලම ස්වයං නිරෝධායනය වන්නැයි යුධ හමුදාපති ශවේන්ද්‍ර සිල්වා මහතා ප්‍රකාශ කළේය.

සුදු සැරයටිය නොපෙනන ප්‍රජාව කෙරෙහි අනුකම්පාවක් නොව සමානව ජීවත්වීමේ අයිතියක්

ජාත්‍යන්තර සුදු සැරයටි දිනට පණිවිඩයකින් අගමැති කියයි

සුදු සැරයටිය දැස් නොපෙනන ප්‍රජාව කෙරෙහි අවශ්‍ය අනුකම්පාවක් නොව සමාජයේ අනෙකුත් පුද්ගලයන්ට මෙන්ම සමානව ජීවත්වීමේ අයිතියක් බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කරයි.

ජාත්‍යන්තර සුදු සැරයටි ආරක්ෂණ දිනය වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කරමින් අගමැතිවරයා මේ බව සඳහන් කරයි.

එම පණිවුඩයේ වැඩිදුරටත් මෙසේ සඳහන් වෙයි.

දෘශ්‍යාබාධිත තැනැත්තන්ට සුදු සැරයටිය සුවිශේෂී මෙවලමකි. එය පාදක කරගනිමින් සෑම වසරකම ඔක්තෝම්බර් 15වැනි දිනට සමරනු ලබන ජාත්‍යන්තර සුදු සැරයටි ආරක්ෂණ දිනයේ දී සමස්ත දෘශ්‍යාබාධිත ජනතාව ඉතා සහෘද සිතින් සිහිපත් කරමි.

සුදු සැරයටිය පාදක කර ගනිමින් ඔක්තෝම්බර් 6 වැනි දින අමෙරිකාවේ කොංග්‍රස් මණ්ඩලයට ඉදිරිපත් කෙරුණු ඒකාබද්ධ යෝජනාවක් අනුව එකල අමෙරිකාවේ ජනාධිපති වූ ලින්ඩන් ජොන්සන් විසින් සෑම වසරකම ඔක්තෝම්බර් 15වැනි දින සුදු සැරයටි ආරක්ෂණ දිනය ලෙස නම් කරනු ලැබීය.

දැස් නොපෙනෙන ප්‍රජාව කෙරෙහි දැස් පෙනෙන සමාජයේ ඇස් ඇරවීම තුළින් දෘශ්‍යාබාධිත තැනැත්තන් මුහුණ දෙන සමාජ, ආර්ථික, සංස්කෘතික, පාරිසරික ගැටලු සහ බාධක ඉවත් කරලීම මේ දිනයෙහි මූලික අරමුණයි.

අන්තර්ජාතික සුදු සැරයටි ආරක්ෂණ දිනය යනු ජයග්‍රහණ සැමරීමේ දිනයකි. එසේම අන්ධ හෝ අඩු පෙනුමක් ඇති පිරිස් හට සුදු සැරයටිය යනු අන්ධභාවය සහ ස්වාධීනත්වයේ මෙවලමකි. දැස් නොපෙනන ප්‍රජාව කෙරෙහි අවශ්‍ය අනුකම්පාවක් නොව මේ සමාජයේ අනෙකුත් පුද්ගලයන්ට මෙන්ම සමානව ජීවත්වීමේ අයිතියකි. ඒ බව පෙන්වාදීමේ අරමුණේ ප්‍රතිඵලයක් ලෙස ලෝකවාසී අන්ධ ජනතාව වෙනුවෙන් සුදු සැරයටි ආරක්ෂණ දිනය බිහි විය.

සුදු සැරයටියේ පසුබිම් කතාව බිහිවන්නේ වර්ෂ 1930 සිටය. 1931 දී ප්‍රංශයේ ගුයිලි ඩි හර්බෙමොන්ට් විසින් සුදු පැහැති යෂ්ටියක් භාවිත කරගෙන ප්‍රංශයේ අන්ධ පුද්ගලයන් වෙනුවෙන් සමාජ සත්කාර ව්‍යාපාරයක් ලෙස දෘශ්‍යාබාධිත පුද්ගලයන් පන්දහසකට සුදු සැරයටි ප්‍රදානය කළේය. පසුව අමෙරිකාව හා අන් රටවල් කෙරෙහි ද දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා සුදු සැරයටි ලබාදීමේ වැඩසටහන් ආරම්භ වුණි.

සුදු සැරයටිය භාවිත කරන දෘශ්‍යාබාධිත පුද්ගලයකුට පරායත්තා හැඟීම අවම වෙමින්, සුරක්ෂිතතාව, ස්වාභිමානය සහ ස්වාධීනත්වය පිළිබඳව හැඟීම් තහවුරු වෙයි. අපගේ සහෝදරයන් වන මේ පුද්ගල කොට්ඨාසයේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඔවුන්ගේ දුෂ්කරතා මඟහැරීමට අප කටයුතු කළ යුතුය. එසේම ඔවුන් වෙනුවෙන් රටක් ලෙස අප අපගේ වගකීම ඉටුකළ යුතුය. ශ්‍රී ලංකාවේ සියලු දෘශ්‍යාබාධිත තැනැත්තන් සමඟ අද දිනයේ ජාත්‍යන්තර සුදු සැරයටි ආරක්ෂණ දිනය සැමරීමට මම ද එක්වෙමි.

කුරුණෑගල පන්සල් 1419ක කඨින පින්කම් නවත්වයි

ඉඹිබාගමුව සමූහ - කුමාරි දිසානායක

කුරුණෑගල දිස්ත්‍රික්කයේ විහාරස්ථාන 1419ක කඨින පින්කම් නැවැත්වීමට ත්‍රෛනිකායික භික්ෂූන් වහන්සේලා තීරණය කර ඇති බව කුරුණෑගල දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයේ සභාපති වයඹ පළාත් අධිකරණ සංඝනායක රැකව ජිනරතන නායක ස්වාමීන් වහන්සේ පවසති. උන්වහන්සේ මේ බව කියා සිටියේ ඊයේ (13) දින කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති විශේෂ මාධ්‍ය හමුවක දී ය . මෙහිදී තවදුරටත් අදහස් දැක්වූ උන්වහන්සේ කියා සිටියේ රටපුරා පවතින කොවිඩ් 19 වසංගතය හේතුවෙන් එය පාලනය කිරීමට රජය දරන ප්‍රයත්නයට සහයෝගයක් ලෙස කඨින පින්කම් නොපැවැත්වීමට තීරණය කළ බව සඳහන් කළහ .

මෙම කාල සීමාවන් තුළදී බෞද්ධයන් හැටියට ජන රාශී වීම් සිදුවුවොත් රෝගය රෝගය පැතිරී යාමේ වැඩි ප්‍රවණතාවක් ඇති හෙයින් , මෙම කඨින චීවර උත්සව නවතා දැමීමට මෙවැනි තීරණයක් කුරුණෑගල දිස්ත්‍රික් ශාසනාරක්ෂක බලමණ්ඩලය ගෙන ඇති බව ය .

අදාළ කාරණාව සම්බන්ධව ත්‍රෛනිකායික මහනායක හිමිවරුන්ට ලිඛිතව කරුණු ඉදිරිපත් කරන බව ද, උන්වහන්සේලාට ද ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කිරීම මෙම අවස්ථාවේ සිදු කිරීම ඉතාමත් කාලෝචිත බව උන්වහන්සේ මෙහිදී සඳහන් කළහ.

මෙම අවස්ථාවට සහභාගී වූ කුරුණෑගල දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ නියෝජ්‍ය සභාපති තුඹුල්ලේ ශීලක්ඛන්ධ නායක ස්වාමීන් වහන්සේ සහ කුරුණෑගල ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේකම් අටමුනේ ආනන්ද නායක හිමිවරු මෙම අවස්ථාවට සහභාගී වෙමින් කියා සිටියේ ,

කඨින පින්කම් සඳහා 50ක් පමණ පිරිසක් සහභාගී කරන ලෙස වඩා සුදුසු බවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාධ්‍ය ප්‍රකාශක වෛද්‍ය ජයරුවන් බණ්ඩාර මහතා කළ ප්‍රකාශයට අනුව එය සිදු කිරීමෙන් දායක දායිකාවන් අතර ගැටලුවක් ඇති වීමට සිදු වන බවත් එක විහාරස්ථානයක කඨින පින්කම සඳහා දහස් සංඛ්‍යාත පිරිසක් සාමාන්‍යයෙන් එකතු වන බවත්ය. එම නිසා දායකයින් 50ක් සහභාගී කරවීමේ ක්‍රමය සාර්ථක නොවන කර්මයක් ලෙස මෙහිදී සඳහන් කළහ. වාර්ෂිකව පවත්වනු ලබන කඨින පිංකමට වඩා රටේ උද්ගතව තිබෙන සෞඛ්‍යමය ගැටලු නිරාකරණය කර ගැනීමට රජය විසින් ගෙන යන වැඩපිළිවෙළට ත්‍රිවිධ ත්‍රිවිධ හමුදාවක් සෞඛ්‍ය අංශ ඉතාමත් කැපවීමෙන් කටයුතු කරනවා මෙන්ම, බෞද්ධ භික්ෂූන් වහන්සේලා ලෙස අපද එම කටයුත්තට සහයෝගය දැක්වීමක් ලෙස මෙවර කඨින චීවර පූජාවේ උත්සවය නොපැවැත්වීමට හා තීරණයක් ගෙන ඇති බව මෙහිදී මෙහිදී සඳහන් කළහ .

මෙම අවස්ථාවට කුරුණෑගල දිස්ත්‍රික් සමායෝජක රාගම සුගතානන්ද හිමි. කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් ආර්.එම්. ආර්. රත්නායක මහතා , කුරුණෑගල දිස්ත්‍රික් අතිරේක ලේකම් ජී. ඒ . කිත්සිරි මහතා ඇතුළු පිරිසක් සහභාගි වූහ .

බදියුදීන්ගේ රියැදුරන් දෙදෙනකු ගණකාධිකාරී අත්අඩංගුවට

බුද්ධි කරුණාරත්න

හිටපු අමාත්‍ය රිෂාඩ් බදියුදීන්ගේ පොලිස් ආරක්ෂක නිලධාරියා සහ රියදුරන් දෙදෙනකු සහ ගණකාධිකාරී අලගරත්නම් මනෝරංජන් නමැති අය පොලිස් අත්අඩංගුවට ගෙන ඇතැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කිවේය. කොළඹ පොලිස් මූලස්ථානයේ පැවැති මාධ්‍ය හමුවකදී ඔහු වැඩිදුරටත් කීවේ පොලිස් කොස්තාපල්වරයා 13දා ප.ව. 6.00ට පමණ වැල්ලවත්තේ දී අත්අඩංගුවට ගත් බවත් තමන් යම් ප්‍රභූවරයකුගේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කරන අවස්ථාවක දී වුවත් එම ප්‍රභූවරයා නීතිය හමුවේ වරදක් සිදු කොට තිබෙන විට ඔහුට නීතිය මඟහැර සිටීමට ඉඩ දීමට පොලිස් නිලධාරියකුට නොහැකි බවත් ඔහු පැවැසීය. ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 209 වැනි වගන්තිය යටතේ මෙම පොලිස් නිලධාරියා අත්අඩංගුවට ගෙන ඇතැයි ද ඔහු වැඩිදුරටත් කීවේය.

එසේම රිෂාඩ් බදුර්දීන් 13 වැනිදා භාවිත කළ බවට සැක කරන වාහන දෙකක් ද වැල්ලවත්ත ප්‍රදේශයෙන් සොයාගෙන ඇති අතර එම වාහන පැදවූ රියදුරන් වූ පුත්තලමේ පදිංචි අවුරුදු 56ක් සහ අවුරුදු 45ක් වයසැති දෙදෙනකු ද අත්අඩංගුවට ගෙන තිබේ. මෙයින් එකක් රේන්ජ්රෝවර් වර්ගයේ ජීප් රථයක් බවත් අනිත් රථය ඇක්සියෝ වර්ගයේ වාහනයක් බවත් කී මාධ්‍ය ප්‍රකාශකවරයා එහි තිබී ගිනි අවි දෙකක් ද සොයාගත් බව අනාවරණය කළේය. මෙම අවි තොගයට පිස්තෝල දෙකක්, මැගසින් හතරක් සහ පතරොම් 48ක් තිබී ඇත.

පසුගිය ජනාධිපතිවරණ සමයේ ලංගම බස්රථ දෙසීයකට වැඩි ගණනක් යොදවා පුත්තලම ප්‍රදේශයේ ඡන්දදායකයන් ප්‍රවාහනය කොට නැවත පදිංචි කිරීමේ සහ පුනරුත්ථාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ ඊට අදාළ මුදල් ගෙවීම සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් මත සිදු කළ පරීක්ෂණවලට අනුව තිදෙනකු අත්අඩංගුවට ගැනීමට නියම කර තිබිණි.

සෞන්දර්ය සරසවියෙන් ඉවත් කළැයි සෞම්‍ය-පේෂල උසාවි යති

නෙල්කා මැදගෙදර

කොළඹ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨයේ මහාචාර්ය ධූරයෙන් සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති ධූරයෙන් තමා ඉවත් කිරීමට එම විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය ගත් තීරණය බල රහිත කරන ලෙස ඉල්ලා සෞම්‍ය ලියනගේ මහතා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කර තිබේ. එම තනතුරුවලින් තමා ඉවත් කර මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම වෙනුවෙන් රුපියල් මිලියන පනහක වන්දි මුදලක් ලබා දෙන ලෙස ඔහු අධිකරණයෙන් ඉල්ලා සිටී. සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය, එහි නිසි බලධාරීන් මහාචාර්ය ඩබ්ලිව්. එම්. අබේරත්න ඇතුළු දහ අට දෙනෙකු මෙහි වගඋත්තර කරුවෝ වෙති.

සහකාර කථිකාචාර්ය වරයකු ලෙස සේවයට එක් වූ පෙත්සම් කරුගේ සේවය 2015 වසරේදී ස්ථිර කළ බවත් පසුව ඔහු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ මහාචාර්ය ධූරයට ත් පශ්චාත් උපාධි අධ්‍යාපන පීඨයේ පීඨාධිපති ධූරයට ත් උසස් කළ බව පෙත්සමෙහි දැක්වේ.

එහෙත් ඉකුත් සැප්තැම්බර් මස 25වැනිදා තමන් එම ධූරයන්ගෙන් ඉවත් කළ බව දක්වා ලිපියක් ලැබුණු බව පෙත්සම් කරුකියයි.

කථිකාචාර්ය වරයකු ලෙස තම පරිවාස කාලය නිම වන්නට පෙර ආචාර්ය උපාධිය සම්පූර්ණ කර නොතිබීම ඊට හේතුව ලෙස සඳහන් කර ඇත.

එහෙත් තමන් එම උපාධිය නිසි පරිදි සම්පූර්ණ කර ඇති බව සඳහන් කරන පෙත්සම් කරු විධිමත් විමර්ශනයක් හෝ තමාගෙන් කරුණු විමසීමකින් තොරව එලෙස තනතුරු වලින් තමා ඉවත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ14(1) වගන්ති වලින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් බවට පැමිණිලි කර සිටී. එබැවින් එම තීරණ ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස ත් එම තනතුරු වලට නැවත තමා පත් කරන ලෙස වගඋත්තරකරුවන් ට නියෝගයක් කරන ලෙස පෙත්සම් මගින් ඉල්ලා ඇත.

මේ අතර එම විශ්ව විද්‍යාලයේ සහකාර කථිකාචාර්ය ධූරයෙන් තමා ඉවත් කිරීමට එම විශ්ව විද්‍යාල පාලක මණ්ඩලය ගත් තීරණය බල රහිත කරන ලෙස ඉල්ලා පේෂල මනෝජ් මහතා අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කර තිබේ.

විනය පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රියාවලියට පටහැනිව යමින් විනය පරීක්ෂණයක් පවත්වා සිය සේවය අත් හිටුවීමට වගඋත්තර කරුවන් ගත් තීරණය අසාධාරණ සහ අත්තනෝමතික බව පෙත්සම් කරු සඳහන් කර ඇත. එබැවින් එම තීරණය බල රහිත කරන ලෙස ඉල්ලා රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා ඇත.

එසේම තමන් දැරූ තනතුරට නැවත තමා පත් කරන ලෙස වගඋත්තරකරුවන් ට නියෝගයක් කරන ලෙස පෙත්සම්කු ඉල්ලා සිටී.

මාලදිවයිනට යන්න හැදූ කහවත්තේ අයකුට කොවිඩ්

සන්ධ්‍යා කරුණාරත්න

මාලදිවයින බලා පිටත්ව යෑම සඳහා පෞද්ගලික රෝහලකින් සිදු කළ පී.සී.ආර්. පරීක්ෂණයේදී රත්නපුර, කහවත්ත පදිංචි පුද්ගලයකුට කොවිඩ් - 19 වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී ඇතැයි කහවත්ත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එච්.ඒ.එන්. විජේසිරි මහතා 'දිනමිණ'ට ඊයේ (14) පැවැසුවේය. මාලදිවයිනේ සිට මීට මාස දෙක තුනකට පමණ පෙර මෙරටට පැමිණි නැවත එරටට යාම සඳහා සෞඛ්‍ය පරීක්ෂණ සිදු කිරීමේදී පී.සී.ආර්. පරීක්ෂාවකට ලක් වීමට ඔහුට සිදු වී ඇති බවත්, වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වීමත් සමඟ ආසාදිතයා ඉරණවිල රෝහලේ ප්‍රතිකාර සඳහා යොමු කළ බවත් ඒ මහතා කීය.

ආසාදිත පුද්ගලයාගේ නිවසේ බිරිය සහ දරුවන් දෙදෙනාට ද මේ වන විට පී.සී.ආර්. පරීක්ෂණ රත්නපුර රෝහලෙන් සිදු කර ඇති අතර ඔවුන්ට වෛරසය වැළඳී ඇත්ද යන්න තහවුරු කළ හැක්කේ එහි වාර්තා ලැබීමෙන් පසුව බව ද ඔහු පැවැසුවේය.

වයිරසය ආසාදනය වූ පුද්ගලයා ළඟින්ම ඇසුරු කළ පුද්ගලයන් 50 ක් පමණ ස්වයං නිරෝධායනයට ලක් කිරීමට නියමිත යැයි ද, මාලදිවයිනේ සිට මෙරටට පැමිණෙන විට ඔහු ආසාදිතයකු නොවුණ ද මෙරටට පැමිණීමෙන් පසුව ආසාදියකු බවට පත්ව ඇතැයි ද ඒ මහතා ප්‍රකාශ කළේය.

ජාතික රෝහලේ හෙදියකට කොරෝනා

සන්ධ්‍යා කරුණාරත්න

කොළඹ ජාතික රෝහලේ හදිසි අනතුරු අංශයේ දැඩි සත්කාර ඒකකයේ සේවය කළ හෙද නිලධාරිනියකට ද කොවිඩ් - 19 වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී තිබේ.

කළුතර නාගොඩ රෝහලෙන් සිදු කළ පී.සී.ආර්. පරීක්ෂණයකින් ඒ බව පෙරේදා (13) තහවුරු වී ඇති බව සෞඛ්‍ය අංශ සඳහන් කරයි.

මෙම හෙද නිලධාරිනියට වයිරසය ආසාදනය වූයේ කෙසේද යන්න තවමත් විමර්ශනය කරමින් පවතියි.

වයිරසය ආසාදිත හෙද නිලධාරිනිය ළඟින්ම ඇසුරු කළ පුද්ගලයන් සොයා ඔවුන් ද පී.සී.ආර්. පරීක්ෂාවට ලක් කිරීමට නියමිත වේ.

බදියුදීන් ඇතුළු 2කගේ විදෙස් ගමන් තහනම්

සුභාෂිණී සේනානායක

හිටපු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් ඇතුළු දෙදෙනකුගේ විදෙස් ගමන් තහනම් කරමින් කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ(14) නියෝගයක් නිකුත් කළේය.

රහස් පොලිසිය අධිකරණයෙන් සිදු කළ ඉල්ලීමක් සලකා බැලූ මහේස්ත්‍රාත්වරයා මෙම නියෝගය සිදු කළ අතර එම නියෝගය ආගමන විගමන පාලකවරයා වෙත දන්වා යවන ලෙසට නියෝග කර සිටියේය.

මහේස්ත්‍රාත්වරයා මෙලෙස විදෙස් ගමන් තහනම් කරනු ලැබුවේ කර්මාන්ත හා වාණිජ කටයුතු හිටපු ඇමැති රිෂාඩ් බදියුදීන්, නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති අධ්‍යක්ෂ සම්සුඩීන් මොහොමඩ් යාසීන් යන අයට වේ.

කර්මාන්ත අමාත්‍යාංශයේ අමාත්‍යාංශයේ හිටපු ගණකාධිකාරීවරයා වන අලගරත්නම් මනෝරන්ජන් යන අය ඊයේ රහස් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ අතර ඔහු ලබන 26වනදා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් වරයා නියෝග කර සිටියේය.

මෙමගින් රජයට සිදු කර ඇති පාඩුව රුපියල් අනූ ලක්ෂ විසිනමදහස් හැටක් බව රහස් පොලිසිය අධිකරණයට දන්වා සිටියේය.

අමෙරිකාවේ ඉන්දු පැසිෆික් නේටෝ හවුල් උත්සාහය ආසියාවේ ආරක්ෂාවට අවදානමක්

චීන විදේශ ඇමැති

බුද්ධි කරුණාරත්න

අමෙරිකාව ඉන්දු පැසිෆික් නේටෝ හවුලක් ගොඩනැඟීමට අවශ්‍ය වී තිබෙන බවත් එය ආසියාවට එල්ල වන විශාල ආරක්ෂක අවදානමක් බවත් චීන විදේශ ඇමැති වැන් යී පසුගියදා ගිනිකොන දිග ආසියානු කලාපයේ රටවල සංචාරයක නිරත වෙමින් සිටියදී මැලේසියාවේ දී ප්‍රකාශ කළේය. ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේ, මේ තත්ත්වය නව සීත යුද්ධයකට මාර්ගය උදා කරනු ඇති බවයි. අමෙරිකාව, කලාපයේ රටවල්වල ඇති දේශපාලන වෙනස්කම් උපක්‍රමාණුකූලව යොදාගෙන භෞමදේශපාලනික තරඟකාරිත්වයක් ඇති කර කලාපයේ අස්ථාවරත්වය ඇති කිරීමට පියවර ගනු ඇතැයි ඔහු මෙහිදී වැඩිදුරටත් කීවේය. වැන්ග් මේ ප්‍රකාශය සිදු කළේ මැලේසියානු විදේශ ඇමැති හිෂම්මුද්දීන් හුසේන් සමඟ ඒකාබද්ධ ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වමිනි.

කලාපයේ රටවල් සමඟ දකුණු චීන මුහුදේ ඇති වී තිබෙන අර්බුද විසඳා ගැනීම සඳහා චර්යා ධර්ම සංග්‍රහයක් ඇති කිරීමේ වැදගත්කම ගැනද ඔහු වැඩිදුරටත් අදහස් දැක්වීය.

ලෝකයේ නෞකා ගමන්වලින් තුනෙන් එකක් සිදු කරන දකුණු චීන මුහුදේ පවතින අර්බුද මුල්කරගෙන අමෙරිකාව තම අත පෙවීම් සිදුකරන බව චීන විදේශ අමාත්‍යවරයා පෙන්වා දුන්නේය. වියට්නාමය, පිලිපීනය, මලයාසියාව සහ බෘනායි රාජ්‍යය දකුණු මුහුදේ අයිතීන් වෙනුවෙන් ගැටීම්වලට මුහුණ දී සිටිති.

බන්ධනාගාර ආරක්ෂාවට විශේෂ බළඇණියක්

බුද්ධිකා ඉඹුලාන

බන්ධනාගාර ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් විශේෂ ආරක්ෂක බළඇණියක් බන්ධනාගාර පද්ධතිය සඳහා බඳවා ගැනීම කෙරෙහි රජයේ අවධානය යොමුව තිබේ.

ඒ අනුව මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර තිබෙන බව බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පෙරේදා (-13) පැවැති සාකච්ඡාවකදී මේ බව සඳහන් කළාය.

ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතා සමඟ ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැති සාකච්ඡාවක දී මේ පිළිබඳව අවධානය යොමුකර තිබෙන අතර බන්ධනාගාර ගතකර ඇති සැකකරුවන් අධිකරණ කටයුතු සඳහා උසාවියට ඉදිරිපත් කිරීමේ දී ඇතිවන විවිධ වූ අපහසුතා පිළිබඳව මෙහිදී සාකච්ඡාවට ලක්වූ තිබේ.

බන්ධනාගාර නිලධාරීන්ට එල්ලවන තර්ජන සහ රැදවියන්ට නාහිර පාර්ශව වලින් එල්ලවන තර්ජන හේතුවෙන් ඒ සඳහා සුවිශේෂී ආරක්ෂාවක් සැපයීමේ වගකීම පිළිබඳව මෙහිදී අවධානයට ලක්විය. එමෙන්ම බන්ධනාගාර තුළ අතලොස්සක් නිලධාරීන් රැදවියන් සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය පිළිබඳව ඇති විවේචන පිළිබඳව අවධානය යොමු කල අතර මේ සියල්ල සඳහා විසඳුමක් ලෙස සුවිශේෂී ආරක්ෂක බලඇණියක සේවය ලබාගැනීම සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡාවට ලක්විය.

බන්ධනාගාර නිලධාරීන්ගේ සේවයට ශක්තියක් දිරියක් දියහැකි කණ්ඩායමක් ලෙස එම පිරිස බඳවා ගැනීමට යෝජිත අතර ඔවුන් සඳහා සුවිශේෂී නිල ඇඳුමක් සහ විශේෂ පුහුණුවකින් යුක්ත පිරිසක් වියයුතු බව ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතා මෙහිදී සඳහන් කර ඇත. බන්ධනාගාරවල පවතින ගැටළු සම්බන්ධයෙන් සහ පුනරුත්ථාපන කටයුතු සම්බන්ධයෙන් පැවැති මෙම සාකච්ඡාව සඳහා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ගීතාමනී කරුණාරත්න, වැඩබලන පොලිස්පති සී.ඩී.වික්‍රමරත්න, පොලිස් මාධ්‍ය ප්‍රකාශක නීතිඥ අජිත් රෝහණ, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙනිය, පුනරුත්ථාපන කොමසාරිස් මේජර් ජෙනරාල් දර්ශන හෙට්ටිආරච්චි, අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ සභාපති විශේෂඥ වෛද්‍ය ලක්නාත් වෙලගෙදර, බන්ධනාගාර කොමසාරිස් බුද්ධි හා මෙහෙයුම් තුසිත උඩුවර, ඇමැතිවරියගේ සම්බන්ධීකරණ ලේකම්වරුන් වන උදාර සිල්වා, හරිත සොයිසා යන මහත්ම මහත්මීන් ඇතුලු පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

අධිකරණ අමාත්‍යාංශයේ මහජන දිනය Online ක්‍රමයට

කොවිඩ් 19 වයිරස තත්වය හේතුවෙන් මහජනතාවට අධිකරණ අමාත්‍යාංශයට පැමිණීමට ඇති අපහසුතාව පිළිබඳව සළකා බලා අධිකරණ ඇමැති ජනාධිපති නීතිඥ මොහොමඩ් අලි සබ්රි මහතාගේ ප්‍රධානත්වයෙන් සදුදා දිනයේ පැවැත්වෙන මහජන දිනය අන්තර්ජාලය (Online) ඔස්සේ පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

මෙහි සඳහන් සබැඳිය (LINK) https://bit.ly/3lIBFgq වෙත පිවිස ලියාපදිංචි වී පවතින ගැටලු ඉදිරිපත් කළ යුතු අතර අධිකරණ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන www.moj.gov.lk වෙත පිවිසීමෙන් ද අදාළ සබැඳිය වෙත පිවිසීමේ හැකියාව තිබේ. සඳුදා දිනයේ පැවැත්වෙන මහජන දිනයට අදාළව ඇමැතිවරයාට ඉදිරිපත් කිරීමට ඇති ගැටලු ඉදිරිදා දින පස්වරු 6 වනවිට ඉදිරිපත් කළ යුතු බව එම අමාත්‍යාංශය කියයි.

අන්තවාදී ව්‍යාපාරය මෙතනින් අවසන් කළ නොහැකියි

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන

සුභාෂිණී සේනානායක

පාස්කු ප්‍රහාරයෙන් පසුව සහරාන්ගේ අන්තවාදී සංවිධානය කෙටි කලකින් විනාශ කළද ප්‍රහාරයෙන් පසුව is සංවිධානය සිදු කළ ප්‍රකාශය සහ ජාත්‍යන්තරව is සංවිධානය කර ඇති ක්‍රියාකාරකම් දෙස බැලූ විට මෙම ව්‍යාපාරය මෙතනින් අවසන් කිරීමට නොහැකි බව හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඊයේ (14) පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය.Is බලවත් රටවල් යුදමය තත්ත්වයක් ඇති කර ගත්තා. සහරාන්ලා සැඟවී සිට ප්‍රහාරය දියත් කළාම is සැඟවී සිටින නායකයා ප්‍රහාරය ගැන ප්‍රකාශයක් කළා. ප්‍රහාරයෙන් පසුව අපේ මිත්‍ර රටවල්වල බුද්ධි අංශ මාසයක් දෙකක් රට තුළ රැඳී සිටිමින් විමර්ශන සඳහා සහාය දුන්නා. මේ ප්‍රහාරයටis සංවිධානය සෘජුවම උපදෙස් දුන් බවක් හෝ තිබූ සම්බන්ධතාවය මොකක්ද කියලා සොයා ගත්තේ නැහැ. එහෙත් මේ සිද්ධිය මේ ප්‍රහාරය කළ අනිතවාදීන් සංවිධානය මෙතනින් පසු අවසන් කියා ප්‍රකාශ කරන්න බැරි බව හිටපු ජනාධිපතිවරයා කොමිසමට කියා සිටියේය.

බදියුදීන්ට රැකවරණය දුන්නොත් වැඩ වරදී

චන්ද්‍රිකා පෙරේරා

අත්අඩංගුවට ගැනීමට අවශ්‍යව සිටින සැකකාර හිටපු ඇමැතිවරයකු වූ රිෂාඩ් බදියුදීන්ට මෙරටින් පැන යාමට කිසිම අවස්ථාවක් නොමැති බවත් ඔහුට රැකවරණය ලබා දෙන ඕනෑම අයකුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන බවත් එම සිද්ධිය පිළිබඳ විමර්ශන පවත්වන විශේෂ පොලිස් කණ්ඩායමේ උසස් නිලධාරියකු ඊයේ (14) දිනමිණට පැවැසීය.

සැකකාර හිටපුඇමැතිවරයා,මොහොමඩ් යාෂිම් සහ ගණකාධිකාරීවරයකු වූ අලගරත්නම් මනෝහරන් යන තිදෙනා අත්අඩංගුවට ගන්නා ලෙස නීතිපතිවරයා වැඩබලන පොලිස්පතිවරයාට පෙරේදා (13) උපදෙස් ලබා තිබිණි.

මේ අනුව මොවුන් අත්අඩංගුවට ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්

චීනයේ ණය උගුලකට ශ්‍රී ලංකාව සිර වී නැති බව ජනාධිපති ගෝඨාභය ප්‍රකාශ කළා

චීන විදේශ අමාත්‍යාංශය අවධාරණය කරයි

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාව චීනයේ ණය උගුලක සිර වී සිටින බවට ඇතැමුන් අර්ථකථනය කළ ද එවැනි තත්ත්වයක් නොමැති බවට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රකාශ කර තිබෙන බව චීන විදේශ අමාත්‍යාංශය අවධාරණය කරයි.

ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් චීනය විශාල දායකත්වනයක් ලබා දී තිබෙන අතර එය මෙරට ආර්ථිකයේ ඉදිරි ගමනට ශක්තිමත් බව ද දෛනික මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදියකු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් චීන විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රකාශක ෂාඕ ලිජියන් මහතා ප්‍රකාශ කර තිබේ.

විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාව සෑම උත්සාහයක්ම දරන බව පෙන්වා දී තිබෙන ඒ මහතා හම්බන්තොට වරාය සහ කොළඹ වරාය නගර ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම තුළින් දෙරටේ අන්‍යෝන්‍ය සහයෝගීතාව ඉහළ මට්ටමකට ගෙන ඒම මෙන්ම ශ්‍රී ලංකාවේ සහ චීනයේ ජනතාවට වඩා හොඳ ප්‍රතිලාභ අත්කර දීම අරමුණ වූ බව ද පෙන්වා දී ඇත.

මේ දක්වා කිසිදු අවස්ථාවක ශ්‍රී ලංකාව ණය උගුලක සිර වී නොමැති බව පෙන්වා දී තිබෙන චීන විදේශ අමාත්‍යාංශයේ ප්‍රකාශකවරයා යම් යම් පාර්ශ්වයන් මේ සම්බන්ධයෙන් විවිධ ප්‍රකාශ සිදු කර තිබෙන බවද හෙතෙම පෙන්වා දී තිබේ.

කෙසේ වුවද සංචාරයක් සඳහා පසුගිය දා මෙරටට පැමිණි චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ දේශපාලන මණ්ඩල සාමාජික සහ චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ විදේශ කටයුතු කොමිසමේ කාර්යාල අධ්‍යක්ෂ යැං ජියෙචි මහතා (Yang Jiechi) ප්‍රමුඛ සත් පුද්ගල දූත පිරිස ජනාධිපති කාර්යාලයේ දී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා හමු වූ අවස්ථාවේ දී ජනාධිපතිවරයා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කෙරිණි.

ශ්‍රී ලංකාවේ මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ගණනාවකට චීනය දායක වී තිබෙන අතර හම්බන්තොට වරාය, වරාය නගර ව්‍යාපෘතිය, දක්ෂිණ අධිවේගී මාර්ගය ඒ අතර වෙයි. හම්බන්තොට වරායක් ඉදිකිරීම චීනයේ නොව ශ්‍රී ලංකාවේ අදහසක් වන අතර එය ඉහළ ආදායම් සහ රැකියා උත්පාදන විභවතාවක් සහිත ව්‍යාපෘතියක් බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පෙන්වා දෙයි.

ඊට අරමුදල් සම්පාදනය කිරීම සඳහා චීනය ඉදිරිපත් වී තිබෙන අතර බොහෝ භූ දේශපාලන විශ්ලේෂණවල මේ ව්‍යාපෘති අර්ථකතනය කරන්නේ ශ්‍රී ලංකාව චීනය ඇට වූ 'ණය උගුලක' සිරවීමක් ලෙස වුවද එය එසේ නොවන බවත්, මේ මහා පරිමාණ ව්‍යාපෘති ජනතාවගේ ජීවන මට්ටම වර්ධනය කිරීමට ඉවහල් වන බවත් ජනාධිපතිවරයා චීන දූත පිරිස හමුවේ ප්‍රකාශ කරයි.

කෙසේ වුවද මෙය සනාථ කිරීමට අවශ්‍ය වන බව ද ඒ සඳහා සහාය ලබාදෙන ලෙස ද ඒ මහතා චීන දූත පිරිසට පැවසීය.

Mother Sri Lanka ආයතනයේ ප්‍රගතිය ගැන අගමැති මහින්දව දැනුවත් කරයි

මහින්ද අලුත්ගෙදර

පෙර පාසල් වයසේ සිට තරුණ ප්‍රජාවන් දක්වා වර්යාවන් සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන Mother Sri Lanka ආයතනයේ වත්මන් ප්‍රගතිය මෙන්ම ඉදිරි වැඩපිළිවෙළ සම්බන්ධයෙන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා ව දැනුවත් කරයි.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා සහ Mother Sri Lanka ආයතනයේ නියෝජිතයන් අතර හමුවක් අරලියගහ මන්දිරයේ දී පෙරේදා (13) පැවැති අතර Mother Sri Lanka ආයතනයේ වර්තමාන ප්‍රගතිය හා ඉදිරි වැඩපිළිවෙළ පිළිබඳ අගමැතිවරයා දැනුම්වත් කිරීම එම හමුවේ මූලික අරමුණ විය.

2008 වර්ෂයේ ස්ථාපනය කර ඇති Mother Sri Lanka ආයතනය, වගකිව යුතු පුරවැසියකුවීම සඳහා පෙර පාසල්, පාසල් දරුවන් හා ශ්‍රී ලංකා තරුණ ප්‍රජාවේ චර්යාවන් සංවර්ධනය කිරීමට අවශ්‍ය වැඩසටහන් සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ආරම්භ වූ ආයතනයක් වන අතර මේ යටතේ පාසල් 2,600 ක Mother Sri Lanka සමාජ ගොඩනැඟීම තුළින් රාජ්‍ය, පෞද්ගලික හා අන්තර්ජාතික පාසල්වල දරුවන්ට අධ්‍යාපනික, නායකත්ව ගුණාංග වර්ධනය හා ජාතීන් හා ආගම් අතර සංහිඳියාව ගොඩනැඟීමේ, වගකිව යුතු පුරවැසියකුවීම සඳහා යොමු කිරීම ඇතුළත් ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.

අධ්‍යාපනය අමාත්‍යාංශය හා එක්ව රටපුරා පිහිටි පාසල් සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක දරුවන්ගේ විෂය සමගාමී ක්‍රියාකාරකම් හා රටට ආදරය කරන වගකිව යුතු පුරවැසියකු බිහි කිරීමට අවශ්‍ය ආකල්ප සංවර්ධනය, යුතුකම් හා වගකීම් පිළිබඳ දරුවන්ගේ මනස ගොඩනැඟීම, ජාතික අභිමානය ඇති වගකීම් සහිත පුරවැසියකු බිහිකිරීමට අවශ්‍ය වැඩසටහන් ඊට අන්තර්ගතය.

දරුවන්ගේ උසස් අධ්‍යාපනයට අවශ්‍ය මඟපෙන්වීම් සිදුකරන වැඩසටහන්, පිරිවෙන් අධ්‍යාපනය මූලික කරගත් වැඩසටහන්, පරිසරය පිරිසිදුව තබා ගැනීම හා පරිසරයට ආදරය කිරීම මූලික කරගත් වැඩසටහන් ද Mother Sri Lanka ආයතනය ක්‍රියාත්මක කරයි.

මෙහිදී Mother Sri Lanka ආයතනයේ සභාපතිනී ආචාර්ය ජානකී කුරුප්පු මහත්මියගේ හා නියෝජිත මහත්වරුන්ගේ ඉල්ලීමකට අනුව අධ්‍යාපන ඇමැතිවරයා හා ලේකම්වරයා සම්බන්ධකර ගනිමින් ඉදිරියේ දී පාසල් ළමුන් සම්බන්ධකර ගනිමින් මෙහි වැඩකටයුතු තවදුරටත් පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන මෙන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

පෞද්ගලික හා රාජ්‍ය අංශයේ අත්දැකීම් බහුල භාරකාර මණ්ඩල සාමාජිකයින් 08 දෙනෙකු මඟින් පාලනය වන මෙම ආයතනය මේ වනවිට දේශීය ව්‍යවසායකයින් නගාසිටුවීම සඳහා ද ක්‍රියාත්මක වේ.

දේශීය නිෂ්පාදන නගාසිටුවීම තුළින් ව්‍යවසායකයාට වෙළෙඳපොළ වටිනාකම ලබාදීම හා ඒ තුළින් ඔවුන්ගේ ආර්ථිකය නගාසිටුවීම, ස්වයං රැකියා හා දේශීය ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් දේශීය ව්‍යාපාර 125 ක් යටතේ, දිස්ත්‍රික්ක 8ක පවුල් 5000 ට පමණ මේ දක්වා Mother Sri Lanka ආයතනය උපකාර කර තිබෙන අතර ඒ යටතේ ක්‍රියාත්මක දේශීය ව්‍යාපාර නගාසිටුවීම සඳහා රජයේ අමාත්‍යාංශ හා ඒකාබද්ධව අවශ්‍ය, සුදුසු වැඩපිළිවෙළක් සකස් කරන්නැයි ද ඒ මහතා මෙම හමුවේ දී නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

මෙම අවස්ථාව සඳහා අගමැති ලේකම් ගාමිණී සෙනරත්, අගමැති අතිරේක ලේකම් චම්න්ද කුලරත්න, Mother Sri Lanka ආයතනයේ සභාපතිනී ආචාර්ය ජානකී කුරුප්පු, Mother Sri Lanka ආයතනයේ භාරකාර මණ්ඩල සාමාජිකයන් වන මහාචාර්ය ආනන්ද ජයවර්ධන, අද්මිරාල් තිසර සමරසිංහ, තුෂාන්ත කරුණානායක, රියාස් ෂබාන්, පියදාස මාරම්බේ මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

17-19 ව්‍යවස්ථා සංශෝධන ගෙන ඒමෙන් රනිල් හැදුවේ ජනපති බලතල අතට ගන්නයි

මන්ත්‍රී එස්.බී. දිසානායක

චන්දිමා කරුණාරත්න

19වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කර මේ රට ඉදිරියට ගෙනයෑමට ඉඩදීම ජනතාවගේ යුතුකමක් බවත් හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයත්, 17 වැනි ව්‍යවස්ථා සංශෝධනයත් ගෙන ඒමෙන් ජනාධිපති බලතල තමන් යටතට ගැනීමට උත්සාහ කළ බවත් පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.බී. දිසානායක මහතා පැවැසී ය.

ඒ මහතා මේ බව පැවැසුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු මාධ්‍ය මධ්‍යස්ථානයේ දී ඊයේ (14) පැවැති මාධ්‍ය හමුවට සහභාගී වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද පැවසීය.

19 වැනි ව්‍යවස්ථා සංශෝධනය නිසා රටේ ආරක්ෂාවත්,ආර්ථිකයත් කඩා වැටුණා. රට තුළ වංචා දූෂණ, මහ බැංකු වංචාව සිදු වුණා.

20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධව විපක්ෂයේ විවේචන තිබෙනවා. මොනම තත්ත්වයක් යටතේ වුවත් අපි කරන කිසිම දෙයකට එකඟ නොවී අපි දියත් කරන කටයුතු විවේචනය කරන ස්ථාවරයක සිටිනවා. ඒවාගේම 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිර්මාණය කළ රාජ්‍ය නොවන සංවිධාන මෙහෙයවන්නන් විවිධාකාර ස්වරූපයෙන් 20වැනි සංශෝධනය ගැන විවේචන ඉදිරිපත් කරනවා.

අපේ පක්ෂයේ සමහරු අතරත් යම් යම් විවේචන තිබුණා. නමුත් ඒ සියල්ල සමථයට පත්වී ඔවුන් යථාර්ථය තේරුම් ගෙන තිබෙනවා. හිටපු කතානායකවරයාගේ සිට මේ ගැන විවේචනය කළ අය, මෙය වැරදි විදිහට තේරුම්ගෙන එම විවේචන ඉදිරිපත් කළා. පළමුවෙන්ම විගණනය නැති වෙනවා කියා ප්‍රකාශ කළා. නමුත් විගණනය නැති වන්නේ නැහැ. ප්‍රසම්පාදන කටයුතු අහෝසි වන්නේත් නැහැ. 19න් ප්‍රසම්පාදනය , විගණනය පිළිබඳ පත් කළ කොමිසම් සභා දෙකෙන් එකක්වත් සිදු වුණේ නැහැ. නමුත් මුලසිට ම මේ රටේ ප්‍රසම්පාදනයත්, විගණනයත් සිදු වුණා. 19න් ජනාධිපති ලේකම් කාර්යාලය හා අගමැති ලේකම් කාර්යාලය කියා නම් කර තිබුණා.

19 වැනි ව්‍යවස්ථා සංශෝධනයත් 17 වැනි ව්‍යවස්ථා සංශෝධනයත් ගෙනාවේ රනිල් වික්‍රමසිංහ මහතා යි. එයින් ජනාධිපති බලතල තමන් යටතට ගැනීම බලාපොරොත්තුවක් වුණා. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ තිබූ විශේෂත්වය වුණේ ද්විත්ව පුරවැසිභාවයයි. ඊට පෙර මේ ගැන කිසිදු කතාබහක් තිබුණේ නැහැ. ඒ ද්විත්ව පුරවැසිභාවය ඇතුළත් කළේ බැසිල් රාජපක්ෂ , ගෝඨාභය රාජපක්ෂ මහත්වරු දේශපාලනයෙන් ඉවත් කරන්නයි. වයස 35 නාමල් රාජපක්ෂ වළක්වන්නයි. ජනාධිපතිවරණයට තරඟ කිරීම දෙවරකට වඩා බැහැ කියා ගෙන ආවේත් මහින්ද මහත්තයාට වැට බඳින්නයි.

19 වැනි ව්‍යවස්ථා සංශෝධනය නිසා රටේ ආර්ථිකය කඩා වැටුණා. කවදාවත් සිදු නොවූ ආකාරයේ වංචාවක් , මහ බැංකුවේ දැවැන්ත හොරකමක් සිදු වුණා. රටේ ආරක්ෂාව ඇද වැටුණා.මහින්ද රාජපක්ෂ මහතාට බලය ලැබෙන විට රටේ ණය සියයට 104යි. රටේ විරැකියාව සියයට 10 , 12 අතර තිබුණා. රටේ ආර්ථික සංවර්ධන වේගය සියයට 2ත් 3ත් අතර තිබුණා. දළ දේශීය නිෂ්පාදනය ඩොලර් බිලියන 16 අතර ප්‍රමාණයක තිබුණා. මහින්ද රාජපක්ෂ මහතා මේ සියල්ල මධ්‍යයේ රට බාරගෙන තිස් අවුරුදු යුද්ධය අවසන් කළා. රටේ ආර්ථිකය වර්ධනය කළා. 6 ලක්ෂ 40 000 සිවිරාජ්‍ය සේවය 14 ලක්ෂ 90 000 දක්වා වර්ධනය කළා.

විදේශ සංචිත ඉහළට ගෙන ආවා. අලුත් වරායවල් , අධිවේගී මාර්ග ඇතුළත්ව මහා සංවර්ධනයක් සිදු වුණා. නමුත් 2015, 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමත් සමඟ ඇද වැටුණා.

අද තත්ත්වය 2015 තිබූ තත්ත්වයටත් වඩා බරපතළයි. සංචරක ව්‍යාපාරය කඩාගෙන වැටිලා.

20 වැනි ව්‍යවස්ථා සංශෝධනය අවශ්‍ය නැහැ ,අලුත් ව්‍යවස්ථාවක් අවශ්‍ය බව සමහරු කියනවා . එහෙම වැඩකරන්න ගියොත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ පාලන කාලයෙන් හතරෙන් තුනක් ඉවර වෙයි. ඒ නිසා 20 වැනි සංශෝධනයෙන් ආරම්භ කර අලුත් ව්‍යවස්ථාවක් ගෙනඒමු. 19 ඉවත් කර මේ රට ඉදිරියට ගෙනයෑමට ඉඩදීම මේ රටේ ජනතාවගේ යුතුකමක්.

පාර්ලිමේන්තු මන්ත්‍රී ඩිලාන් පෙරේරා මහතා-

19 වැනි ව්‍යවස්ථා සංශෝධනය නිසා මේ රටේ ශිෂ්ඨත්වයක් ඇති වුණේ නැහැ. මේ රට සිංහල ,බෞද්ධ රටක් නොවේ කියන තත්ත්වයට ඒ ආණ්ඩුවේ මන්ත්‍රීවරු පත් වුණා. 19 වැනි සංශෝධනය කොහොමවත්ම ක්‍රියාත්මක කරන්න බැහැ. මොකද ව්‍යවස්ථාදායක සභාවට පත්වන සාමාජිකයන් 10 දෙනාගෙන් 5ක් පත්වන්නේ අගමැති හා විපක්ෂ කියන දෙදෙනාගේ එකඟත්වයෙන්. මහින්ද රාජපක්ෂ මහතා හා සජිත් ප්‍රේමදාස මහතා එකතු වී මේ කටයුත්ත සිදු කරන්න බැහැ.19 වැනි සංශෝධනය තියා ගන්න ගියොත් රට ඇණ හිටිනවා. අපි මේ කරන්නේ රට ඉදිරියට ගෙනයන්න අවශ්‍ය වැඩපිළිවෙළයි. ජනතාවගේ ඡන්දයෙන් පත් වූ පුද්ගලයාට අවශ්‍ය විධායක බලය නැවත ලබාදීමයි.

එහිදී මාධ්‍යවේදීන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දුන් පාර්ලිමේන්තු මන්ත්‍රී ඩිලාන් පෙරේරා මහතා,

20 සම්බන්ධව ගැටලු තිබෙන ආගමික නායකයින් සිටින්න පුළුවන්. නමුත් 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ගෙන ආ පසුව කාරක සභා අවස්ථාවේදී ප්‍රශ්න කරන්න පුළුවන්. එහිදී ආගමික නායකයන් කියන කාරණාවල යම් තාර්කික බවක් තිබේ නම් ඒ ගැන සලකා බැලීමක් කරන්න අපට පුළුවන්.

මේ මොහොතේ 20ට විරුද්ධව නැගිටින රාජ්‍ය නොවන සංවිධානවල උගුලට අහුවෙන්න එපා කියා ඉල්ලා සිටිනවා.මේ තරමට රට අරාජික වුණේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය නිසා බව එය ගෙන එන අවස්ථාවේ සිටි හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා දැන් කොමිෂන් සභාවලදී පවා ප්‍රකාශ කරනවා. 19 නිසා බල කේන්ද්‍රස්ථාන 4ක් නිර්මාණය වුණා. 20 න් එය නැති කරනවා.

වත්මන් ආණ්ඩුව පොලිස් රාජ්‍යයක් හදමින් සිටිනවා

මන්ත්‍රී එස්.එම්. මරික්කාර්

ශිවන්ති ප්‍රනාන්දු

වත්මන් ආණ්ඩුවේ ක්‍රියා කලාපය පොලිස් රාජ්‍යයක් කරා යන ගමනක් ද යන සැකය තමන්ට තිබෙන බව සමඟි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. එම්. මරික්කාර් මහතා පැවසීය.

කොළඹ විපක්ෂ නායක කාර්යාලයේ ඊයේ (14) පැවති මාධ්‍ය හමුවකට සහභාගී වෙමින් මන්ත්‍රීවරයා මේ බව පැවසුවේය.

එහිදී තවදුරටත් කතා කළ ඒ මහතා මෙසේද පැවසීය.

පළවැනි වතාවට කොවිඩ් ආ වේලාවෙත් අපි කිව්වා ඉවන්තොටුපොළ වැහුවා නම් මේක මීට වඩා පාලනය කර ගන්න තිබුණා කියලා. අපි විපක්ෂය විදිහට ඉන් පස්සේත් දිගටම කිව්වා මේක සමාජයේ තියෙන්න පුළුවන් කියලා. නමුත් ආණ්ඩුවත් ආණ්ඩුව එක්ක කයිය ගහන අනිත් අයත් කිව්වා කොවිඩ් මර්දනය කළ දෙවැනි රට අපි කියා. කොවිඩ් දෙවැනි රැල්ල ඉතාම වේගයෙන් ඇවිල්ලා අපේ සමාජය භීතියට පත් කරමින් තියෙනවා. අද අපිට හැදෙයි ද කියන අවදානමකට මේක ඇවිත් තියෙනවා. දැන් මේ වගේ වුණාම අවධානය අනිත් පැත්තට යන්න ආණ්ඩුව වෙන මොනාහරි එකක් ගේනවා. හරියට ක්‍රිකට් මැච් එකක් තියෙන කොට බඩු මිල වැඩි වෙනවා වගේ. දැන් මේ දෙවැනි කොරෝනා රැල්ල බ්‍රැන්ඩික්ස් පොකුර හරහා ආවයි කියලා කතාවක් තියෙනවා. බ්‍රැන්ඩික්ස් සමාගම වැරැද්දක් කරලා තියෙනවා නම් අනිවාර්යෙන් එයට දඬුවම් දිය යුතුයි. බ්‍රැන්ඩික්ස් සමාගම කියන දේ ඇත්ත නම් ඒ කියන්නේ ඒ හරහා කොරෝනා ඇවිල්ලා නෑ. එහෙම නම් කොරෝනා තිබ්බලා තියෙන්නේ සමාජය ඇතුළේ. ඒ කියන්නේ කොරෝනා පළවැනි රැල්ලෙන් පස්සේ ඒක සමාජයේ තිබ්බලා තියෙනවා. අපි රන්ඩම් පී.සී.ආර්. පරීක්ෂණ නොකළ නිසා මේක බ්‍රැන්ඩික්ස් සමාගම පිටින් යවන්න හදන වැඩක් කියලා අපිට හිතෙනවා. මට බ්‍රැන්ඩික්ස් සමාගම ආරක්ෂා කිරීමේ කිසිම අවශ්‍යතාවක් නෑ. නමුත් මේ කියන ඒවායේ පරස්පරතාවයන් තියෙනවා. නියැදි පී.සී.ආර්. පරීක්ෂණ නොකර ඉඳලා කයිවාරු ගසමින් ආ ගමනේදී තමයි මේ තත්ත්වය ඇති වෙලා තියෙන්නේ. ගොඩක් වෛද්‍යවරු, වෛද්‍ය සංගම් පහුගිය දවස්වල මේ වගේ අනතුරක් ඇති විය හැකි බව නිතර අනතුරු ඇඟෙව්වා. බ්‍රැන්ඩික්ස් සමාගම වැරදි නම් ඔවුන්ට දඬුවම් දෙන්න ඕනෑ. නැත්නම් ඒක බ්‍රැන්ඩික්ස් පිටින් යවන්නේ නැතුව ආණ්ඩුවේ එකේ වරද භාර ගන්න ඕනෑ. මට මතකයි ප්‍රේමලාල් ජයසේකර මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවට ගෙනා දවසේ ගව ඝාතනය නතර කරනවා කියලා ජනතාවගේ අවධානය වෙන අතකට යැව්වා. ආණ්ඩුව මේ පිළිබඳව ඉතාම පැහැදිලි පිළිතුරක් ලබා දිය යුතුයි. වරදකරුවන්ට එරෙහිව පියවර ගත යුතුයි. අද රටේ ජනතාව ආර්ථික, කායික, මානසික වශයෙන් පීඩාවට පත් වෙලා ඉන්නවා. නමුත් ඒ ගැන සත පහකට ගානක් නෑ. මොකද ජනාධිපතිවරණය ඉවර වුණු දා ඉඳන් තියෙන්නේ තුනෙන් දෙක හදලා ඒකාධිපති ව්‍යවස්ථාවක් ගෙනල්ලා තනි පුද්ගලයකුගේ අල්ලේ නටවන්න පුළුවන් රාජ්‍යයක් කරා අපේ රට ගෙනි යන්නේ කොහොමද කියන එකයි. කොරෝනා තියෙද්දී ඒකාධිපති 20 ගෙන ඒම තමයි ඒගොල්ලන්ගේ මුඛ්‍ය පරමාර්ථය.

සමඟි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී මනුෂ නානායක්කාර මහතාද මාධ්‍ය හමුවට සහභාගී විය.

දුමින්ද ශ්‍රීනාග මේජර් ජනරාල් නිලයට උසස් කරයි

ශ්‍රී ලංකා යුද හමුදාවේ ඉංජිනේරු බළකායේ මාණ්ඩලික උප ප්‍රධාන නිලධාරී ලෙස මේජර් ජනරාල් දුමින්ද ශ්‍රීනාග මහතා ඔක්තෝබර් 1වැනි දා සිය බළකා මූලස්ථානයේ දී වැඩ භාර ගත්තේය.

ඒ මහතා ගාල්ල මහින්ද විද්‍යාලයේ හා බදුල්ල මධ්‍ය මහා විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍යයෙක් වන අතර ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ උප සභාපති ලෙස ද, ශ්‍රී ලංකා යුද හමුදා පාපැදි සම්මේලනයේ සභාපති ලෙස ද කටයුතු කරයි.

1985 දී කෙඩෙට් නිලධාරියකු ලෙස හමුදා සේවයට එක්වී , ඊලාම් යුද්ධයේදී රට වෙනු වෙන් සුවිශේෂී කර්යභාරයක් කර සම්මානයට පත්‍ර වූ නිලධාරියෙකි.

කොවිඩ් ආසාදිත පොකුර අඩු වෙන්න මාස දෙකක් යා හැකි

විශේෂඥ වෛද්‍ය නිහාල් අබේසිංහ

නදී මාණික්කගේ

අවම වශයෙන් මාසයක් හෝ දෙකක කාලයක් තුළ මෙම කොවිඩ් ආසාදිත පොකුර අඩුවෙමින් යන බවත් එය වළක්වා ගැනීම සඳහා සාධනීය ක්‍රියාමාර්ග සමාජයක් ලෙස ගන්නා බවක් පෙනෙන්නට ඇති බවත් ජාතික විද්වත් සංවිධානයේ ලේකම් විශේෂඥ වෛද්‍ය නිහාල් අබේසිංහ මහතා පැවසීය.

ඒ මහතා මේ බව පැවසුවේ ඊයේ (14) ජාතික විද්වත් සංවිධානය මඟින් පවත්වනු ලැබූ විශේෂ මාධ්‍ය හමුවකදීය.

තවදුරටත් ඒ මහතා මෙසේ ද පැවසීය.

මුව ආවරණ පැලඳීම, අත් සේදීම, දුරස්ථභාවය ආරක්ෂා කිරීම ආදිය කෙරෙන බැවින් මුල් කොවිඩ් පොකුරට වඩා ඊට පසු එන පොකුරු ප්‍රමාණයෙන් අඩුයි. ඒ නිසා පැතිරීම සීමා වී තිබෙනවා.

ඉදිරියේ දී එන්නත් භාවිතයෙන් මෙය පාලනය කර ගන්නා තුරු මෙවැනි පොකුරු තව තවත් පැතිරිය හැකි. මේ තත්ත්වය ඇතිවීම වැළැක්වීමට සෞඛ්‍ය අමාත්‍යාංශයට ගැටලු කිහිපයක්ම ඇතිව තිබෙනවා.

ජාතීන් අනුව ඉඩම් මායිම් වෙන් කිරීම වත්මන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නොවේ

දෙමළ සන්ධාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හමුවේ නැඟෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් කියයි

ජාතීන් අනුව ඉඩම් මායිම් වෙන් කිරීම වත්මන් ආණ්ඩුවේ මෙන්ම තමාගේ ද ප්‍රතිපත්තිය නොවන බව නැඟෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මිය ප්‍රකාශ කළා ය.

මඩකලපුව, අම්පාර දිස්ත්‍රික් දෙක මායිම්ව පිහිටි දිවුලපතාන ප්‍රදේශයේ ඉඩම් කෘෂිකර්මාන්තය සඳහා ජනතාවට ලබාදීම පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා දෙමළ සන්ධාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් ඊයේ (14) පෙරවරුවේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට පැමිණි අවස්ථාවේදී ආණ්ඩුකාරවරිය මේ බව පැවසීය.

තවදුරටත් ආණ්ඩුකාරවරිය මෙසේද පැවසීය.

සිංහල, දමිළ හෝ මුස්ලිම් යනුවෙන් ඉඩම් වෙන් කිරීමක් සිදුව නැහැ.දේශපාලන අරමුණු වෙනුවෙන් එවැනි වෙන් කිරීම් සිදු කිරීමට උත්සහ කරන්නේ නැහැ.

එහිදී මෙම දෙමළ සන්ධාන මන්ත්‍රීවරු පිරිස ප්‍රකාශ කර සිටියේ අදාළ ප්‍රදේශය මඩකලපුවේ ජනතාව ඇති කරන ගවයන්ගේ තෘණභූමි බැවින් එම ඉඩම් කෘෂිකර්මාන්තය සඳහා ලබාදීමට ගෙන ඇති තීරණය වහාම නතර කරන ලෙසයි. එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ ආණ්ඩුකාරවරිය පෙන්වා දුන්නේ කෘෂිකාර්මික කටයුතු සඳහා මෙම ඉඩම් ලබාදීමේ අරමුණ රට ස්වයංපෝෂිත කිරීම සහ පිටරටින් ආහාර භෝග ගෙන එම අවම කිරීම සඳහා වන ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නිසා බවයි.

මෙම පිරිස දිගින් දිගටම ආණ්ඩුකාරවරියට බලකර සිටියේ මෙම ඉඩම් කෘෂිකර්මාන්තය සඳහා ලබාදීමේ දී ජනවර්ග අතර ගැටලු ඇති වන බවයි.

එය ප්‍රතික්ෂේප කරමින් 2015 වසරට පෙර එම භූමිවල වගාකළ ජනතාවට මෙම ඉඩම් ලබා දෙන්නේ කෘෂිකර්මාන්තය සඳහාම පමණක් බවත් එසේ නොමැතිව මෙම කිසිදු ඉඩමක් සින්නක්කරව ලබා නොදුන් බවත් ආණ්ඩුකාරවරිය ප්‍රකාශ කළා ය. එසේම මෙම ඉඩම් පවරාදීම හෝ අත්පත් කර ගැනීම තමාගේ වගකීමක් නොවන බවද කීවා ය.

එම පිරිස දිගින් දිගටම දැඩි ආවේගශීලිව ආණ්ඩුකාරවරියට ප්‍රකාශ කළේ තම වැසියන් ඇති කරන ගවයන්ගේ තෘණභූමි සඳහා භාවිතා කරන ඉඩම් කෘෂිකර්මාන්තය සඳහා ලබාදීමට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බවයි. එහි දී ආණ්ඩුකාරවරිය පිළිතුරු දෙමින් ජාතීන් ඉලක්ක කර ගනිමින් තමන් කිසිම අවස්ථාවක ගැටලු විසඳීමට කටයුතු නොකරන බවත් පළාතේ සිටින සියළු පුරවැසියන්ට එක හා සමානව සේවය කිරීමට තමන් බැඳී සිටින බවත් ආණ්ඩුකාරවරිය එම අවස්ථාවේ දී දැඩිව අවධාරණය කරමින් කියා සිටියා ය. මෙම ගැටලුව නිරාකරණය කිරීම සඳහා සියළු පාර්ශ්ව කැඳවා විශේෂ සාකච්ඡාවක් පැවැත්වීමට තමන් කටයුතු යොදන බවත් අනාවරණය කළා ය.

"තමුන්නාන්සේලා ලැප්ජා වෙන්න ඕනේ මේ වගේ වේලාවක මෙවැනි ඉල්ලීමක් කිරීම ගැන .මොකද කොවිඩ් - 19 නිසා අපි පිටරටින් ආහාර පාන ගෙන්වීම අවම කර රට කෘෂි කර්මාන්තයෙන් ස්වයංපෝෂිත කිරීම ජනාධිපතිතුමා ,අගමැතිතුමා ඇතුළු අපේ ආණ්ඩුවේ අරමුණයි. ජනතා වෙනුවෙන් ඒ ක්‍රියාමාර්ගවලට සහය දෙන එකයි ඔබතුමාලා කරන්න ඕනේ" ආණ්ඩුකාරවරිය වැඩිදුරටත් අවධාරණය කළාය.

එම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන රාසමාන්ක්කම් සානකියන්, ගෝවින්දන් කරුණාකරන්, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී පි. සෙල්වරාජ්, මඩකලපුව නගරාධිපති ටී.සරවනබවන් යන මහත්වරු ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

දිනමිණ
ක්‍රීඩා
2020 ඔක්තෝබර් 15 බ්‍රහස්පතින්දා
sports.dinamina@lakehouser.lk



අක්කර 10ක බිම් ප්‍රමාණයත් කුඩා වෙලා

නිසි නඩත්තුවක් නැතිව ක්‍රීඩක ක්‍රීඩිකාවෝ අසීරුවේ

කළුතර දිස්ත්‍රික්කයේ ලොකුම ක්‍රීඩාංගණය අද වල් වැදිලා

ක්‍රිකට් පුහුණු පැති විකට්ටුවේ අද තත්ත්වය

ටෙනිල් විශ්ව ශාන්ත

අසංක මංජු

සිරිසේන ලියනගේ

මීගහතැන්න සමූහ - පී. සෝමරත්න

යටත්විජිත පාලන සමයේ ලංකාවේ ප්‍රධානතම ක්‍රීඩාංගණයක් වූ තෙබුවන ක්‍රීඩාංගණය නිසි නඩත්තුවක් නැති හෙයින් මේ වන විට වල් බිහිව, විනාශ වී ගිය අයිතිකරුවන් නැති කැලෑවට ගිය බිමක් බවට පත්ව තිබේ.

දොඩංගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි මේ ක්‍රීඩාංගණය කළුතර දිස්ත්‍රික්කයේ විශාලතම ක්‍රීඩාංගණය වන අතර, එය මේ වන විට ක්‍රීඩාංගණයක් දැයි හඳුනා ගැනීමටත් නොහැකි තරමට විනාශයට ගොසිනි.

1930 දශකයේ වතු පාලකයන්ගේ ප්‍රධානතම ක්‍රීඩාංගණය ලෙස යොදාගෙන ඇත්තේ ද මේ ක්‍රීඩාංගණයයි. එම කාලයේදී වතු පාලකයන් නුවරඑළිය, දඹුල්ල ආදී ඈත ප්‍රදේශවලින් පවා සති අන්තයේ ක්‍රීඩා කිරීම සඳහා තෙබුවනට පැමිණ තිබේ. එකල ක්‍රිකට්, වොලිබෝල්, නෙට්බෝල්, ගොල්ෆ් සහ ටෙනිස් වැනි ක්‍රීඩා මෙහිදී කළ බව තෙබුවන ක්‍රීඩාංගණයේ ඉතිහාසය පිළිබඳ තතු දන්නෝ පවසති.

කළු ගඟට සමාන්තරව ඉතා දර්ශනීය පරිසරයක පිහිටි ක්‍රීඩාංගණය කැලෑවට ගියත් තවමත් බස්නාහිර පළාත් කළාප, යෞවන සමාජ ඇතුළු ක්‍රීඩා උත්සව සඳහා යොදා ගන්නේ මේ වල් වැදුණු තෙබුවන ක්‍රීඩාංගණයයි. ක්‍රීඩාගාරයක්, වැසිකිළියක්, ජලය පහසුකම් නැති ක්‍රීඩාංගණයේ එක් පසක කිරිමැටි කැපූ වළවල් කිහිපයක් දක්නට ලැබේ. අතීතයේ මේ ක්‍රීඩාංගණයට අක්කර දහයක් පමණ වෙන්ව තිබුණද අද වන විට එය ඉතා කුඩා බිම් කඩක් ලෙස සීමා මායිම් වෙනස්ව ගොසිනි.

මේ ක්‍රීඩාංගණය දොඩංගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබුණත් ප්‍රාදේශීය සභාවට නීත්‍යානුකූල අයිතියදී නැති බව ප්‍රාදේශීය සභාවේ සභාපති ටෙනිල් විශ්ව ශාන්ත මහතා පවසයි. එම නිසා ප්‍රදේශීය සභාවට ද මෙහි කටයුතු සඳහා මැදිහත් වීමට නොහැකි වී තිබේ.

"මේක සභා බල ප්‍රදේශයේ තියෙන විශාල සම්පතක්. ඒත් තවම නීත්‍යානුකූල අයිතිය අපට පැවරී නැහැ. මේ ක්‍රීඩාංගණය සංවර්ධනය කර ප්‍රදේශයේ ජනතාවට පහසුකම් සැපයිය යුතුයි. ඉදිරියේදී මේ පිළිබඳ රජයේ අවධානය යොමු කර ප්‍රදේශයට, රටට වැඩදායි ස්ථානයක් කිරීමට අවශ්‍ය කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා." ප්‍රදේශීය සභා සභාපතිවරයා කියා සිටියේය.

මේ ක්‍රීඩාංගණය අසල ව්‍යාපාර කටයුතු කරන අසංක මංජුල මහතා පවසන්නේ දැනට මෙය තෙබුවන ක්‍රීඩා සමාජය මඟින් රැක බලා ගන්නා බවයි.

"ක්‍රීඩාංගණයේ පහසුකම් කිසිවක් නැහැ. පාසල් දරුවන් ක්‍රීඩා තරගවලට රැගෙන එන ගුරුවරුන්, ගුරුවරියන් පවා වතුර ටිකක් බොන්න නැතුව, වැසිකිළියක්, කැසිකිළියක්, දරුවන්ට ඇඳුම් මාරු කර ගන්න තැනක් නැතිව අසරණ වෙනවා. දරුවෝ වතුර හොයා ගෙන කළු ගඟට බසිනවා. ඒක අනතුරුදායකයි. මෙය තෙබුවනට තිබෙන විශාල සම්පතක් වුවත් ක්‍රීඩාංගණයක් වන්නේ නමට විතරයි." මංජු මහතා කියයි.

තෙබුවන සිරිසේන ලියනගේ මහතා දැනට තෙබුවන ප්‍රදේශයේ අතීත අත්දැකීම් පිළිබඳ මතකය ඇති එකම ජීවමාන සාක්ෂියයි. අවුරුදු 93ක් වූ ඒ මහතා පවසන්නේ 1930 ගණන්වල සිට ප්‍රසිද්ධ වූ මේ ක්‍රීඩාංගණය අද කැලෑවට ගියත් මෙතන ගොල්ෆ්, ක්‍රිකට්, පාපන්දු වැනි ක්‍රීඩා කර ඇති බවයි. එදා රටේ අංක එකේ ක්‍රීඩාංගණයක් වුණත් නඩත්තුවක් නැති නිසා මේ වන විට මුළුමනින්ම විනාශ වී ඇති බවත්, ක්ලබ් එක පමණක් දැනටත් වතු සමාගම යටතේ පවතින බවත් ය.

ඡායාරූප - මීගහතැන්න සමූහ

ආසියානු කුසලාන යොවුන් තරගාවලියත් කොරෝනාට බිලි

නිරෝෂාන් ප්‍රියංකර

ආසියානු ක්‍රිකට් කවුන්සලය සංවිධාන කරන ආසියානු කුසලාන අවුරුදු 19න් පහළ එක්දින තරගාවලිය කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කල් දැමීමට තීරණය කරයි.

9 වැනි වරට සංවිධාන කරන මෙවර තරගාවලිය ලබන නොවැම්බර් මස එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සත්කාරකත්වයෙන් පැවැත්වීමට නියමිතව තිබිණි. ඒ අනුව මේ තරගාවලිය ලබන වසරේ සුදුසු කාලයකදී පැවැත්වීමට ආසියානු ක්‍රිකට් කවුන්සලයේ අවධානය යොමුව තිබේ.

මේ සඳහා ශ්‍රී ලංකාව සමඟ වත්මන් ශූර ඉන්දියාව, පාකිස්තානය, බංග්ලාදේශය, ඇෆ්ගනිස්තානය සහ සත්කාරක එක්සත් අරාබි එමීර් රාජ්‍යය එක්වන අතර සුදුසුකම් ලැබීමේ තරගාවලියෙන් කණ්ඩායම් 2ක් ද එක් වෙයි. අවසන් වරට පසුගිය වසරේ ශ්‍රී ලංකාවේ සත්කාරකත්වයෙන් මේ තරගාවලිය පැවැති අතර, එහි ශූරතාව දිනා ගැනීමට ඉන්දියාව සමත් වූයේ බංග්ලාදේශය පරාජය කරමිනි. එම තරගාවලියට මේ කණ්ඩායම් 6 සමඟ කුවේට් සහ නේපාලය එක්ව සිටියේය.

බංග්ලාදේශ ක්‍රිකට් ආයතනය 19න් පහළ නව සංවිතයක් පිහිටු වූ අතර, එහි සාමාජිකයන්ගේ පළමු පරීක්ෂාව මේ තරගාවලිය වනු ඇතැයි අපේක්ෂාවෙන් පසු වූ බවත් කොරෝනා තත්ත්වය හේතුවෙන් තරගාවලිය කල් දැමූ බවත් පවසා තිබේ.

මෙතෙක් පැවැති තරගාවලි 8 අතරින් 7 වරක් ශූරයන් වීමට ඉන්දියාව සමත් වූයේ 2012 වසරේ පාකිස්තානය සමඟින් සම ශූරයන් ද වෙමිනි. 2017 වසරේ ඇෆ්ගනිස්තානය ශූරතාව දිනා ගත් අතර, ශ්‍රී ලංකාව සිව්වරක් අනුශූරයන් වී තිබේ.

ආසියානු ක්‍රිකට් කවුන්සලය මේ වසරට සංවිධාන කරන අවසන් තරගාවලිය වන ආසියානු නැඟී එන ක්‍රිකට් තරගාවලිය එළැඹෙන දෙසැම්බර් මස රටවල් 8ක සහභාගිත්වයෙන් බංග්ලාදේශයේදී පැවැත්වීමට නියමිතය.

මින් පෙර කොරෝනා වසංගතය හේතුවෙන් ආසියානු ක්‍රිකට් කවුන්සලය සංවිධාන කරන පිරිමි සහ කාන්තා ආසියානු කුසලානයට සුදුසුකම් ලබා ගැනීමේ තරගාවලි සමඟ මේ වසරේ සැප්තැම්බර් පැවැත්වීමට නියමිතව තිබූ ආසියානු කුසලාන ජ්‍යෙෂ්ඨ පිරිමි සහ කාන්තා විස්සයි20 ශූරතාවලි ද කල් දැමිණි. එම තරගාවලියට ලබන වසරේ ජූනි මාසයේදී පැවැත්වීම පිළිබඳ ආසියානු ක්‍රිකට් කවුන්සලය අවධානය යොමු කර තිබේ.

පාකිස්තානයට එරෙහිව සිම්බාබ්වේ පිල සූදානම්

මේ මස 30 වැනිදා පාකිස්තානයේ සත්කාරකත්වයෙන් ආරම්භ වීමට නියමිත එක්දින සහ විස්සයි20 ක්‍රිකට් තරගාවලි සඳහා සිම්බාබ්වේ කණ්ඩායම නම් කරයි.

ක්‍රීඩකයන් 20 දෙනකුගෙන් සමන්විත සංචිතයේ නායකත්වය චමු චිබාබාට හිමිව ඇති අතර, 24 හැවිරිදි බ්ලෙසින් බුසරබානි නැවත කැඳවා තිබීම විශේෂත්වයකි. ඔහු කණ්ඩායමට එක් කර ඇත්තේ 2018 වසරේ පසුවය.

එමෙන්ම 24 හැවිරිදි ෆරාස් අක්‍රම්ටද පළමු වරට ජාතික සංචිතයේ ස්ථානයක් හිමිව තිබේ.

සිම්බාවේ කණ්ඩායම මේ 19 වැනිදා පාකිස්තානය බලා පිටත්ව යෑමට නියමිතය. තරග 3කින් සමන්විත එක්දින තරගාවලිය මේ මස 30, නොවැම්බර් 1 සහ 3 වැනිදා රාවල්පින්ඩිහිදීත් විස්සයි20 තරග 3 නොවැම්බර් 7, 8 සහ 10 දිනවල ලාහෝර්හිදීත් පැවැත්වීමට නියමිතය.

දෝනිලාට සැනසුම් දිනුමක්

පිට පිට පරාජයන් දෙකක් අත් කර ගෙන සිටි මහේන්ද්‍ර සිං දෝනිගේ නායකත්වයෙන් යුත් චෙන්නායි සුපර් කිංග්ස් පිල මෙවර තරගාවලියේ තෙවැනි ජයග්‍රහණය වාර්තා කිරීමට සමත් වූයේ සන්රයිසස් හයිද්‍රාබාද් පිල ලකුණු 20කින් පරාජය කරමිනි. කෙසේ වෙතත් මේ වන විට තරග 8ක් ක්‍රීඩා කර ඇති චෙන්නායි පිලට ප්‍රසාද ලකුණු සටහනේ හිමිව ඇත්තේ 6 වැනි ස්ථානයයි. චෙන්නායි පිල හමුවේ පරාජය වුවද හයිද්‍රාබාද් පිල 5 වැනි තැන රැඳී සිටී.

තරගාවලියේ 29 වැන්න ලෙස ඩුබායිහිදී පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දෙමින් චෙන්නායි පිල දුන් ලකුණු 168ක ඉලක්කය හමුවේ හයිද්‍රාබාද් පිලට රැස් කළ හැකි වූයේ ලකුණු 147ක් පමණි.

කේන් විලියම්සන් පන්දු 39කදී හතරේ පහර 7ක් සමඟ ලකුණු 57ක් රැස් කරමින් හයිද්‍රාබාද් පිල ජයග්‍රහණය කරා ගෙන යෑමට උත්සහ කළ ද සෙසු පිතිකරුවන්ගෙන් සහායක් නොලැබීමෙන් එය අසාර්ථක විය.

පන්දු යැවීමේදී ඩ්වේන් බ්‍රාවෝ සහ කරන් ශර්මා කඩුලු දෙක බැගින් දවා ගත්හ.

පළමුව පන්දුවට පහර දුන් චෙන්නායි ඉනිම ඇරඹූ සෑම් කරන් පන්දු 21කින් ලකුණු 31ක් රැස් කළ අතර, ෂේන් වොට්සන් පන්දු 38කින් ලකුණු 42ක් සහ අම්බති රයිදු පන්දු 34කින් ලකුණු 41ක් ඉනිමට එක් කළහ. නායක මහේන්ද්‍ර සිං දෝනිගේ ඉනිම ලකුණු 21කට සීමා වූ අතර, ජඩේජා හතරේ පහර 3ක් සහ හයේ පහරක් සමඟින් පන්දු 10කින් නොදැවී ලකුණු 25ක් ඉනිමට එක් කළේය. පන්දු යැවීමෙන් ද දස්කම් දැක්වූ ජාඩේජා තරගයේ වීරයා ලෙස නම් කෙරිණි.පන්දු යැවීමේදී සන්දීප් ශර්මා, ටී. නටරාජන් සහ කලීල් අහ්මඩ් අතරේ කඩුලු 2 බැගින් බෙදී ගියේය.

එල්පීඑල් දඹුල්ලෙන් යයි

නිරෝෂාන් ප්‍රියංකර

කොරෝනා වසංගතය හේතුවෙන් කිහිප වරක් කල් දැමූ ලංකා ප්‍රිමියර් ලීග් විස්සයි20 ක්‍රිකට් තරගාවලිය ලබන මස 21 වැනිදා ආරම්භ වීමට නියමිත බවත්, සියලු තරග පැවැත්වීම ක්‍රීඩාංගණ දෙකක් දක්වා අඩු කර ඇතැයි ද වාර්තා වේ.

ඒ අනුව දෙසැම්බර් මස 13 වැනිදා නිමාවට පත්වීමට සැලසුම් කර ඇති තරගාවලියට ඇතුළත් තරග 23 පල්ලේකැලේ සහ හම්බන්තොට මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී පමණක් පැවැත්වෙනු ඇත. මින් පෙර රංගිරි දඹුලු ක්‍රීඩාංගණයේදීත් තරග පැවැත්වීමට සැලැසුම් කර තිබිණි. කොළඹ බෙත්තාරම ක්‍රීඩාංගණයේ මේ වන විට අලුත්වැඩියා කටයුතු සිදු කෙරෙමින් පවතින බැවින් එම ක්‍රීඩාංගණය මේ සඳහා යොදා නොගැනීමට තීරණය කර තිබිණි.

මේ තරගාවලියේ ක්‍රීඩකයන් තෝරා ගැනීම (ලැයිස්තු සැකසීම) ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ මේ 19 වැනිදා සිදු කිරීමට නියමිත බව තරගවලියේ මෙහෙයුම් කටයුතු බාරව කටයුතු කරන ඩුබායිහී පිහිටි අයිපීජී (Innovative Production Group) සමාගම නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.

ක්‍රීඩක තෝරා ගැනීම මේ මස පළවැනිදා පැවැත්වීමට නියමිතව තිබූ අතර, කොරෝනා තත්ත්වය හේතුවෙන් පසුව මේ 9 වැනිදා දක්වාත් අනතුරුව 19 වැනිදා දක්වාත් කල් දැමිණි.

ක්‍රීඩක තෝරා ගැනීම සඳහා ජගත් ක්‍රිකට් පිටියේ ක්‍රීඩා කළ හා ක්‍රීඩා කරන විදෙස් ක්‍රීඩකයන් 75 දෙනකු සහභාගි වීමට නියමිත බව අයිපීජී සමාගම කියයි. කොළඹ, මහනුවර, ගාල්ල, දඹුල්ල සහ යාපනය ලෙස කණ්ඩායම් 5ක් තරගාවලියට එක් වන අතර, එක් කණ්ඩායමකට විදෙස් ක්‍රීඩකයන් 6 දෙනකු බැගින් ක්‍රීඩකයක් 30 දෙනකු තෝරා ගැනීමට නියමිතය.

කණ්ඩායම් පහෙන් 4කට අනුග්‍රාහකයන් එකඟතාව ප්‍රකාශ කර ඇති අතර, ඉතිරි කණ්ඩායම සඳහා අනුග්‍රාහකත්වය සැපයීමට තිදෙනක් ඉදිරිපත්ව සිටින බව පවසන ශ්‍රී ලංකා ක්‍රිකට් උප සභාපති/ එල්පීඑල් තරාගවලි අධ්‍යක්ෂ රවීන් වික්‍රමරත්න මහතා මේ තරගාවලිය තුළින් දේශීය ක්‍රීඩකයන්ට ලෝක මට්ටමේ ක්‍රීඩකයන් සමඟ ක්‍රීඩා කිරීමෙන් දක්ෂතා වර්ධනය කර ගැනීමට අවස්ථාවක් උදා වන බවත්, ශ්‍රී ලාංකික ක්‍රිකට් ලෝලීන්ට ඉණාත්මක තරගාවලියක් නැරඹීමට අවස්ථාව හිමි වන බවත් පවසයි.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් දින 14කට නිරෝධායනයකට ලක් විය යුතු අතර, එය ද මින් පෙර තරගාවලිය කල් දැමීමට හේතුවක් විය. විදෙස් ක්‍රීඩකයන්ට තරගාවලියට එක්වීම සඳහා මේ නීති ලිහිල් වනු ඇතැයි ද සංවිධායකයෝ බලාපොරොත්තු වෙති. මේ දිනවල එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පැවැත්වෙන අයිපීඑල් තරගාවලියෙන් පසු ඇතැම් ක්‍රීඩකයන් එහි සිට ශ්‍රී ලංකාවට පැමිණීමට අපේක්ෂාවෙන් සිටින බව ද වික්‍රමරත්න මහතා පැවැසීය.

ජගත් පාපන්දු සහ ගොල්ෆ් ප්‍රබලයන් 2කට කොරෝනා

පෘතුගාලයේ සුපිරි පාපන්දු ක්‍රීඩක ක්‍රිස්ටියානෝ රොනල්ඩෝට කොරෝනා වයිරසය ආසාදනය වී ඇතැයි වාර්තා වේ.

ස්වීඩනයේ පැවැත්වෙන යුරෝපා නේෂන් කුසලාන පාපන්දු තරගාවලිය අතරතුර සිදු කළ පරීක්ෂණයකින් අනතුරුව මෙලෙස රොනල්ඩෝට වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී ඇති අතර, ඔහුගේ තත්ත්වය බරපතළ නොවන බව ද වාර්තා වෙයි. රෝග ලක්ෂණ නැති වුවද ඔහු හුදෙකලා තත්ත්වයේ සිටින බව ද පෘතුගාල පාපන්දු සම්මේලනය කියා සිටී.

මින් පෙරද රොනල්ඩෝ සමඟ ඔහු නියෝජනය කරන ජුවෙන්ටස් ක්‍රීඩා සමාජයේ ක්‍රීඩකයන් කිහිපදෙනකු ස්වයං නිරෝධායනයට ලක් කර තිබිණි.

මේ අතර, ජගත් ගොල්ෆ් පිටියේ ශ්‍රේණිගත කිරීම්වල අංක එක ස්ථානයේ පසුවන අමෙරිකාවේ ඩස්ටින් ජොන්සන්ට කොරෝනා වයිරසය ආසාදන වී ඇති බවට වාර්තා වෙයි. මේ හේතුවෙන් පසුගියදා ෂැඩෝ ක්‍රික්හිදී ආරම්භ වූ සීජේ කුසලාන තරගාවලියට එක්වූ 36 හැවිරිදි ජොන්සන් ඉන් ඉවත් වී ස්වයං නිරෝධායනය සඳහා යොමුව තිබේ.

පරීක්ෂණයක් කිරීමට පෙර තමා කොරෝනා රෝග ලක්ෂණ අත්විඳින බව පවසා ඇති ජොන්සන් මේ සතියේ තරග කිරීමට බලාපොරොත්තුවෙන් සිටියදී එය බිඳ වැටුණත් තමාට තරග බිමට පැමිණීමට හැකි සෑම දෙයක්ම කරන බව ද පවසා තිබේ.

රවින්ද්‍ර ජඩේජා

නින්දාන නේත්‍රාට හෑන්ඩ්බෝල් ජය

ගාල්ල දිස්ත්‍රික් සංවාරක
ධම්දාස සිරිවර්ධන

බලපිටිය තරුණ බෞද්ධ සංගමයට වසර 75ක් පිරීම නිමිත්තෙන් සංවිධාන කළ හෑන්ඩ්බෝල් තරගාවලියේ ශූරතාව දිනා ගැනීමට නින්දාන නේත්‍රා ක්‍රීඩා සමාජය සමත් විය.

කණ්ඩායම් 9ක් එක් වූ තරගාවලියේ අවසන් තරගයේදී නින්දාන නේත්‍රා පිල හමුවේ බලපිටිය සරසවි ක්‍රීඩා සමාජය පරාජයට පත් විය. ජයග්‍රාහී නින්දාන නේත්‍රා පිලට සෙන්පති චන්ද්‍රා ජයරත්න ශූරතා පළිහ සමඟ රුපියල් විසිදාහක් ද අනුශූරයන්ට එන්.ඇස්. ද එස්. වික්‍රමසිංහ කුසලානය සමඟ රු. 10,000ක් ද පිරිනැමිණි.

ඡායාරූපය - ගාල්ල දිස්ත්‍රික් සංවාරක

අවුරුදු ගණනක් පාඩු ලැබූ ධීවර සංස්ථාව ලාභ ලබයි

විධායකයන් 19න් 13ක් ලාභ තත්ත්වයට

අතරමැදියන්ගෙන් මසුන් මිල දී ගැනීමත් නවතයි

අලෙවිසල් ජාලය පුළුල් කර පැවැති ඒවා නවීකරණයට

වසර ගණනාවකින් උසස් වීම් නොලද කාර්ය මණ්ඩලයටත් උසස්වීම්

බුද්ධිකා ඉඹුලාන

වසර ගණනාවක සිට පාඩු ලබමින් තිබූ ලංකා ධීවර සංස්ථාව ලාභ ලබන ආයතනයක් බවට පත් වී ඇත.

ලංකා ධීවර සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ ක්‍රිෂාන්ත රත්නවීර මහතා පැවැසුවේ ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතාගේ මඟපෙන්වීම යටතේ මෙම ලාභ අත්පත් කරගෙන ඇති බවයි.

රටම ආවරණය වන පරිදි ලංකා ධීවර සංස්ථා විධායකයන් 19ක් පමණ ක්‍රියාත්මක වුවද ඉන් බහුතරයක් පාඩු ලබන තත්ත්වයේ පසු වූ අතර වත්මන් පාලනාධිකාරිය ඒ සම්බන්ධ නිසි ක්‍රමවේදයක් අනුගමනය කරීම තුළින් ඉතා කෙටි කලකින් විධායකයන් 19න් 13ක් ලාභ උපයන මට්ටමට පත් වී ඇති බවත් අනෙක් විධායකයන් 5 ද ඉතා කෙටි කලකින් ලාභදායී මට්ටමට වර්ධනය කිරීම සඳහා ක්‍රමවේද සකස් කර ඇති බවත් වාර්තා වේ. පසුගිය රජය පැවැති සමයේ ධීවර සංස්ථාවේ මාසික මත්ස්‍ය අලෙවිය ටොන් 317ක් පමණ විය. අද වන විට මසුන් ටොන් 100කින් එය ඉහළ නංවා ඇති අතර, තවත් මසුන් ටොන් 100කින් මාසික මත්ස්‍ය අලෙවිය ඉහළ නැංවීමට කටයුතු කිරීම තුළින් ධීවර සංස්ථාව අලෙවි ඉලක්ක පසු කර ගොස් තිබේ.

දැනටමත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව (සතොස) වරාය අධිකාරිය සහ රජයේ රෝහල් සඳහා ද මත්ස්‍ය අවශ්‍යතා සඳහා ධීවර සංස්ථාව විසින් මසුන් සපයනු ලබන අතර සෙසු රාජ්‍ය ආයතන සඳහාද ඉදිරියේ දී මත්ස්‍ය අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන බව කළමනාකාර අධ්‍යක්ෂ ක්‍රිෂාන්ත රත්නවීර මහතා පැවසීය.

ලංකා ධීවර සංස්ථාව පාඩු ලැබීමට හේතුවක් වූ අතරමැදියන්ගේ මසුන් මිල දී ගැනීමේ ක්‍රමවේදයෙන් ඉවත් වී වත්මන් පාලන අධිකාරිය විසින් වැල්ලට ගොස් මත්ස්‍ය අස්වැන්න මිල දී ගැනීමට පියවර ගැණිනි.

තවද වර්තමානය වන විට මසුන් බෙදා හැරීමේ කටයුතු පහසු කර ගැනීම සඳහා ලොරි රථ 05ක් මිල දී ගැනීමට අවශ්‍ය ටෙන්ඩර් ද මේ වන විට කැඳවා ඇති අතර, ජනතාවගේ පහසුව උදෙසා මසුන් මිල දී ගැනීමේ අලෙවිසල් ජාලය පුළුල් කිරීම සඳහා 87ක් වූ අලෙවිසල් 98ක් දක්වා වර්ධනය කර ඇත. මෙම වසර තුළ මේ වන විට නව අලෙවිසල් 11ක් පමණ විවෘත කර තිබේ. මේ අතර, පැවැති වෙළෙඳසල් සුපිරි වෙළෙඳසල් බවට නවීකරණය කිරීමට ද පියවර ගෙන ඇත.

මෙතෙක් වසර ගණනාවකින් උසස් වීම් නොලැබුණු කාර්ය මණ්ඩලයට වත්මන් කළමනාකාරිත්වය යටතේ උසස්වීම් ලබා දීමට ද පිළිවෙළක් සකස් කර ඇත.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රත්නවීර මහතා අවධාරණය කර සිටියේ, කරවල ආනයනය මේ වන විට සීමා වී ඇති බැවින් දේශීය කරවල නිෂ්පාදනය ධීවර සංස්ථාව මඟින් සිදු කරවීම සඳහා කරවල සැකසුම් ඒකකයක් ආරම්භ කිරීමටත් ඒ සඳහා අවශ්‍ය වැකුම් යන්ත්‍රයක් රුපියල් මිලියන 4ක මුදලකට මිල දී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු ද මේ වන විට සිදු කරමින් පවතින බවත්ය. මෙමඟින් පාරිභෝගිකයාට ගුණාත්මක බවින් යුත් මසුන් සහනදායී මිල යටතේ ලබා ගැනීමට හැකි වන බව ද හෙතෙම කියා සිටියේය.

සමුගෙන ගියත් අමතක නොවන කමනි...

කමනි අපෙන් සමුගෙන වසරකි. වයස හැට එක නික්ම යෑමට තරම් වයසක් නොවූව ද ඇය නික්ම ගියාය. දෙවයේ හැටි එසේය.

කමනි අල්විස් නම් ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදිනිය එඩිතරය. එඩිතර බවේ සංකේතයක් අවශ්‍ය නම් ඒ සඳහා මා නම් කරන්නේ කමනිය. ඇය බිය නම් කුමක්දැයි හඳුනාගෙන නොසිටියාය. මා මේ ලියන්නේ අතිශයෝක්තියක් යැයි සිතන්නේ කමනි හොඳින් නොහඳුනන අයයි. කියන්න තිබෙන දේ ඇය කෙලින්ම ඕනෑම කෙනාගේ මුහුණට පැවසුවාය. ආයතනයේ ඉහළම නිලධාරියා වුවද ඇයට කම් නැත. ඒ, මා දන්නා කමනිය.

කොළඹ උපන් කමනි අධ්‍යාපනය ලැබුවේ කොළඹ විශාකා විද්‍යාලෙනි. පත්තර කලාවටම උපන් ඇය ඒ සඳහා අත්පොත් තැබුවේ ටයිම්ස් කන්තෝරුවෙන් මුද්‍රණය කළ ලංකාදීප පුවත්පතෙනි. පසුව විජය පුවත්පත් ආයතනයේ සිරිකත පුවත්පතට ද සේවය කළ කමනි ලේක්හවුස් ආයතනයට එක් වූයේ 1990 වසරේ මා එහි පා තැබීමට මාස කිහිපයකට පෙරය. මුලින්ම දිනපතා සවස මුද්‍රණය කෙරුණු ජනතා පුවත්පතේ සේවය කළ ඇය ඉන් වසර දෙකකට පමණ පසු දිනමිණට එක් වූවාය. මට වඩා වසර ගණනාවක්ම වැඩිමහළු වූ කමනිත් මාත් නොබෝ දිනකින්ම කලණ මිතුරියන් බවට පත් වූයේ අප එකම පාසලේ සිප්සතර හැදෑරූ නිසා නම් නොවිණි. කමනි අනං මනං විකාර නොඉවසුවාය. ගොටු ඇල්ලීම ඇයගේ ව්‍යක්තිය ජීවිතයේ නොවිණි. ඉතාම ප්‍රතිපත්තිගරුක වූ ඇය වාසි පැත්තට අලඟු නොතැබුවාය. ඇය අවංක, විශ්වාස තැබිය හැකි චරිතයක් වූවාය. ඇය ඇසුරු කළේ ද ඒ හා සමානයන්ය. ඇය වැනි මිතුරියක් ලැබීම සැබවින්ම වාසනාවකි.

රාජකාරි වේලාවේදී ඇගේ එකම රාජකාරිය රැකියාවම පමණක් විය. ඇය පෞද්ගලික ජීවිතයේ කාලයද රැකියාව වෙනුවෙන් වෙන් කිරීමට පසුබට නොවූවාය. 2013 වසරේදී ලේක්හවුස් ආයතනයෙන් විශ්‍රාම ගිය කමනි විජය පුවත්පත් ආයතනයේ ලංකාදීප පුවත්පතට එක් වූවාය. ඇය නැවතත් ලේක්හවුසියට එක් වුණේ 2015 ජුනි 17 වැනිදාය. එදින ඇයගේ 57 වැනි උපන් දිනය යෙදී තිබිණි. උපන් දිනයට ඇයට ලැබුණු හොඳම තෑග්ග යළි ලේක්හවුසියේ සේවය කිරීමට ලැබීම විය.

එදින සිට ඇය රෝහී වී රෝහල්ගත වූ පසුගිය වසරේ ඔක්තෝබර් 16 වැනිදා දක්වාම ඇය හදවතින්ම කැප වී දිනමිණ වෙනුවෙන් රාජකාරිය ඉටු කළාය. එවකට ළඟ ළඟ එමින් තිබූ ජනාධිපතිවරණයේ අපේක්ෂකයකු වූ සජිත් ප්‍රේමදාස මහතාගේ මාධ්‍ය මෙහෙයුම් කාර්යාලයේ එදින උදයේ පැවැති මාධ්‍ය හමුවකට ගොස් කමනි යළි කාර්යාලයට පැමිණියේ තදබල උදර වේදනාවක් ද සමඟිනි. වහාම වෛද්‍යවරයකු වෙත යා යුතු බවට මා කළ යෝජනාව ඇය ප්‍රතික්ෂේප කළේ "ගිය වැඩේ ප්‍රවෘත්ති තුනක් ලියන්න තිබෙනවා." යැයි පවසමිනි. ශරීර වේදනාව තබාගෙනම ඇය සිය ව්‍යක්තිය වගකීම ගැන සිතුවාය. ඇයගේ උදර වේදනාව ඇයගේ මුහුණෙන් පෙනුණු බැවින් වහාම ඇය රෝහල වෙත පිටත් කළෙමි.

ඇය එදා කාර්යාලයෙන් පිටව ගියේ යළි එහි නොඑන්නටය. එලෙස පිටත්ව යන වේලාවේ දී ඇය හෝ මා එය දැන සිටියේ නැත. ඔක්තෝබර් 18 වැනිදා ඇය අප සැම අතැර දෙනෙත් පියා ගත්තාය. කමනි ගැන ලියන්න බොහෝ දේ තිබේ. ඇයගේ ව්‍යක්තිය හා සබැඳුණු ඉන් එක් සිද්ධියක් පමණක් සඳහන් කරන්නට සිතමි.

රණසිංහ ප්‍රේමදාස මහතා ජනාධිපතිවරයාව සිටි සමයේදී බිහිසුණු ත්‍රස්තවාදී එල්.ටී.ටී.ඊ. සංවිධානය දරුණු ලෙස ප්‍රහාර එල්ල කරමින් තිබිණි. කොළොන්නාව තෙල් ටැංකි පරිශ්‍රයට එක් රාත්‍රියක ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල විය. එවකට කමනි ආවරණය කළේ ආරක්ෂක ප්‍රවෘත්තිය. සිද්ධිය දැන ගත් වහාම නිවෙසේ සිටි කමනි වහාම සිය සැමියා වූ එවකට සිළුමිණ පුවත්පතේ මාධ්‍යවේදී සුනිල් දයා අල්විස් සහ ඩේලි නිවුස් පුවත්පතේ සරත් මලලසේකර සමඟ සතුරු ප්‍රහාර එල්ල වූ ස්ථානයට ගියේ සැබෑ පත්තරකරුවන්ගේ වගකීම ඉටු කරමිනි.

ඔවුන් එහි ළඟා වන විටත් ත්‍රස්තවාදී ප්‍රහාර නතර වී නොතිබිණි. ජීවිතය පරදුවට තබා කමනි සිද්ධිය වාර්තා කිරීමට කරුණු ගොනු කරමින් සිටියාය. සැණින් නැවතත් ත්‍රස්ත ප්‍රහාර එල්ල වන්නට විය. "බිම දිගා වෙන්න." ආරක්ෂක හමුදා විධාන ලැබිණි. කමනි එදා දිවි බේරා ගත්තේ අනූ නවයෙනි. ඇයගේ ඒ කැපවීම සඳහා සහෝදර මාධ්‍ය ආයතනවලින් උපහාර ලැබුණ ද තම ආයතනයෙන් ඇයට ලැබුණු දෙයක් ඇත්දැයි නොදනිමි. කමනිට ඉක්මනින් කේන්ති යනවා යැයි බොහෝ දෙනා සිතති. ඒත් ඇයට කේන්ති යන්නේ අසාධාරණයටය. අනං මනං කෝලම්වලටය. තමන් අදහන ප්‍රතිපත්තිය වෙනුවෙන් නොබියව පෙනී සිටියද ඉන් ඇයට ලැබුණු දෙයක් නොමැත.

කමනි සිය ආදරණීය සැමියා වෙනුවෙන් සිදු කළ කැපවීම් ගැන කිව යුතුමය. සුනිල්ට හෘදාබාධයක් වැළඳී සැත්කමක් සිදු කිරීමට සිදු වූ අවස්ථාවේ දී කමනි නමැති ධෛර්ය සම්පන්න කාන්තාව හොඳින්ම මා දුටුවෙමි. ඉන් පසුව ද සුනිල්ට වැලඳුණු රෝගාබාධ සුවපත් කර ගැනීම වෙනුවෙන් ඇය කැප වී සිටියාය. 2018 වසරේදී එවකට අගමැතිවරයාගේ ඉන්දීය නිල සංචාරය දිනමිණ පුවත්පත වෙනුවෙන් ආවරණය කිරීමට යෑමට ඇයට ලබා දුන් අවස්ථාව ද ඇය ප්‍රතික්ෂේප කළේ සුනිල් අසනීප නිසා දමා යෑමට නොහැකි බව පවසමිනි. ගීතක පුතු ද සුචිනි දියණිය ද සිය පියාණන් වෙනුවෙන් කැප වී සිටිය ද සුනිල්ට කමනි නොමැති අඩුව නොඅඩුව දැනෙනු ඇත.

කමනි මිය ගියා යැයි නොසිතේ. තවමත් ඇයගේ මතකයන් සිතේ සැරිසරන්නේ ජීවමාන කමනි ලෙසින්මය. යළි යළි සිය ළඟැදියන් සමඟ සසර සැරිසැරීම කමනිගේ පැතුම දැයි නොදනිමි. සසර ගමනේ ඇය පැතූ දෙයක් වේද එය ඉටු වේවායි පතමි.

ශිරෝමි අබයසිංහ

අමරපුර - රාමඤ්ඤ සංඝ සභාවල ඉල්ලීම සලකා - 20 සම්මතය ඉවත දමන්න

ඒජාපය ජනපති හා අගමැතිගෙන් ඉල්ලයි

මැද කොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ

අමරපුර - රාමඤ්ඤ සාමග්‍රී සංඝ සභාවෙන් නිකුත් කළ නිවේදනයට අනුව මේ මාසය තුළ ඉදිරිපත් කිරීමට යෝජිත 20 වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත නොකරන ලෙස එක්සත් ජාතික පක්ෂය ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගෙන් හා මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යවරයාගෙන් රඹුක්කන එ.ජා.ප. ප්‍රධාන සංවිධායක සන්දිත් සමරසිංහ මහතා ඉල්ලා සිටියේය.

සන්දිත් සමරසිංහ මහතා මේ බව ප්‍රකාශ කළේ පෙරේදා (13) පිටකෝට්ටේ සිරිකොත මන්දිරයේදී පැවැති එ.ජා.ප. මාධ්‍යය හමුවේදීය. මාධ්‍යවේදීන් විසින් නඟන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් හෙතෙම වැඩිදුරටත් මෙසේද පැවසීය.

"අමරපුර හා රාමඤ්ඤ නිකායන් විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශය ගැන එම නිකායන් දෙකටත් පූජනීය සංඝරත්නයටත් ස්තුතිය පුද කරනවා. උන්වහන්සේ කටයුතු කරන්නේ රටත් ජාතියත් ආගමත් බේරා ගන්නා අරමුණිනුයි. ඒ සඳහා ගම්මට්ටමින්, දිසා මට්ටමින් හා පළාත් මට්ටමින් රටේ ජනතාවට කරුණු දැක්වීමට අප සමඟ එකතු වන ලෙස අනෙකුත් දේශපාලන පක්ෂ හා විවිධ බහුජන සංවිධානවලට ඇරයුම් කරනවා.

"20 වැනි සංශෝධනය සම්මත වුණොත් ඒකාධිපතිවාදයට මාවත කැපෙනවා. සියලු බලතල ජනාධිපතිවරයාට හිමි වෙනවා. කොමිෂන් සභා පත් කරනු ලබන්නේ ජනතාවට උවමනා අන්දමටයි. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය තුළින් විශාල සේවාවන් රැසක් රටට සිදු කළ නමුත් 20 වැනි සංශෝධනය සම්මත වුණොත් රටේ දැනට පවතින මාධ්‍ය නිදහස පවා නැති වෙනවා."

ඔයාමඩුව ඖෂධ කර්මාන්තපුරයෙන් බිලියන 40ක් රටට ඉතිරි වනවා

සේලයින් සියයට 100ක් ලංකාවේ හදා අතිරික්තය රට යවන්නත් පුළුවන්

රාජ්‍ය ඇමැති, මහාචාර්ය චන්න ජයසුමන

සන්ධ්‍යා කරුණාරත්න

අනුරාධපුර ඔයාමඩුව ගම්මානයේ ඉදිකිරීමට යෝජිත ඖෂධ කර්මාන්තපුරයෙන් රුපියල් බිලියන 40ක මුදලක් මෙරටට ඉතිරි කර ගත හැකි බව ඖෂධ නිෂ්පාදන, සැපයීම හා නියාමනය රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන මහතා පැවැසුවේය.

මෙරට රෝගීන්ට අවශ්‍ය ප්‍රතිජීවක ඖෂධ, වේදනා නාශක, පිළිකා ඖෂධ, ස්නායු රෝගවලට අවශ්‍ය ඖෂධ නිෂ්පාදනය මෙම කර්මාන්තපුරයෙන් සිදු කරන බවත් ඖෂධ කර්මාන්තපුරය ඉදි කිරීම සඳහා දේශීය ආයෝජකයන් 10ක් ඉදිරිපත්ව ඇති බවත් රාජ්‍ය ඇමැතිවරයා ප්‍රකාශ කළේය.හෙතෙම පෙන්වා දුන්නේ, මෙරටට අවශ්‍ය ඖෂධවලින් සියයට 85ක්ම දැනට ගෙන්වනුයේ පිටරටින් බවයි. ඔයාමඩුව ඖෂධ කර්මාන්තපුරය ඉදි කිරීමෙන් පසුව නිෂ්පාදනය කරන අතිරික්ත ඖෂධ පිටරටට යැවීමට පියවර ගන්නා බවද රාජ්‍ය ඇමැතිවරයා සඳහන් කළේය.

කර්මාන්තපුරය ඉදිකිරීමට එක්ව සිටින දේශීය නිෂ්පාදකයන් අප්‍රිකානු කලාපයේ රටවල් සමඟ සම්බන්ධතා පවත්වන පිරිසක් නිසා ඉතා පහසුවෙන් මෙම ඉලක්කය ජය ගත හැකි යැයි ද කර්මාන්තශාලා ඉදිකිරීමේ දී එහි භෞතික සැලැස්ම බලා කර්මාන්තශාලා ආරම්භ කළ යුතු අතර දැනට පවතින පරිසරයට කිසිම හානියක් නොකළ යුතු යැයි ද හෙතෙම පෙන්වා දුන්නේය. පසුගිය කාලය තුළ දී මෙරට වරින් වර ඇති වූ ඖෂධ හිඟයට මෙම කර්මාන්තපුරය තිරසාර විසඳුමක් වනු ඇති බවත් රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකේම සහාය ලබාගෙන මෙම වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම රජයේ අරමුණ බවත් හෙතෙම පැවැසුවේය.

මෙරටට අවශ්‍ය සේලයින් නිෂ්පාදන කටයුතු මහනුවර පල්ලෙකැලේ කර්මාන්තපුරයේ දී පෞද්ගලික අංශයේ ද දායකත්වය ඇතිව පසුගිය සතියේ දී ආරම්භ වූ බවත් රටට අවශ්‍ය සේලයින් නිෂ්පාදනයෙන් සියයට 100ක් මෙහි නිෂ්පාදනය කරන අතර අතිරික්තය අපනයනය කිරීමට සැලසුම් කර ඇති බවත් ඇමැතිවරයා කීය. ඔහු තවදුරටත් පැවසුවේ, පෙරේ තාක්ෂණික ඉන්සියුලින් නිෂ්පාදන කම්හලක් හා මෙරට පිහිටි විශාලම පෞද්ගලික ඖෂධ කම්හල හෝමාගම පිටිපන ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණික උද්‍යානයේ පිහිටුවා ඇතැ බවත් ජනාධිපතිවරයාගේ සංකල්පයට අනුව ඉදිරි වසර හතර තුළ දී මෙරටට අවශ්‍ය බටහිර ඖෂධවලින් රට ස්වයංපෝෂිත කිරීමේ වැඩපිළිවෙළක් සකසා ඇති බවත්ය.

රාජ්‍ය ඇමැති චමල්, මාලදිවයින් මහ කොමසාරිස් හා එ.ජා. මෙරට නියෝජිත අතර හමුවක්

චන්දිමා කරුණාරත්න

වාරිමාර්ග අමාත්‍ය, අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා, මාලදිවයින් මහ කොමසාරිස් ඔමාර් අබ්දුල් රාසික් මහතා සහ එක්සත් ජාතීන්ගේ මෙරට නේවාසික නිත්‍ය නියෝජිත හනා සින්ගර් මහත්මිය අතර හමුවක් පෙරේදා (13) එම අමාත්‍යාංශයේ දී සිදු විය.

එම අවස්ථාවට සංක්‍රමණය සඳහා වන අන්තර්ජාතික සංවිධානයේ මෙරට ප්‍රධානී සරත් ධාෂ් මහතා ද සහභාගී වී සිටියේය.

නිදහස් අධ්‍යාපනයේ පියාගේ 136 වැනි ජන්ම දිනය සැමරේ

සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර ශ්‍රීමතානන්ගේ 136 වැනි ජන්ම දින සැමරුම වෙනුවෙන් කන්නන්ගර පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීම අධ්‍යාපන ඇමැති, මහාචාර්ය ජී.එල්. පීරිස් මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (13) සිදු කෙරිණි. එම අවස්ථාවට රාජ්‍ය අමාත්‍යවරුන් වන ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත්, විජිත බේරුගොඩ, පියල් නිශාන්ත ද සිල්වා, විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොළ යන මහත්ම මහත්මිනු ද, අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතා ඇතුළු එම අමාත්‍යාංශයේ ජ්‍යේෂ්ඨ නිලධාරිනු රැසක් ද එක්ව සිටියහ.

යථාවත් කළ ස්වයංක්‍රීය විදුලි ලාම්පුවලින් සංඥා දෙන හන්දි මෙන්න

නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ

රක්ෂණ ශ්‍රියන්ත

ස්වයංක්‍රීයව යථාවත් කළ විදුලි ලාම්පු මඟින් ප්‍රදේශ කිහිපයක වාහන ගමනාගමනය සඳහා සංඥා ලබා දීම සිදු කරන බවත් පොලිස් නිලධාරීන් විසින් එම ස්ථානවල හස්ත සංඥා මඟින් වාහන හැසිරවීම ඊයේ (14) දින සිට සිදු නොකරන බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පැවසීය.

උදැසන කාලයේ කොළඹ නගරය දෙසට විශාල වාහන තදබදයක් පවතින අතර, සවස් කාලයේ කොළඹ නගරයෙන් පිටතට විශාල වාහන තදබදයක් පවතින බවත් එම හේතුව නිසා පොලිස් නිලධාරීන් ස්වයංක්‍රීය සංඥා ලාම්පු නිවා දමා ඔවුන් විසින් ලබා දෙනු ලබන හස්ත සංඥා මඟින් වාහන හැසිරවීම සිදු කළ බවත් පවසන පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා එසේ සිදු කළේ ස්වයංක්‍රීය සංඥා හේතුවෙන් ඇතැම් මාර්ගවල තදබදයක් ඇති වීම හේතුවෙන් බව ද පෙන්වා දුන්නේය.

මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා පොලිස් රථවාහන අංශයේ නිලධාරීන් විසින් කරන ලද සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙස මෙසේ පෙරේදා (14) දින සිට ස්වයංක්‍රීයවම ක්‍රියාත්මක වන ආකරයට සංඥා ලාම්පු ක්‍රියා කිරීමට තීරණයක් ගෙන තිබේ. ඒ අනුව උදැසන 6.00 සිට මෙම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බවත් වෙනදා මෙන් පොලිස් නිලධාරීන් සංඥා ලාම්පු නිවා දමා ඔවුන් විසින් සංඥා නොකරන බවත් ස්වයංක්‍රීය ආකාරයට යථාවත් කළ විදුලි ලාම්පු ක්‍රියාත්මක කෙරෙන බවත් නියෝජ්‍ය පොලිස්පතිවරයා කියා සිටියේය. ඒ අනුව පානදුර සිට විලියම් හන්දිය දක්වා ඇති පාණදුර, මොරටුව, කටුබැද්ද හන්දිය, අඟුලාන හන්දිය, බොරුපන හන්දිය, බෙලෙක් කඩේ හන්දිය, මැලිබන් හන්දිය, ටෙම්පල්ස් පාර හන්දිය, දෙහිවල ගුවන් පාලම හන්දිය, විලියම් හන්දිය යන ස්ථානවල ඇති සංඥා ලාම්පු, කොළඹ හොරණ මාර්ගයේ කැස්බෑව සිට කොහුවල හන්දිය දක්වා ඇති කැස්බෑව අතුරු මාර්ගය, පිලියන්දල, ජාලියගොඩ, බෝකුන්දර හන්දිය, බොරලැස්ගමුව හන්දිය, රත්නනපිටිය හන්දිය, පැපිලියාන හන්දිය සහ කොහුවල හන්දිය යන ස්ථානවල ඇති විදුලි සංඥා ලාම්පු ක්‍රියාත්මක වේ.

මාලඹේ මාර්ගයේ මාලඹේ හන්දිය, කොස්වත්ත හන්දිය, බත්තරමුල්ල හන්දිය, ඇතුල් කොටටේ හන්දිය සහ රාජගිරිය හන්දිය යන ස්ථානවල ඇති සංඥා ලාම්පු ද මේ අනුව යථාවත් කර ක්‍රියාත්මක කෙරේ. කොටටාව බත්තරමුල්ල මාර්ගයේ තලවතුගොඩ හන්දියේ සහ පාලම්තුන හන්දියේ ඇති මාර්ග සංඥා ලාම්පු මෙන්ම තලවතුගොඩ නුගේගොඩ මාර්ගයේ කිඹුලාවල හන්දියේ ඇති සංඥා ලාම්පු ද බේස්ලයින් මාර්ගයේ කැලණිතිස්ස හන්දිය, ඔරුගොඩවත්ත මංසන්දිය, ඉන්ද්‍රජී හන්දිය, දෙමටගොඩ හන්දිය, බන්ධනාගාර හන්දිය, බොරැල්ල හන්දිය, ඩී.එස්. හන්දිය, කනත්ත හන්දිය, පොලිස් ගරාජය ඉදිරිපිට හන්දිය, කිරිමණ්ඩල මාවත හන්දිය, නාරාහේන්පිට හන්දිය, පොල්හේන්ගොඩ හන්දිය යන ස්ථානවල ද සංඥා ලාම්පු අනුව වාහන ගමනාගමනය සිදු කළ යුතුය. නුවර මාර්ගයේ තොරණ හන්දිය සහ මීගමුව මාර්ගයේ මහබාගේ හන්දිය යන ස්ථානවල පිහිටා ඇති සංඥා ලාම්පු ද මෙසේ ස්වයංක්‍රීයවම ක්‍රියාත්මක කිරීමට සලස්වා ඇත.

■ ප්‍රසාද් පුර්ණමාල් - පුත්තලම දිසා සමූහ

වැලි ජාවාරමට එරෙහිව මුගුණුවටවන උද්ඝෝෂණ

දැනමිණ දිසත දස අත ම එක තැන

මාදම්පේ මුගුණුවටවන ඇතුළු ප්‍රදේශ කීපයක ජනතාව මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වට කරමින් උද්ඝෝෂණයක නිරත වුයේ මුගුණුවටවන ප්‍රදේශයේ සිදුකරන මහා පරිමාණ වැලි කැණීමකට විරෝධය පල කරමිනි . මේ පිළිබඳ විශේෂ සාකච්ඡාවක් මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවති අතර ඒ සඳහා භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයේ නිලධාරීන් , වයඹ පරිසර අධිකාරියේ නිලධාරීන් , මාදම්පේ ප්‍රාදේශීය ලේකම් චානක ප්‍රේමසූරිය මහතා ඇතුළු රජයේ නිලධාරීන් පිරිසක් සහභාගීවූහ.

මේ පරිසර විනාශය පෙන්වා දීම සඳහා ප්‍රදේශයේ පරිසර සංවිධාන නියෝජිතයන් , බෞද්ධ කතෝලික ආගමික නායකයන් හා මේ පරිසර විනාශය නිසා විපතට පත්ව ඇති ජනතාවගෙන් කොටසක්ද සහභාගී වුහ .

මේ සාකච්ඡාව ඉතා උණුසුම් මුහුණුවරක් ගත් අතර රජයේ නිලධාරීන් අවස්ථා කීපයකදීම ජනතාවට කතා කිරීමට පවා ඉඩ ලබා නොදීම හේතුවෙන් ගැටලුකාරී තත්ත්වයක් මතු විණි . මෙහිදී පොලිසිය මැදිහත්ව ජනතාවටද කතා කිරීමට අවස්ථාව සලසා දුන් අතර මේ තත්ත්වය ප්‍රදේශයේ ආගමික නායකයන්ගේ දැඩි දෝෂ දර්ශනයට ද ලක්විණි .

මේ රැස්වීම සඳහා පැමිණි නිලධාරීන් මධ්‍යම පරිසර අධිකාරිය හා හලාවත ප්‍රාදේශීය සභාව හැල්ලුවට ලක් කරමින් කතා කළ අතර මේ ආයතන දෙකට වැලි කැණීම් නතර කිරීමට හෝ අවසර දීමට කිසිදු බලයක් නොමැති බවද පැවසීය .

මේ ප්‍රදේශයේ සිදුකරන වැලි කැණීම් සඳහා වයඹ පරිසර අධිකාරියේ පමණක් අනුමැතිය ප්‍රමාණවත් බව භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයෙන් පැමිණි නිලධාරියා පැවසීය .

ඔවුන් වැඩිදුරටත් ප්‍රකාශ කළේ ජනාධිපති ලේකම්වරයාගේ උපදෙස් පරිදි ක්‍රියා කරන බවයි. තමන් ක්‍රියාත්මක විය යුතු බවයි . ඒ අනුව වැලි කැණීම් සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට දින 10 ක් තුළ ඒ සඳහා අනුමැතිය ලබා දිය යුතු බවද පැවසිය .

■ රාහුල් සමන්ත හෙට්ටිආරච්චි - අම්බලන්තොට සමූහ

වන අලියකු මෝටර් රියට පහර දෙයි

හම්බන්තොට ගොන්නොරුව මාර්ගයේ කැළණි ගම වැව ආසන්නයේදී වනඅලියකු වාහනයකට පහරදී එම වහනය පෙරලා දමා තිබේ.

මසක පමණ කාලයක සිට තුවාල ලබා රෝගාතුරව සිටින මෙම වන අලියාට වනජීවී නිලධාරීන් විටින් විට ප්‍රතිකාර ලබාදෙමින් සිටින අතර අලියා එම වැව ආසන්නයේම සිටින බවයි ප්‍රදේශයේ ජනතාව කියා සිටින්නේ.

කෙසේනමුත් එම ස්ථානයෙන් පසුගියදා මෝටර් රථයකින් ගමන් ගත් පිරිසක් වන අලියා දැක බියවී වහනය නතරකර වෙනත් වාහනයකට නැග ඇති අතර පසුව වන අලියා විසින් එම මෝටර් රථයට පහරදී පෙරලා දමා තිබේ.

■ රත්තොට සමූහ කිංස්ලි රිචඩ් ද සිල්වා

දිවියකු නිසා ජනතාව මර බියෙන්

මාස කීපයක සිට වරින්වර ලග්ගල ගුරුවෙල ගම්මානයේ හා ඒ අවට ප්‍රදේශවල සැරිසරන දිවියකු නිසා ගම්වැසියන්ගේ දෛනික කටයුතු මහත් හිරිහැරයකට පත්ව ඇත. හිටි ගමන් ගම් වදින දිවියා සති ගණනක් නිඟඩව සිට යළි ගමට එන බව පවසති.

ගමේ සිටින සතුන් මරණ අතර මෙම තත්ත්වයට මේ වන විට කිසිදු පියවරක් ගෙන නොමැත.

■ ටී.කේ.මහින්ද - වැලිගම සමූහ

පොල්හේනේ ග්‍රීස් යකෙක්

මාතර පොල්හේන හා පරමුල්ල ප්‍රදේශයේ පසුගිය කාලය තුළ පුද්ගලයකු සැරිසරණ අයුරු දැක ගම්වැසියන් බියට පත්ව ඇත. මෙම පුද්ගලයා නිවාස වලට එන අතර නිවැසියන් දුටු විට එක වරම නොපෙනී යන බව ප්‍රදේශවාසීහු පෙන්වා දෙති. මෙම පුද්ගලයා මීට පෙර දිවයිනේ සෙසු ප්‍රදේශවල හැඳින්වූ ග්‍රීස් යකාට සමාන වුවත් මෙහි විශේෂත්වය වන්නේ එකවර නොපෙනී යාමත්, නාදුනන පුද්ගලයා ස්ථාන කිහිපයකම ආරක්ෂිත කැමරාවලද සටහන් වී තිබීමයි.ගම්මානයේ විවිධ පිරිස් එක්රැසි වෙමින් ඔහු අල්ලා ගැනීමට උත්සාහ කළ ද, ඒ අසලට යනවිට ඔහු නොපෙනී ගොස් දැත. ඇතැම් විට නිවාස වල වහලවල් උඩින් පැන ගොස් තිබේ. ප්‍රදේශවාසීන් පවසන්නේ මොහු මෙම ප්‍රදේශවල කිසිදු සොරකමක් හෝ දුරාචාරයක් සිදු කර නොමැති බවත් මේ කුමන හේතුවක් මත කවුරුන් විසින් මෙසේ ගම් වැසියන් බිය කරන්නේද ? යන්න ගැටලුවකි. එහෙත් ප්‍රදේශවාසීන් පවසන්නේ මෙය කිසියම් අද්‍යශමාන සිද්ධියක් බවයි.

■ ඒ.එම්.සරත් කුමාර - බිංගිරිය මධ්‍යම සමූහ

තලකොළ පුහුණු මධ්‍යස්ථානයේ ගැටලු සොයන්න ඇවිත්

තලකොළ තම්බා සියුම් ලෙස සකසා නිවැරදි වර්ණ රටා මුසු කරමින් දේශීය නිර්මාණ බිහි කිරීම සිදු කරනු ලබන පඬුවස්නුවර කනතේවැව කොළඹගම පිහිටි ජාතික ශිල්ප සභාවට අයත් තලකොළ කර්මාන්ත පුහුණු මධ්‍යස්ථානයේ පවතින අඩුපාඩු හා ගැටලු සොයා බලා ඒවාට විසඳුම් ලබා දීමේ අරමුණින් රාජ්‍ය ඇමති දයාසිරි ජයසේකර මහතා නිරීක්ෂණ චාරිකාවක නිරත විය. එහිදී එහි සේවිකාවන් හමුවී ඔවුන් මුහුණ පාන ගැටලුවලට විසඳුම් ලබා දීමට ඇමතිවරයා එකඟ විය.

දකුණේ කිරි ලීටර මිලියන 15 නිපදවන්න යයි

■ එස්.දියගහගේ - දකුණු පළාත් සංචාරක

ගාල්ල දිස්ත්‍රික්කයේ වාර්ෂික දියර කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 15ක් දක්වා වැඩි කිරීමේ අරමුණින් ව්‍යාපෘති හතක් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇතැයි දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පවසයි.

මේ යටතේ කිරි ගව ගොවිපළ දිරි ගැන්වීම, කාන්තා මූලික කිරි ගොවිපළ සංවර්ධනය, අභිජනන ගොවිපළ ඇති කිරීම , නව කිරි ගොවිපළ ආරම්භ කිරීම, තෘණ කැබලි කිරීමේ යන්ත්‍ර ලබා දීම, කිරි ගන්නා දෙනුන් සඳහා සාන්ද්‍ර ආහාර ලබා දීම , තෝරාගත් කිරි ගව ගොවිපළ සඳහා සෞඛ්‍යාරක්ෂිත උපකරණ කට්ටල ලබා දීම සිදු කෙරේ. ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 19 ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන අතර නව කිරි ගව ගොවිපළක් ආරම්භ කිරීම සඳහා රුපියල් 50000 බැගින් ලබා දීමට නියමිතය.

බලපිටිය, ඇල්පිටිය, වැලිවිටිය දිවිතුර, බෝපෙ පෝද්දල, රත්ගම සහ ගෝනපිනුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල කිරි ගව ගොවිපළ දිරි ගැන්වීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන අතර එක් එකකයක් සඳහා රුපියල් 80000ක මුදලක් ලබා දෙනු ඇත.

කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ කාන්තා මූලික කිරි ගොවිපළ සංවර්ධනය කිරීම සඳහා එක් එකකයක් වෙනුවෙන් රුපියල් 80000ක් ලබා දෙනු ලබන අතර එම ව්‍යාපෘතිය හිනිදුම, හබරාදුව, බෙන්තර සහ අක්මීමණ යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල ක්‍රියාත්මක කරනු ඇත.

සත්ත්ව අභිජනන ගොවිපළ 05ක් පිහිටුවීමටද සැළසුම්කර ඇති අතර ඒ සඳහා එක් ගොවි පොළකට ලබාදෙනු ලබන ආධාර මුදල රුපියල් ලක්ෂයකි. නියාගම, වැලිවිටිය දිවිතුර, බලපිටිය, හිනිදුම සහ රත්ගම යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල මෙම අභිජනන සත්ත්ව ගොවිපළ පිහිටුවීමටද සැළසුම් කර තිබේ.

කිරි ගව ගොවිපොළ දිරි ගැන්වීමේ ව්‍යාපෘතිය බලපිටිය, ඇල්පිටිය, වැලිවිටිය දිවිතුර, බෝපෙ පෝද්දල, රත්ගම සහ ගෝනපිනුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල ක්‍රියාත්මක කරනු ලබන අතර එක් ඒකකයක් සඳහා රුපියල් 80000ක මුදලක් ලබා දෙනු ඇත.

■ නිමල් විජේසිංහ - අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් සමූහ

'වැව් ගම් පුබුදුව' ව්‍යාපෘතියෙන් ග්‍රාමීය වැව් 172කට නව පෙනුම

වියළි කලාපයේ දිස්ත්‍රික්ක හතක නියඟයෙන් හා ගංවතුරෙන් පීඩාවට පත්වන සෑම ගොවි ජනතාවටම ආහාර සුරක්ෂිතතාවය, ජීවනෝපාය සුරක්ෂිතතාවය සහ ජල සුරක්ෂිතතාව කරදීම සඳහා ක්‍රියාත්මක කර ඇති 'වැව් ගම් පුබුදුව ව්‍යාපෘතිය යටතේ එල්ලංගා පද්ධති 08 කට අයත් සුළු වාරිමාර්ග වැව් 172 ක් ගතවූ දෙවසර තුළ සම්පූර්ණයෙන් පිළිසකර කර තිබේ.

මේ තුළින් අනුරාධපුර, වව්නියාව, කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල ගොවි පවුල් 8177 කට සෙත සැලසේ. අලුතින් කුඹුරු අක්කර 5000 ක් වගා කිරීමට පිළිසකර කරනු ලැබූ කුඩා වැව් යටතේ ඉඩ සැලසේ. මෙම වසර තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ අලුත්හල්මිල්ලෑව එල්ලංගාව යටතේ පවතින කුඩා වැව් 22 ක් හා අමුණු 08 ක් හා රත්මලේ එල්ලංගාවට අයත් අබලන් ග්‍රාමීය වැව් 14 ක් අලුත්වැඩියා කිරීමට විධිවිධාන යොදා ඇතැයි වැව් ගම් පුබුදුව ව්‍යාපෘතියේ ප්‍රකාශකයකු පැවසීය. මෙම වැව් 36 යටතේ කුඹුරු ඉඩම් අක්කර 2000 කට පමණ වාරි ජලය සැපයීමට හැකිවනු ඇත.

■ ගාල්ල දිසා සමූහ

ආරච්චිකන්ද රෝහලේ කොටසක ඇඳුන් 100ක නිරෝධායන මධ්‍යස්ථානයක්

හික්කඩුව ආරච්චිකන්ද රෝහලේ කොටසක ඇඳුන් 100කින් යුත් නිරෝධායන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට සැලසුම්කොට ඇති බැව් දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය විලී ගමගේ මහතා පවසයි. ආරච්චිකන්ද රෝහල පරිශ්‍රය තුළ ඇති ගොඩනැඟිලි ප්‍රයෝජනයට ගනිමින් රෝහලින් වෙන්කොට මෙම නිරෝධායන මධ්‍යස්ථානය ස්ථාපනය කිරීමට සැලසුම්කොට ඇති බවද ආණ්ඩුකාරවරයා පවසයි. මේ මගින් තුන් ආරච්චි කන්ද රෝහලේ කටයුතුවලට කිසිදු බාධාවක් නොවන බව සඳහන් කළ දකුණු පළාත් ආණ්ඩුකාරවරයා රෝහලේ කටයුතු සාමාන්‍ය පරිදි සිදුකරගෙන යා හැකි බවද පවසයි.

මේ පිළිබඳ අදහස් දක්වමින් ඒ මහතා මෙසේද කිවේය. මේ නිසා ආරච්චි කන්ද රෝහල වහන්නේ නැහැ. රෝහලින් වෙන්කොට තමයි මෙහි නිරෝධායන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට සැලසුම් කරලා තියෙන්නේ. පසුගිය කොරෝනා වසංගතය අවස්ථාවේත් අපි මේ ගැන සාකච්ඡා කළා. රමේෂ් පතිරණ හා මොහාන් පි . ද සිල්වා යන ඇමතිවරුන් සමග ගොස් අපි එම ස්ථානය නිරීක්ෂණය කළා. දකුණු පළාත තුළ කොරෝනා වසංගතය පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවරයන් ගැන සඳහන් කරමින් ආණ්ඩුකාරවරයා මෙසේ කීය.

දකුණු පළාතට තවම කොරෝනා අනතුරක් නැහැ. අපි මධ්‍යම රජය මගින් ලබාදෙන උපදෙස් අනුව එම කටයුතුවලට පළාත් සභාවක් වශයෙන් සහයෝගය ලබාදෙමින් කටයුතු කරනවා. රටක් හැටියට අපි මෙම උවදුර පාලනය කිරීමට සාමුහිකව මුහුණදිය යුතුයි. දකුණු පළාතේ ඇති රජයේ කාර්යාලවල කටයුතු සෞඛ්‍ය උපදෙස් වලට අනුකූලව සාමාන්‍ය පරිදි පවත්වාගෙන යනවා. කොරෝනා වසංගතය සමග එයට මුහුණ දෙමින් සාමාන්‍ය ජනජීවිතය බිඳී නොවැටී පවත්වාගෙන යාමට අවශ්‍ය පියවරයන් අරගෙන තියෙනවා.

■ කේ.ඒ.මෛත්‍රීපාල - දමන සමූහ

අබලන් අතුරු මාර්ගයට පිළියම්

දමන ප්‍රාදේශිය සභාවට අයත් හිඟුරාන පැරණිගම ගම්මානයේ වසර ගණනාවක් ප්‍රයෝජනයට නොගෙන අතහැර දමා තිබූ අතුරු මාර්ගය දමන ප්‍රාදේශිය සභාවේ සභාපති මංගල මහින්ද ගුණවර්ධන මහතාගේ උත්සාහය හා කැපවීම මත එම අතුරු මාර්ගය නැවත අලුත්වැඩියා කර ගම්වාසීන්ගේ ගමන් පහසුව සඳහා ජනතා අයිතියට පත් කර ඇත.

■ සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ

මාතලේ සර්ව ආගමික කමිටුව රැස්වෙයි

කොවිඩ් වසංගත තත්ත්වය පාලනය කිරීමේදී මාතලේ දිස්ත්‍රික්කයේ ආගමික සිද්ධස්ථානවල කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් මාතලේ දිස්ත්‍රික් ලේකම් එස්.එම්.ජී.කේ පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් මාතලේ දිස්ත්‍රික් සර්ව ආගමික කමිටුව පසුගියදා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්විණි.

එහිදි අදහස් දැක්වූ මහ සංඝරත්නය ඇතුළු ආගමික නායකයන් පවසා සිටියේ ආගමික සිද්ධස්ථාන වලට පැමිණෙන බැතිමතුන්ට සීමා පැනවීම ගැටලුකාරී බැවින් රජය මගින් මේ සම්බන්ධයෙන් විධි විධාන පැනවීම සුදුසු බවත් රජය විසින් හඳුන්වා දෙන නිර්ණායකයන්ට අනුව කටයුතු කිරීම ගැටලුවක් නොවන බවත් පෙන්වා දුන්නේය.

බෞද්ධ විහාරස්ථාන ආශ්‍රිතව ඉදිරියේ කඨින පින්කම් සිදුකිරීමට නියමිත බවත් එහිදී අවම ජන සහභාගිත්වයෙන් කටයුතු කිරීමට අපේක්ෂා කරන බව මහ සංඝරත්නය පෙන්වා දුන්නේය. හින්දු පූජක වරුන් පෙන්වා දුන්නේ විශේෂයෙන් හින්දු කෝවිල් ආශ්‍රිතව ඉදිරියේදී විවාහ මංගල උත්සව පැවැත්වීමට දින වෙන් කර ඇති බවත් මෙම උත්සව සඳහා විශාල පිරිසක් සහභාගි වීමට නියමිත බැවින් රජය මගින් මේ සම්බන්ධව නිර්නායක ඉදිරිපත් කිරීම උචිත බව පැවසීය.

කෝවිඩ් වසංගත තත්ත්වය පාලනය කිරීමට රජය ගෙන යන වැඩපිළිවෙළට සිය පූර්ණ සහය ලබා දෙන බව මාතලේ දිස්ත්‍රික්කයේ මහ සංඝරත්නය ඇතුළු සර්ව ආගමික නායකය මෙහිදී සඳහන් කළ අතර එම අවස්ථාවට මාතලේ දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති කොස්ගොල්ලේ සීලරතන නායක හිමි ලෝක තරුණ බෞද්ධ සංගමයේ ලේකම් මුගුණුවෙල අනුරුද්ධ හිමි ඇතුළු මහ සංඝ රත්නයද. හින්දු,කතෝලික, මුස්ලිම් ආගමික පූජක තුමන්ලාද, මාතලේ අතිරේක දිස්ත්‍රික් ලේකම් පාලන නිශාන්ත කරුණාතිලක, අතිරේක දිස්ත්‍රික් ලේකම් ඉඩම් ඉෂාන් විජේතිලක යන මහත්වරු ඇතුලු පිරිසක් සහභාගි වුහ.

■ සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ

සංවර්ධන වැඩ ඉබි ගමනේ: වාහන තදබදය උග්‍ර අතට

මාතලේ නගරයේ දුම්රියපොළ පාර අලුත්වැඩියා කටයුතු දැනට මාස 06 කට (කොරෝනා) පෙර ආරම්භ කර ඇතත් මෙතෙක් එම අලුත්වැඩියා කටයුතු නිම නොකිරීම හේතුවෙන් මෙම මාර්ග ඔස්සේ ගොංගාවෙල රජයේ සහ පෞද්ගලික නැවතුම්පළට යන වාහන තදබදයක් ඇති වන බවත් මෙම දුම්රියපොළ පාර අලුත්වැඩියා කටයුතු ඉබි ගමනේ පවතින නිසා මෙම මාර්ගයේ වෙළඳසල් වල ව්‍යාපාර කටයුතු ද අඩ පණ වී ඇති බවත් පවතින වැසි සහිත කාලගුණය හේතුවෙන් මෙම කානු පද්ධතිය තුළ ඩෙංගු වැනි භයානක මදුරු කීටයන් බෝවීමට ඉඩ ඇති හෙයින් මෙම අලුත්වැඩියා කටයුතු හැකි තාක් ඉක්මනින් මාතලේ නාගරික ජනතාව අදාළ අංශවලින් ඉල්ලා ඇත.

■ විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ

කෙටි නාට්‍ය පිටපත් රචකයන්ට වැඩමුළුවක්

දකුණු පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය වාර්ෂිකව සංවිධානය කරනු ලබන කෙටි නාට්‍ය තරඟාවලිය සඳහා මෙම වර්ෂයේදී නාට්‍ය පිටපත් ඉදිරිපත් කර තිබූ පිටපත් රචකයන් 26 දෙනා වෙනුවෙන් වැඩමුළුවක් එම අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

දකුණු පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් රංජිත් යාපා මහතාගේ මගපෙන්වීම මත වැඩමුළුව පැවැති අතර වැඩමුළුව අවසානයේදී දකුණු පළාත් නාට්‍ය සංගමය පිහිටුවා ගත්හ. මෙදින පැවැති විශේෂ වැඩමුළුව සඳහා ප්‍රවීන රංගන ශිල්පී , නාට්‍ය අධ්‍යක්ෂවරයකු මෙන්ම සෞන්දර්ය පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රසන්නජිත් අබේසූරිය , මහාචාර්ය බුද්ධික රණවීර , සචිත්‍ර රාහුබද්ධ යන මහත්වරුන් විසින් දකුණු පළාතේ නාට්‍ය පිටපත් රචකයන් සඳහා දේශන පැවැත්වූහ. අලුතින් බිහිවූ දකුණු පළාත් නාට්‍ය සංගමයේ සභාපතිවරයා ලෙස දිනේෂ් හේවගේ , ප්‍රධාන ලේකම්වරයා ලෙස සමන් කුමාර ගමගේ සහ භාණ්ඩාගාරික ලෙස විජිත් හේවාවිතාරණ යන මහත්වරුන් තේරී පත්වූහ.

අමාත්‍යාංශය වෙනුවෙන් වල්පොල පදුම හිමියන් වැඩමුළුව සහ නාට්‍ය සංගමය පිහිටුවීමේ සියලු කටයුතු සංවිධානය කර තිබිණි.

අමාත්‍යාංශයේ සහකාර ලේකම් ඒ.පී.ඒ. තිළිණි මහත්මිය සහ සංස්කෘතික නිලධාරී දසුන් රණසිංහ මහතා සංවිධාන කටයුතු වලට සහායවෙමින් දායකත්වය සැපයූහ.

■ සමන්තා කංකානම්ගේ - බෙලිහුල්ඔය සමූහ

නාය යන අවදානමක්: පවුල් 13ක් ඉවතට

පවතින අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් හා නාය අවදානමක් ඇති බැවින් බළන්ගොඩ පෙට්ටිගල වසමේ ඉහළ කොටසේ පවුල් 13 ක පුද්ගලයන් 56 දෙනෙක් නේවාසික ස්ථානයන්ගෙන් ඉවත් කර ඇත.

මෙම පුද්ගලයන් එම ස්ථාන වලින් ඉවත් කර මේ වනවිට කොවිලේ නවාතැන් සපයා ඇති අතර පිසූ ආහාර ලබාදීමට කටයුතු කර ඇති බව බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් හේමන්ත බණ්ඩාර මහතා පැවසීය. කාලයක සිට මෙම වතු නිවාස නාය අවදානමට ලක්ව තිබෙන කලාපයකි.

■ ඇම්.පී. චන්ද්‍රපාල - තංගල්ල විශේෂ

සේරුවාවිල පුදබිම අවට වාරිමාර්ග බලන්න ඇමැති චමල් යයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි සේරුවිල විල්ගම්වෙහෙර විහාරස්ථානයේ විහාරාධිපති අළුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේගේ ආරාධනයක් අනුව ඓතිහාසික සේරුවාවිල පුදබිම අශ්‍රිත වාරිමාර්ග ඇළවේලි සහ අමුණු ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව සොයා බැලීමට ඉකුත්දා වාරි මාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා ඇතුළු පිරිසක් විල්ගම්වෙහෙර විහාරස්ථාන පුදබිමට පැමිණියහ.

උතුරු නැගෙනහිර පුරා විද්‍යාත්මක උරුමය යළි මතු කර ගැනීම සඳහා යුද්ධය අවසන් කිරීමෙන් පසු 2014 නව කැණීම් කටයුතු ආරම්භ කරන ලද විහාරස්ථානය සහ ඒ අවට ප්‍රදේශ නිරීක්ෂණය කිරීමටද අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා නිලධාරීන් සමඟ එක්වූහ. මෙහිදී සේරුවිල විලේ ඓතිහාසික පාරිසරික වැදගත්කමක් වර්තමාන අවධියේ ඇති වී ඇති තත්ත්වය පිළිබඳවද මෙහිදී අමාත්‍යවරයාගේ අවධානයට ලක්විය. මීට අමතරව ප්‍රදේශයේ ගොවි ජනතාවගේ ගොවි ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීමේ රැස්වීමක්ද විහාරස්ථානයේදී පැවැත්විණි. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට අයත් ග්‍රාමීය වැව් සියල්ල වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ ප්‍රතිසංස්කරණය කරන වැව් 5,000ක ව්‍යාපෘතියට එක් කරන බවද අමාත්‍යවරයා ගොවීන්ට පැවසූහ.

මෙම සාකච්ඡාවට නැගෙනහිර පළාත් අණ්ඩුකාර අනුරාධ යහම්පත්, වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් අනුර දිසානායක, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නිහාල් සිරිවර්ධන, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් සෙනරත් දිසානායක යන මහත්ම මහත්මීන් සමඟ මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු රාජ්‍ය නිලධාරීන්ද ප්‍රදේශයේ ගොවි සංවිධානවල නියෝජිතයන් ඇතුළු සේරුවිල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ඇතුළු ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරුද සහභාගි වූහ.

■ ආර්.එම්. විජේරත්න - හාලිඇළ සමූහ

හාලිඇළ වැටලීමකින් මත්පැන් ජාවාරම්කරුවෝ 2ක් අත්අඩංගුවට

හාලිඇළ දික්වැල්ලවත්ත ප්‍රදේශයේ පසුගියදා (12) උදේ සිදු කළ හදිසි වැටලීමකින් නීතිවිරෝධී මත්පැන් වන කසිප්පු නිපදවූ බවට සැකපිට පුද්ගලයන් දෙදෙනකු අදාළ උපකරණ සමඟ අත්අඩංගුවට ගැනීමට බදුල්ල පොලිස් කොට්ඨාස දූෂණ මර්දන අංශය සමත්විය.

මෙසේ අත්අඩංගුවට පත්වූ එක් සැකකරුවකු හාලිඇළ දික්වැල්ල වත්ත දෙවන කොටසේ පදිංචි 39 හැවිරිදි පුද්ගලයෙකි. ඔහු සතුව තිබූ කසිප්පු ග්‍රෑම් 88ක්, ගෝඩා ග්‍රෑම් 960ක්, ගෑස්ලිපක් හා දඟර ඇතුළු සෙසු පෙරීමේ උපකරණද අත්අඩංගුවට ගෙන ඇත. කලක සිට නීතිවිරෝධී මත්පැන් ජාවාරම කරගෙන යන මොහු ප්‍රදේශයට විශාල හිරිහැරයක් බවට ප්‍රදේශවාසීහු විසින් ජනාධිපතිවරයා වෙත පවා ලිපි යවා ඇතැයි අනාවරණය වෙයි.

අත්අඩංගුවට පත් දෙවන සැකකරු දික්වැල්ල වත්ත 16 කොටසේ පදිංචි 34 හැවිරිදි අයෙකි. ඔහු සමඟ ගෝඩා ග්‍රෑම් 1160ක් සහ සෙසු උපකරණද අත්අඩංගුවට ගෙන ඇත.

■ මිගහකිවුල කුමාර

කසිප්පු බෝතල් දෙකක් සමඟ අයෙක් අත්අඩංගුවට

නීතිවිරෝධී කසිප්පු බෝතල් දෙකක් ළඟ තබාගෙන සිටි පුද්ගලයකු පසුගියදා (12) උදෑසන කන්දකැටිය බදුලු ඔය ප්‍රදේශයේදී ඔහු සතුව තිබූ කසිප්පු ද සමඟ සැකපිට අත්අඩංගුවට ගත් බව කන්දකැටිය පොලීසිය පවසයි.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ කන්දෙකැටිය බදුලු ඔය ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 46ක පුද්ගලයෙකි.

පොලීසිය වෙත ලද තොරතුරක් මත සිදු කළ වැටලීමකදී සැකකරු ඔහු සතුව තිබූ කසිප්පුද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු ඇප මත මුදා හළ අතර ඔහුට එරෙහිව නඩු පැවරීමට නියමිතය. කන්දකැටිය පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

■ සම්පත් ප්‍රියනන්දන - බළන්ගොඩ විශේෂ

වලේබොඩ ග්‍රාමීය රෝහල ඇරලා අවුරුදු 3යි

ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගාමන්ත අබේරත්න

තාම දොස්තරලා නෑ

බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයට අයත් එගොඩ වලේබොඩ ප්‍රාථමික සෞඛ්‍ය ප්‍රතිකාර ඒකකය (වලේබොඩ ග්‍රාමීය රෝහල) විවෘත කර දැනට වසර තුනකට වැඩි කාලයක් ගත වී ඇතත් ප්‍රදේශයේ රෝගීන්ට සෞඛ්‍ය පහසුකම් ලබා දීම සඳහා එම සෞඛ්‍ය ප්‍රතිකාර ඒකකය සඳහා වෛද්‍යවරයකු යොදාවා නොමැති බවට ජනතාව චෝදනා කරති.

සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීමේ අරමුණින් ග්‍රාමීය සෞඛ්‍ය පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහනේ දෙවැනි අදියර යටතේ සබරගමු පළාත් සභාවේ මුදල් ප්‍රතිපාදන මත වලේබොඩ ප්‍රාථමික සෞඛ්‍ය ප්‍රතිකාර ඒකකය ඉදිකර 2017 වර්ෂයේ ජනතා අයිතියට පත් කළ බව ප්‍රදේශවාසීහු පෙන්වා දෙති. මෙම දෙමහල් ගොඩනැගිල්ල සඳහා රුපියල් කොටි එකහමාරකට ආසන්න මුදලක් වෙන් කර ඇති බවට ඔවුහු පවසති. දැනට මෙම දෙමහල් ගොඩනැගිල්ල මාතෘ හා ළමා සායන සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරීන් විසින් මාසයකට දින කිහිපයක් පමණක් භාවිත කරන බවත් ඉතිරි දින සියල්ලම එය වසා දමා තිබෙන බවද ජනතාව සඳහන් කරති.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ වලේබොඩ පදිංචි එන්. ප්‍රේමසිරි මහතා මෙසේ අදහස් දැක්වීය,

'මෙම සෞඛ්‍ය ප්‍රතිකාර ඒකකය හෙවත් ග්‍රාමීය රෝහල් ඉදි කරලා තියෙන්නේ කාගෙවත් පෞද්ගලික මුදලකින් නෙවෙයි. ජනතාවගේ බදු මුදලින්. ජනතා අයිතියට පත් කරලා දැන්ට අවුරුදු තුනකටත් වැඩියි. තාම රෝගීන්ට ප්‍රතිකාර ලබා දෙන්න වෛද්‍යවරයෙක් යොදවලා නැහැ. වලේබොඩ ප්‍රදේශයේ රෝගීන් මෙම ස්ථානය පසු කරලා කිලෝමීටර් පහළොවක් දුරින් ඇති රාස්සගල රෝහට නැත්නම් කිලෝමීටර් විසි පහක් දුරින් ඇති බළන්ගොඩ මූලික රෝහට යන්න ඕනි.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ බළන්ගොඩ එගොඩවලේබොඩ කොට්ඨාසයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගාමන්ත අබේරත්න මහතා,

'ඔය අවුරුදු තුන ඇතුළත සබරගමු පළාතේ ආණ්ඩුකාරවරු දෙදෙනකුට මේ සම්බන්ධයෙන් දැනුම් දුන්නා. මේ අතර වර්තමාන සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍ර දේවි වන්නිආරච්චි මහත්මිය දැනුම්වත් කරලා තිබෙනවා. ඇයගේ පෞද්ගලික ලේකම් සබරගමු පළාත් සභාවේ සභාපති කාංචන ජයරත්න මහතාගේ විසින් පසුගිය දිනක මෙය නිරීක්ෂණය චාරිකාවකට ද එක් වුණා. වලේබොඩ ප්‍රදේශයේ තිබෙන කාලගුණික තත්ත්වය නිසා නිරන්තරයෙන් ජනතාවට ලෙඩ රෝග බෝ වෙනවා. ඒ වගේම තේ වගාව වැනි කෘෂි කාර්මාන්තය ජීවිකාව කරගත් ජනතාවක් ජීවත් වෙන්නේ. මේ සම්බන්ධයෙන් සියලුම සෞඛ්‍ය අංශවල අවධානය යොමු වෙන්න ඕනි.

අප මේ සම්බන්ධයෙන් සබරගමු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය කපිල කන්නන්ගර මහතාගෙන් දුරකතනයෙන් විමසීමක් කළ අතර එහිදී ඒ මහතා මෙසේ පැවැසීය,

'වලේබොඩ ප්‍රාථමික සෞඛ්‍ය ප්‍රතිකාර ඒකකය සඳහා වෛද්‍යවරයකු හෝ දෙදෙනකු යෙදවීම සඳහා අවශ්‍ය වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යය දැනුම්වත් කරලා වෛද්‍යවරු ඉල්ලලා තිබෙනවා. පසුගිය වර්ෂවල පළාතේ මෙම රෝහල ඇතුළු තවත් රෝහල් විශාල සංඛ්‍යාවක වෛද්‍යවරුන්ගේ හිඟයක් පැවැතුණා. ඒ නිසා ඔය ප්‍රාථමික සෞඛ්‍ය ප්‍රතිකාර ඒකකයට එහෙමත් නැත්නම් වලේබොඩ ග්‍රාමීය රෝහට ඉතා කෙටි කාලයකින් වෛද්‍යවරයකු යෙදවීමට හැකියි.

දකුස ඇස
ukusuase@lakehouse.lk

■ ඩබ්ලිව්. විදානපතිරණ - ඇඹිලිපිටිය සංචාරක

පුංචි පාර්ලිමේන්තු නව ගොඩනැගිල්ල ආණ්ඩුකාරවරයාගේ නිරීක්ෂණයට

සියලු පහසුකම්වලින් සමන්විතව ඉදි වන ඇඹිලිපිටිය පුංචි පාර්ලිමේන්තුවේ නව පරිපාලන ගොඩනැගිල්ලේ කටයුතු සබරගමුව පළාත් ආණ්ඩුකාර විකිරි කොබ්බෑකඩුව මහතා නගරාධිපති ලලිත් යූ. ගමගේ මහතා ඇතුළු පිරිස ඉකුත්දා (30) නිරීක්ෂණය කිරීම සිදු කරන ලදි.

මෙම අවස්ථාවට ඇඹිලිපිටිය නාගරික මන්ත්‍රීවරු ද සබරගමුව පළාත් පාලන සහකාර කොමසාරිස් නිශාන්ත කුමාර මහතා ඇතුළු නිලධාරීන් ද එක්ව සිටියහ.

■ ප්‍රියදර්ශනී කහවල - ඉංගිරිය මධ්‍යම සමූහ

ගිනි අවියක් සහ පතරොම් දහයක් සමඟ පුද්ගලයකු අල්ලයි

නවීකරණය කරන ලද රුසියාවේ නිෂ්පාදිත බෝර 12 ගිනි අවියක් සහ ඊට යොදන පතරොම් දහයක් සමඟින් සැකකරුවකු බුලත්සිංහල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගැනීමට කළුතර පොලිස් විශේෂ කාර්ය බළකා ඒකකය සමත් ව තිබේ.

සැකකරු මෙම ගිනි අවිය භාවිත කරමින් නීතිවිරෝධී අන්දමින් වන සතුන් සීයකට අධික සංඛ්‍යාවක ඝාතනය කර ඇති බවට පොලීසිය සැක කරන අතර මෙලෙස අත්අඩංගුවට පත් වූයේ හොරණ ප්‍රදේශයේ පදිංචි 47 හැවිරිදි අයෙකි.

තමන් විසින් ඌරෙකු කොටු කරගෙන ඇති බවත් වහා පැමිණියහොත් එම සත්ත්වයා අල්ලා ගැනීමට හැකි බවත් පවසමින් විශේෂ කාර්ය බළකා නිලධාරීන් විසින් ඉතා සූක්ෂ්ම ලෙස සැකකරු නොමඟයවා එම ස්ථානයට ගෙන්වාගෙන ඇති අතර පොලිස් උපායට රවටී ඌරා මැරීම පිණිස දිව ආ එම තැනැත්තා පසුව අත්අඩංගුවට ගෙන තිබේ.

■ ප්‍රභාත් විතානාච්චි - දකුණු පළාත් විශේෂ

නිල්වැල්ල පාලමේ ප්‍රගතිය බැලීමට විලී ගමගේ එයි

රුපියල් ලක්ෂ 300ක් වැය කරමින් නාවික හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් ඉදි කරනු ලබන ගාල්ල, ලංකාගම, නිල්වැල්ල පාලමේ ප්‍රගතිය පිළිබඳව සොයා බැලීමට දකුණු පළාත් ආණ්ඩුකාරවර විලී ගමගේ මහතා පසුගියදා (09) වැනි දින එම ස්ථානයට පැමිණියහ.

2021 ජනවාරි මස වන විට පාලම ඉදි කිරීමේ කටයුතු අවසන් කිරීමට නියමිත අතර මෙම පාලම ඉදිකිරීමට මුලිනම මැදිහත් වූ දකුණු පළාත් ආණ්ඩුකාරවරයාට ප්‍රදේශවාසීන් ස්තුතිය පිරිනැමූහ.

මෙම අවස්ථාවට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා එහි සාමාන්‍යාධිකාරීවරයා, ආයතනයේ ගණකාධිකාරිතුමා ඇතුළු නාවික හමුදාවේ උසස් නිලධාරීන්ද සහභාගි විය.

■ ඩබ්ලිව්.පී. ධර්මසේන - මාතර සමූහ

පුද්ගලයකු පැහැරගෙන යමින් සිටි සැකකරු කොටු වෙයි

මෝටර් රථයකින් පැහැරගෙන යමින් සිටි පුද්ගලයකු හිඟුරපත්වල දක්ෂිණ අධිවේගී මාරගයේ රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරීන් විසින් බේරාගෙන සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරු කටුවන ජාතික පාසල අසල පදිංචි 27 හැවිරිදි අයෙකි. පැහැර ගැනීමට ලක්වී ඇත්තේ කටුවන හල්මිල්යාය පදිංචි 21 හැවිරිදි තරුණයෙකි. පසුගිය 12 වැනි දින දහවල් 11.30 ට පමණ හක්මන දෙනගම කණ්ඩිය අසලදී මේ පැහැර ගැනීම සිදුවී ඇත. සැකකරු සහ මෝටර් රථය තිහගොඩ පොලීසියට භාරදීමෙන් පසුව හක්මන පොලීසියට භාරදී ඇති අතර සැකකරු දෙයියන්දර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත ය. හක්මන පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

■ එන්.පී. රාජදොරේ - රත්නපුර විශේෂ

රත්නපුරේ මුව ආවරණ නැති අය දැනුම්වත් කෙරේ

රත්නපුර නගර බල ප්‍රදේශය තුළ මුව ආවරණ නොමැතිව ගමන් කරන පිරිස් එක් ස්ථානයක රඳවා මුව ආවරණ පැලඳීමේ ඇති වැදගත්කම පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහනක් රත්නපුර මහ නගර සභාව සහ රත්නපුර මූලස්ථාන පොලීසිය මගින් ඒකාබද්ධව පසුගියදා ක්‍රියාත්මක කරන ලදී. මෙමඅවස්ථාවට රත්නපුර මහ නගරාධිපති විරොන් අත්තනායක, රත්නපුර මූලස්ථාන පොලිස් පරීක්ෂක රොහාන් ඕළුගල යන මහත්වරුන් සහ රත්නපුර මහ නගරසභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු සහභාගි වූහ.

■ කළුතර අතිරේක

සුවඳමල් ලක්ෂයක ප්‍රාර්ථනා පූජාවක්

කළුතර ඇතගම ශ්‍රී විජයාරාම විහාස්ථානය මගින් රටේ දැනට උද්ගත වී ඇති කොරෝනා වසංගතය රටින්ද ලොවෙන්ද තුරන් වේවා යැයි ප්‍රාර්ථනා කරමින් සුවඳමල් ලක්ෂයක සහ සුවඳකුරු දස දහසක් දල්වමින් ද ගමේ ප්‍රාදේශයේ ස්ථාන 4කින් මල් පෙරහරවල් හතරක් පැමිණීමෙන් විහාස්ථාන භූමියෙන් අධිෂ්ඨාන පූජාවවක්ද රතන සූත්‍ර දේශනාවක්ද පසුගියදා (11) පැවැත්විණි. මෙම පින්කම ඇතගම ශ්‍රී විජයාරාමාධිපති ශ්‍රාස්ත්‍රපති මස්පැන්නේ ගුණාලංකාර හිමිගේ අනුසාශනා පරිදි සිදු කරන ලදී.

■ ඒ.එම්. සරත් කුමාර - බිංගිරිය මධ්‍යම සමූහ

ප්‍රජාමූල සංවිධාන නායකයන් දැනුවත් කිරීමේ වැඩමුළුවක්

බිංගිරිය සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියේ සමාජ සංවර්ධන අංශය හා කුලියාපිටිය නීති ආධාර කොමිසම එක්ව සංවිධානය කරන ලද නීති ආධාර කොමිසම කාර්ය භාර්ය හා නීති උපදෙස් හා නීති සේවාවන් ලබා ගැනීම පිළිබඳව සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා ප්‍රජාමූල සංවිධාන නායකයන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් කුලියාපිටිය නීති ආධාර කොමිසමේ නීති නිලධාරී නීතිඥ ගයානි ඉලංගකෝන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් 2020 ඔක්තෝබර් 08 දින පෙරවරුවේ බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

බිංගිරිය ප්‍රාදේශීය ලේකම් නිලුකා ඩී. දසනායක මහත්මියගේ උපදෙස් පරිදි බිංගිරිය සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියේ කළමනාකාර අධ්‍යක්ෂ කේ.ඒ. නන්දනසිරි මහතාගේ මැදිහත් වීම මත සමාජ සංවර්ධන සහකාර එස්. එච්.එම්. සුනිල් ප්‍රේමරත්න මහතා විසින් සංවිධානය කරන ලද මෙම වැඩසටහනේදී ග්‍රාමීය මට්ටමින් අඩු ආදායම්ලාභීන්ට බලපාන නීතිමය ගැටලුවලට මුහුණ දීමේදී ඔවුන් නොදැනුවත්කම නිසා පීඩාවට පත්වන බැවින් එවැනි ගැටලු විසඳා ගැනීමට අවශ්‍ය නීතිමය උපදෙස් හා නීතීඥ සේවාවන් ලබා ගන්නා ආකාරය පිළිබඳ මෙහිදී දැනුම්වත් කිරීම සිදු කරන ලදී.

මේ අවස්ථාවට සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා ප්‍රජාමූල නායකයන් විශාල පිරිසක් එක්ව සිටියහ.

■ ධර්මදාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංචාරක සහ අනුරාධ ප්‍රියදර්ශන - කරන්දෙණිය

ගංජා සැපයූ අයෙක් අත්අඩංගුවට

බන්ධනාගාර රැඳවියන්ට හා බහුදින ධීවර යාත්‍රාවලට අලෙවි කිරීමට සූදානම් කොට තිබූ ගංජා ග්‍රෑම් 530ක් ප්‍රවාහනය කරමින් මෝටර් රථයකින් ගමන් කළ පුද්ගලයකු බලපිටිය හීනටියේදී පසුගියදා (10) අත්අඩංගුවට ගෙන ඇත.

මොහු මීට පෙරද ගංජා වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් වී ඇති අතර තවත් විටෙක සෝදිසිවලදී අත්අඩංගුවට පත් නොවී පැන ගොස් කලක් ප්‍රදේශයෙන් පැනගොස් සැඟවී සිට නැවත පැමිණ මෙම ජාවාරමේ යෙදුණ අයකු බව අම්බලන්ගොඩ පොලීසිය පැවසීය. මෙහිදී සැකකරුගේ ගෝලයෙකු, ජංගම දුරකතන හතරක් හා මෝටර් රථය ද අත්අඩංගුවට පත්විය. එමෙන්ම ගුද මාර්ගයේ සඟවා බන්ධනාගාර රැඳවියන්ට ගෙනයෑමට සූදානම් කරන ලද ගංජා කැලි දෙකක් ද හමුවී ඇත. රාජ්‍ය බුද්ධි අංශ තොරතුරු මත උපාය දූතයන් යොදවා මෙම පුද්ගලයන් හා භාණ්ඩ අත්අඩංගුවට ගෙන ඇත.

අම්බලන්ගොඩ සහකාර පොලිස් අධිකාරී නිහාල් රත්නායක මහතාගේ උපදෙස් පරිදි මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ජනක ගුණසේකර, පොලිස් පරීක්ෂක ප්‍රසාද් බණ්ඩාර, පොලිස් සැරයන් පෙරේරා යන අය මෙහි පරීක්ෂණ පවත්වයි.

■ ධම්දාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංචාරක

දහම් ගුරු සේවයට උපහාර

බලපිටිය රිවිදින දහම් පාසලේ ප්‍රධානාචාර්ය හසිත තොටවත්ත මහතාගේ දහම් ගුරු සේවයට වසර 40ක් පිරීම නිමිත්තෙන් උපහාර උලෙළක් රේවත විද්‍යාල පරිශ්‍රයේදී පසුගියදා පැවැත්විය. එහිදී බලපිටිය ප්‍රාදේශීය සභා මන්ත්‍රී බලපිටියේ ධම්මික,ලේඛකාධිකාරී කැටපොල සමිත,බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක අහංගම මෛත්‍රී මූර්ති යන හිමිවරුන් මේ උපහාර තිළිණය පිළිගැන්වූ අයුරු.

දහම් පාසල් සිසුන්ට පිරුවානා පොත්

සදහම් ලංකා සංසදයේ සභාපති අභයරතනාරාමාධිපති පිටුවල විමල හිමියන්ගේ අනුග්‍රහයෙන් නියෝජ්‍ය ලේඛකාධිකාරී කිරඔ දේවින්ද,ගාලු මහ දිසාවේ උප ප්‍රධාන අධිකරණ සංඝනායක ප්‍රවීණ රූපවාහිනී දේශක පිටිගල ධම්මවිනීත, යන හිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අගලවත්තේ ධම්මාවාස හිමියන් විසින් දහම් පාසල් සිසුන්ට පිරුවානා පොත් වහන්සේ බෙදා දීමක් පසුගියදා අහුංගල්ල බෝගහපිටිය සිරි විජය බෝධිරාජාරාම විහාරස්ථානයේ දී සිදු වුණි.

■ ගාල්ල දිසා සමූහ

ලක්ෂයක අයිස් සන්තකයේ: සැකකරු දැලේ

රුපියල් ලක්ෂයක් පමණ වටිනා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 01යි, මිලිග්‍රෑම් 400ක් සන්තකයේ තබාගෙන සිටි පුද්ගලයකු අලුත්ගම පොලිස් වසමේ දී අත්අඩංගුවට ගත් බව කළුතර පොලිස් විශේෂ කාර්ය බළකා කඳවුර පවසයි. සැකකාර පුද්ගලයා විලා එකක් පවත්වාගෙන යන අතර විලා එක තුළදි මොහු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට ගෙන ඇත.අත්අඩංගුවට ගත් සැකකරු 38 හැවිරිදි වියේ පසුවන විවාහකයෙකි.මොහුගේ බිරිය විදේශගතවී ඇති බව පරීක්ෂණවලදි අනාවරණය වී ඇත. සැකකරු වැඩිදුර පරීක්ෂණ කටයුතු සඳහා අලුත්ගම පොලීසියට බාරදී ඇත.

■ බණ්ඩාර විපුලසේන - වවුනියාව මධ්‍යම විශේෂ

වැලිඔය පරණගම වැව පාසලේ සිසු දරුවන්ට උපකරණ පරිත්‍යාගයක්

ආරක්ෂක සේනා මූලස්ථාන වන්නි යටතේ පාලනය වන 62වැනි පාබල සේනාංක මූලස්ථානයට අයත් 621 පාබල බළසේනා මූලස්ථාන බළ ප්‍රදේශයේ ඉතා දුෂ්කර ගම්මානයක් වන වැලිඔය පරණගම වැව පාසලේ ඉගෙනුම ලබන සිසු දරුවන්ට උපකරණ බෙදාදීමක් පසුගියදා සිදු වුණි. ලෝක ළමා දිනයට සමගාමීව ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) හී බ්‍රිගේඩියර් එච්.ජේ.එච් නිශාන්ත මහතාගේ සම්බන්ධීකරණයෙන් පාසල් පොත්පත් සහ ලෝක වැටිහිටි දිනය වෙනුවෙන් එම ගම්මානයේ පවුල් 60ක් සඳහා වියළි ආහාර ද්‍රව්‍ය මල්ලක් බෙදා දීමට කටයුතු කරන ලදි.

දිනමිණ දැසින

දැස අත ම එක තැන

■ ඊ.සී.ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

වෙන්නප්පුවේ සහ ලුණුවිල මත් ජාවාරමේ යෙදුණු දෙදෙනෙක් දැලේ

වෙන්නප්පුව හා ලුණුවිල ප්‍රදේශය පුරා කාලයක් තිස්සේ මහා පරිමාණයෙන් මත්කුඩු අලෙවි කිරීමේ ජාවාරමක් පවත්වා ගෙන ගිය කාන්තාවක් සමඟ පිරිමි පුද්ගලයකු මත්කුඩු තොගයක් සමඟ අත් අඩංගුවට ගැනීමට හැකි වූ බව වෙන්නප්පුව පොලීසිය කියයි. අත්අඩංගුවට ගත් කාන්තාවගේ සැමියා මත්කුඩු ජාවාරමේ නිරතව සිටි අතර ඔහු පොලිස් අත් අඩංගුවට ගෙන අධිකරණයේ නඩු පවරා මේ වන විට සිර දඩුවම් විඳිමින් සිටින අතර එම ජාවාරම ඇය විසින් තව දුරටත් පවත්වා ගෙන යන බවට ලද තොරතුරක් අනුව පොලිස් නිලධාරීන් ලුණුවිල සිරිගම්පල ප්‍රදේශයේ පිහිටි ඇගේ නිවෙසට ගොස් සිදු කළ පරීක්ෂණයක දී ඇය ළඟ තිබි මත්කුඩු ග්‍රෑම්13කුත් මිලි ග්‍රෑම්870ක් සොයා ගත හැකිවූ බව කියයි.

සැකකරු 28 වැනි වියේ පසුවන අතර කාන්තාව 26 වැනි වියේ පසුවේ. ඔවුන් දිගු කලක සිට ලුණුවිල සිරිගම්පල ප්‍රදේශයේ ජීවත් වන බවත් කියයි.සැකකරුවන් මාරාවිල අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. වෙන්නප්පුව සහකාර පොලිස් අධිකාරී එරික් පෙරේරා, වෙන්නප්පුව මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක චම්න්ද ප්‍රනාන්දු ,මහත්වරුන්ගේ උපදෙසින් පොලිස් පරීක්ෂක දක්ෂිණ, උප පොලිස් පරීක්ෂකවරුන් වන සුබසිංහ හා මධුසංක යන මහත්වරු ඇතුළු නිලධාරීන් මේ වැටලීම සිදු කර ඇත.

■ සමන් කුමාර - උතුරුමැදි පළාත් සමූහ සමන් කුමාර

තඹුත්තේගම මූලික රෝහලේ රුධිර කාන්දුකරණ ඒකකය නමට පමණයි

තඹුත්තේගම මූලික රෝහලේ රුධිර කාන්දුකරණ ඒකකය ස්ථාපිත කර වසර තුනකට අධික කාලයක් ගතව ඇතත් මේ වනතුරුත් කිසිදු වකුගඩු රෝගියකුගේ රුධිර කාන්දුකරණයන් සිදු කිරීමට කටයුතු කර නැතැයි වකුගඩු රෝගීහු පවසති. තඹුත්තේගම මූලික රෝහලේ මේ රුධිර කාන්දුකරණ ඒකකය 2017 වසරේ අගෝස්තු මාසයේදී විවෘත කර තිබේ.ඒ සඳහා එකවර රෝගීන් හතර දෙනෙකුගේ රුධිර කාන්දුකරණ සිදුකිරීමට හැකිවන පරිදි යන්ත්‍ර හතරක්ද සවිකර තිබිණි.මේ වන විට එම යන්ත්‍ර කිසිදු ප්‍රයෝජනයකට නොගැනීම හේතුවෙන් පැත්තකට දමා ඇතැයි රෝහල් සේවකයෝ කියති.

විශේෂයෙන් මහවැලි එවි කලාපය තුළ වකුගඩු රෝගීන් විශාල පිරිසක් ජීවත්වන අතර ඔවුන්ගේ ලේ පිරිසුදු කර ගැනීම සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලේ වකුගඩු ඒකකය වෙත යෑමට සිදුව තිබේ.අසාධ්‍ය රෝගීන් ලෙස සිටින වකුගඩු රෝගීන්ගේ ලේ පිරිසුදු කර ගැනීමට අනුරාධපුර රෝහලට බස්රථවල රැගෙන යෑමට නොහැකි නිසා ඔවුන් කුලී රථවල රැගෙන යාමට සිදුව ඇතැයිද කියති.

තඹුත්තේගම මූලික රෝහලේ රුධිර කාන්දුකරණ ඒකකය එවකට සිටි සෞඛ්‍ය ඇමැති රාජිත සේනාරත්න මහතා විසින් කඩිමුඩියේ විවෘත කළද ඒ සඳහා අවශ්‍ය සේවකයන් හා වෛද්‍යවරුන් ලබාදී නොමැති නිසා මේ තත්ත්වය උදාවී තිබෙන බව රෝහල් සේවකයන් පවසති.ඔවුන් පවසන්නේ පළාත් සෞඛ්‍ය බලධාරීන්ද මේ සඳහා අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය ලබා ගැනීමට කිසිදු උනන්දුවක් නොදක්වන බවයි. මේ චෝදනා සම්බන්ධයෙන් අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ එන්.සී.ආරියරත්න මහතාගෙන් දුරකතනයෙන් විමසීමේදී මෙසේ කීවේය.

තිබුණු අනෙක් අඩුපාඩු දැන් සම්පූර්ණ කරලා තියෙන්නේ. මේ වන විට සේවක හිඟය විතරයි තියෙන්නේ.කාර්ය මණ්ඩලය පුහුණු කරලා දෙන්න කියලා අනුරාධපුර රෝහලට දන්වලා තියෙනවා.ඒත් තවම පිළිතුරක් ලැබිලා නැහැ.ඒ සම්බන්ධව කටයුතු කරන්නේ විශේෂඥ වෛද්‍යවරුන් විසින්. දැන් මැෂින් සියල්ල සවිකරලා තියෙන්නේ.වෛද්‍යවරුන් දෙන්නයි තවම ඉන්නේ.තව කෙනෙක් පුහුණු කරලා දෙන්න කියලා දන්වලා තියෙනවා. සේවකයන් පුහුණු කළ පසු සේවා පටන් ගන්න පුළුවන්.

■ ඩබ්ලිව්.පී.ධර්මසේන - මාතර සමූහ

පැරණි අමනාපයක් දුරදිග: එකම පවුලේ 3කට පිහි ඇනුම්

අකුරැස්ස බෝලියද්ද හන්දියේදී පිහිවලින් පහරදී එකම පවුලේ තිදෙනෙකුට බරපතළ තුවාල සිදු කිරීමේ සිද්ධියක් අකුරැස්ස ප්‍රදේශයෙන් වාර්තා වේ.මේ සිද්ධියෙන් තුවාල ලබා ඇත්තේ අකුරැස්ස මලිදුව පදිංචි රශ්මික රංග, ක්‍රිෂාන්ත සඳරුවන්, දම්න්ද ,යන පුද්ගලයන් තිදෙනෙකි. තුවාලකරුවන් අකුරැස්ස රෝහලට ඇතුළත් කිරීමෙන් පසුව මාතර මහ රෝහලට මාරුකර එවා ඇති අතර සිද්ධියට අදාළව එම ප්‍රදේශයේ පදිංචි “ බෝලේ,, නැමති සැකකරු සහ “ වස්තු,, නැමති 53 හැවිරිදි සැකකරුවකු අකුරැස්ස පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. සිද්ධියට අදාළව තවත් සැකකරුවන් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගැනීමට නියමිතව ඇත. පැරණි අමනාපයක් මත දෙපිරිසක් අතර මෙම ගැටුම සිදුවී ඇත. සැකකරුවන් දෙදෙනා මාතර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

■ කේ. චන්ද්‍රරත්න - මහනුවර දිසා සමූහ

හාරිස්පත්තුව - පුජාපිටිය පුරන් කුඹුරුවල ගම්මිරිස් වගාවට පියවර

දැනට පුරන් වීමට හැර දමා තිබෙන කුඹුරු ඉඩම් ආශ්‍රිතව ගම්මිරිස් වගා කිරීමට අවස්ථාව සලසා දෙන්නේ නම් ගොවි ජනතාවට හොඳ ආදායමක් කෙටි කාලයක් තුළදී උපයා ගැනීමට හැකියාව ලැබෙන බව හාරිස්පත්තුව හා පුජාපිටිය ගොවිජන සේවා බල ප්‍රදේශවල පිහිටි ගොවි සංවිධාන පවසති.දැනට පුරන් වීමට හැරදමා තිබෙන කුඹුරු ඉඩම් නිසා වන සතුන් බෝවීම වගේම වෙනත් ආපදාවන් ඇතිවීමේ ප්‍රවණතාවක් පවතින නිසා එම තත්ත්වය වළක්වා ගැනීමට නම් මේ පුරන් වීමට හැරදමා තිබෙන කුඹුරු ඉඩම් කිසියම් ඵලදායී කටයුත්තකට යෙදවීම කඩිනමින් සිදුකළ යුතු බවද එම ගොවි සංවිධාන පවසයි.

■ කේ. චන්ද්‍රරත්න - මහනුවර දිසා සමූහ

අකුරණ කොනකලගල ගමේ ඉපැරණි අම්බලමට පණ දෙන්න

අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කොනකලගල ගම්මානයේ ඇති වසර හයසීයක් පමණ ඉපැරැණි අම්බලම අදවන විට විනාශ වීමට ලක්ව තිබේ. ටැම්පිට ඉදිකර තිබෙන මේ අම්බලම අනුරාධපුර යුගයට අයත් ලක්ෂණ රැසකට හිමිකම් කියන අතර මහනුවර යුගයේද ඉතා මැනවින් සංරක්ෂණය කර තිබෙන බවට සාක්ෂි රැසක්ම ඇත .ඉතා අලංකාර ලෙස ගොඩනගා තිබෙන මේ අම්බලම අදවන විට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් සංරක්ෂණය කළ යුතුව ඇතත් එම නඩත්තුව නිසි පරිදි සිදුවනවාද යන්න එම වටිනා උරුමය විනාශ මුඛයට ලක්වෙන ආකාරය දෙස බලන විට කිසියම් සැකයක් ඇතිවන බව කිව යුතුමය.මේ සම්බන්ධව වගකිවයුතු අංශ වහා අවධානය යොමු කළ යුතුමය .

■ එස්.ජී.විජේරත්න - කටුගස්තොට සමූහ



කටුගස්තොට උඩුවාවල අම්බලමේ පිළිසකර වැඩ අරඹන්නේ කවදාද?

වසර 200කට වඩා පැරණි කටුගස්තොට උඩුවාවල අම්බලම අබිරහස් අන්දමින් විනාශයට පත්ව වසර තුනක් පමණ ගතව ඇතත් එය නැවත් ප්‍රතිසංස්කරණය නොකිරීම පිළිබඳ ප්‍රදේශවාසීහු සිය කනස්සල්ල පළ කර සිටිති. වසර තුනකට පමණ පෙර දිනෙක රාත්‍රී කාලයේ මේ අම්බලමේ වාහනයක් වැනි යමක් ගැටීමෙන් සම්පූර්ණයෙන්ම කඩා වැටී විනාශයට පත්වූ බවත් එය කඩා වැටීමෙන් අසල පිහිටි නිවෙසකටද හානි සිදුවූ බව ප්‍රදේශවාසීහු පවසති. තම ගම් ප්‍රදේශය මේ අම්බලම නිසා ප්‍රසිද්ධියට පත්ව තිබුණු බවත් අද එය විනාශ වීම ගැන උඩුවාවල පුරාණ විහාරයේ විහාරාධිපති මාතලේ සීලවිමල හිමියෝ මෙසේ පැවැසූහ.මම මේ අම්බලම ගැන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට කියල තියෙනවා.ලිඛිතව ලියුම් දීල තියෙනවා.ඒ අය පස් හය වතාවක්ම ඇවිත් බලලත් තියෙනවා.ඒ අය කියන්නේ ප්‍රතිපාදන වෙන්වෙලා නැහැ කියල. අවසානයේ මම තීරණය කළා ගමේ අයගේ සහයෝගය මත මෙය අලුත්වැඩියා කරන්න.නමුත් ඒකට විශාල පිරිවැයක් යනවා.ලක්ෂ පහක් හයක් යන වැඩක්.වහලෙට විතරක් ඇස්තමේන්තුවක් හදල එවල තියෙනවා කොළඹ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් එක් ලක්ෂ හැට දහසක.ඒ අය කියනවා ලී ටික අනිත් දේවල් ලබා දෙනවා නම් ඒ අයගේ බාස්ලා දාල හදල දෙන්නම් කියල.අපිට එහෙම කරන්න බැහැනේ.පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන්ම කරන්න ඕන වැඩක් නේ මේක'

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් සංවිධාන කරණ ලද "ගොවි අබිමන"වැඩසටහන යටතේ පළාපත්වල ගොවිජන සංවර්ධන කොට්ඨාසයේ ගොවීන් ගොවි සංවිධාන නියෝජිතයන් හා ගොවිජන සේවා දෙපාර්තමේන්තු නිලධාරීන් ඇගයීමේ ප්‍රාදේශීය උත්සවය පසුගියදා පළාපත්වල ගොවිජන සේවා කාර්යාලයේදී සිදු කෙරුණි. එහිදි ඇගයීමට ලක්වූ පිරිස් වෙත තිළිණ ප්‍රදානය මාතලේ ප්‍රාදේශීය සභා සභාපති කපිල බණ්ඩාර හේන්දෙණිය, සහකාර ගොවිජන සේවා කොමසාරිස් එල්. පී. කරුණාරත්න පළාපත්වල ගොවිජන සංවර්ධන නිලධාරී දිල්රුක්ෂී ලන්සක්කාර යන මහත්ම,මහත්මිහු අතින් සිදු කෙරුණි.

■ සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ

පළාපත්වල ගොවීන්ට ගොවි අබිමන්

දිනමිණ පුවතට හොඳ ප්‍රතිචාර:

■ ඩබ්ලිව්.පී.ධර්මසේන මාතර සමූහ

ගංජා ජාවාරම් කළ කතුන් 3ක් දැලේ

මාතර නගරයේ ගංජා ජාවාරමේ යෙදුණු කාන්තාවන් තිදෙනකු ගංජා මිලි ග්‍රෑම් 10000ක් සමඟ මාතර කොට්ඨාස දූෂණ මර්දන අංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.පොලිස් උපාය දූතයන් යොදවා අත්අඩංගුවට ගෙන ඇති සැකකාරියන් බලපිටිය,වැල්ලවාය,ඇතිලිවැව, සහ කෝට්ටගොඩ පදිංචි 38 ,40, 42, යන වයස්වල පසුවෙන්නන් වෙති.

■ සිගිරිය විශේෂ

ගලේවෙල වකුගඩු රෝගී පියාගේ අසරණ පවුලට වාසනාව

ගලේවෙල හීනුග්ගල ප්‍රදේශයේ අසරණව සිටි දියණියන් හතර දෙනෙකුගෙන් යුත් වකුගඩු රෝගයෙන් පෙළෙන පියකු ගැන මාධ්‍යයෙන් හෙළිදරව් කිරීමෙන් පසු දානපතියන්ගේ උදවු රැසක් ලැබෙමින් පවතී. මේ පවුලේ දියණියන්ට,මවට සහ පියාට නව නිවෙසක් ඉදිකිරීම සඳහා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයකුගේ පවුලේ පිරිස ඉදිරිපත්ව සිටිති.එමෙන්ම මේ පුවත පළ වීමත් සමඟ මහනුවර ප්‍රදේශයේ වැඩ සිටින වියටනාම ජාතික හිමිනමක් ඇතුළු කණ්ඩායමක්ද එම නිවෙසට වැඩම කොට වැඩිමහල් දියණියට සරසවි අධ්‍යාපනය දක්වා ඉගෙන ගැනීමට අවශ්‍ය වියදම් ලබාදීමට කටයුතු කළ අතර වියළි ආහාර ද්‍රව්‍ය ද රැසක් පරිත්‍යාග කළහ. එමෙන්ම නිවසේ අලුත්වැඩියා කටයුතු සඳහා රුපියල් ලක්ෂයක මුදලක් ද වියටනාම ජාතික හිමියන් විසින් එම පවුලට පරිත්‍යාග කිරීම ද සිදු කෙරිණි.

දියණියන් හතර දෙනෙකු සහ සැමියා ජීවත් කරවීම සඳහා මහ පොළොව සමඟ කඳුළු සලමින් පොරබඳින සැමියාට ලේ මාරු කිරීමට යන ගමන් වියදම සොයා ගැනීමට ජනතා සහාය පතන අසරණ වූ සිව් දරු මව ගැන අප පසුගියදා වාර්තා කළෙමු. මේ පවුල පෝෂණය කළ ඇයගේ සැමියා එච්. එම් .රවින්ද ගුණතිලක (42) හැවිරිදි වියේ පසුවෙන අතර මේ වන විට ඔහුගේ වකුගඩු දෙකම දියවී දැඩි අසාධ්‍ය තත්ත්වයෙන් ඇඳට වී සිටී.ඔහු සතියකට දින තුනක් ලේ පිරිසුදු කිරීම හා ලේ මාරු කිරීම සඳහා දඹුල්ල රෝහලට රැගෙන යා යුතුය.ඒ සඳහා ත්‍රිරෝද රථයකට එක වරකට රු 1000ක් මුදලක් සොයා ගැනීමට නොහැකි වීම නිසා ඔහුගේ ජීවිතය අනතුරේ පවතී.

■ ආර්.එම්.විජේරත්න - හාලිඇළ සමූහ

බදුල්ල දිස්ත්‍රික් සිල්මාතා සංගමයේ නව නිල මණ්ඩලය

බදුල්ල දිස්ත්‍රික් සිල්මාතා සංගමයේ නිලවරණය බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය පැරණි ශ්‍රවනාගාරයේදී පසුගියදා පැවැත්විණි. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව පැවැති මේ නිලවරණයේදී ඉදිරි වසර තුනක කාලයක් සඳහා තෝරා පත්කර ගන්නා ලද එම සංගමයේ නව නිලධාරී මණ්ඩලය මෙසේය. සභාපති - වැලිමඩ සුදත්තා සිල් මාතාව, නියෝජ්‍ය සභාපති - උඩවෙල පදුමා සිල් මාතාව, ලේඛකාධිකාරී - වැලිමඩ සුනන්දා සිල් මාතාව, ලේඛකාධිකාරී - මල්හැවේ අනුරාධා සිල් මාතාව, භාණ්ඩාගාරික - රණමුරේ ස්වර්ණදීපා සිල් මාතාව, ප්‍රධාන සංවිධායක (නිල/පොදු) - මැදවෙල ධම්මිස්සරා සිල් මාතාව. කාරක සභාව - බලංගොඩ අසේලා සිල් මාතාව, ලුණුගල සුබෝධා සිල් මාතාව, කහටරුප්පේ ධම්මසීලී සිල් මාතාව, වැවතැන්නේ සුධීපා සිල් මාතාව, නාමල්ගම සුමිත්තා සිල් මාතාව, හපරගහපිටියේ ධම්මපාලිකා සිල් මාතාව. ගණන් පරීක්ෂක- බදුල්ලේ අජන්තා සිල් මාතාව. අනුශාසකවරු- (ස්වාමීන් වහන්සේ නියෝජනය කරමින්) කෝමාරිකේ සුමනරතන හිමි. (සිල් මාතාවන් නියෝජනය කරමින්) මයිලපිටියේ ආයුපාලී සිල්මාතාව. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ දැනුම් දීම පරිදි බදුල්ල දිස්ත්‍රික් ලේකම් දමයන්ති පරණගම මහත්මියගේ උපදෙස් හා සහකාර දිස්ත්‍රික් ලේකම් සමිත සපුතන්ත්‍රී මහතාගේ මෙහෙයවීම මත දිස්ත්‍රික් බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී පාලිත ශ්‍රීනාත් පෙරේරා මහතා ඇතුළු නිලධාරීන් විසින් මේ නිලවරණය සංවිධාන කොට තිබිණි.

ප්‍රභාත් විතානාච්චි - දකුණු පළාත් විශේෂ

ගාල්ල මහින්ද විද්‍යාලය අසල ඇළ මාර්ගයේ සංවර්ධන වැඩ ලත් තැනම ලොප්

මැඟී ජනතාව අසීරුවේ

ගාල්ල මොරගොඩ ඇළ සංවර්ධන ව්‍යාපෘතියට අදාළ අතුරු ඇළ මාර්ගයක් සංවර්ධනය කිරීම සඳහා මහින්ද විද්‍යාලයීය ක්‍රීඩාපිටිය අසලින් දංගෙදර ජයවර්ධනාරාම පාර හරහා ඩොනර්ස් ජයන්ස් මාවත තෙක් ආරම්භ කළ සංවර්ධන වැඩ අතර මඟ නවතා දැමීම නිසා එම මාර්ගයේ ගමන් ගන්නා ජනතාව දැඩි අපහසුතාවකට පත්ව සිටිති.

ගාල්ල උපාය මාර්ග නගර සංවර්ධන ව්‍යාපෘතිය මඟින් 2019 අප්‍රේල් 21 එක් වන දින සිට වැඩ ආරම්භ කරන ලද මෙහි වැඩ නිම කිරීම 2019 ජූලි 21 දින නිම කිරීමට නියමිතව තිබිණි. එම වකවානුවේදී සංවර්ධන කටයුතු අතපසු වීම නිසා නැවත එම වසරේ අගෝස්තු 31 දක්වා කල් ගෙන තිබුණ ද ටික දිනකට පසු වැඩ නවතා දමා අදාළ කොන්ත්‍රාත් සමාගම ප්‍රදේශයෙන් මේ වනවිට බැහැරව ගොස් ඇති අතර මේ සඳහා වගකීම දැරීමට ආයතනයක් නොමැති වීම ද ගැටලු සහගත ය.

මහින්ද විද්‍යාලයීය ක්‍රීඩා පිටිය අසලින් පළල අඩි 4ක් සේම ගැඹුර අඩි 4කින් පටන්ගෙන ක්‍රමයෙන් දංගෙදර ජයවර්ධනාරාම පාර හරහා අඩි 8ක් පළල හා ගැඹුර අඩි 6ක් පමණ විශාලත්වයෙන් යුතුව ඉදිකිරීම් සිදුකර ඇත.

මේ තත්ත්වය මත පාසල් සිසුන් මේ මඟින් ගමන් කිරීම නිසා මඩ ගොහොරු මත ඇද වැටී එදින පාසල් යෑම නැවැත්වීමට සිදු වූ වාර අනන්තය. එසේම මේ ඇළ මාර්ගයට යාබදව ජාත්‍යන්තර පාසලක් ඇති අතර ළමයින් රැගෙන එන වාහන හැසිරවීමට නොහැකි වීමෙන් උදැසන හා දහවල් මේ ස්ථානයේ ඇත්තේ දැඩි වාහන තදබදයකි. මාර්ගය පිළිසකර කරන්නේ නම් මේ දැඩි වාහන තදබදය ද අඩුවේ.

මේ ප්‍රදේශයේ පදිංචි එම්.කේ. සුසන්ත මහතා මෙසේ කීය.

මේ පාර කඩලා දාලා දැන් අවුරුදු දෙකකටත් වැඩියි. කඩේ යන්න ගියත් වට රවුමක් යන්න ඕන. මේක හදන්නේ නැතුව හැම තැනම පාරවල් හදනවා.

මේ එහා පැත්තේ පාරත් හදන්න පටන් ගත්තා. මේ කරපු වැඩේ ඉවර කරලා දෙන්න. කොන්ක්‍රීට් ලෑලිවල අපේ කකුල් හැපිලා තුවාල වුණු වාර අනන්තයි. නගර සභාවට කිව්වා. මන්ත්‍රීලා ට කිව්වා. ඒත් වැඩක් වුණේ නැහැ.

ඩී.ඩී. නන්දදාස මහතා- මේ පාර හදන්න කියලා කොන්ක්‍රීට් දාපු බර වාහන ආවේ අපේ මේ පාරෙන්. දැන් මේ පාරත් හොඳටම අබලන් වෙලා. අපට යන්න හරියට පාරක් නැහැ. මේ හරිය අයිති ගාල්ල මහ නගර සභාවට. මේ පාරේ කානුවක්වත් හදන්නේ නැහැ. පාර කඩල හදනවා කියල තිබුණු ටිකත් නැති කරපු එක කළේ.

ප්‍රියදර්ශනී කරුණාරත්න මහත්මිය - සංඝමිත්තා විද්‍යාලයට, මහින්ද විද්‍යාලයට මේ කිට්ටුවට ළමයි යන්නේ මේ පාරේ. මේ පාර කඩපු නිසා දැන් යන්න බැහැ. වෙනත් යන්න පාරක් නැති නිසා මෙතැනින් ගිහිල්ලා මඩ වළවල් වල ළමයි වැටුණු වාර අනන්තයි. නවත් නැහැ.

ගාල්ල නාගරික කොමසාරිස් රනිල් වික්‍රමසේකර මහතා -

මේ සම්පූර්ණ වැරැද්ද කොන්ත්‍රාත් සමාගමේ.

මේක ලෝක බැංකු ආධාර මත උපාය මාර්ග නගර සංවර්ධන ව්‍යාපෘතිය තමයි ඉදිකිරීම් කටයුතු කරන්නේ. මේ අය තමයි මේකට වගකියන්න ඕන. කොන්ත්‍රාත්කරු ඉවත් කරන්න කියලා අපි ලිපි යොමු කරල තියෙන්නේ.

ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම මත මේ සම්බන්ධව පරීක්ෂා කිරීමට රාජ්‍ය ඇමැති මොහාන් පී. සිල්වා මහතා මේ ස්ථානයට පැමිණි අතර එම අවස්ථාවේ අදාළ උපාය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත දුරකථනයෙන් ඇමතූ විට ඔහු කියා සිටියේ 2019.09.28 දින වැඩ නැවත ආරම්භ කළ බවයි. එහෙත් මේ වන තෙක් මෙහි වැඩ ආරම්භ කර නොමැත.

කළුතර මධ්‍යම විශේෂ

වසා ඇති හෝටලයකට ගියැයි කළුතර ප්‍රා. සභා මන්ත්‍රීවරු 2ක් පීසීආර් පරීක්ෂණයට

දැනට වසා දමා ඇති හෝටලයකට ගොස් සිටි බව කියන කළුතර ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු පෙරේදා (13) පැවැති මාසික සභා වාරයට පැමිණීම නිසා සභා වාරය ආරම්භ කිරීමට පෙර සෞඛ්‍යාරක්ෂක තත්ත්වයක් ඇති විය.

මන්ත්‍රීතුමා, කරුණාකරලා මේ සභාවේ සිටින සියලු දෙනාගේ යහපත වෙනුවෙන් සභා ගැබෙන් එලියට යන්න. පී.එච්. අයි. මහත්තයා ඇවිත් මේ ගැන මට දැනුම් දෙනකම් කරුණාකරල එළියට යන්න යැයි සභාපති සංජීව ආරියරත්න මහතා අදාළ මන්ත්‍රීවරයාගෙන් ඉල්ලීමක් කළ අතර සභාපතිවරයාගේ ඉල්ලීමට කන් නොදුන් එම මන්ත්‍රීවරයා දිගින් දිගටම කියා සිටියේ තමා නිර්දෝෂී බවත්, බොරු තර්ක නොගෙනෙන ලෙසත්ය.

සභාපතිවරයාගේ දැනුම් දීම මත කළුතර උතුර පොලිස් නිලධාරීන් සමඟ පොතුපිටිය මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා පැමිණ අදාළ මන්ත්‍රීවරුන් දෙදෙනා පීසීආර් පරීක්ෂණ සඳහා කළුතර නාගොඩ මහ රෝහල වෙත යොමු කෙරිණි.

නිමල් විජේසිංහ - අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් සමූහ

අනුරාධපුර දිස්ත්‍රික්කයේ

හෙක්ටයාර් 1,90,000ක්

වගා කිරීමට සැලැසුම්

අනුරාධපුර දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු සභාපති හා අනුරාධපුර දිසාපති ආර්.එම්. වන්නිනායක මහතා

මෙවර මාස් කන්නය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වගා කළ හැකි ඉඩම් හෙක්ටයාර් 191738.29ක බිම් ප්‍රමාණයක් තුළ වී සහ අතුරු බෝග වගා කිරීමට සැලැසුම් කර තිබේ. අනුරාධපුර දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු සභාපති හා අනුරාධපුර දිසාපති ආර්.එම්. වන්නිනායක මහතා 2020/21 මාස් මෝසම් වගා කන්නය තුළ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 686445.91 මට්ටමට ළඟාවනු ඇතැයි සඳහන් කළේය.

දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජලාශ 14ක් යටතේ මාස් කන්නය තුළ හෙක්ටයාර් 46094.6ක බිම් ප්‍රමාණයක වී වගා කෙරේ. මීට අමතරව ග්‍රාමීය වැව ද 2000ක් යටතේ හෙක්ටයාර් 56383.69ක වී සහ අතිරේක භෝග වගා කිරීමට සැලැසුම් කොට තිබේ. එමෙන්ම හෙක්ටයාර් 11354ක මධ්‍ය පරිමාණ වැව් යටතේ වී වගා කිරීමට නියමිත ය.

වී වගාවට අමතරව හෙක්ටයාර් 40000ක මාස් කන්නය තුළ බඩඉරිඟු වගා කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙයි. අමතරව හෙක්ටයිර් 6514ක උඳු වගා කෙරෙන බව ද දිසාපතිවරයා අවධාරණය කළේ ය.

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ බඩඉරිඟු බීජ හිඟයක් බල පවත්නා බවට වාර්තා වී ඇති බැවින් කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කොට බීජ ලබා දීමට හා බඩඉරිඟු ගොවීන්ට බීජ සඳහා 50%ක සහනාධාරයක් ලබා දීමට පියවර ගන්නා බව ද වන්නිනායක මහතා සඳහන් කළේ ය. මාස් කන්නය තුළ සෝයා, කුරක්කන්, කවුපි, මුං ඇට, රටකජු, තල, මිරිස් සහ ලූනු හෙක්ටයාර් 51903.4ක වගා කෙරෙනු ඇත.

තමරසිරි විජේසේකර - දෙයියන්දර සමූහ

කොරෝනා ගැන හක්මණ ජනතාව දැනුම්වත් කෙරෙති

කොරෝනා වයිරසයෙන් ආරක්ෂා වීම සඳහා ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් රැසක් මේ දිනවල හක්මණ පොලිස් ස්ථානය හා මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය විසින් සංවිධාන කර ක්‍රියාත්මක කර තිබේ.

එහි එක් පියවරක් පසුගියදා හක්මණ මහජන පොළේ ක්‍රියාවට නංවා තිබිණි. එහිදී ව්‍යාපාරිකයන් ඇතුළු පොළට පැමිණෙන ජනතාව මුඛ ආවරණ පැලඳවීම හා මීටරයේ පරතරය පවත්වා ගැනීම ඇතුළු සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද පිළිබඳව ජනතාව දැනුම්වත් කෙරිණි. එම අවස්ථාවට හක්මණ පොලිස් ස්ථානාධිපති නලින් වීරවර්ධන මහතා ඇතුළු පොලිස් නිලධාරීහු සහ සෞඛ්‍ය නිලධාරීන් සහභාගී වී සිටියහ.

ඩී.එස්. ගුණතිලක - උඟව වෙල්ලස්ස විශේෂ

මොනරාගල සමුපයට අයත් වාහන ප්‍රයෝජනයකට ගනිමු ද?

මොනරාගල දිස්ත්‍රික් කිරි නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතියට අයත් ලොරි රථ දෙකක් සහ ත්‍රිරෝද රථයක් මොනරාගල වැල්ලවාය පාරේ පිහිටි එම සමිතියේ කාර්යාල පරිශ්‍රයේ දිරාපත්වෙමින් පවතී.

මොනරාගල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලබාදී ඇති ලොරිරථ රුපියල් ලක්ෂ ගණනක වටිනාකමින් යුක්ත වන අතර ඒව මේ වන විට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන කාර්යාලය පිටුපස ගාල් කැර ඇත. මේ පිළිබඳ මොනරාගල සමුපාකාර සංවර්ධන උප කොමසාරිස් කාර්යාලයෙන් විමසූ විට එහි උසස් නිලධාරියකු පැවසුවේ මේ වාහන ඉතාමත් පැරණි භාවිතයට ගත නොහැකි ඒවා බවයි.

සිරි අබයසිරි -මාතලේ මධ්‍යම සමූහ

මාතලේ වාහන නවතා තැබීමේ සැලැස්මට නගරවාසීන්ගේ විරෝධතා

මාතලේ කෙලින් විටියේ රථවාහන නවතා තැබීම ඔත්තේ ඉරට්ටේ ක්‍රමයට ක්‍රියාත්මක කිරීමට එරෙහිව එම විටියේ වෙළෙඳසල් හිමියන් හා කුලී රථ රියැදුරන් මාතලේ නගරයේදී පෙරේදා (13) පැවැත්වූ විරෝධතාවට සහාය පළකරමින් පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ දිසානායක මහතා ද එම ස්ථානයට එක්ව විරෝධතාවේ නිරත විය.

මාතලේ මහනගර සභා රථවාහන කමිටුව විසින් මාතලේ නගරයේ රථවාහන තදබදයට විසඳුමක් ලෙස කෙලින් විටියේ රථවාහන ඔත්තේ ඉරට්ටේ ක්‍රමයට නවතා තැබීමට තීරණය කර එම වැඩ සටහන සඳුදා දිනයේ සිට ක්‍රියාත්මක කර තිබිණි. එහෙත් එම ක්‍රමය හේතුවෙන් වෙළෙඳසල් හිමියන්ට පරිභෝගිකයන්ට සහ ත්‍රිරෝද රථ රියැදුරන්ට අසාධාරණයක් වන බව පවසමින් ඔවුහු විරෝධතාවේ නිරත වූහ.

මේ මාර්ගය එක් දිසාවකට පමණක් වාහන ගමන් කළ හැකි මාර්ගයක් මේ රථවාහන සැලැස්ම තුළින් වාහන තදබදයට විසඳුමක් ලැබෙන්නේ නෑ. ඒ නිසා පෙර තිබූ පරදිම රථවාහන සැලැස්ම ක්‍රියාත්මක කළ යුතුයි. ඒ මඟින් ජනතාවගේ පහසුව සහ කුලීරථ රියැදුරන්ගේ ගැටලුවට විසඳුමක් ලැබෙනවා. ඒ සඳහා මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ මහතා සමඟ සාකච්ඡා කර මේ ගැටලුවට විසඳුමක් ලබා ගැනීමට පියවර ගන්වා යැයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා මෙහිදී පැවැසීය.

ආර්. ඤාණදාස - අම්බලන්ගොඩ සමූහ

බටපොළ පදිංචිකරුවකුට කොරෝනා: තවත් නිවාස 3ක් නිරෝධානයට

හික්කඩුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල බල ප්‍රදේශයට අයත් කහව වේරගොඩ උප තැපැල් ස්ථානාධිපතියගේ නිවෙසේ පවුලේ අය හා එම ප්‍රදේශයේම තවත් නිවාස දෙකක පවුල් දෙකක් ඉකුත් 7 දින සිට එම නිවෙස්වලම නිරෝධානයට ලක් කොට ඇතැයි මාදම්පාගම මහජන සෞඛ්‍ය පරීක්ෂක නලීන් දේවප්‍රිය මහතා දිනමිණ ට පැවැසුවේය.

මේ නිවාස තුනේ පදිංචිකරුවන් මෙලෙස නිරෝධානයට ලක් කොට ඇත්තේ බටපොළ ප්‍රදේශයේ පදිංචිකරුවකුට කොරෝනා වයිරසය වැලඳී ඇති බව සෞඛ්‍ය අංශය මඟින් සොයා ගැනීමෙන් අනතුරුව ය. මේ කොරෝනා රෝගියාගේ බිරිය පසුගිය දිනක උප තැපැල් ස්ථානාධිපතිනියගේ නිවෙසට හා අනෙක් නිවාස දෙකකට පැමිණ කාලය ගත කොට ඇති බවට දැන ගන්නට ලැබීමෙන් පසුව එම නිවෙස් හිමියන් ඇතුළු පවුලේ අය නිරෝධනය ලක් කොට තිබේ.

මාවරල සමූහ - වැලිගම සමූහ

සිසුවකු සමඟ අතුරුදන් වූ ගුරුවරියට ශරීර ඇප

උපකාරක පන්ති සිසුවකු සමඟ පසුගිය 6 වැනි දින සිට අතුරුදන්ව සිටි ගුරුවරියක පසුගිය 13 වැනි දින මාතර ප්‍රධාන මහෙස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු ඉසුරු නෙත්තිකුමාර මහතා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව රුපියල් ලක්ෂයක ශරීර ඇපයක් මත මුදාහැරීමටත්, ගුරුවරියගේ මානසික වෛද්‍ය වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කිරීමටත් නියෝග කළාය.

වයස අවුරුදු 15 මාස7 ක් වූ පිරිමි ළමයකු බරපතළ ලිංගික අපයොජනයකට ලක් කළ බවට වූ චෝදනා යටතේ සැකකාරිය ඉදිරිපත් කරන බව වැලිගම පොලිසිය පැවැසීය.

පසු ගිය 6 වැනි දින දෙනිපිටිය, ඌරුවිටිය, දෙල්ගහවත්තගොඩ මවක පොලීසියට පැමිණි උපකාරක පන්ති ගිය දරුවා ගෙදර නොපැමිණි බවත්, පන්ති පවත්වන නිවෙස අසල පදිංචි ගුරුවරියගේ ගෙදරට ගොස් සොයා බැලීමේදී ගුරුවරියද ගෙදර පැමිණ නැති බව දැනගන්ට ලැබුණ බවත් පැමිණිල්ලක් කර පොලිසියට පවසා තිබේ.

විත්දිත සිසුවා මාතර මහ රෝහලේ වෛද්‍ය පරීක්ෂණයකට යොමු කර ඇති බව ද පොලිස්ය අධිකරණයට කියා සිටියේ ය. නඩුවේ ඉදිරි විභාගය 2021 ජුනි මස 6 වැනි දිනට කල් තැබිණි.

පී.මද්දුමගේ - මාවරල සමූහ

ගංජා සමඟ හසුවූ 6ක් උසාවියට

ගංජා මිලිග්‍රෑම් 12300 ක් සමඟ පුද්ගලයින් 4 දෙනකු සහ වරෙන්තුකරුවන් දෙදෙනකු කොටවිල පොලීසිය මඟින් අත්අඩංගුවට ගත් බව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක හෙට්ටිආරච්චි මහතා පැවැසීය. සැකකරුවන් පසුගිය 13 වන දින මාතර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

වැඩිදුර විමර්ශන කටයුතු උප පොලිස් පරීක්ෂක, කපිල, සුනිල් සහ රණවීර, සැරයන්වරුන් වන සුබසිංහ, සමරතුංග යන නිලධාරීහු සිදු කරති.

ඒ.පී.දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

බෙහෙත් කොටන තුවක්කුවක් ළඟ තබාගත්තාට 10,000ක දඩ

මෙරට නිෂ්පාදිත බෙහෙත් කොටන තුවක්කුවක් සන්තකයේ තබාගෙන සිටි පුද්ගලයකු 12 දින මොරවක මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු මොරවක මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු ශශිකා මිතුනආරච්චිගේ මෙණවිය හමුවේ වරදකරු බවට පිළිගත් සැකකරුට රුපියල් දසදහසක දඩ මුදලක් ගෙවන ලෙසට නියෝග කෙරිණි.

මෙසේ දඩ මුදල් ගෙවීමට නියම වූයේ බෙරලපනාතර කන්දේකුඹුරු පදිංචිකරුවකුට ය.

පැමිණිල්ල වෙනුවෙන් ඌරුබොක්ක පොලිස් ස්ථානාධිපති ප්‍ර.පො.ප.සමරවික්‍රම මහතාගේ උපදෙස් අනුව පො.සැ.56012 පේමරත්න මහතා අධිකරණයට කරුණු දැක්වීය.

කුමාර උදයරත්න - යක්කලමුල්ල විශේෂ

ගාල්ල රත්ගම වෙරළේ කාන්තා මළ සිරුරක්

ගාල්ල රත්ගම වෙරළට ගොඩගසා තිබූ කාන්තා මළ සිරුරක් පසුගියදා (14) උදැසන සොයා ගැනිණි. මියගිය කාන්තාව වයස අවුරුදු 45-50 අතර වියහැකි අතර ගාල්ල පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

නන්දසිරි වැලිගමගේ - ගාල්ල දිසා සමූහ

කරාපිටිය රෝහලේ මී උණ රෝගීහු 15ක්

ගෙවී ගිය මාස දහය ඇතුළත කරාපිටිය රෝහලේ දී පමණක් මී උණ රෝගීන් 15 දෙනකු මිය ගොස් ඇති අතර එයින් දස දෙනකුම ගාල්ල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් බව ගාල්ල දිස්ත්‍රික් වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය වෙනුර කේ. සිංගාරච්චි මහතා පවසයි. මෙයට අමතරව ගාල්ල දිස්ත්‍රික්කයේ මේ වර්ෂයේ ජනවාරි සිට මේ දක්වා කාලය තුළදී මී උණ රෝගීන් 421 දෙනකු වාර්තා වී ඇති අතර ඉන් 10 දෙනකු මියගොස් ඇති බැව ද ඒ මහතා පෙන්නා දෙයි.

පෙර වර්ෂවලට වඩා මේ වර්ෂයේ මී උණ රෝගීන්ගේ වැඩිවීමක් දක්නට ඇති බවත් කරන්දෙණිය , ඇල්පිටිය, උඩුගම ප්‍රදේශවලින් වැඩි වශයෙන් මී උණ රෝගීන් වාර්තා වී ඇති බව ද ගාල්ල දිස්ත්‍රික් ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය වෙනුර කේ. සිංගාරච්චි මහතා සඳහන් කළේය. ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහල තුල මෙම වර්ෂය තුල මී උණ රෝගය වැළදීමෙන් පුද්ගලයින් 15 දෙනකු මියගොස් ඇති බව පවසන වෛද්‍ය වෙනුර කේ. සිංගාරච්චි මහතා ඉන් 10 දෙනකුම ගාල්ල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් බවත් අනික් අය අනිකුත් දිස්ත්‍රික්කවල අය බව ද පැවැසීය.

සමන්තා කංකානම්ගේ - බෙලිහුල්ඔය සමූහ

ගසක අත්තක් කඩා වැටී කාන්තාවෝ 2ක් මරුට

පින්නවල පොලිස් බල ප්‍රදේශයේ වලවේවත්ත ප්‍රදේශයේ තේ දලු නෙළමින් සිටි කාන්තාවන් තිදෙනකු වෙත ගසක අත්තක් කඩාවැටීමෙන් කතුන් දෙදෙනෙක් මියගොස් ඇති බව පින්නවල පොලීසිය පවසයි. වැස්ස හා තද සුළං හේතුවෙන් මේ අනතුර සිදුව ඇති බව පොලිස් ස්ථානාධිපතිවරයා පැවැසීය. අනතුරට ලක්වීමෙන් පසු කාන්තාවන් තිදෙනා රෝහලට ගෙනගොස් ඇති අතර ඒ වන විටත් දෙදෙනකු මියගොස් ඇති බව පොලීසිය පවසයි .

කොන්තයේ කතාව

“ජපමාලයේ ආරම්භය සිදු වූයේ අකුරු නොදත් අයගේ ප්‍රයෝජනය සඳහා වුවද, පසුව එය මහා වියතුන් අතරද, කතෝලික සභා නායකයාගේ සිට අන්තිමයා දක්වාද ජනප්‍රිය යාච්ඤා ක්‍රමයක් බවට පත් වූ සැටි විස්මයජනකය!

අප කුඩා අවධියේ එදිනෙදා සවස ඉවුම්-පිහුම් කටයුතු හමාර කළ අම්මා කෙනකු දරුවන් අමතා කියන කරුණාබර වචන පේළියකි ඒ. සවස 6.30ට ගමේ පල්ලියේ සීනුවෙන්, ‘තිරින්දාදිය’ (ශුද්ධ වූ ත්‍රිත්වයේ මහා අභිරහස, එනම් පුත්‍රවන දෙවියන් වහන්සේ ශුද්ධාත්මයාණන් මඟින් කන්‍යාවකගේ කුසෙහි මනුෂ්‍යාකාරයෙන් බිහිවීමට මුල පිරීම සිහිපත් කරන ආරාධනය) නද දෙන විට තම තමන් ඉන්නා තැනින් නැගිට, නියමිත යාච්ඤාවක් කීමටත් නිවෙස් බලා පා නැඟීමටත්, හුරුපුරුදුව සිටි කාලයකි ඒ. දූ දරුවන් රැස්කර ගෙන සුරුවම් කුඩුව ළඟ පොල්තෙල් පහනක් දල්වා දුංකබලට කටුකුමංජල් කැට හෝ කුඩු ටිකක් දමා බිම පැදුරක් එළාගෙන, ඒ මත දණ ගසාගෙන ජපමාලය උච්චාරණය කිරීම එකල දිනපතා පුරුද්දක් විය. ඒ සොඳුරු වදන් හා දසුන දැන් රූපවාහිනී යමදූතයා විසින් ගිල හමාරය.

ඒ නිවෙස්වල ජපමාලය කියන්නට එකතු වීමට නොහැකි වන විට ඔවුන් ජපමාලයක් රැගෙන ගියේ මඟ තොටේදී, බසයේ හෝ දුම්රියේ දී ඒ ණය යුක්තිය ඉටුකිරීමේ අදිටනින්ය. අද ජපමාලයක් අතැතිව එවැනි හක්ති අභ්‍යාසයක් කරන්නකු දුටුවොත් සමහරකු, ඔහු හෝ ඇය දෙස විමතියෙන් යුතුව බලනු ඇත.

මෙතැනදී මට අපූරු සිද්ධියක් මතකයට නැඟේ. මෙය සිදුවූයේ 19 වන සියවස අග භාගයේ දී ප්‍රංශයේය. පැරිස් නුවර බලා දිව යන දුම්රියකට හොඳට හැඳ පැලඳ සිටි කඩවසම් පෙනුමැති තරුණයෙක් ගොඩ විය. ඉඳගැනීමට තැනක් සොයමින් ගිය ඔහුට, සාමාන්‍ය ගැමියකුගේ පෙනුමැති වයස්ගත පුද්ගලයකු ඉදිරිපස හිස් අසුනක් දැක එහි වාඩි විය. වයස් ගත මිනිසාගේ වයසට ඇදී ගිය මුහුණේ වූ ශාන්ත පෙනුම කෙරෙහි ඔහුගේ සිත ඇදී ගිය මුත්, ඔහුගේ නිහැඬියාව බිඳීමට ඔහු තරමක් පසුබට විය. මහල්ලා අඬවන් දැසකින් යුතුව තනිවම යමක් මුමුණමින් සිටින බවත්, අතැඟිලි අතුරින් ඇට වැලක් එල්ලෙමින් තිබුණ අතර, ක්‍රමයෙන් එකින් එක ඇටය බැගින් බේරෙමින් පහළට යන සැටිත් දුටු තරුණයාට සිය ආචිචිගේ කොන්තය මතක් විය. නිහඬතාව තවත් ඉවසා සිටිය නොහැකි තැන ඒ කොලු ගැටයා සිය හඬ අවධි කරවමින් මහල්ලා අමතා “ඔබ තවමත් ඔය මධ්‍යතන යුගයේ මෝඩ පූජකවරු දෙසා බෑ මිථ්‍යා කතා අදහනවා දැ” යි පිළිකුලින් මෙන් ඇසීය.

“ඔව් පුතා, පල්ලියේ ස්වාමිලා අපට උගන්වන සියල්ල අදහන්ඩ අපි බැඳිලනේ. ඔබ ඒවා අදහන්නේ නැද්ද?” යි ඇසීය. ඊට පිළිතුරු දුන් තරුණයා කියා සිටියේ, “මම විශ්වවිද්‍යාලයේ දී ඔව ඔක්කොම බොරු බව ඉගෙන ගත්තා. නවීන විද්‍යාව ගැන ඔබත් උසස් අධ්‍යාපනයක් ලබා ගත්තා නම් ඔය ඇට වැල වීසි කරලා හුගක් කල්.”

“අනේ පුතේ, මම නම් ඔය කියන තාලේ නවීන විද්‍යාවක් ගැන අහලවත් නැහැ. ඔබට හැකි නම් මටත් කියා දෙන්නැ”යි මහලු තැනැත්තා පිළිතුරු දුනි. මහල්ලාගේ බැහැපත් ඉරියව්ව ගැන අනුකම්පා සහගත වූ තරුණයා කියනුයේ; “ඔබට පොත පත කියවන්ඩ හැකි නම්, නවීන විද්‍යාව ගැන පළ වී ඇති පොත්-පත් හා පත්‍රිකා යනාදිය ඔබට එවන්නට මට හැකිය.” යි කීය. “ඔව් පුතා මට කියවන්න නම් පුළුවනි”යි මහල්ලා පිළිතුරු දුනි. “එහෙම නම් ඔබේ ලිපිනය මට දෙන්නැ”යි තරුණයා කියද්දීම දුම්රිය පැරිසියේ දුම්රිය ස්ථානයට අවුත් නතර විය. මහලු මිනිසා දුම්රියෙන් බැසීමට පෙර සිය පරණ කබායේ සාක්කුවක තිබුණ සිය ලිපිනය මුද්‍රිත කාඩ් පතක් තරුණයාට දික්කර නොපෙනී ගියේය. කාඩ්පත කියැවූ තරුණයාට සිය දැස අදහාගත නොහැකිව පුදුමයෙන් පුදුමයට පත් විය. ඒ මහල්ලා අන් කිසිවකුත් නොව පැරිසියේ ප්‍රධානතම විද්‍යා පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ, ලුයි පාස්චර් යනුවෙන් එහි සඳහන්ව තිබුණි. අදටත් ලොව පුරා ආහාරපාන නරක් නොවී කල්තබා ගැනීමට පරිහරණය කෙරෙන ක්‍රමය (කල්කිරි = Pasturized Milk) සොයාගත්තේ මේ ලුයි පාස්චර් (1822 - 1895) නම් විද්වතා ය.

ජපමාලයේ ආරම්භය සිදු වූයේ කියවන්නට අකුරු නොදත් අයගේ ප්‍රයෝජනය සඳහා වුවද, පසුව එය මහා වියතුන් අතරද, කතෝලික සභා නායකයාගේ සිට අන්තිමයා දක්වාද ජනප්‍රිය යාච්ඤා ක්‍රමයක් බවට පත් වූ සැටි විස්මයජනකය. සාමූහික තපස් දිවිය ආරම්භක යුගයේ දී ප්‍රසිද්ධ යාච්ඤා ලෙස පොදුවේ කීමට අවසර තිබුණේ බයිබලයේ අඩංගු යාච්ඤා පමණකි. ක්‍රිස්තු පූර්ව දසවන සියවසේ විසූ දාවිත් රජු විසින් සම්පාදිත යැයි සැලකෙන තෙහිලි ගී 150 කින් සමන්විත ගීතාවලිය සහ බයිබලයේම අඩංගු වෙනත් යැදුම් පමණක් ඒ සඳහා අනුමත වී තිබිණි. එහෙත් එකල බයිබලය විවිධ භාෂාවන්ට පරිවර්තනය කිරීමට කතෝලික සභාව මැළිකමක් දැක්වූවාය. ඊට ප්‍රධාන හේතුව වූයේ විවිධ වැරදි අර්ථකථන බිහිවීමට එමඟින් ඉඩකඩ ඇති විය හැකිය යන බියය. ඒ නිසා ඒ අවධියේ තිබුණ හෙබ්‍රෙව්, ග්‍රීක්, ලතින් වැනි පරිවර්තන කිහිපයකට බයිබලය සීමා වී තිබිණ.

එවන් බසින් සාමූහිකව තෙහිලි ගී ගයමින්, යාච්ඤා කරමින්, ගොවිතැන් කරමින්, කමින් බොමින්, අසල්වැසියන් සමඟ තමන්ට ඇති දෙයක් බෙදා-හදා ගනිමින් ඉතා සතුටින් කල්ගත කරන අව්‍යාහක කණ්ඩායම් ගත කරන අමුතු ජීවිත ක්‍රමයට ආකර්ෂණය වූ බොහෝ පිරිස් ඒ සාමූහික දිවිපැවැත්ම පතා ඇදෙන්නට වූහ. උගත්-නූගත්, ස්ත්‍රී-පුරුෂ යනාදී කිසි භේදයකින් තොරව ඒ ජීවිත ක්‍රමයට පිළිගනු ලැබුවේ “ඇවිත් බලන්නැ” යි එදා ස්නාවක ජුවාම්ගේ ගෝලයන් දෙදෙනාට යේසුතුමා (ජුවාම් 1:39) කළ ආරාධනාව අනුවයමිනි.

ඊළඟට මතු වූ ප්‍රශ්නය වූයේ ලතින් බස නොදත් සහෝදර සහෝදරියන් කෙසේද සාමූහික යැදුම්වලට හවුල් කර ගන්නේ යන්නය. ඊට විසඳුමක් ලෙස ඉදිරිපත් කෙරුණේ අකුරු දන්නා අය තෙහිලි ගී 150 ගයන අතර, අකුරු නොදත් අය යේසුස් වහන්සේ විසින් ම උගන්වා වදාළ “පරමණ්ඩලවල වැඩ සිටින අපගේ පිතාවෙනි” (මතෙව් 6:9) යන යැදුම දවසට 150 වතාවක් කීමට අවසර දෙන ලදී. ලතින් බසින් “පාතර් නෝස්තර්” යනුවෙන් ආරම්භ වන එම යැදුම කටපාඩම් කරගෙන ලතින් බසින්ම උච්චාරණය කිරීම කෙසේ වෙතත් එකසිය පනහක් ගණන් තබා ගැනීම පහසු කරුණක් නොවීය. ඊට උදව්වක් වශයෙන් තිරිවාන ගල් හෝ ඔලිව් ඇට 150ක් මල්ලක දමාගෙන 50 බැගින් වූ වරු තුනකින් එම වගකීම ඉටු කිරීමට ලැබීම ඔවුන්ට මහත් අස්වැසිල්ලක් විය. ඔවුන් “පාතර් නෝස්තර්” පනහ බැගින් කී පසු ඒ වගන්තිය අලළා පැරණි පොත පතක තිබුණ විස්තරයක් ඔවුන්ට සිය මව්බසින් පහදා දෙනු ලැබිණ. ඒ කරුණ ගැන දිනකට කිහිප වතාවක් මෙනෙහි කිරීමටත් ඒ අනුව තම දවස ගත කිරීමටත් ඔවුන්ට උපදෙස් ලැබිණ. වැඩපළ හා යාච්ඤා කිරීම තුළ දිගටම රැඳී සිටීමට කැමැත්තක් දැක්වූ අය දිළිඳුකම, අධ්‍යාත්මික ඒකාග්‍රතාවයට අවශ්‍ය වෘත ශුද්ධිය (බ්‍රහ්මචර්යාව) සහ නායකත්වයට කීකරුවීම යන කරුණු තුන දිවිහිමියෙන් සුරැකීමට පොරොන්දු වී පැවිදි වන අතර සෙස්සෝ වැඩ කිරීමටත්, “පාතර් නෝස්තර්” 150 දිනපතා යැදීමටත් අනුශාසනාවලට සවන් දී සිය දරු පවුල් ඒ අනුව හැඩ ගස්වා ගැනීමටත් යොමු වූහ. එලෙස තාපසාරාම තුළ ඔවුන් අත්දුටු සංහිඳියාව හා ලෝකෝත්තර සතුට සිය ලෞකික ගිහි දිවිය තුළද අත්දකින්නට පුරුදු වූහ.

තාපසාරාම වතුවල වැඩ කරමින් ඔවුන් හා යදිමින් සිටි ගිහි සැඳැහැවතුන්ගෙන් ලැබුණ යෝජනා සැලකිල්ලට ගත් නායකයෝ “පාතර් නෝස්තර්” 50 එක දිගට කීමේදී ඇතිවන ඒකාකාරී බවින් මිදීමට ඒවා දහයකට වරක් දණ ගසා ත්‍රිත්ව වන්දනාවක් කිරීම සුදුසු යැයි අනුමත කළහ. එලෙස ඇට හෝ ඇට වැල, පංති පහකින් සමන්විත වන ලෙස සකස් විය.

13 වන සියවසේ මැද භාගය පසුකරන විට (ක්‍රි.ව.1268) ශු. ලූක් තුමාගේ ශුභාරංචියේ (1:28) සඳහන් “නමෝ දේව ප්‍රසාදයෙන් පූර්ණ වන්තියනී, සම්භාණෝ ඔබ කෙරෙහි ය” යනුවෙන් ගාබ්‍රියෙල් දේවදූතයා මරිය තුමිට කළ ආචාරයත් එහිම 42 වැනි වගන්තියේ සඳහන් “ස්ත්‍රීන් අතුරින් ආශීර්වාද ලද්දී ඔබය. ඔබගේ කුසයෙහි ඵලයද ආශීර්වාද ලද්දේ ය” යනුවෙන් එළිසබෙත් තුමිය, මරිය තුමියට කී වදන් පෙළත් බයිබලයේ ඇති නිසා එයද මරිය තුමියට කරන ආයාචනයක් ලෙස පරිහරණය කිරීමට සුදුසු නැද්දැ යි ගිහියන් කළ යෝජනාවද තාපසාරාම නායකයන් විසින් අනුමත කෙරිණ.

මරිය තුමි ගිහි දිවියක් ගත කළ කෙනෙකු වූ නිසා එතුමියට කන්නලව් කිරීම වඩා සුදුසු යැයි ගිහි සැඳැහැවතුන්ගේ අදහස වූ බැවින් “පාතර් නෝස්තර්” එකකට පසු “ආවේ හෙවත් නමෝ” දහයක් කියා ත්‍රිත්ව වන්දනාවෙන් එක් එක් කොන්ත පංතිය අවසන් කිරීමට සංශෝධනය වූවත් එම යැදුමද “පාතර් නෝස්තර්” යනුවෙන් ම හැඳින්වෙන්නට විය. “පාතර් නෝස්තර්” ගැන විවිධ කාලවල ධර්මධරයන් විසින් කර තිබුණ විග්‍රහ සහ විස්තර කිරීම් සියල්ලක්ම පාහේ ගිහි සැඳැහැවතුන්ට ඒ වන විට පැහැදිලි කර තිබුණ නිසා ඊළඟට ඔවුන්ට මෙනෙහි කිරීමට අලුත් යමක් දිය යුතුව තිබිණ. ඒ අනුව එක් දිනක් තුළ කොන්ත පන්ති පහේ කාණ්ඩ තුනක් උච්චාරණය කිරීමේ දී මෙනෙහි කිරීමට පේසු සම්ඳුන්ගේ දිවියේ සුවිශේෂ අභිරහස්මය අවස්ථා 15ක් ඉදිරිපත් කරන්නට ක්‍රි.ව.1470 දී දොම්නිකානු නිකායේ ඇලන්ද රූපේ නම් තාපසයකු විසින් පියවර ගනු ලැබිය.

ලබන සතියට...

ඩී. එෆ්. මැදගොඩ පියතුමා

කිතුනු මිණුම

kithunumina@gmail.com

සොබාදහමේ අධිපති නොවී පංගුකාරයකු වෙන්න ෆ්‍රැන්සිස් පාප්තුමා



ෆ්‍රැන්සිස් පාප්තුමාගේ “ප්‍රශංසා වේවා මා සම්දුන්ට” විශ්ව චක්‍ර ලේඛනය සම්බන්ධව ශ්‍රේටා තන්බර්ග්ගේ පරිසර සුරක්ෂිතතා ව්‍යාපාරය ගැන යමක් සටහන් කිරීම කාලෝචිතය. මේ ලිපිය ඒ වෙනුවෙන් ලියැවුණි.

“ප්‍රශංසා වේවා මා සම්දුන්ට (laudato Si’)” නමැති විශ්ව ලේඛනය ෆ්‍රැන්සිස් පාප්තුමා විසින් නිකුත් කරන ලද දෙවැනි විශ්ව ලේඛනයයි. එහි දැක්වෙන ලෙස “අපගේ පොදු නිවහන වන සොබා දහම රැක ගනිමු” යන්නෙන් සොබා දහම පිළිබඳ මානව වගකීම ඉදිරිපත් කිරීමට එතුමා සමත් විය. මෙම විශ්ව ලේඛනයෙන් ඉදිරිපත් කර ඇත්තේ, සොබාදහමේ දායාදය විනාශ මුඛයෙන් බේරාගැනීමේ මෙහෙවරට දායක වීමට ජගත් ලෝකවාසීන් වෙත කළ ආරාධනාවකි. මෙම විශ්ව ලේඛනය නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන්නේ 2015 වසරේ ජූනි 18 වැනි දාය.

මෙහි දී පාප්තුමා විසින් පරිභෝජනවාදය, අනාරක්ෂිත සංවර්ධන වැඩසටහන්, පරිසර විනාශය, ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම වැනි ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කර ඇත. ෆ්‍රැන්සිස් පාප්තුමා සොබාදහමේ යථාර්ථයට සංවේදීවෙමින් එය රැක බලා ගැනීමත්, සංවර්ධනය කිරීමත් මානව වගකීමක් ලෙස පෙන්වා දෙයි.

එතුමා දක්වන පරිදි මෙය හුදෙක් පරිසරය පිළිබඳ අවධාරණය කරන ලියවිල්ලක් පමණක් නොවේ. එතුමා මෙම විශ්ව ලේඛනයෙන් සමාජ විද්‍යාව කෙරෙහිද අවධානය යොමු කර ඇත. පරිසරය සමඟ ඇති සම්බන්ධතාව අසල්වැසියා හා දෙවියන් වහන්සේ සමඟ ඇති අපගේ සම්බන්ධතාවයෙන් කිසි විටෙකත් හුදෙකලා නොවිය යුතු බව ෆ්‍රැන්සිස් පාප්තුමාගේ මතයයි.

සුදොතුම් පිය තතු

පාප්තුමාට අනුව වර්තමාන ලෝකයේ ඇති ගැටලු සඳහා ප්‍රධානතම හේතුව වී ඇත්තේ මිනිසා විසින් දෙවියන් වහන්සේ තවදුරටත් මැවිල්ලේ කර්තෘ ලෙස පිළිනොගැනීමයි. එහෙයින් අප අනෙක් ජීවීන්ට සලකනුයේ, ඒවා මිනිස් ආධිපත්‍යයට යටත් වූත්, මානවයාගේ භාවිතය සඳහා වූත් වස්තූන් ලෙසය. මෙහිදී පාප්තුමා පවසනුයේ, මානවයා හුදෙක් පොළොව මත ආධිපත්‍යය ඇති ජීවයක් ලෙස නොසලකා, සියලු මැවිල්ල එකම විශ්වීය පවුලක් ලෙස සැලකිය යුතු බවය.

සමාජයේ සිටින දිළිඳුන් කෙරෙහි අවධානය යොමු කරන සේම පොදු නිවහන කෙරෙහිද අවධානය යොමු කළ යුතු බවත්, පරිසරය සුරක්ෂිත කිරීම ඇදහිල්ලේම කොටසක් බවත් ෆ්‍රැන්සිස් පාප්තුමා මෙහි දී පෙන්වා දෙයි. පාරිසරික හා මානව අර්බුද එක් සංකීර්ණයක ගොඩ නැඟී ඇති බැවින් මේ සඳහා පිළිතුරු සෙවිය යුත්තේ සියල්ල සමස්තයක් ලෙස සලකාය. ෆ්‍රැන්සිස් පාප්තුමාන් විසින් නිකුත් කරන ලද මෙම විශ්ව ලේඛනයේ පරිසරවේදය, දර්ශනවාදය, විද්‍යාව, නූතනවාදය හා තාක්ෂණය යන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කර ඇත.

සොබා දහමේ සුන්දරත්වය නැවත සොයා ගන්නා ලෙසට සමාජයෙන් ඉල්ලීමක් කළ පාප්තුමා මේ සම්බන්ධයෙන් 16 හැවිරිදි ස්වීඩන ක්‍රියාකාරිනියක වන ශ්‍රේටා තන්බර්ග් විසින් දියත් කරන ලද ව්‍යාපාරය කෙරෙහි සිය අවධානය යොමු කරනු ලබයි. ඇය දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රැස්වීමක අදහස් ප්‍රකාශ කිරීම සඳහා අත්ලන්තික් සාගරය හරහා සිය ගමන ආරම්භ කළේ ගුවනින් නොව මුහුදෙනි. ගුවන් ගමන් මඟින් කාබන් ටොන් ගණනක් පරිසරයට මුදා හැරීමෙන් පරිසරය දූෂණය වන බැවින් සිය ගමනාන්තය වෙත ළඟා වීමට ඇය තෝරා ගත්තේ, පරිසරයට කාබන් මුදා නොහරින නැවකි (Carbon neutral saling ship). 2018 වර්ෂයේ ස්වීඩන පාර්ලිමේන්තුව ඉදිරිපිට පැවැති පුද්ගලික විරෝධතාවක් හරහා ශ්‍රේටා තන්බර්ග් ප්‍රසිද්ධියට පත් විය. පාසල් ළමුන් විසින් ලොව පුරා සිදු කරන ලද වර්ජන මාලාවක් සඳහා මෙම සිදුවීම බලපා ඇති අතර එය “අනාගතය උදෙසා සිකුරාදාවන් (Fridays For Future)” ලෙස නම් කරන ලදී. මේ සඳහා මිලියනයකට අධික පිරිසක් සහභාගී වී ඇත. ගෝලීය කතෝලික දේශගුණික ව්‍යාපාරය (Global Catholic Climate Movement) යටතේ සංවිධානය කරන ලද උද්ඝෝෂණ 50ක් ඇතුළු රටවල් 118ක 1600කට ආසන්න ප්‍රමාණයක වැඩවර්ජන සැලසුම් කර තිබුණි.

දේශගුණික විපර්යාසයේ අයහපත් ප්‍රතිඵල ඉදිරියේ ඇය නිර්භීතව සිය වගකීම ඉටු කරන ලදී. ඇයගේ උත්සාහය අගයමින් ඇය නොබෙල් ත්‍යාගයක් සඳහා නිර්දේශ කර ඇති අතර, ෆ්‍රැන්සිස් පාප්තුමා විසින් එය සහතික කර ඇත. දේශගුණික අර්බුදයන්ට ප්‍රතිචාර වශයෙන් තිරසාර භාවය සඳහා ස්ථීර ක්‍රියාමාර්ගයක් ඉල්ලීම හේතුවෙන් ඇය ළමා හා තරුණ ව්‍යාපාරයන්ගේ කැපී පෙනෙන සාමාජිකාවක් විය.

මැඩ්රිඩ්හි එක්සත් ජාතීන්ගේ COP25 දේශගුණික සමුළුවට සහභාගී වන විට ශ්‍රේටා තන්බර්ග් ටයිම්ස් සඟරාවේ “වසරේ පුද්ගලයා” ලෙස නම් කරන ලදී. වසරේ පුද්ගලයා ලෙස නම් කළ ලාබාලතමයා වූයේ ඇයයි. COP25 සමුළුවේදී නියෝජිතයන් අමතමින් තන්බර්ග් තර්ක කළේ, දේශගුණික අර්බුද නැවැත්වීමට ධනවත් රටවල් සිය දායකත්වය ප්‍රමාණවත් ලෙස ලබා නොදෙන බවයි.

ඇය ජාත්‍යන්තර සමුළු රාශියක දී දේශගුණික අර්බුදයන් පිළිබඳ සාකච්ඡා කර ඇත. ඇය යුරෝපා සංවිධානයට පවසා ඇත්තේ, “වර්ෂ 2030වන විට ඔවුන්ගේ දේශගුණික ඉලක්කය සපුරාගැනීමට නම් පරිසරයට කාබන්ඩයොක්සයිඩ් විමෝචනය වන ප්‍රමාණය 80කින් පමණ අවම කරගත යුතු බව” ය.

2019 අප්‍රියෙල් මස 17වැනි දින ශ්‍රේටා තන්බර්ග් රෝමය බලා පිටත් විය. වතිකානයේ සාන්ත පීතර චතුරස්‍රයේ පැවැති සාමාන්‍ය ප්‍රේක්ෂක හමුවේ දී ඇය දුටු පාප්තුමා ඇයගේ උත්සහය අගය කළ අතර, පෘථිවියේ පැවැත්ම මූලික කාරණයක් බව හඳවතින්ම තේරුම් ගත හැකි තරුණ පිරිසක් වර්තමානයේ බිහි වී ඇති අතර, ඔවුන් හඳවතින්ම “ප්‍රශංසා වේවා මා සම්දුන්ට (Laudata Si’)” විශ්ව ලේඛනය වටහාගෙන ඇති බවත් මෙම විශ්ව ලේඛනයෙන් ඉදිරිපත් කෙරෙන පණිවුඩය ලොව පුරා ප්‍රචලිත කිරීමට අප වග බලාගත යුතු බවත් පවසා ඇත.

ශ්‍රේටා තන්බර්ග් විසින් සිදු කළ ව්‍යාපාර හේතුවෙන් තරුණ තරුණියන්ගේ හෘදය සාක්ෂිය අවදි කිරීමට හැකිවීම පිළිබඳ පාප්තුමා සතුටු විය. මෙවැනි විශ්ව ලේඛන හා ව්‍යාපාර ලොව පුරා ප්‍රචලිත කර, ක්‍රියාත්මක කිරීමෙන් පොදු නිවහන වන සොබා දහම රැකගැනීමට හැකි වන බව නොඅනුමානය.

ජයනි මාරසිංහ

ඇත්ත නැසීම මීසම නැසීමක්

‘මීසම සිරුවෙන්’ සංවාදය

(ලෝරන්ස් ආනන්ද පියතුමා විසින් රචිත, ‘අද මිසම හෙට’ නම් වූ කෘතිය සම්බන්ධයෙන් ඇති වූ සංවාදයේ තුන්වැනි ලිපියයි මේ.)

පූජකභාවයට ගිහි පැවිදි භේදයක් නැත. එසේ නම් මේ දෙපිරිස ශුද්ධ පූජක පිරිසක් බවට පත් වන්නේ කෙසේද? නූතනයේ අප හමුවේ ඇති ප්‍රශ්නය එයයි. දැඩි නීති රීති ව්‍යවස්ථාවලින් හිස පුරවාගත් ඒකාධිපති පාලක ස්වරූප ආරූඪ කරගත් ඇතැම් අය අප අතර සිටිත් නම් අප ඔවුන් වෙනුවෙන් යාච්ඤා කළ යුතුය. තවද එමඟින් අප, යහපත් අය බලාපොරොත්තු විය යුතුය. අපගේ අපේක්ෂාව විය යුත්තේ එයයි. එසේ අපේ අපේක්ෂාව හා බලාපොරොත්තුව ඵලදායී කර ගැනීමට නම් අප විසින් කුමක් කළ යුතුද? එවැනි ඒකාධිපති ක්‍රියා හමුවේ අප සියලුදෙනා ධෛර්යයෙන් ක්‍රියා කළ යුතු අතරම, දැඩි සේ කෝප විය යුතුය. මන්දයත් බලාපොරොත්තුව හා අපේක්ෂාව වඩා ඵලදායී වන්නේ කෝපය හා ධෛර්යය යන ගුණාංගය ජනිත කිරීමෙන්ය. ඒ ශු. අගුස්තිනුතුමාගේ වදන්ය. එය තවදුරටත් විග්‍රහ කළහොත්, “අපේක්ෂාතුමියට දාව දියණියෝ දෙදෙනෙක් වෙති. එක්කෙනෙක් කෝපවතිය. අනෙකා දිරියවතිය.”

දෙවියන් වහන්සේ හා උන්වහන්සේගේ ධර්ම රාජ්‍යයේ උරුමක්කාරයන් වන පීඩිතයන් වෙනුවෙන් කතා කරන දිවැසිවරයාට ආවේණික ලක්ෂණයක්ය, “කෝපය”.

එම දිවැසිවරිය කෝපය අප තුළ ද සැඟවී ඇත. අප විසින් එය අවුස්සා ගත යුතුය. එම දිවැසිවරිය කෝපය අප තුළ ඇති වීම ක්‍රිස්තු ශ්‍රාවකත්වයේ ලක්ෂණයකි. එවැනි කෝපයක ක්‍රියාකාරිත්වය කිසිවිටෙක ක්‍රෝධයේ හෝ වෛරයේ ස්වරූපය නොගනී. එය වනාහි පීඩිතයාගේ විමුක්තිය පමණක් නොව, පීඩකයාගේ සිත් පෙරළියද ජනිත කරලීමට අප යොදා ගන්නා වූ කියුම් කෙරුම් මාලාවයි. මෙයින් පැහැදිය නොයුතු එහෙත් වැළකිය නොහැකි ඉරණමකටද එම දිවැසිවරයා හෙවත් සැබෑ කෝපකාරී තැනැත්තා හසු වේ. එනම් පීඩකයාගේ වෛරයට ගොදුරු වීමය. එවැනි අවස්ථාවක දී දරිද්‍රයන් මධ්‍යයේම ස්ථිරව හා නොසැලී සිටීම, විශ්වාසයේ හා බලාපොරොත්තුවේ සලකුණකි.

“විශ්වාසය” යනු දෙවියන් වහන්සේ කෙරෙහි ඇති අන්ධ භක්තියක් හෝ ශුද්ධ වූ සභාව උගන්වන දේවල් අපැහැදිලි වුවත් අව්වාදයෙන් පිළිගැනීමක් හෝ නොවේ. විශ්වාසය යනු, අසීමිත ප්‍රේමය වන අප දෙවි ස්වාමීන් වහන්සේගේ විමුක්තිජනක වදන ඇසෙන විට අප ගන්නා ස්ථාවරය වේ. හීබෘ බසින් “විශ්වාස කරනවා” යන්න ප්‍රකාශ වී ඇත්තේ “ස්ථිරව සිටිනවා” යන අරුත ගෙන හැර පාන “අමන්” යන ක්‍රියා පදය හරහාය. ඒ අනුව නිතිරීතිවලට යටත්ව විශ්වාසය ජනිත කළ හැකි නොවේ. (රෝම 3:9-20 කියවන්න.)

‘ව්‍යවස්ථාව පිළිපැදීමෙන් කිසිම මනුෂ්‍යයෙක් දේව සබඳතාවට පත් කරනු නොලැබේ. ව්‍යවස්ථාව පිළිපැදීමෙන් සිදු වන්නේ, පාපය පිළිබඳ හැඟීම ඇති කිරීමය.’ (රෝම 3:19-20)

එසේ නම් අප ගිහි- පූජකයන් වශයෙන් අන්‍යෝන්‍ය ලෙස විශ්වාසවන්තව, ඇදහිල්ලෙන් සිටින විට ව්‍යවස්ථාව ඉබේම වඩවඩාත් තහවුරු නොවන්නේ ද? (රෝම 3: 21-31 කියවන්න)

පහත උද්ධෘතයන් දෙස බැලීමෙන් ගිහියන් වශයෙන් අප කළ යුතු දෑ මොනවාදැයි වටහා ගැනීමට උත්සාහ කරමු.

“මනුෂ්‍ය පුත්‍රයාණන් වැඩියේ සේවය ලැබීමට නොව සේවය කරන්නටය, බොහෝ දෙනෙකුගේ මිදීම උදෙසා පිදීමටත් ය.”(මතෙව් 20:28)

“ඇත්ත ප්‍රකාශ නොකිරීම තරම් සභා එකමුතු ව්‍යාපාරයට හානිකර අන් දෙයක් නැත. එය හේතු කොටගෙන කතෝලික ධර්මයේ නිර්මලතාවයට හානි වන අතර, සත්‍යය හා ධර්මය යටපත් වන්නේය.”

දෙවැනි වතිකාන මන්ත්‍රණ සභා නිර්දේශ 16 න් 11 වැනි ප්‍රකාශයේ 10 වැනි ඡේදයෙන් උපුටා ගත් ප්‍රකාශයන් පහත දැක්වේ.

“ගිහියන් සභාව තුළ ඉටු කළ යුතු ක්‍රියාකාරකම් රැසකි. ගිහියන් නැතිව සභා පාලක සේවා සම්පූර්ණයෙන්ම ඵලදායක කර ගත නොහැකිය. ධර්මදූතික චින්තනයක් ඇති ගිහියන් තම සහෝදරයන්ගේ අඩුපාඩු පිරිමැසීමට සභා පාලකයන්ටද, අනෙකුත් විශ්වාසිකයන්ටද, ධෛර්යය දිය යුතුය.” (1 කොරින්ති 16:17-18)

ලබන සතියට...

රොමේෂ් නෝනිස්
සහකාර කථිකාචාර්ය
කැලණිය විශ්වවිද්‍යාලය

හලාවත දරුදැරියෝ පේසු ලැබූ දා

ඊ. සී. ප්‍රනාන්දු මුන්නේශ්වරම සමූහ

කාර්මෙල් දේව මාතා වහන්සේ නමින් නම් කර ඇති හලාවත ආසන දෙවි මැදුරු ඕසමේ ඊවත් වන දරු දැරියන් අතරින් පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම සඳහා පැවැත්වූ විශේෂ දිව්‍ය පූජා මෙහෙයක් පසුගියදා එම දෙවි මැදුරේදී පැවැත්විණි. අතර දරු දැරියෝ 143 දෙනෙක් ඕසම පාලනාධිපති ඩිලාන් මේරියස් ප්‍රනාන්දු පියතුමා වෙතින් පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ.

ශ්‍රී ලංකාවේ අපනයන ආදායම ඉහළට

මෙරට අපනයන ආදායම පසුගිය වසරට සාපේක්ෂව ඉහළ ගොස් ඇති බව ජූලි හා සැප්තැම්බර් මාසයේ අපනයන දත්ත සැලකිල්ලට ගනිමින් අපනයන සංවර්ධන මණ්ඩලය අනාවරණය කරයි.

රේගු සංඛ්‍යා ලේඛනවලට අනුව, 2019 සැප්තැම්බර් මාසයේදී වාර්තා වූ අමෙරිකානු ඩොලර් මිලියන 952.1ක වටිනාකමට සාපේක්ෂව වෙළෙඳ භාණ්ඩ අපනයන ඉපැයීම් 2020 සැප්තැම්බර් මාසයේදී 5.16%කින් අමෙරිකානු ඩොලර් මිලියන 1,001.27ක් දක්වා වර්ධනය වී තිබේ.

මේ ශක්තිමත් ආර්ථික පදනම ස්ථාපිතව ඇත්තේ රට තුළ සහ ගෝලීයව කොවිඩ් 19 හේතුවෙන් පවතින සීමා කිරීම් තුළ වීම විශේෂිතය.

මෙසේ අපනයනවල වැඩිවීම් මෙසේය.

2019 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2020 සැප්තැම්බර් මාසයේදී යුරෝපා කලාපයට යවන ලද අපනයනයන් සමස්ත අපනයනයෙන් 20.19%ක් වශයෙන්ද, මැදපෙරදිග රටවල් සඳහා 19.59%ක ප්‍රමාණයක්ද, අප්‍රිකානු කලාපය සඳහා 56.4% ක් වශයෙන් සමස්ත අපනයන බෙදා දැක්විය හැකිය.

එසේම 2020 අගෝස්තු මාසයේදී වෙළෙඳ අපනයනවලින් ලද ඉපැයීම් 2020 අගෝස්තු මාසයේදී වාර්තා වූ වටිනාකමට සාපේක්ෂව 5. 65% කින් ඉහළ ගොස් තිබේ.

"මේ වසරේදී අපනයන ඉහළ යන තුන්වැනි අවස්ථාව මෙයයි" යනුවෙන් පවසන අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති ප්‍රභාෂ් සුබසිංහ මහතා වැඩිදුරටත් පවසන්නේ "කෙසේ වෙතත් මෑතදී ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 ඉහළ යෑම පිළිබඳ අපි සැලකිලිමත් වන නමුත් කඩිනම් ප්‍රකෘතිමත් තත්ත්වයට පත්වීමට සහ ස්ථාවරව ව්‍යාපාර අඛණ්ඩ වර්ධනයක් කරා ඔසවා තැබීමට අපේක්ෂා කරමු.

මෙවැනි හදිසි තත්ත්වයන්ට අපගේ ව්‍යාපාර ඔරොත්තු දීමට තරම් ශක්තිමත් විය යුතුව ඇති අතර, ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවර බව සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන විදේශ විනිමය ගෙන ඒම සඳහා කැපවීමෙන් කටයුතු කළ යුතු බවත්, ඒ සඳහා කොවිඩ් 19 වැළැක්වීම සඳහා කඩිනම් පියවර තිබිය යුතුය." යනුවෙන් වැඩිදුරටත් සඳහන් කරයි.

භාණ්ඩ මෙහෙයුම් සේවකයකුට කොරෝනා ආසාදනය වීම ගැන ශ්‍රීලන්කන් කරුණු පැහැදිලි කරයි

කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළේ ශ්‍රීලන්කන් ගුවන් භාණ්ඩ මෙහෙයුම් අංශයේ සේවකයකු හට කොවිඩ් 19 පරීක්ෂණයක් සිදු කර ඇති බවත් එහි ප්‍රතිඵලය ධනාත්මක වූ බවට පළවන මාධ්‍ය වාර්තා සනාථ කිරීමට ශ්‍රී ලන්කන් ගුවන් සේවය බලාපොරොත්තු වේ.

එම කාර්ය මණ්ඩල සාමාජිකයා ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචිකරුවකු වන අතර, ඔහු මේ වන විට රෝහල්ගත කර අවශ්‍ය ප්‍රතිකාර ලබමින් සිටී.

ඔහුට බාහිර අයකුගෙන් මේ වයිරසය වැලඳී ඇති බව විශ්වාස කෙරේ. වයිරසය වැලඳී ඇති කාර්ය මණ්ඩල සාමාජිකයා සමඟ රාජකාරි කළ සේවකයෝ 50ක් මේ වන විට පීසීආර් පරීක්ෂණවලට භාජනය කර ඇති අතර, එහි ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටියි.

ආයතනය තුළ වයිරසය පැතිරීම වැළැක්වීම සඳහා රජය කොවිඩ් 19 සෞඛ්‍ය ආරක්ෂණ මාර්ගෝපදේශයන්ට අනුව සිය ශ්‍රම බළකාය ආරක්ෂා කිරීමට ගුවන් සමාගම සෑම පියවරක්ම ගෙන ඇති අතර, සෞඛ්‍ය හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ අඛණ්ඩව කටයුතු කරන බව පවසයි.

SriLankan Airlines
You're our world

ඇඟලුම් අපනයනකරුවන්ගේ වාණිජ මණ්ඩලය බ්‍රැන්ඩික්ස් ගැන මෙසේ කියයි

ඇඟලුම් කර්මාන්තකරුවන්ගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නියෝජනය කරන ශ්‍රී ලංකා ඇඟලුම් අපනයනකරුවන්ගේ වාණිජ මණ්ඩලය බ්‍රැන්ඩික්ස් සමූහය සහ විශේෂයෙන් මිනුවන්ගොඩ, යකහටුවෙහි පිහිටි කම්හලේ සේවය කළ සමස්ත රැකියා නියුක්තිය පිළිබඳ කරුණු දක්වමින් නිවේදනයක් නිකුත් කර තිබේ. වාණිජ මණ්ඩලයේ සභාපති බන්දුල ප්‍රනාන්දු සහ ප්‍රධාන ලේකම් හේමන්ත පෙරේරා විසින් නිකුත් කරන ලද ප්‍රකාශයේ මෙසේ සඳහන්ය. කාර්මික අපනයන අංශය තුළ ඉහළම විදේශ විනිමය ජනනය කරන ප්‍රධාන කර්මාන්තවලින් එකක් වන්නේ ඇඟලුම්ය. ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඔවුන් එවැනි ආදායමක් ලබා ගැනීමට උපරිම උත්සාහයක් ගන්නා අතර, සංචාරක හා විදේශ රැකියා වැනි අනෙකුත් අංශ මේ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත්ව ඇත.

ඇඟලුම් කර්මාන්තය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රමුඛ දායකයකු වන අතර, අපේ රටේ සමස්ත වැඩ කරන ජනගහනයෙන් 15% කට වැඩි පිරිසකට රැකියා උත්පාදනය කර තිබේ. මේ කර්මාන්තය හරහා ලබා දෙන වක්‍ර රැකියාද සැලකිල්ලට ගත යුතුය.

මේ කර්මාන්තයට සම්බන්ධ සමාගම් නිසා ජනතාවට රැකියා, ඔවුන්ගේ පවුල් පෝෂණය කිරීමේ සහ දරුවන්ගේ අධ්‍යාපන දියුණුව සඳහාද උපකාරීවී තිබේ. බ්‍රැන්ඩික්ස් යනු ශ්‍රී ලංකා රජය සහ විදේශයන්හි පිළිගත් බොහෝ සංවිධාන විසින් පිරිනමන ලද සම්මාන රාශියක හිමිකරුවකු වන හොඳම හා ප්‍රමුඛ ඇඟලුම් අපනයනකරුවෙකි. "මේ අභියෝගාත්මක කාලවලදී අපගේ ජාතිය සහ එහි ආර්ථිකය මුහුණ දී ඇති අර්බුදය ජය ගැනීම සඳහා අප එක්ව සිටිය යුතුය.

ව්‍යාපාරයට සහ එහි සේවය කරන පුද්ගලයන්ට කිසිදු ආකාරයකින් අප විසින් අනිසි බලපෑමක් ඇති නොකළ යුතුය. එසේ නොවුව හොත් එයින් රටේ ආර්ථිකයට ප්‍රබල බලපෑමක් ඇති වනු නොඅනුමානය. මෙවැනි තත්ත්වයක් රටේ ඕනෑම සාමාජික සමාගමකට ඕනෑම වේලාවක සිදු විය හැකිය.

ශ්‍රී ලංකාවේ මිත්‍රශීලී හා යහපත් හදවත් ඇති පුද්ගලයන් සිටින බවට ලොව පුරා ප්‍රචලිත කරුණකි. අපි ඒ අනුව ජීවත්වී මේ අවාසනාවන්ත තත්ත්වය මගහරවා ගැනීමට බ්‍රැන්ඩික්ස් වෙත සහාය දෙමු. "මේ තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා කාලෝචිත ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ සෞඛ්‍ය බලධාරීන්ට සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ස්තූතිවන්ත වන අතරම, අප නැවත වරක් බ්‍රැන්ඩික්ස් කණ්ඩායම සහ සියලු සේවකයන් සමඟ අපගේ සහයෝගිතාව ප්‍රකාශ කරමු.

In conversation with...

දේශීය පේෂ කර්මාන්තයට රටම සළුපිළියෙන් සරසන්න පුළුවන්

මධ්‍යම පළාත් පේෂකර්ම අධ්‍යක්ෂිකා දිනීකා කවිසේකර

මෙරට පේෂ කර්මාන්තයේ ඉතිහාසය කුවේණි යුගය දක්වා ඇතට දිවෙයි. කපු නූලෙන් විවිධ රටා මතු කරමින් නූතනයේ ජීවත් වන කුවේණි දියණියකගේ දැතින් හැඩගැන්වෙන සාරියක සුන්දරත්වය කියා පාන්නේ දේශීය නිර්මාණකරුවන්ගේ සාඩම්බර කතා පුවතයි. මේ වන විට පේෂ කර්මාන්තය පාරම්පරික ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් නව මානයක් ඔස්සේ ගමන් ආරම්භ කර තිබේ. ඒ වත්මන් රජය බලයට පැමිණ පාරම්පරික කර්මාන්ත නඟාසිටුවීම සඳහා ගත් පියවර සමඟිනි. අත් යන්ත්‍ර හා බලවේග යන්ත්‍ර භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන රෙදි පිළි ශ්‍රී ලංකාව පුරා නිෂ්පාදනය වුවත් මධ්‍යම පළාත එහිදී සුවිශේෂී වන්නේය. ඒ වැඩිම කාර්මිකයන් පිරිසක් එම ව්‍යාත්තියේ නිරතව සිටින්නේ මධ්‍යම පළාතේ බැවිනි.

පළාතේ පේෂකර්ම ක්ෂේත්‍රයේ ඉදිරි ගමන් මඟ සම්බන්ධවත් එම ව්‍යාත්තියේ නිරතව සිටින පිරිසගේ සුබ සිද්ධියත් වෙනුවෙන් ගෙන යන වැඩපිළිවෙළ සම්බන්ධව මධ්‍යම පළාත් පේෂකර්ම අධ්‍යක්ෂිකා දිනීකා කවිසේකර මහත්මිය සමඟ කළ සාකච්ඡාවකි මේ.

◆ මෙරට පේෂකර්ම නිෂ්පාදන ක්ෂේත්‍රයට මධ්‍යම පළාතෙන් සුවිශාල දායකත්වයක් දක්වනවා නේද?

මධ්‍යම පළාතේ පේෂකර්ම දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මධ්‍යස්ථාන 136ක් තිබෙනවා. සාරි, සරම්, කෝට්, ඇඳ ඇතිරිලි, අතපිස්නා, කොට්ට උර, තිර රෙදි, අත් බෑග්, සෙරෙප්පු, ටයි ඇතුළු නිර්මාණ 20ක් පමණ අපි වෙළෙඳපොළට හඳුන්වා දී තිබෙනවා. සාරි අතරින් පෙතම්පිළි සාරිය මධ්‍යම පළාතට සුවිශේෂී එකක්. ඒ නිර්මාණයේ තිඹිරිගෙය මධ්‍යම පළාතයි. දේශීය දේට වඩා විදේශීය දේ අගය කරන්නට පුරුදු පුහුණු වූ ජාතියක් ලෙස අප කොතරම් හොඳ පේෂකර්ම නිෂ්පාදන තිබුණත් අදින්නට පලඳින්නට පුරුදු වී සිටින්නේ විදේශවලින් ආනයනය කරන දේ. මේ නිසා මේ වටිනා කර්මාන්ත පිළිබඳ පසුගිය දශක කිහිපයක කාලයක් පුරා යොමු වුණේ අඩු අවධානයක්.

ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා අමාත්‍යාංශ විෂය පථ වෙන් කිරීමේදී පාරම්පරික ශිල්ප ක්‍රම ආරක්ෂා කර ගැනීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර ඒ වෙනුවෙන් වෙනම අමාත්‍යාංශ ස්ථාපිත කිරීමත් සමඟ පේෂ කර්ම නිර්මාණ සම්බන්ධව පෙරට වඩා වැඩි අවධානයක් සමාජයේ ඇති වුණා. අපේ පළාතේ තිබෙන මධ්‍යස්ථාන 136ක සේවය කරන 950ක් පමණ වන කාර්මිකයන්ගේ දැතින් පසුගිය වසරේ නිෂ්පාදනය වී තිබෙන රෙදි ප්‍රමාණය මීටර 190,000ක්.

◆ මේක පාරම්පරික කර්මාන්තයක් නේ ද?

ඔව්. අදටත් මහනුවර දිස්ත්‍රික්කයේ තලගුණේ ගම්මානයේ මේ කර්මාන්තයේ පාරම්පරික උරුමකරුවන් ජීවත් වෙනවා. අපි මධ්‍යම පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුව විදිහට පහසුකම් සපයා දී මේ කර්මාන්තයේ නිරතව මාසික ආදායමක් ලබා ගන්න ග්‍රාමීය කාන්තාවන්ට අවස්ථාව ලබා දී තිබෙනවා. රෙදි වගේම අපි නිමි ඇඳුම් නිර්මාණය කරනවා. මේ ක්ෂේත්‍රයේ බහුලව කාන්තාවන් නිරතව සිටියත් පුරුෂ පක්ෂයේ අයත් නිර්මාණකරණයේ යෙදී සිටිනවා. වයස අවුරුදු විස්සේ පමණ සිට දැත් දෙපා ශක්තිමත්ව තිබෙන කල් කාන්තාවන් මේ කර්මාන්තයේ නිරතව සිටිනවා. විශේෂ අවශ්‍යතා ඇති විශාල පිරිසක් අප සමඟ වැඩ කරනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් තිබෙන මධ්‍යස්ථානවලට ගොස් උපදේශිකාවන් අවශ්‍ය පුහුණුව ලබා දෙනවා.

◆ මෙමඟින් හොඳ ආදායමක් ලබා ගැනීමේ හැකියාවක් තිබෙනවා නේ ද?

පසුගිය වසරේ මධ්‍යම පළාතේ පේෂ කර්ම රැකියාවල නිරත වූ ග්‍රාමීයව වාසය කරන කාර්මිකාවන්ට ගෙවා තිබෙන මුදල රුපියල් ලක්ෂ 353ක්. සාමාන්‍යයෙන් මේ රෙදි විවීමෙන් රුපියල් 20,000ක පමණ මුදලක් මාසිකව පහසුවෙන් උපයා ගැනීමට පුළුවන්. දෑස් අන්ධ අය හැරෙන්නට විශේෂ අවශ්‍යතා ඇති අය නිවෙස්වලට බරක් නොවී තමන්ගේම දැතින් කීයක් හෝ පේෂ කර්ම කටයුතුවලින් උපයා ගන්නවා. මධ්‍යම පළාතේ ඩයි මධ්‍යස්ථාන ගණනාවක් තිබෙනවා. සුදු පැහැති නූල් ඩයි කර විවිධ පාට කවන්නේ මේ මධ්‍යස්ථානවලදී. ඒවගෙත් විශාල පිරිසක් සේවය කරනවා.

◆ නව රජය ගත් තීන්දුවත් එක්ක පෙරට වඩා මේ ක්ෂේත්‍රයට තරුණයන්ගේ අවධානය යොමු වෙලා නේ ද?

දේශීයව නිෂ්පාදනය කරන රෙදිපිළි පරිභරණය ප්‍රවර්ධනය කරන්න වත්මන් රජය පියවර රැසක් ගෙන තිබෙනවා. මේ කර්මාන්තයට හොඳ කලක් උදාවන බව දැන් කාටත් දැනී තිබෙනවා. මේ නව පිබිදීමත් එක්ක තරුණ කොටස් පේෂකර්ම ක්ෂේත්‍රයට වැඩි වශයෙන් නැඹුරු වෙමින් සිටිනවා. ඉදිරියේදී රාජ්‍ය සේවකයන්ට සතියකට වතාවක් බතික් හෝ අත්යන්ත්‍රවලින් නිර්මාණය වූ සාරි අඳින්න වක්‍ර ලේඛයක් නිකුත් වේවි. මේ කර්මාන්තය පුබුදුවාලීමට ඒ අකාර වැඩපිළිවෙළක් අවශ්‍යයයි.

◆ පේෂකර්ම නිෂ්පාදනවල මිල තරමක් ඉහළයි නේ ද?

අත් යන්ත්‍රයෙන් නිම කළ සාරියක මිල ටිකක් ඉහළයි තමයි. සාමාන්‍ය සාරියක් වියලා ඉවර කරනවාට කාර්මිකාවකට අපි අවම වශයෙන් රුපියල් 1,100ක් පමණ දෙනවා. නූල් මිලට ගැනීමට, ඩයි කිරීමට තවත් මුදලක් වැය වෙනවා. මේ සියල්ල එකතු වුණාම ටිකක් ඉහළ මිලක් මේ සාරියකට නියම කරන්න වෙනවා. අපි නූල් මිලට ගන්නේ ව්‍යාපාරිකයන්ගෙන්. රජය මැදිහත් වෙලා පළාත් නවයෙම පේෂකර්ම දෙපාර්තමේන්තුවලට අවශ්‍ය නූල් ප්‍රමාණය එකම ස්ථානයකින් නිකුත් කරන ආකාරයේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළොත් අපිට අඩු මිලට මේ නූල් ගන්න පුළුවන් වෙනවා. එහෙම වුණොත් සාරියකට වැය වන මුදල අඩු කර ගන්න පුළුවන්.

◆ පේෂ කර්ම නිෂ්පාදනවලට විදේශිකයන්ගේ හොඳ ඉල්ලුමක් තිබෙනවා නේ ද?

විදේශිකයන්ගේ ආකර්ෂණය මේ නිෂ්පාදනවලට ඉහළින්ම තිබෙනවා. මධ්‍යම පළාතේ පේෂ කර්ම අලෙවි මධ්‍යස්ථාන බොහොමයක් තිබෙන්නේ නගරයෙන් පිට. ඒ නිසා නගරයේ ජනතාව ගැවසෙන ස්ථානයක පේෂකර්ම අලෙවි ස්ථාන විවෘත කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. සංචාරක මඟ පෙන්වන්නන්ට කොමිස් ලබාදීමේ ක්‍රමවේදයක් අපි ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ නිසා විදේශික යන් අපේ මධ්‍යස්ථානවලට ඔවුන් රැගෙන එන්න උනන්දු වන්නේ නැහැ. මධ්‍යස්ථානවල ක්‍රෙඩිට් කාඩ් පහසුකම් නොමැති වීමත් අලෙවිය අඩු වීමට හේතුවක්. මේවා ගැන අපි දැන් අවධානය යොමු කරමින් සිටිනවා. රජය ගත් තීරණත් සමඟ දැන් අපේ පේෂකර්ම නිෂ්පාදනවලට ඇති ඉල්ලුම ඉහළ යමින් තිබෙනවා.

◆ මධ්‍යම පළාතේ පේෂකර්ම නිෂ්පාදන අංශය දියුණු කිරීම සඳහා වන සැලසුම් මොනවා ද?

Wපළාත් නවයේ පේෂකර්ම නිෂ්පාදන සහ පෞද්ගලික අංශයේ නිෂ්පාදකයන් එකතු වුණොත් අපිට රටටම අවශ්‍ය රෙදි දිය හැකියි. අනිත් පැත්තෙන් මේ අත්යන්ත්‍ර රෙදි නිර්මාණ කරන අයට NVQ සහතිකය ලබා ගැනීම සඳහා වැඩපිළිවෙළක් ආරම්භ යුතුයි. මධ්‍යම පළාත පුරා විසිරී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දේශීය ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙනවා. කොවිඩ් වසංගත තත්ත්වයත් සමඟ ඔවුන්ගේ වෙළෙඳපොළ බිඳ වැටුණා. ඔවුන්ට යළිත් මතුව එන්න අපි මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ ගමගේ මහතාගේ උපදෙස් මත වෙළෙඳ ප්‍රදර්ශනයක් (INNEX 2020) නමින් මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හිදී පැවැත්වූවා. අත්යන්ත්‍ර රෙදි, බතික්, සම් ආශ්‍රිත නිෂ්පාදන ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක නිරතව සිටින පාරම්පරික කර්මාන්තකරුවන් මේ ප්‍රදර්ශනයට තමන්ගේ නිර්මාණ එකතු කළා. දේශීය කර්මාන්තකරුවන්ට නව වෙළෙඳපොළ අවස්ථා නිර්මාණය කරදීම අපේ මූලික අරමුණයි. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් ගාමිණී රාජරත්න මහතාත් කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් මධුපානි පියසේන මහත්මියත් පළාතේ පේෂකර්ම අංශය දියුණු කරන්න විශාල දායකත්වයක් ලබා දෙනවා.

සාකච්ඡා කළේ
අසේල කුරුළුවංශ
ඡායාරූප
රුවන් මීගම්මන

රිෂාඩ් බදියුදීන් ලබා දුන් සියලු පත්වීම් අවලංගු කරන්න

ගලගොඩඅත්තේ ඥානසාර හිමි

උපාලි කරුණාරත්න

වත්මන් ආණ්ඩුවට බලය ලබා දුන්නේ පෙර තිබූ වැරදි නිවැරදි කිරීමට බවත් හිටපු ඇමැති රිෂාඩ් බුදුර්දීන් මහතාගේ අධික්ෂණය යටතේ සිදුවූ පත්වීම් සියල්ල අවලංගු කර විධිමත් පරීක්ෂණයක් සිදුකර සුදුස්සන්ට නැවත අදාළ පත්වීම් ලබා දිය යුතු බවත් බොදු බල සේනා සංවිධානයේ මහ ලේකම් ගලගොඩඅත්තේ ඥානසාර හිමියෝ ප්‍රකාශ කළහ.

උන් වහන්සේ එසේ ප්‍රකාශ කළේ ඊයේ (14) පාරිභෝගික සේවා අධිකාරියට පැමිණි අවස්ථාවේදීය.

වැඩිදුරටත් අදහස් දැක්වූ උන් වහන්සේ :

පාරිභෝගික කටයුතු අධිකාරියට අප ආවේ සභාපතිතුමා ඇතුළු වගකිව යුතු පිරිස දැනුවත් කරන්න. අප සභාපතිතුමා සමඟ දුරකතනයෙන් සම්බන්ධ වුණා. අධ්‍යක්ෂක මහත්මයෙක් මුණගැසුණා.ඇමැතිවරයෙකු වූ රිෂාඩ් බදියුදීන් මහතා මෙම අමාත්‍යාංශය භාරව කටයුතු කළ කාලයේ කලමනාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර තිබෙනවා පාරිභෝගික

අධිකාරියට බදවා ගැනීම සඳහා තිබූ සුදුසුකම් ලිහිල් කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව මගින් පිළිගත් උපාධියක් එක්ක මේ ආයතනයට යම් පිරිසක් බදවා ගත යුතු බව විමර්ශන නිලධාරීන් ලෙස. මේ ආයතනයට පුද්ගලයන් බදවා ගැනීම සඳහා සුදුසුකම් ඉල්ලා තිබුණේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගත් ආර්ථික විද්‍යාව, කළමනාකරණය හෝ අලෙවිකරණය සම්බන්ධයෙන් වන උපාධි සුදුසුකමක් තිබිය යුතු බව. නමුත් අපට පෙනෙනවා ඉතා විශාල වංචාවක් මේ බඳවා ගැනීම් තුළ සිදුවී තිබෙන බව. එනිසා බදුර්දීන් ඇමැතිවරයාගේ අධික්ෂණයෙන් ලබාදුන් පත්වීම් සියල්ල අවලංගු කර ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කර ඉන් අනතුරුව සුදුසුකම් තිබෙන අයට නැවත පත්වීම් ලබාදෙන ලෙස අප ඉල්ලා සිටිනවා. ඉස්ලාම් ආගම පිළිබඳ උපාධියක් තිබෙන අයට මුස්ලිම් විදුහලක පත්වීමක් දීම වරදක් නැහැ. එසේ උපාධි තිබෙන අය පාරිභෝගික කටයුතු අමාත්‍යාංශයට අවශ්‍යද?. ඇතැමුන්ගේ උපාධි තහවුරු කරගෙන නැහැ. මේ රට තුළ ක්‍රියාත්මක වන ආර්ථික හා චින්තන ජීනාදය තේරුම් ගත යුතුයි. බදුර්දීන් මහතා කළ වැරදි නිවැරදි කළ යුතුයි. මොහුව අත්අඩංගුවට ගැනීමට කොච්චර දේ තිබෙනවාද. අක්කර තුන් දහසක් අයිති වුණේ කොහොමද?.

ඇමැති පී.එල්.ගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අගරදගුරු හිමියෝ සහාය පළ කරති

අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතාගේ මගපෙන්වීම යටතේ මෙරට අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාවට නැංවෙන ඉදිරි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් කතෝලික පල්ලි ඇතුළු සමස්ත ප්‍රජාවගේ සහයෝගය ලබා දෙන බවත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාවට නංවන ඉදිරි සංවර්ධන ක්‍රියාමාර්ග වෙනුවෙන් සිය පූර්ණ දායකත්වය ලබාදීමට සූදානම් බවත් අග රදගුරු හිමියෝ සඳහන් කළහ.

ආගමික සංස්ථාව හා අධ්‍යාපන පද්ධතිය අතර සහ සම්බන්ධයක් පවත්වා ගැනීමේ වැදගත්කම ද අගරදගුරු හිමියෝ අවධාරණය කළහ.

කොළඹ අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සහ අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා අතර පැවැති විශේෂ හමුවකදී උන්වහන්සේ මේ බව සඳහන් කළහ.

ළඟිරු දමිත් කොඩිතුවක්කු අගමැති සම්බන්ධීකරණ ලේකම් ධුරයට

රෝහණ ආරියරත්න හම්බන්තොට විශේෂ

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ සම්බන්ධීකරණ ලේකම්වරයකු ලෙස ළඟිරු දමිත් කොඩිතුවක්කු මහතා මේ මස 13 දින සිට පත් කර ඇත.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රබල ක්‍රියාකාරිකයකු ලෙස 1970 වර්ෂයේ සිට බෙලිඅත්ත ප්‍රදේශයේ දේශපාලන කටයුතු වල නිරත වී ඇති සිරිපාල කොඩිතුවක්කු මහතා ළඟිරු දමිත් මහතාගේ පියාය.

වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය හදාරා ඇති ඔහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානයට නායකත්වය ලබා දෙමින් ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතවී ඇති අතර 2010 වර්ෂයේ සිට වර්තමාන ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතාට ශක්තියක් වෙමින් ඔහුගේ දේශපාලන කටයුතුවලට සම්බන්ධ වී ඇත. 2015 වර්ෂයේ සිට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ හම්බන්තොට දිස්ත්‍රික් තරුණ සංවිධානයේ සංවිධායකවරයා ලෙසද ඔහු කටයුතු කර තිබේ.

පෝලන්ත රැකියා ඒජන්සිවලට මුදල් බැඳීමට පෙර විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් තහවුරු කරගන්න

අනුර ප්‍රේමලාල්

පෝලන්ත රැකියා ලබාගැනීම සඳහා, තම රැකියාව තහවුරු කර ගැනීමෙන් පසුව හා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් විමසීමෙන් පසුව පමණක් රැකියා නියෝජිතායතනවලට මුදල් ගෙවන මෙන් විදේශ සේවා නියුක්ති කාර්යාංශය රැකියා ලාභීන්ගෙන් ඉල්ලා සිටියි.

ඇතැම් රැකියා නියෝජිතයන් පෝලන්තයේ රැකියා ලබාදෙන බවට නීත්‍යනුකූල පුවත්පත් දැන්වීම් පළකරමින්, රැකියා ලාභීන්ගෙන් විශාල වශයෙන් මුදල් අය කරගන්නා බවට ලැබී ඇති පැමිණිලි සැලකිල්ලට ගෙන මෙම තීරණයට එළැඹි බව කාර්යාංශය සඳහන් කරයි.

පෝලන්තයේ රැකියා සඳහා රැකියා ඇනවුම් හා ඒ සඳහා දැන්වීම් පළකිරීමට කාර්යාංශයේ අනුමැතිය ලබාදෙන අතර, විසා පත්‍රය හා රැකියා ගිවිසුම නොමැතිව රැකියා ලාභීන්ගෙන් මුදල් අයකිරීමට අවසර ලබාදී නැත. එබැවින් කිසිවිටෙක රැකියා බලපත්‍රය හා රැකියා සඳහා වීසා බලපත්‍රය ලබා නොගෙන කිසිදු විටෙක ඒජන්සි ආයතනවලට මුදල් ලබාදීමෙන් වළකින ලෙස කාර්යාංශය රැකියා ලාභීන්ට දැඩිව අවධාරණය කරයි. එසේම කාර්යාංශයේ විධි විධානවලට පටහැනිව මුදල් අයකිරීමද නීති විරෝධී වේ.

පෝලන්තයේ රැකියා සම්බන්ධ සියලුම තොරතුරු කාර්යාංශයේ පැය 24 තොරතුරු මධ්‍යස්ථානයේ 011-2879901/ 011-2879903/ 011-2118700/ 011-2880500 යන දුරකථන අංකයන් වෙත ඇමතීමෙන් ලබාගන්නා ලෙසත්, මුදල් ලබාදීමට පෙර ඒ බව තහවුරු කරගන්නා ලෙසත් කාර්යාංශය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

උඟ වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට වෛද්‍ය පීඨයක්

අනුර ප්‍රේමලාල්

උඟ වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීමට රජය තීරණය කරයි.

මෑතක දී ස්ථාපිත කරන ලද උඟ වෙල්ලස්ස විශ්ව විද්‍යාලය උසස් අධ්‍යාපනික ගුණාත්මකභාවයක් සහ රැකියා වෙළඳ පොළ ඉලක්ක කරගත් ,විවිධාංගීකරණය කරන ලද උපාධි පාඨමාලා නිසා එම උපාධිධාරීන්ට රැකියා අවස්ථා සපයා ගැනීමේ අසීරුතා අවම වීම නිසා උඟ වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සුවිශේෂත්වයකට පත්වී ඇත.

මෙම සාකච්ඡාවේදී අදහස් දැක්වූ කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා කියා සිටියේ.

උඟ වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට වෛද්‍ය පීඨයක් ලබාදෙන ලෙස තමන් මෙම සරසවිය පිහිටුවූ දවසේ සිටම දීර්ඝ කාලයක් උඟ වෙල්ලස්ස ජනතාව වෙනුවෙන් ඉල්ලීම් කළ බවයි.

අමාත්‍යවරයා මේ බව කියා සිටියේ,ඊයේ (13) අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී.එල්.පීරිස් මහතාගේ ප්‍රධානත්වයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ පැවති සාකච්ඡාවකදීය.

එහිදි වැඩිදුරටත් අදහස් දැක්වූ කම්කරු ඇමැතිවරයා මෙසේද කීය. නවක වදය හා පංති වර්ජන,පිකටින් වලින් තොර මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය සම්පූර්ණ කරන සෑම අයකුටම ස්ථීර රැකිය අවස්ථාවක් හිමවන අතර මෙම විශ්වවිද්‍යාලයේ උපාධිලාභීන්ට ඉහළම පිළිගැනීමක් පවතී.

මෙම විශ්වවිද්‍යාලයට අවශ්‍ය සියලු යටිතල පහසුකම් සම්පූර්ණ කර ඇති බවද, එය පුළුල් කිරීම සඳහා අවශ්‍ය අතිරේක ඉඩම් ද වෙන් කර ලබා ගෙන ඇත.

පීඨයේ සායනික කටයුතු සඳහා සියලු පහසුකම්වලින් සමන්විත බදුල්ල රෝහල ද හෙද විදුහල ද ඇත.එසේම පරිවාරයේ ඇති මහියංගන,දියතලාව සහ වැලිමඩ රෝහල් ද මෙම සායනික කටයුතුවලට බද්ධකර ගත හැක. බදුල්ල හා මොනරාගල දිස්ත්‍රික්වලින් වසරකට වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා 150 දෙනකු පමණ සුදුසුකම් ලබන අතර සිය නිවෙස්වල සිටම වෛද්‍ය විද්‍යාව උපාධිය හැදෑරීමට මේ තුළින් සිසුන්ට පහසුව සැලසෙන බව මෙහි දී ප්‍රකාශ විය.

මෙහි දී අදහස් දැක් වූ අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා කියා සිටියේ,උඟ වෙල්ලස්ස විශ්ව විද්‍යාලයට වෛද්‍ය පීඨයක් ලබාදීම සුදුසු බව රජය තීරණය කර ඇති බවයි.මෙරටට අවශ්‍ය වෛද්‍යවරුන් සංඛ්‍යාව බිහි කිරීම සඳහා වෛද්‍ය අධ්‍යාපනය පුළුල් කිරීම අත්‍යවශ්‍ය බවය.වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීමේ දී ඊට අවශ්‍ය විද්වත් විශේෂඥයන් අගනුවරින් බැහැර ප්‍රදේශවලට යැවීම දුෂ්කර බවත් ,ඒ නිසා ගත්‍යානුගතික පාඨමාලාවලින් බැහැර වූ නව ආකෘතිගත වෛද්‍ය පීඨයක් උඟ වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට අනුබද්ධව පිහිටුවීම ඵලදායි බව මෙම සාකච්ඡාවට එක් වූ වෛද්‍ය පීඨාධිපතිවරු සහ විද්වත්හු පෙන්වා දුන්හ.එහෙයින් ආරම්භයේ දී මෙම පීඨය වෙනත් විශ්ව විද්‍යාලවල වෛද්‍ය පීඨයන්ට අනුබද්ධ වෛද්‍ය පීඨයක් ලෙස පවත්වා ගෙන යාම තුළින් බොහෝ ගැටලු විසඳා ගත හැකි බව අමාත්‍ය පී .එල්.පීරිස් මහතා පැවසීය.ඒ අනුව මේ පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සහ සෙසු වෛද්‍ය පීඨයන් අතර පුළුල් සාකච්ඡාවක් පවත්වා මෙම වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීම පිළිබඳ ධනාත්මක පියවර ගැනීමට අදාල යෝජනා මාසයක් ඇතුලත මිළඟ සාකච්ඡාවට ගන්නා ලෙස ද උපදෙස් දුන්නේය.

මෙම සාකච්ඡාවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග,කොළඹ,කරාපිටිය,ජයවර්ධනපුර, වෛද්‍ය පීඨාධිපතිවරු ද එක් වූහ.

බදියුදීන් අත්අඩංගුවට ගන්න කිසිම දේශපාලන බලපෑමක් කර නෑ

ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු

රිද්මි අමෝදා

රිෂාඩ් බදියුදීන් අත්අඩංගුවට ගන්න කිසිදු දේශපාලනික බලපෑමක් සිදු නොකළ බව මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පැවසුවේ ය.

වයඹ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා ලෝක බැංකු මූල්‍ය ප්‍රතිපාදන මගින් බමුණුකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාවට ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ළඟා කර දීම සඳහා රුපියල් මිලියන 22.7 ක් වැය කර ඉදි කරන ලද බමුණුකොටුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඊයේ (14) ජනතා අයිතියට පත් කිරීමේ අවස්ථාවට එක්වෙමින් අමාත්‍යවරයා මේ බව කීවේ ය.

එහි දී වැඩිදුර අදහස් දක්වමින් අමාත්‍යවරයා මෙසේ ද කීවේ ය.

මාධ්‍ය හරහා දේශපාලනික වශයෙන් පළිගැනීම් කරන්න රිෂාඩ් බදියුදීන් අත්අඩංගුවට ගන්න නියෝග කර තිබෙනවා.ජනතාව අපේ ආණ්ඩුවට මෙවට නීතිය ක්‍රියාත්මක නො කිරීමට හේතු මොනවාදැයි ඇහුවා.නීතියට ඉඩ දී කිසිදු දේශපාලනික බලපෑම් නො කර මේ තින්දුව අරන් තියෙන්නේ.ඒ වගේම රිෂාඩ් බදියුදීන් මහතාගේ සහෝදරයා පාස්කු ප්‍රහාරය සම්බන්ධව අත්අඩංගුවට ගෙන සිටිය ද ඔහුව සම්පූර්ණයෙන්ම නිදහස් කර තිබෙනවා.ඒ ගැන වහාම හොයන්න අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කළා.මේ පරීක්ෂණය ගැන අපිට අවිශ්වාසයක් තිබෙනවා.දැන් ඒ ගැන හොයල බලනවා.කැලෑ නීතිය ක්‍රියාත්මක වීමට අප ඉඩ දෙන්නේ නෑ. නීතියෙන් පරිබාහිරව යම් යම් අය තීන්දු ගන්නවා නම්,නීතිය ක්‍රියාත්මක නො කර වැරදිකරුවන් නිදහස් කරනවා නම් ඒක වැරැද්දක්.ඒ වැරැද්ද කරන්නේ ආණ්ඩුව කෙරෙහි සිය විශ්වාසය තබා සිටින රටේ ජනතාවටයි.ඒ නිසා රටේ නීතිය ක්‍රියාත්මක කරන පිරිස් නීතිය අවංකභාවයෙන් ක්‍රියා කරවීමට කටයුතු කළ යුතුයි.

මෙම අවස්ථාවට පශු සම්පත් , ගොවිජොල ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත ගරු රාජ්‍ය අමාත්‍ය ඩී.බී.හේරත් , කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගුණපාල රත්නසේකර, වයඹ පළාත් ආණ්ඩුකාර අධිනීතිඥ රාජා කොල්ලුරේ යන මැතිතුමන්ලා ඇතුළු සම්භාවනීය අමුත්තෝ රැසක් සහභාගී වූහ.

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සහ ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ වෘත්තීය සමිති එකමුතුවෙන් රජයට තුති මල් මිටක්

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සහ ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු පසුගිය සතියේ එම ධුරයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් බැංකුවල වෘත්තීය සමිති නායකයෝ රජයට ප්‍රසාදය පළ කරති.

මෙම බැංකු දෙකෙහිම සියලු වෘත්තීය සමිති නායකයෝ රජය ගනු ලැබූ තීන්දු සම්බන්ධයෙන් ප්‍රසාදය පළ කරන අතර නැවත වතාවක් එවැනි අයෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට ඉඩ නොතබන ලෙසද ඉල්ලීමක් කර සිටියි.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව මෙරට ජනතාවට වඩාත් සුහදශීලි සහ ජනතාවගේ විශ්වාසනීයම බැංකුව ලෙස සේවා සපයමින් ඉදිරියටත් ශක්තිමත්ව ක්‍රියාත්මක වීමට ගනු ලබන ඕනෑම තීන්දුවකට තම පූර්ණ සහයෝගය ලබාදෙන බවද වෘත්තීය සමිති නායකයෝ අවධාරණය කරති.

දික්ඕවිට ධීවර වරාය යළි ඇරේ

බුද්ධිකා ඉඹුලාන

දික්ඕවිට ධීවර වරායෙන් ධීවර රැකියාවට ගිය ධීවර කාර්මිකයකුට කොවිඩ් වයිරසය ආසාදනය වීම හේතු කොට ගෙන පසුගියදා තාවකාලික වසා දැමූ දික්ඕවිට ධීවර වරාය ඊයේ (14) ධීවර කටයුතු සඳහා යළි විවෘත කෙරිණි.

ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතාගේ නිර්ක්ෂණයෙන් පසු ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපති කපිතාන් නිහාල් කැප්පෙටිපොළ මහතාට ලබා දුන් උපදෙස් අනුව මෙම ධීවර වරාය විෂබීජ හරණය කොට විවෘත කර ඇත.

ධීවරයකුට කොවිඩ් වයිරසය ආසාදනය වීම නිසා දික්ඕවිට වරායේ සමස්ත මෙහෙයුම් කටයුතු නතර කර එම යාත්‍රාවේ ගමන් ගත් ධීවරයින් හා සේවා පහසුකම් ලබා දුන් වරාය කාර්ය මණ්ඩල සේවකයන් ඇතුළු සමස්ත පුද්ගලයන් PCR පරීක්ෂණයට ලක් කරන ලද අතර ඔවුන්ගේ PCR පරීක්ෂණ වාර්තා අනුව ඔවුන්ට කොවිඩ් වයිරසය ආසාදනය වී නොමැති බව සනාථ වී තිබේ.

වැඩි දුරටත් PCR පරීක්ෂණ සඳහා යොමු කල එම පිරිස් දින 14ක කාලයක් සඳහා නිරෝධායනට යොමු කර තිබේ. පසුව වරාය පරිශ්‍රය සම්පූර්ණයෙන් විෂබීජ හරණය කොට සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව වරාය යළි විවෘත කිරීමට කටයුතු කළ බවත් දික්ඕවිට වරායේ කටයුතු ,මේ වනවිට සාමාන්‍ය පරිදි සිදු වන බවත් ධීවර වරාය නීතිගත සංස්ථාවේ සාමාන්‍යාධිකාරී ජනක ප්‍රසන්න මුදලිගේ මහතා කියයි.

මෙහිදී මුලික අදියරේදී ආරක්ෂක මත්ස්‍ය තොග ගොඩ බෑම හා ධීවර කර්මාන්තයේ නිරතවීමට ධීවරයන් පිටත් කිරීම පමණක් ධීවර දෙපාර්තමේන්තුව හා වෙරළාරක්ෂක නිලධාරීන්ගේ අධික්ෂණය යටතේ සිදුකිරීමටත් ඉදිරියේදී ඉන්ධන, ජලය හා අයිස් යන සේවා සැපයීමටද කටයුතු කරන බවද මුදලිගේ මහතා කියයි.

මෙම නිරෝධායන කටයුතු වත්තල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය අසුන්තා සහ වෛද්‍ය සදමාලි මහත්මින් විසින් සිදුකරන ලදි.

චීනයත් පාකිස්තානයත් රුසියාවත් ජගත් මානව හිමිකම් කවුන්සලයට

මහින්ද අලුත්ගෙදර

රුසියාව, චීනය හා පාකිස්තානය ඇතුළු රටවල් කිහිපයක් ජගත් මානව හිමිකම් කවුන්සලය ඉදිරි වසර තුනක කාලය සඳහා නියෝජනයට තේරී පත්ව ඇත

මේ රටවලට අමතරව කියුබාව, උස්බෙකිස්තානය, නේපාලය ද මෙවර ජගත් මානව හිමිකම් කවුන්සලය සඳහා තේරී පත්ව ඇත. පසුගිය 2016 වසරේ දී ඡන්ද 152ක් ලබාගනිමින් ජගත් මානව හිමිකම් කවුන්සලයට තේරී පත්වූ සවුදි අරාබියාව මෙවර තේරී පත් නොවීම විශේෂත්වයකි

චීනය සහ රුසියාව අන්තර්ජාතික වේදිකාවේ දී ශ්‍රී ලංකාව වෙනුවෙන් පෙනී සිට තිබෙන අතර ජගත් මානව හිමිකම් කවුන්සලය ඇතුළු අන්තර් ජාතික තලයේ දී ශ්‍රී ලංකාවට එල්ල වූ අභියෝගයන්වල දී එම රටවල් ද්විත්වය ශ්‍රී ලංකාව වෙනුවෙන් හඬනඟා තිබෙන බවද ඒ අනුව ඔවුන් යළි ජගත් මානව හිමිකම් කවුන්සලයට පිවිසීම ශ්‍රී ලංකාවට අතිශය වැදගත් වනු ඇති බවද ජාත්‍යන්තර විචාරකයෝ පෙන්වා දෙති.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් 193 අතර මේ සම්බන්ධයෙන් රහස් ඡන්ද විමසීමක් පවත්වා තිබේ.

මෙම ඡන්ද විමසීමේ දී පාකිස්තානය ඡන්ද 169ක් ලබා තිබෙන අතර උස්බෙකිස්තානය ඡන්ද 164ක් ද නේපාලය ඡන්ද 150 ක් සහ චීනය ඡන්ද 139 ක්ද වශයෙන් ලබාගෙන තිබේ.

මානව හිමිකම් කවුන්සිලයේ නීතිරීති යටතේ, භූගෝලීය නියෝජනය සහතික කිරීම වෙනුවෙන් එක් එක් කලාපවලට ආසන වෙන්කරමින් මේ තෝරා ගැනීම සිදුව තිබෙන අතර 47 දෙනෙකුගෙන් යුත් මානව හිමිකම් කවුන්සිලයට සාමාජිකයින් 15 දෙනෙකු තෝරා පත්කර ගැනීම වෙනුවෙන් මෙම රහස් ඡන්දය පවත්වයි.

මහ මඟ නවතා තිබුණු වාහනවල බැටරි සොරකම් කළ දෙදෙනෙක් අත්අඩංගුවට

මල්වාන සමූහ - මහානාම විතානගේ

යතුරු පැදියෙන් ගොස් මහ මග ගමන් ගන්නන්ගේ ජංගම දුරකතන මංකොල්ල කමින් රාත්‍රී කාලයේ මහ මඟ නවතා තිබෙන වාහන වල බැටරි සොරකම් කිරීමේ යෙදුන තරුණයන් දෙදෙනෙකු එම යතුරු පැදියත් සමඟ වැලිවේරිය පොලිසිය මගින් අත්අඩංගුවට ගන්නා ලදී.

තවද මොවුන් විසින් එසේ මංකොල්ල කනු ලැබූ රුපියල් හැත්තෑ දහසක් පමණ වටිනා ජංගම දුරකතන දෙකක් හා ලොරි රථයකින් සොරකම් කළ බැටරියක් ද පොලිසිය විසින් සොයා ගෙන ඇත.

එහි බස්නාහිර පළාත් බුද්ධි අංශයේ සැරයන්වරයකු ලද තොරතුරක් මත අත්අඩංගුවට ගත් එම තරුණයන් දෙදෙනාගෙන් එක් තරුණයෙකුට හෙරොයින් හා සොරකම් සම්බන්ධව අධිකරණයෙන් වරෙන්තු තුනක් ද නිකුත් කර තිබෙන බවට ද හෙළිවිය.

මොවුන් විසින් මහමග සිටින අය ළඟට ගොස් සුභඳ වී හදිසි පණිවුඩයක් දැනුම් දීමට බවට පවසමින් ඔවුන්ගෙන් ජංගම දුරකථන ඉල්ලා ගෙන හෝ නැතිනම් මංකොල්ලකා ගෙන රැගෙන යන බව කියති .

මෙ අතර මොවුන් රාත්‍රී කාලයට යක්කල- මල්වතුහිරිපිටිය මාර්ගයේ නවතා තිබෙන වාහන වල බැටරි ද සොරකම් කර තිබේ.

මොවුන් විසින් මංකොල්ල කන ලද එම ජංගම දුරකථන දෙක සේදවත්ත පුදේශයට හා බැටරිය තොටළඟ පුදේශයට විකුණා තිබි සොයා ගත් අතර ඔවුන් මත්කුඩු වලට ඇබ්බැහි වූවෝ වෙති.

මොවුන් ඌරුවල හා පිළිකුත්තුව යන පුදේශවල පදිංචි වයස අවුරුදු 19 හා 26 වන වියේ පසුවන්නන් වන අතර ඔවුන් ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට දැන් කටයුතු කර ගෙන යති.

වැලිවේරිය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක පුදීප් හේමන්ත කුමාර අතපත්තු මහතාගේ උපදෙස් අනුව අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ජයනිස්ස, උප පොලිස් පරීක්ෂක බොතේජු, සැරයන් ස්ටැන්ලි , හෙට්ටිආරච්චි හා පෝ කො වනසිංහ), යන නිලධාරීන් විසින් මෙම වැටලීම සිදු කරනු ලැබීය.

පිටුව 22
› නූතන ශාසන ප්‍රබෝධයේ ශාස්ත්‍රවන්තයා

පිටුව 23
› මහාවංසයේ තිබෙන්නෙ හෙළයන්ගේ ඉතිහාසයම ද?

පිටුව 24
› ශ්‍රී වික්‍රම රාජසිංහ සැහැසි පාලකයෙක්?

ඉතිහාසය

ස්වර්ණභූමියේ අතීතාවලෝකනය

යාල වන මැද

මහ රහතුන් බවුන් වැඩූ

චිතල පවත

යාල වන මැද පුදබිම ලෙස සිවිදිග ප්‍රසිද්ධියට පත් සිතුල්පව්ව පින්බිම, වර්ෂයේ වැඩි කාලයක් කුටුක දේශගුණයක් පවතින පෙදෙසකි. වර්ෂයේ අග භාගයේ යාල මහ වනයට ඇදහැලෙන වර්ෂාව, හුදෙක් සිතුල්පව්වේ සුන්දර පරිසරයට පමණක් නොව, සමස්ත යාල මහ වනයටම සශ්‍රීකත්වය රැගෙන පැමිණේ. මහ වැසි ලද විට මේ මහ වනය, ගස්වැල් හරිත වර්ණයෙන් සරසා, අතු අග නේක වර්ණයෙන් සුවඳ පුෂ්ප හටගන්වා, හාත්පස මනරම් දර්ශනයක් මවන්නේ, එම අපූර්වත්වය විඳහා පාමිනි.

දකුණු පළාතේ හම්බන්තොට හා උඩ පළාතේ මොනරාගල දිස්ත්‍රික්කවලට අයත්ව ව්‍යාප්ත වී ඇති යාල වනෝද්‍යානය මධ්‍යයේ සිතුල්පව්ව රාජමහා විහාරය පිහිටා ඇත. මේ පෞරාණික භූමියට පිවිසීමට ප්‍රධාන මාර්ග දෙකකි. ඉන් එකක් තිස්සමහාරාමයේ සිට යෝධ කණ්ඩිය පාර හරහා යාල වනාන්තරය මැදින් වැටී ඇත. මේ මාර්ගයේ කිලෝමීටර 34ක් පමණ දුර ගෙවා, මේ සුන්දර භූමියට පැමිණිය හැකිය. අනෙක් මාර්ගය නම්, කතරගම සිට කිලෝමීටර 18ක් පමණ දුර යාල වන මැදින් පැමිණීමයි. මේ කුමන මාර්ගයේ පැමිණිය ද, මෙහි යෑම සඳහා ස්වභාවධර්මයේ අපූරු නිර්මාණයක් ලෙස සැලකිය හැකි යාල මහා වනාන්තරය පසු කළ යුතුය.

දේශගුණික බෙදීම් අනුව යාල අර්ධ ශුෂ්ක දේශගුණයකට උරුමකම් කියයි. මතුපිට බෙහෙවින්ම තැනිතලා ස්වරූපයක් දැරුවද, ඉඳහිට භූමිය පුරා උස් වූ පාෂාණ උද්ගත නොඅඩුව පවතී. කුටුක දේශගුණයට කර්කෂ වූ ශාක පද්ධතිය, ප්‍රදේශයට ආවේණික ශාකවලින් ද යුක්තය. වැසි සමයේ දී මලින් බර වන මල් ගොමුවලට අමතරව, භූමියේ විසිරි පවතන පෞරාණික වාරි පද්ධතිය ද, වැසි ලද පසු ජලයෙන් පිරී ඉතිරී යන්නේ, සකලවිධ ජීවීන්ට සෙත සලසමිනි.

යාල මහ වනය අත්විඳින කුටුක අත්දැකීම් නොඅඩුව ලබමින්, සිතුල්පව්ව පුද බිම ද නොසැලී දරා හිඳී. ඒ සඳහා බුදු දහමින් මනා ලෙස හික්මවන ලද බෞද්ධ පරිසරයක් මෙහි දැකිය හැකිය. බුදු දහමේ ඉගැන්වෙන අටලෝදහම, මේ පරිසරයේ සියලු ගහ කොළ හා සත්ත්ව සිවිපාවා මැනවින් ප්‍රගුණ කර ඇති සේය. ඒ නිසාම, මේ පින්බිම සියලු සතුන්ට අභය ස්ථානයකි.

පැරණි මාගම්පුර රාජධානියට අයත් අතිශය වැදගත් මහාවිහාර අතර, සිතුල්පව්ව විහාරය ප්‍රමුඛ ස්ථානයක පසු වේ. සිතුල්පව්ව අයත් යාල වනෝද්‍යානය ප්‍රදේශයේ අතීතයේ ඉතා සශ්‍රීක ජනාවාසයක් පැවැති බව, වනයෙන් වැසී ඇති නටබුන් සාක්ෂ්‍ය දරයි. මේ භූමියේ ඉතිහාසය, මාගම්පුර රාජධානි සමයටත් වඩා ඈතට ගෙන යාමට ජ.ඇ. නිකොලොස් උත්සාහ දරා ඇත. (නිකුලස් 1979: 72, 73). ඊට අනුව පැරණි කතරගම නිදහස් ප්‍රාදේශීය රාජ පෙළපතක් වූ කතරගම ක්ෂත්‍රියයන්ගේ පාලන ප්‍රදේශයක් ලෙස අතීතයේ මේ ප්‍රදේශය අයත්ව තිබී ඇත. (නිකුලස් 1979: 58).

මහානාග උපරාජයා ක්‍රි. පූ. 3වැනි සියවසේ දී පමණ මාගම් ප්‍රදේශයේ රාජධානිය ආරම්භ කිරීමත් සමඟ, සිතුල්පව්ව ආශ්‍රිත ප්‍රදේශය ද රුහුණු මාගම්පුර රාජධානියට අයත් විය.

ඓතිහාසික කාලපරිච්ඡේදය ඉක්මවා ගිය සාධක වන ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාත්මක සාධක ද, සිතුල්පව්ව අයත් යාල වනෝද්‍යාන ප්‍රදේශයෙන් ලැබී තිබීම, ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම මේ ප්‍රදේශ ජනාවාස වී තිබූ බවට වැදගත් සාක්ෂ්‍යයකි. සිතුල්පව්ව පුදබිම පිහිටි ප්‍රදේශය අවටින් ප්‍රාග් ඓතිහාසික මානව ක්‍රියාකාරකම් තිබූ බවට සාක්ෂ්‍ය 06ක් පමණ, 2004 වසරේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල් ඒකාබද්ධව කරන ලද ගවේෂණවලින් තහවුරු කරගෙන ඇත. මීට අමතරව, යාල වන බිම් සීමාවට අයත් මිනිහා ගල්කන්ද නම් ස්ථානයෙන් ලංකාවෙන් ලැබෙන පැරණිතම ප්‍රාග් ඓතිහාසික මානව සාධක ලැබෙන බව ආචාර්ය ශිරාන් දැරණියගල මහතාගේ අදහසයි. ඒවා ඉහළ පුරා ශිලා යුගයට අයත් කළ හැකි බව එතුමා වැඩිදුරටත් පවසයි. (දැරණියගල 1992).

ඓතිහාසික හා ප්‍රාග් ඓතිහාසික වශයෙන් ඉතා වැදගත් වූ සිතුල්පව්ව, ක්‍රි. පූ. යුගයේ සිට බෞද්ධ ආරාමික භූමියක් ලෙස ප්‍රසිද්ධියට පත්වූ ස්ථානයකි. මේ ස්ථානය සාහිත්‍ය මූලාශ්‍රයවල මෙන්ම, අභිලේඛන මූලාශ්‍රයවල ද සඳහන් වී ඇත. සාහිත්‍ය මූලාශ්‍රයවල 'චිත්තල පබ්බත' ලෙසත්, අභිලේඛන මූලාශ්‍රයවල 'චිතල පවත', 'චිතල පවම' ලෙසත් සඳහන්ව ඇත්තේ සිතුල්පව්වයි. 'චිත්තල පබ්බත', 'චිත්තල කූට' යන පාලි නාමවලින් ද එහි සිංහල නාමය ලෙස සැලකිය හැකි 'චිතල පවත' ලෙසත් හඳුන්වන මේ නාමයට අනුව, චිත්ත + ආල + පබ්බත යන චිත්තල පබ්බත වී යැයි විද්වත් මතයයි. (දිසානායක 2006:2). එනම්, ' සිත් අලවන පර්වතය' යන්නයි. මේ නාමය මේ ස්ථානයට පට බැඳීම සඳහා ද මෙහි පවතින ස්වභාව සෞන්දර්ය හේතු වන්නට ඇතැයි සිතිය හැකිය. මහා සිතුල්පව්ව හා කුඩා සිතුල්පව්ව පර්වත මස්තකවලට ප්‍රවේශ වී, හාත්පස පරිසරය නරඹන අයෙකුට මේ නාමය මේ ස්ථානයට කොතරම් අගනේදැයි හැඟේ. පෙනෙන නොපෙනෙන මානයක් දක්වා ඈතට දර්ශනය වන මේ මනරම් භූමි භාගය, තැන තැන උස් වූ පර්වත උද්ගත සහ සිත් අලවන වන වැස්ම මෙන්ම, තැන තැන දැකිය හැකි නීල වර්ණ ජල තටාක, සැබැවින්ම දෙනෙත හමුවේ සුන්දර පරිසරයක් දිගහරවයි.

එසේම, දොළොස් දහසක් මහ රහත් වීතරාගී උතුමන්ට විදසුන් වැඩීමට උදවු උපකාර වුණ මනරම් ගල් ලෙන්, නිහඬව හිඳිමින්, එම ඓතිහාසික යුගය අද පවා සිහිපත් කරනවා වැනිය. හාත්පස පරිසරය පුරා නිහඬව විසිරී පවතින ගල් ලෙන් සමූහය, මෙහි පැමිණෙන කවර පුද්ගලයකුගේ වුව මනස සන්සුන් කරවන උපශාන්ත පරිසරයක් මවා පායි.

සිතුල්පව්වේ ඓතිහාසික යුගයේ ඉතිහාසය ආරම්භ වනුයේ මහින්දාගමනයත් සමඟ යැයි කීම නිවැරැදිය. සිංහල බෝධිවංශයට අනුව සිතුල්පව්වෙහි ශ්‍රී මහා බෝධියේ දෙතිස්ඵල රුහ බෝධීන් වහන්සේ නමක් රෝපණය කර ඇත. (සිංහල බෝධි වංශය 2018: 245). ක්‍රි. පූ. යුගයේදීම ශ්‍රී මහා බෝධි අංකුරයක් රෝපණය කිරීමට තරම් මේ පින්බිම සුවිශේෂ ස්ථානයක් වී තිබූ බව පැහැදිලිය. මහාවංසයට අනුව සිතුල්පව්ව විහාරය ආරම්භ කරන ලද්දේ, අද්දින් වසර 2200කට පෙර රුහුණේ කාවන්තිස්ස රජු විසිනි. (ක්‍රි. පූ 161 ට පෙර) (මහාවංසය1994: 22. 24) එසේම, කාවන්තිස්ස රජ කරවූ "මහානුග්ගල" නම් ස්තූපයේ වැඩ නිම වීමේ උත්සවයට සිතුල්පව්වෙන් 12000ක් මහරහතන් වහන්සේලා සහභාගී වූ බව ද මහාවංසයේ සඳහන් වේ. (මහාවංසය1994: 24. 8, 9)

සිතුල්පව්ව විහාරයේ විවිධ කාලපරිච්ඡේදවල දී වාසය කළ මහ රහතුන් හා භික්ෂූන් පිළිබඳ සීහළවත්ථුප්පකරණය, සහස්සවත්ථුප්පකරණය හා අට්ඨ කථාවල තොරතුරු සඳහන්වේ. මැදුම් සඟි අටුවාවේ ඡුජුක්ක සූත්‍ර වර්ණනාවෙහි මලියදේව මහ රහතන් වහන්සේ ඡුජුක්ක සූත්‍රය දේශනා කළ විට, එය අසා සිටි භික්ෂූන් රහත් වූ බව සඳහන් වේ. එසේ රහත්වූ භික්ෂූන් වැඩසිටි ස්ථාන අතරින් සිතුල්පව්වද එක් ස්ථානයකි. සිතුල්පව්ව විහාරයේ සිටි සැට වයස ඉක්මවූ මහ තෙරවරු හැට නමක් ද, මලියදේව මහ රහතන් වහන්සේගෙන් ඡුජුක්ක සූත්‍රය අසා රහත් වී ඇත. එසේම, මේ විස්තරයේ සිතුල්පව්ව විහාරයේ තිබූ මහා පොකුණක් හා එහි කුරවක තිත්ථ නම් ස්ථානයක් ගැන ද සඳහන් වේ. මෙය වර්තමාන කොරවක්ගල නම් ස්ථානය විය හැකිය (මජ්ඣිමනිකායට්ඨ කථා 2008: 209). විභංගට්ඨකථාවෙහි බුද්දක වත්ථු විභංගයේ, සිතුල්පව්වේ විසූ රහත් යැයි සිතා සිටි භික්ෂුවක ගැන සඳහන්වේ. මේ භික්ෂූන් වහන්සේ, සිතුල්පව්වේ 'නිංකපොණිණක' නම් පියන්ගලෙහි වාසය කළ චුල්ල සුම්ම ලෙස හඳුන්වා ඇති අතර, උන්වහන්සේ තමා රහත් යැයි සිතා සිටි සේක. මේ තෙරුන් කරා වැඩම කළ ධම්මදින්න නම් රහත් තෙර නමක්, උන්වහන්සේ නොරහත් බව අවබෝධ කර දී ඇත. (විභංගට්ඨ කථා 2007: 408). එසේම, සිතුල්පව්වේ විසූ මේ නොරහත් තෙර නම පිළිබඳ වැඩිදුර විස්තරයක්, මැදුම් සඟි අටුවාවෙහි සල්ලේඛ සූත්‍ර වණ්ණනාවෙහි ද සඳහන් වේ. මෙහි සඳහන් කථා ප්‍රවෘත්තියට අනුව, පෙර කී ධම්මදින්න රහතන් වහන්සේ එම තෙරුන් කරා පැමිණ, පොකුණක් මවන්න යැයි ඉල්ලීය. ස්ථවිර තෙම එය මැවීය. ස්වාමීනි මෙහි පියුම් ගොනුවක් මවන්න, එයද මැවීය. පියුම් ගොනුවෙහි මහත්වූ පියුමක් මවන්න, එය ද මැවීය. ඒ පියුම් ගැබෙහි සිට මිහිරි නදින් ගයන්නාවූ ද, නටන්නාවූ ද එක් ස්ත්‍රී රූවක් මවන්න, එය ද මැවීය. පසුව ධම්මදින්න මහ රහතුන් වහන්සේ එම ස්ථවිරයන් වහන්සේට එම ස්ත්‍රී රූපය ගැන නැවත නැවත සිතන්න යැයි පවසමින් එතැනින් ඉවත් වූහ. ඒ රූපය ගැන සිතන්නා වූ තෙරුන්ගේ සැටවස් යටපත්ව තිබූ ක්ලේශයෝ චලිත වී, තමා නොරහත් බව අවබෝධ කරගෙන, ධම්මදින්න තෙරුණි වෙත එළැඹ කමටහන් ගෙන රහත් වූහ (මජ්ඣිමනිකායට්ඨ කථා 2008: 239). මෙහි සඳහන් නිංකපොන්නක පධානඝරය යන නාමය විසුද්ධිමාර්ගයේ මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධි නිද්දේශයේ සඳහන් වන්නේ, 'නිංකපෙනෙක පධානඝරවාසී' යනුවෙනි (විසුද්ධි මාර්ගය, වර්ෂය රහිත : 294). එමෙන්ම, මැදුම්සඟි අටුවාවෙහි සඳහන් වන 'චුල්ල සුම්ම' යන නාමය විශුද්ධිමාර්ගයේ සඳහන් වන්නේ, 'චුල්ල සුමන' යනුවෙනි (එම : 294).

සිතුල්පව්ව විහාරයේ දී රහත්වූ තවත් භික්ෂූන් වහන්සේ නමක් ගැන තොරතුරු, අංගුත්තර නිකායට්ඨ කථාවෙහි ඒකක නිපාත වර්ණනාවෙහි දෙවැනි වර්ගයේ සඳහන් වේ. මෙහි මිලක්ක තිස්ස තෙරුන්ගේ කථාවක් නිදසුන් කොට දක්වයි. මෙහි එක් තැනක සිතුල්පව්ව විහාරය ගැන සඳහනක් ඇත. එම කථාව සැකෙවින් මෙසේය.

"රුහුණු රට ගාමෙණ්ඩවාල විහාරයට නුදුරු තැනක උපන් එක්තරා පුද්ගලයෙක්, සතුන් මරා ජීවිකාව කළේය. දිනක් ඔහු මහත් දිය පිපාසාවක් දැනී, ගාමෙණ්ඩවාල විහාරයට ගියේය. එහි දී කළ දහයක තිබූ ජලය පානය කළ ද, එම තැනැත්තාගේ අකුශල කර්ම හේතුවෙන් පිපාසය නොසන්සිඳිනි. එහි විසූ චුල්ල පිණ්ඩපාතික තිස්ස තෙර මේ පුද්ගලයා පිළිබඳ සිත් යොමු කර, මොහුගේ අකුශල කර්මවල බලවත් බව දැන ඔහුට ධර්මය දේශනා කළ සේක. මෙයින් පැහැදුණු එම පුද්ගලයා, පාපකාරී ජීවිතය අතහැර තෙරණුවන් වෙත එළැඹ මහණ විය. අප්‍රමාදීව පිළිවෙත් කරන හෙතෙම ධර්මය ද උගෙන, තෙරුන් වහන්සේගෙන් කමටහන් ද ලබා, නොපසුබට භාවනාවෙහි යෙදුණි. හෙතෙම වත් පිළිවෙත් පිරීමද අත නොහැර, වරින්වර සිතුල්පව් මහා විහාරයෙහි ද, ගාමෙණ්ඩවාල මහා විහාරයේ ද, කතරගම මහා විහාරයේ ද, වතාවත් කළේය. දිනක් සිතුල්පව්ව විහාරයෙහි වතාවත් කර, පශ්චිමයාමාවසානයෙහි නිදිමත ආ විට තෙත් පිදුරු ගුළියක් හිස මත තබාගෙන හිඳින අතරතුර, එම විහාරයේ නැගෙනහිර පර්වතය අසල සාමණේර නමක් අරුණාවතිය සූත්‍රයේ ගාථාවක් කියනු ඇසී, ඒකාන්තයෙන්ම මා වැනි වීර්යවත් භික්ෂූන් උදෙසා බුදු රදුන් විසින් මේ ගාථාව දෙසන ලදැයි ප්‍රීති උපදවා ධ්‍යාන ලබා, එය පාදක කොට රහත් ඵලය ලැබිය" (අංගුත්තර නිකායට්ඨ කථා 2009: 29).

සිතුල්පව්වේ විසූ එක්තරා තෙර නමක් බලවත් වාත රෝගයකින් පෙළීම නිසා, අවසන එම වේදනාව අරමුණු කොට විදසුන් වඩා රහත් වූ බව, විභංග අට්ඨ කථාවේ සතිපට්ඨාන විභංගයේ කථාවකින් පෙනේ. එම කථාව මෙසේ ය.

"සිතුල්පව්වෙහි එක්තරා ථෙර නමක් බලවත් වේදනාවෙන් එහෙමෙහෙ පෙරළයි. එහි වැසි එක් තරුණ භික්ෂුවක් රිදෙන්නේ කොතැන දැයි ඇසීය. ඇවැත්නි, වෙන වෙනම රිදෙන තැනක් නම් නැත. වස්තුව අරමුණු කොට වේදනාව පවතියි කීය. ස්වාමීනි එසේ දන්නා විට ඉවසිය යුතු නොවේ ද? යි භික්ෂුව කී විට ඉවසිමියි කියා වේදනාව ඉවසුවේය. පසුව වේදනාව බලවත් වී වාතය හෘදය දක්වා ගොස් එය පැළීය. බඩවැල් ඇඳෙයි ගොඩ ගැසුණි. පසුව මේ වේදනාව අරමුණු කොට ගෙනම විඳසුන් වඩා රහත් ඵලය ලබාගෙන පිරිනිවියේය." (විභංගට්ඨ කථා 2007: 218).

පැළලුප් නුවර වැසි විසාඛ නම් කෙළෙඹියෙකුට සිංහලද්වීපය කසාවතින් බබළන්නේ යැයි අසා ලක්දිවට පැමිණ මහාවිහාරයේ පැවිදි විය. පැවිදි වීමෙන් අනතුරුව ලක්දිව සංචාරය කළේය. එම භික්ෂුව එක් විහාරයක සාර මසක් බැගින් වසමින් යන අතරතුර, සිතුල්පව්වට ද පැමිණ, සාර මසක් ගත කොට අන් තැනකට යන්නට සැරසුණහ. පසුව සිතුල්පව්වෙන් බැහැරවන්නට සැරසෙත්ම එක් මයිල ගසකට අධිශාහිත දේවතාවෙක් හඬමින් සිතුල්පව්වෙන් බැහැරට නොවඩින ලෙස තෙරුන්ට ආයාචනය කළේය. විසාඛ නම් වූ එම මහථෙර බැහැර වන්නට කළ හැම උත්සාහයකදීම, පෙරකී දේවතාවා විසින් ආයාචනය කොට ගමන නැවැත්වූ හෙයින්, එහිම සිට පිරිනිවියේය. (බුද්ධ දත්ත හිමි 2009 : 167).

සිතුල්පව්වේ විසූ දෙබෑ ථෙරවරුන් පිළිබඳ කථාවක් ද අටුවාවල සඳහන් වේ. මේ තෙරවරු දෙදෙනා අතරින් වැඩිමහල් තෙර නම භික්ෂූන් අමතා ' තොප විසින් කොයි ආකාරයෙන් පිරිනිවෙන තැනැත්තන් දක්නා ලද්දහු ද?' යි විමසීය. ඇතැම් කෙනෙක් ' හිඳගෙන පිරිනිවන් පාන්නන් දුටුවෙමු ' යි කීය. තවත් කෙනෙක් 'පළඟ බැඳගෙන පිරිනිවෙන්නන් දුටිමි' යි කීය. ඉක්බිති තෙර නම 'මම දැන් සක්මන් කරමින් පිරිනිවෙන්නකු පෙන්නන්නෙමි' කියා සක්මන් ඉරියව්වෙන් හිඳිමින් පිරිනිවියේය (බුද්ධදත්ත හිමි 2009: 171). වළගම්බා සමයේ පැවැති බ්‍රාහ්මණ තිස්ස නියං සමය වන විට සිතුල්පව්වේ දොළොස් දහසක් භික්ෂූන් සිටියහ (බුද්ධදත්ත හිමි 2009 : 171). තිස්ස විහාරයේ ද එපමණ පිරිසක් සිටියහ. එක් එක් විහාරයේ භික්ෂූන්ට අවුරුදු තුනකට ප්‍රමාණවත්ව රැස්කොට තිබූ ධාන්‍ය එක් රැයකින් මියන් විසින් කා දැමූහ. සිතුල්පව්වේ ආහාර විනාශ වීම හේතුවෙන් එහි වැසි භික්ෂු පිරිස තිස්සමහාරාමයට ගොස් ජීවත් වන්නට කතිකා කොට පිටත් වූහ. තිස්සමහාරාමයේ භික්ෂු පිරිස ද එලෙසින්ම කල්පනා කොට සිතුල්පව්වට ගොස් ජීවත් වෙමුයි කතිකා කර පිටත් වූහ. දෙපිරිසම ගම්භීර කන්දර නම් තැන දී මුණගැසී කථාබස් කොට, දෙතැන්හිම ආහාර නොමැති බව අවබෝධ කරගෙන එම ස්ථානයේදීම පිරිනිවියහ. (බුද්ධදත්ත, 2009: 171, 172).

සිතුල්පව්වේ එකල විසූ තෙර දෙනමක් ගැන අටුවා කථාවල සඳහන්වේ. මාසෙ පෝය ද, වැසි වලාකුළින් අහස අඳුරු වීම ද පැවැති එක් රාත්‍රියක, එක් තෙර නමක් අනෙක් තෙරුන්ට කථාකොට, තමාට කළුවරේ පෙනෙන දැ ගැන විස්තර කර ඇත. අනෙක් තෙරුන් ද තමාට අඳුරේ බොහෝ දැ පෙනෙන බව ප්‍රකාශ කළහ (බුද්ධදත්ත හිමි 2009 : 180).

දොරටුපාල රූපයක් දැකීමෙන් රාගය ඉපිද, ඉන්ම දැවී සිටිවනම කළුරිය කළ භික්ෂුණියක ගැන තොරතුරු, සිතුල්පව්ව විහාරයෙන් ලැබේ (එම : 184). මේ කථා ප්‍රවෘත්තිය සුමංගල විලාසිනිය නම්වූ දීඝනිකායට්ඨ කථාවෙහි සංගීති සූත්‍ර වණ්ණනාවෙහි ද සඳහන් වේ. ඊට අනුව එක් දහර භික්ෂුණියක් සිතුල්පව්ව විහාරයෙහි පොහොයගෙට ගොස්, දොරටුපාල රූපය බලමින් සිටියාය. ඉක්බිති ඇයගේ ඇතුළත රාගය ඇති වී, ඕ එයින්ම දැවී කළුරිය කළාය. අසල සිටි එක් භික්ෂුණියක් ඇය වෙත ගොස් මොකද සිටින්නේ කියා අත ඇල්ලීය. එකෙණෙහිම ඇය පෙරළී වැටුණාය (දීඝනිකායට්ඨ කථා 2011: 309).

සිතුල්පව්වේ වැසි භික්ෂූන් ගැන කියැවෙන තවත් කථාවක් විනය අටුවාවෙහි නිස්සග්ගියවණ්ණනාවෙහි සඳහන් වේ. එම කථාවට අනුව සිතුල්පව්වේ විසූ එක් භික්ෂුවක් ශාලා හතරක් ඒකාබද්ධව තිබෙන තැනක දොරටුව අසල සිටගෙන ආරාමිකයන්ට පෙනෙන ලෙස පොළොවෙහි රවුම් වටයක් ඇන්දේය. එයින් මහත් වූ කැවුම් සෑදීම අදහස් කරන ලදැයි සිතාගත් එක් ආරාමිකයෙක්, එතරම් විශාල කැවුම් හදා, පසුදා බෙර ගසා, සංඝයා රැස් වූ විට මෙසේ කීය. "ස්වාමීනි මාගේ පියමුතුන්ගේ කාලයේ දී වත් මෙවැනි දෙයක් සිදු වී යැයි නො අසන ලදී. එක් ස්වාමීන් වහන්සේ නමක් විසින් චතුෂ්ශාලාව ඉදිරියෙහි කැවුම් සඳහා වට්ටුවක් අඳින ලදී. මෙතැන් පටන් ස්වාමිවරු තම තමන්ට කැමැති සැපියක් කියතොත් අපටත් පහසු වන්නේය. " යි කීය. මේ කීම අසා මහ තෙරවරුන්ගේ පටන් කිසිදු භික්ෂුවක් කැවුම් නොපිළිගත්තේ යැයි සඳහන් වේ. (බුද්ධදත්ත හිමි 2009: 180).

අට්ඨසාලිනී අටුවාවෙහි නික්ඛේපකණ්ඩව වණ්ණනාවෙහි තික නිද්දේසයෙහි "අරියානං අදස්සාවි" යන පදය විස්තර කිරීමේ දී, සිතුල්පව් වැසි රහත් තෙර නමක් ගැන කියැවේ. එම කථාව මෙසේය. "සිතුල්පව්වේ වෙහෙර වැසි රහත් තෙර නමකගේ අතවැසිවූ මහලු වී පැවිදි වූ එක් භික්ෂු නමක්, ඒ තෙරුන් සමඟ පිඬු පිණිස හැසිර, තෙරුන්ගේ පාත්‍ර සිවුරු රැගෙන පිටුපසින් යන්නේ, 'ස්වාමීනි ආර්යයෝ කෙබඳු වෙත් ද?' යි ඇසීය. තෙර නම ' ඇවැත්නි ඇතැම් කෙනෙක් ආර්යයන්ට වත් පිළිවෙත් කරමින් ඔවුන්ගේ පාත්‍ර සිවුරු රැගෙන යමුනුත් ආර්යයන් නොහඳුනත් ආර්යයෝ නම් මෙසේ ඇඳිනීමට අපහසු පුද්ගලයෝ වෙතියි " කීය. ඒ කී කල්හිත් මේ තෙර නම රහත් නමකැයි අවබෝධ කර ගැනීම ඔහුට නොහැකි විය (එම: 190).

සිතුල්පව්වේ වැසි මහ රහතුන් මෙන්ම, විවිධ භික්ෂූන් සම්බන්ධ මෙවැනි කථා රාශියක් විවිධ මූලාශ්‍රයවල සඳහන් වේ. විශේෂයෙන් අට්ඨ කථාවල දැක්වෙන තොරතුරු අතර වලගම්බා සමයේ බැමිණිවියා සාගතය ගැන දැක්වෙන තොරතුරුවලට අනුව මේ කථා ප්‍රවෘත්ති ක්‍රිස්තු පූර්ව පළමු වැනි සියවසෙන් පසුව ලියැවෙන්නට ඇතැයි සිතිය හැකිය. ආරාමික ප්‍රදේශයේ දක්නට ලැබෙන සෙල් ලිපි හා නටබුන්වල ස්වභාවය අනුව, ක්‍රිස්තු පූර්ව පළමු වැනි සියවසෙන් පසුව ක්‍රිස්තු වර්ෂ හය, හත සියවස් දක්වා සංවර්ධනය වී ඇති ආකාරය පැහැදිලිය.

බුද්ධි නාගොඩවිතාන
පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
කොටුව, ගාල්ල.

ආශ්‍රිත ග්‍රන්ථ

1. අටුවා පරික්ෂණ හා අටුවා කථා වස්තු, (සිංහල පරිවර්තනය), 2009, පොල්වත්තේ බුද්ධ දත්ත හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
2. විභංග අට්ඨ කථා (සිංහල පරිවර්තනය), 2007, බී. එම්. පී. බාලසූරිය, පරි: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
3. දිසානායක, සෙනරත්, 2006, අසිරිමත් සිතුල්පව්ව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.
4. නිකුලස්, සී. ඩබ්., 1979, පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය, සිංහල පරිවර්තනය. සෝමපාල ජයවර්ධන. තිසර ප්‍රකාශකයෝ, දෙහිවල.
5. මහාවංසය, 1994, සිංහල පරිවර්තනය, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි හා බටුවන්තුඩාවේ දේවරක්ෂිත, සංස්:රත්න පොත් ප්‍රකාශකයෝ, මරදාන පාර, කොළඹ.
6. මහාවංසය, 1996, සිංහල පරිවර්තනය, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි හා බටුවන්තුඩාවේ දේවරක්ෂිත, සංස්: රත්න පොත් ප්‍රකාශකයෝ, මරදාන පාර, කොළඹ.
7. සිංහල බෝධිවංසය, 2018, නෝමන් සිරිපාල, සංස්: සීමාසහිත ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
8. මජ්ඣිම නිකායට්ඨ කථා (සිංහල පරිවර්තනය), 2008, බලපිටියේ සිරි සීවලී හිමි, පරි: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
9. අංගුත්තර නිකායට්ඨ කථා, (සිංහල පරිවර්තනය), 2009, කපිල අභයවංස, පරි: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
10. විශුද්ධි මාර්ගය, (සිංහල පරිවර්තනය), වර්ෂය රහිත, හේමචන්ද්‍ර දිසානායක, පරි: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
11. දීඝ නිකායට්ඨ කථා, (සිංහල පරිවර්තනය), 2011, බී. එම්. පී. බාලසූරිය, පරි: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

ආනාවට

නූතන ශාසන ප්‍රබෝධයේ ශාස්ත්‍රවන්තයා සිටිනාමළුවේ මහ තෙරිඳු

සිත්තමිගල ගල් ලෙන බලන්නට මී ආතා "බරින්දු" එක්කගෙන ගියේ ගැල් කරත්තයෙන්ය. " අපේ රැහේ උන් තමයි දරුවෝ මෙතන නැණපිල පටන් ගෙන සාහිත රස බෙදුවේ." එදා මී ආතා කී කථා පොකුර හද පපුවේ දබර කරමින් මතුවේ. හිත කොඳුරන්නේ ඒ කතාවේ අග, මුල, මැද හැම අතය. මල් උඩින් සමනලුන් පැනි උරන උදැසනකි. බරින්දු මල් මත රඟන සමනල රෑනේ තනිවී, හිතූ තරම් හිතුවේ සාහිත රසය ගැනය. වටකුරු අකුරු දැඟිලි තුඩින් ලියන්න කියා දුන් දවස සිහි විය. ඒ දවස දැනුණේ, කියා ගන්න බැරි හැඟුමක් යැයි බරින්දුගේ ගැටවර හිත කොදුරයි. තංගල්ලට ලංසිකාරයෝ ඇවිත් හදපු පල්ලිය ළඟ නතර වී, මී ආතා කියපු කතාව ඒ ඇහිල්ලේ බරින්දුගේ හිත පතුලෙන් පැන ඇවිත්, හද ඇතුළ පුරාම දුව පනින්න ගත්තේය. දුව පැනපු හිතිවිල්ල නතර වුණේ, සමනල රෑන මැදින් මිදුලට වැඩපු කහ සිවුරේ රුව දුටුවාමය. දුටු දා ලද හැඟුම්, බරින්දුව යළි කිසිවක් මතක නැති තරම් ළබැඳි කළේය. ඔහු කහ සිවුරේ දුටුව රුව, කදුරුපොකුණේ සාමණේර සමඟ පසුපසම වැටී යන්නටම ගියේය.

එසේ නික්ම ගිය බරින්දු, ධම්මජෝති නමින් ගිහි නම ඉවතලා, සිවුරු වත දරා ගත්තේය. සිටිනාමළුවේ උපන් නිසා ධම්මජෝති, සිටිනාමළුවේ ධම්මජෝති යැයි නම් වූහ. පොඩි නම ඒ කාලයේ ජීවත්වූ හැමෝටම වඩා වෙනස්ය. පද අරුතක්, ව්‍යාකරණයක්, සැලලක්, විත්තියක්, පද අරුතක් ඔහු ඇහිද, එය වටහා කියවා සාධනය කරයි. සර්ග, රිද්ම, තාල, ඡන්දස් ගැනම සොයයි. දවසක කදුරුපොකුණේ සාමණේර ඇවිත් කීවේ, දෙනගමින් විහාර කැලේට වැටුණු පාරේ ගියාම හමුවන්න හැකි අමුතු මිනිසෙක් ගැනය. සිටිනාමළුවේ ධම්මජෝති සාමණේරයන්ට සිල්වතුන් වහන්සේ නමක වෙන්න පාර හමු වූයේ එහෙමය. 'විහාරකැලේ' කැලේ පීරාගෙන, විහාර කැලයට වැඩිය උන්වහන්සේට, මුං කොටුවේ රාල හමු වූයේ එහෙමය. දුසිල්වතුන් අතර සිල්වතුන් වන අගේ, අගේටම වැටහුණේ මේ හමුව මැදය. මුං කොටුවේ රාල පද බැඳපු පුස්කොළ පද කවි ගොතාන කියවමින්, කැලේ යටින් විල්පිට වනවාසේට වැටුණු දවසේ සාලිය වැව අද්දරදී තමයි වනිගච්චිතාමනි මොහොට්ටාල හමුවන්නේ. ඒ කාලේ පෘතුගීසින්ගේ කටුවන කොටුව බිඳ දමලා, මහා විරුකමක් පෙන්වූ චිත්තාමනි මොහොට්ටාල බුද්ධිගම ගම්වරය ලබාපු පරපුරේය. වල් වැදී කැලෑ රොද මැදින් කිරඹ ආර සැලි සැලි වක්ව ගලන තැනය. ඒ ගතාරය. ගතාර වෙල් යායේ වල නෙළනදා මේ දෙන්නා හමුවන්නේය. ඡන්දස් ශාස්ත්‍රය ගැන සිටිනාමළුවේ සිල්වතුන් කී කථාව චිත්තාමනිට මතක හැඟීම් අවදි කළේය. එවිට ඔහුට සිහි වූයේ, කැකුණේවෙල ගණේගොඩ ආරාමයේ ගල්පොත්ගුලය. සිටිනාමළුවේ සිල්වතුන් සමඟ චිත්තාමනි මොහොට්ටාල එහි ගියේය. ගණේගොඩ අරමේ තිබුණේ සියවස් පහක්ම මඟහැරී තිබූ මවිබසේ පද මිහිරි තනුවය. ගණේගොඩ ආරාමයේ හිටපු ගණේගොඩ උපාසක දිවියෙන් සමු ගන්න ඔන්න මෙන්නය. එසේ තිබියදී ඔහු සොයාගෙන පැමිණි මේ ශාස්ත්‍රවන්ත සාමණේරට, ප්‍රාණ සමාන වස්තුව පූජා කළේය. ගණේගොඩ අරමේ අතුරලිය වෙල් යායට මුහුණලාපු ගල උඩ හිඳන්, සිටිනාමළුවේ සාමණේර හිමි සිදත් සඟරාවම වනපොත් කළහ. සිංහල බසේ පද මිහිර සෛද්ධාන්තික තාල වියමන බැඳෙන වග අරුත දන්නා අන්තිමයාවූ ගණේගොඩ උපාසක, එදා රැයේ සතුටු සිතින් මිය ගියේ, ප්‍රතිසන්ධියක යහපත් ආරම්මණ ලැබය. මිය යන්න තිබූ දැනුම යාවත්කාලීන කිරීමේ යුග වගකීම තමන්ට පවරා, උපාසක ගණේගොඩ මියගිය වග සිටිනාමළුවේ සාමණේර දැන ගත්හ. ගණේගොඩ උපාසකගේ භූමදානයට රැස් වූ ගම්මු පුදුම කළේ, මේ තරම් අරුම මිහිරි බුදු බණ පද සජ්ඣායනා කරනා සිටිනාමළුවේ සාමණේර වහන්සේ දැකය. ආරාමය භාරගෙන, ගම්වැසිව සිටින්නැයි ගම්මු ඉල්ලා සිටියේ, සතර පේරුවෙන් වැද, ධවල රෙද්දෙන් පාවඩ අතුරාය.

වතුපිටි, කුඹුරු දෙණිවල ආදායම ගැනීම, වී මැනීම, පොල් ගැනිල්ල, කුරුඳු තැළවිල්ල, යකැදුරු රක්ෂාව සමඟ සිවුරු දරා ගත්තත්, එකල කල වෙනත් යමක්ද ඇත. එනම් අඹුවන් ගම් වටේ තබාගෙන, ගණ ගැටවි තැනීමය. ගණින් වහන්සේලාගේ ළමයින්ට, ඒ කීවේ ගණින්වහන්සේලාට දාව, උපාසකම්මලාට උපන් ළමයින්ට ගම්මු කීවේ ගණ ගැටවි කියාය. ගණ ගැටවි තාත්තගෙන් සිවුර උරුම කරගෙන, ඒ කාරියම කළෝය. කාරියෙන් කාරිය රාජකාරිය විය. කවුරුත් වෙන කාරියට කරබාගෙන වැඳ වැටුණා මිසක, නිමල සසුනේ කහට තවරන මේ පිළිල ප්‍රශ්න නොකළේය. ගණේගොඩ අරමේ අන්තිම ගණින් වහන්සේ මියගොස් සිටියේ ගණ ගැටයෙක් නැතුවය. ඒ, ගණේගොඩ ගණින් වහන්සේය. කාලයේ තාලය ප්‍රතික්ෂේප කළ ගණින් වහන්සේලා අතර, පියවරයෙක් නොවූ ගණින් වහන්සේය. ගණේගොඩ ගණින්වහන්සේගේ, ගණේගොඩ ආරාමයේ ගල් පෙට්ටගමක වටිනා වස්තුවක් තබා රකින බවට කසු කුසු තිබුණ ද, උපාසකම්මලා මායිමට නොගත් නිසා, කිසිවෙක් ඒ ගැන මායිම් අසන්න එහි නොගියහ. උන්වහන්සේට පැන් විතක්, දන් බිඳක් රැගෙන ආව ගිය එකමයා ගණේගොඩ උපාසකය. ගණේගොඩ ගණින් වහන්සේ මිය ගියේ, ගණේගොඩ උපාසකට ගල් පොත්ගුලේ රහස කී දිනයේය. මේ රහස දැනගත්තා එන තෙක්ම රැක ආරක්ෂා කොට, ගණේගොඩ උපාසක මිය ගියේ ද ඔහොමය.

සිදත ලැබුණු ආරාමයෙන් වඩින සිටිනාමළුවේ සාමණේරයන් වහන්සේට යළි සිහි වූයේ, මී ආතා තංගල්ලේ පල්ලිය පෙන්නා කී කතාවය.

"ඔය වනවාස විහාරය තිබුණ තැන පුතේ, මහ මුහුදෙන් එතෙර වැඩපු මහ රහතුන් මෙතෙර වැඩියේ මෙතැනින් තමයි !"

"ඉතින් ආතේ !"

"ඉතින් පුතේ මහ වනවාසේ බිමට පෙරළා ලංසි පල්ලි හැදුවා. එදා තමයි වනවාසේ තිබුණ ගල් පොත්ගුල පෙරළුණේ."

ගල් පොත්ගුල සොයාගෙන දෙනගමින් විහාර කැලේ, ඇල්ලවෙල, නාරංදෙණිය, කඹුරුපිටිය, විටියල හරහා ගණේගොඩට පා තැබුව වග ඒ ඇසිලේලේ සිහි විය. ව්‍යාකරණ පද රීති වැකි තනමින්, භාෂා නෛපුණ්‍යය ලද එකම සිංහලයකුවත් නැති සමයකි. ඡන්දස් අලංකාරය, පාලි ව්‍යාකරණය නොදන්නා සමයකි. බුදු වදන් කිමදැයි දන්නා අයෙකු නැත. යාග හෝම, පුද පූජා මිසක, දහම ලෙස දන්නා කිසිවෙක් ද නැත. ගණේගොඩින් මූකිරිගල ගිය දවසය. මූකිරිගල මූලායතනයේදී ගණේතැන්නට ගෙන ගිය ග්‍රන්ථ රත්නයන් ගැන ලියා තැබූ වටාපතක් නෙත ගැටේ. සිටිනාමළුවේ ධම්මජෝති සාමණේරයන් වහන්සේ අනලස්ය. පා යුග පැළී ලේ ගැලුවද, ගමන නොනවතී. භාෂා ශාස්ත්‍රය ඔප් නැංවූ කල ඥාන ශාස්ත්‍රය ද, ඥාන ශාස්ත්‍රය ඔද වැඩුණු විට, ශීල ශාස්ත්‍රය ද පාදාගත හැකි යැයි උන්වහන්සේ දෙඩුවේය. ඒත් සිටිනාමළුවේ දොඩන වදන් අපට මොටදැයි කීවා මිසක, ගණින් වහන්සේලා අතර දන්නා උන්වහන්සේ ගැන ඊර්ෂ්‍යාව මිසක නැම්යාවක් නොවීය. දැනුමෙන් පලක් නැති අන්ධකාරය ඉරාගෙන, දැනුම පිපාසාවක් සේ සොයන ළබැඳියෙක් හමු විය. ඒ, වේහැල්ලේ ධම්මදින්න සාමණේරය. වහ වහා පිපාසිත සිත නිවී නිවී සනහාලන පද අරුත්, ව්‍යාකරණ, ඡන්දස් ශාස්ත්‍ර උර උරා බොමින් සිටිනාමළුවේ සාමණේර පසුපසේ වැටුණ ධම්මදින්න සාමණේරය. වේහැල්ලේ ධම්මදින්න සාමණේරයන් හා සිටිනාමළුවේ සාමණේරයන් ගණේතැන්න පන්සලට පැමිණ, පාලි ව්‍යාකරණය, ඡන්දස් හා විරිත් රිද්ම ගැන හදාරන, දෙදෙනාගේම පාද මූලයේ වැටුණ ශිෂ්‍ය පුත්‍රයා වූයේ කඹුරුපිටියේ සඟිධර ඉණරතන සාමණේරය. තිදෙනාම ශාස්ත්‍ර ශික්ෂාවෙන් සීල ශික්ෂිතව සොයන මඟ ගැන කතිකාවේය. භාෂා මිහිර දුටු දුටුවන් නළවන සිටිනාමළුවේ සාමණේරයන් වහන්සේ සොයාගෙන, ශාස්ත්‍ර ආලින් රොද බැඳෙන්නට විය. භාෂා සාහිත්‍යය ශාස්ත්‍රයට කමටහනක් වැනිය. සිත ඒ මතට රැඳී ඇත. ගණින් වහන්සේලා අතර සිල්වතුන් සේ උන්වහන්සේලා මතුවී පෙරට පැමිණියහ. මේ සමඟ මුං කොටුවේ රාළගෙන් ලද සැලවි පත්‍රය, සිටිනාමළුවේ සාමණේරයන් වහන්සේගේ හද පැතුමට මල් පිපුණා වැනිය.

තමන් වැනිමය. තම ප්‍රාර්ථනාවේ උසස් බව කදිමට වටහාගෙන, වඩා පූර්වගාමීවී ඇත. සසුනම පිහිටුවාලීම අරමුණ වශයෙන් ගෙන, නිෂ්ක්‍රමණය ජීවිත ප්‍රාර්ථනාව කොටගත් ශ්‍රමණ සගයකුය. වැලිවිට සරණංකර සිල්වතුන් වහන්සේ සහ සිටිනාමළුවේ ධම්මජෝති හිමියන්ගේ ශාසනමාමක මිත්‍ර බන්ධනය ඇරඹෙන්නේ, ඒ සැලවි පතින් ලද සංඥාව ඔස්සේය. රුහුණින් මහනුවර වඩින සිටිනාමළුවේ සාමණේරයන්, තත්කාලීන ලංකාවේ භාෂා නෛපුණ්‍යයාය. උන්වහන්සේගේ හසළත්වය නොමැතිව පෙරට යන්නම බැරිය. නිමල ශාසනය පිහිටුවීමේ අරමුණ සැල කර ගැනීම සඳහා, වඩා සංවිධාන ශීල තපෝ ව්‍යාපාරයක් ලෙස 'සිල්වතුන්ගේ සමාගම' නැඟ එන්නේ මෙලෙසිනි.

සිල්වතුන්ගේ සමාගම බැඳෙන ශීල තපෝ ප්‍රාර්ථනාගාමී නව යති ප්‍රවාහයෙහි ශාස්ත්‍ර ආචාර්යපාදයෝ වූයේ, සිටිනාමළුවේ හිමියෝය. සිටිනාමළුවේ සාමණේර, වේහැල්ලේ සාමණේර සහ කඹුරුපිටියේ සාමණේර යන තිදෙනා, වැලිවිට සාමණේර සමඟ එක්වීම, දුස්සීලයන් භීතියට පත් කළේය. ඒ භීතියේ ප්‍රතිඵලය සිටිනාමළුවේ සිල්වතුන් වහන්සේලා උඩරට ගම් දනව් පුරා ඇති කළ ශාස්ත්‍ර ප්‍රබෝධයට තහංචි පනවා, රුහුණට පලවා හැරීමය. ඒත් උන්වහන්සේ අරමුණ අත් නොහළේය. සිය ගණන් සාමණේරයන් ද, භාෂා ලෝලීන් ද සොයමින් ශාස්ත්‍ර ශික්ෂාවේ අගතැන් කළහ. සිටිනාමළුවේ සිල්වතුන් වහන්සේගේ ව්‍යක්ත කවිත්වය ද, එයටම බැඳී තිබූ මිහිරි අරුම බස් වහර ද යළි ප්‍රාචීන භාෂා ශිල්පය සොයා යෑමට ළබැඳියාවක් වගා කළේය. එහි ප්‍රතිඵලය අවබෝධය සහිත පරපුරක නැඟී ඒමය. එම අවබෝධගාමී සිල්වතුන්ගේ සමාගම සමඟ අවබෝධ සහිත ගිහියන්ගේ බැඳියාව රාජ්‍යයට නව පාඩමක් බවට පත් විය. ආධ්‍යාත්මික ශාසනයක නැඟීම රාජ්‍ය පාලනය දක්වා සුසංයෝග වන්නේ මේ සමඟය.

මේ පඬිවර ජයෙන් සිල්වතුන්ගේ භාෂා රසය නුදී ජනයා ද පහන් කළේය. අකැමැත්තෙන් වුව ද, භාෂා ශාස්ත්‍රය පිණිස සිටිනාමළුවේ ධම්මජෝති සිල්වතුන් වහන්සේට තම ශිෂ්‍යවරයන් යොමු කරන්න දුසිල් ගනින් වහන්සේලාට සිදු විය. එම ශිෂ්‍යයන් අතින් උන්වහන්සේගේ කීර්තිය රටපුරා පැතිර යන්නේ, උන්වහන්සේ රචිත පතපොත හරහාය. සිටිනාමළුවේ සිල්වතුන් වහන්සේ දිනෙක වැලිවිට සරණංකර සිල්වතුන් වහන්සේට කීවේ, සියම් දේශයට සංදේශයක් පිටත් කර යැවිය යුතු බවය. සිටිනාමළුවේ ධම්මජෝති සිල්වතුන්ගේ සිංහල භාෂාව හදාරන්න එක් දිනක් ෆන් එග් නම් ලන්දේසි නාවිකයා පැමිණීමේ ප්‍රතිඵලය, මේ අනගි අදහස උපත තැනූ තැනය. නරේන්ද්‍රසිංහ රජතුමාගේ ඉඟැවරයා වූයේ, වැලිවිට සරණංකර සිල්වතුන් වහන්සේය. ඒත් රජතුමාට දේපළ ගැති ගණින් වහන්සේලාගේ බලය නොතකා සිටීමට නොහැකි විය. ඔහු කොතරම් වටහා ගනු ලැබුව ද, අවසානයේ කුමන අයුරකින් හෝ උපසම්පදාව යළි පිහිටුවීමට බාධා කරන පාර්ශ්වයේ අනුග්‍රාහකයා විය. මේ බාධාව මඟහැරී යන්නේ, ෆන් එග් නාවිකයාගේ සිංහල භාෂා ලෝලීත්වයම නිසාය. එබැවින් වැලිවිට සරණංකර හිමියන්ගේ අපේක්ෂාව බලවත්ව නැඟ ඒමෙන්, සියම් රජතුමා වෙත සංදේශය ලියැවේ. සංදේශය පද බැන්දේ, සිටිනාමළුවේ ධම්මජෝති හිමියන්ය. ව්‍යක්ත පාලි භාෂාව මනාව ගැළපූ මේ සංදේශය, හෙළදිව මහ සඟුන් වහන්සේලාගේ පාලි භාෂා ප්‍රවීණත්වය තහවුරු කළේය. එහෙත් සිදු වූයේ, දුස්සීල සමාගමේ ගණින් වහන්සේලා එම සංදේශයට එරෙහිව සංදේශයක්, සියම් රජතුමාට ගොතා බැඳ යැවීමය. මේ අනුව යළි පිරිසුදු සසුන පිහිටුවීම යටපත් වේ.

මේ අතර නරේන්ද්‍රසිංහයන්ගේ මධුලෝලීත්වයේ කෙළවර වනුයේ, රජු හතළිස් හත් වියැති අඩු වියෙන්ම මිය යෑමය. නිල අපුත්‍රක රජුගේ අනුප්‍රාප්තිකයා වනුයේ, ඔහුගේ මස්සිනා වූ නායක්කර් කුමරු හෙවත් විජය රාජසිංහය. නායක්කාර කුමරු බොළඳ වියේ පටන් සිප් සතර හැදෑරුවේ, සිටිනාමළුවේ ධම්මජෝති සහ වැලිවිට සරණංකර සිල්වතුන්ගේ සිල්වත් සමාගමේය.

විජය රාජසිංහගේ රාජ්‍යපද ප්‍රාප්තිය, නිසැකව යළි ශාසනෝදයේ මාවත බවට පත් වන දේශපාලන වාතාවරණය මතු විය. මේ සමයේ සිටිනාමළුවේ ධම්මජෝති සිල්වතුන් වහන්සේ ආරම්භ කළ 'සැලවි කවි' හුදී ජනතාවගේත්, දැනුවත් ජන තීරුවේත් නිබඳ අවධානය දිනා ගත්තේය. 'සැලවි කවි' ලෙස ලේඛනගත වූයේ, තල්පත්වල පණිවිඩයක් සේ කවි පබඳාලීමය. සැලවි කවියෙන් නිමල සසුන පිළිබඳ අවල පැතුම් ලේඛනගත විය. එම සැලවි පත් පරෙවියන් අත රට තොට සරන්නට විය. පරෙවියන්ගේ පාදවලින්, ගම් දනව්, වෙල් ඉපනැලි සහ කඩමණ්ඩිවලට ලැබෙන සැලවි පත්‍ර, රට වටා කතා තේමාවක් තැනුවේ, නිමල ශාසන උදානයක අගයය. සිටිනාමළුවේ ධම්මජෝති සිල්වතුන් වහන්සේගේ මහා පාණ්ඩිත්‍යයෙන් උදම් ආචාර්යපාද භූමිකාවේ සිටි චරිත සිරිතක් නොවීය. පොදු ජන මතය අවුළුවාලීමේ ශූර ඥාන භාවිතාවෙන් හෙබියෙකි. එබැවින්, දන් දෙන්න, පින් ගන්න නමක්, නැකතක් ගන්න, උන්වහන්සේ හමුවන කවරකු අත වුව ද සැලවි පත් පද බැඳ දීම සිරිතක් කළේය. එම සැලවි පත් සිරිත නිසා සිදු වූයේ, මහජන මතය කුළගැන්වීමය. සැබැවින් නූතන සමයේ මහජන මත නැඟිටීමක් ආරම්භ කළ චරිතයසේ ද, සිටිනාමළුවේ සිල්වතුන් වහන්සේ ඉතිහාසයේ කේන්ද්‍රීය චරිතයක්මය. කෙසේ නමුත්, විජය රාජසිංහ රජතුමා මියයන තුරුම, පවිත්‍ර මහණ උපසම්පදාව යළි සිරිලක ස්ථාපිත නොවුණේය. ඒත්, ෆන් එග් මඟින් සිදු වන දූත මෙහෙවර දිගටම සිදු විය. දෙවැනි වර සියමට යෑමට යළි දූත ගමනක් පිළියෙල වූ අතර, ඒ අතර විජය රාජසිංහ රජතුමා මිය යන්නේය.

විජය රාජසිංහ රජුගේ අභාවය සමඟ, කීර්ති ශ්‍රී රාජසිංහ නමින් රජ වන්නේ, විජය රාජසිංහ රජුගේ බිසවගේ සොහොයුරාය. ඔහු ද කුඩා වියේ පටන් වැලිවිට - සිටිනාමළුවේ සිල්වත් දෙනමගේ ශිෂ්‍යයකු ලෙස බුදු දහම හා පාලි සංස්කෘත භාෂා ශාස්ත්‍රය හැදෑරූ කුමරෙකි. ඔහු, අන් හැම රජ දරුවකුටම වඩා ඉදිරිගාමීව, සසුන යළි ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යායාමය තම රාජ්‍ය පාලනයේ මුදුන් කාරිය සේ තබන්නේය. ඒ සිල්වත් සමාගමට එරෙහි ගණින් වහන්සේලාගේ මෙන්ම, බ්‍රාහ්මණ පූජක පැලැන්තියේ අභියෝග ප්‍රහාර මැදය. දීර්ඝ ආයාසයක ප්‍රතිඵල උදා වේ. සියම් රටින් සියම් රජ අණ ලැබ, සියම් උපාලි මහ තෙරිඳු සමඟ උපසම්පදාව සිරිලකට සැපත් වේ. ශාසන උදානයෙහි නිෂ්ක්‍රමණ ප්‍රහර්ෂය සතර අත උදාවිය. මහනුවර මල්වතු පෝය ගේ ද, අස්ගිරි පෝය ගෙය පුරා උපසම්පදා අපේක්ෂාවේ උලෙළ නිමැවිණි. සිටිනාමළුවේ ධම්මජෝති සාමණේරයන් වහන්සේ ඒ වන විට අසූ තුන් විය ඉක්මවූ වෘද්ධයෙකි. සියලු සිල්වතුන්ට භාෂා ශාස්ත්‍රය කියා දුන් ගුරු දේවාචාර්ය, සියලු පිළිකෙව් ඉවත් කිරීම හා පළිගැනීම් මැද පසුපස නොහැරී, ඉදිරි මඟ පැදූ ශාස්ත්‍රවන්ත සීල වෘද්ධයාණෝය. ඒ නයින් තපෝ වෘද්ධයාණෝය. සිංහල ශාසන වංශයේ භාෂා ශාස්ත්‍රීය විද්ගධ බව, සීල කමටහනක් සේ පූජාබර පැවිදි දිවියක අඩිතාලම කර ගත් දුර්ලභයාණෝය. මේ අපූර්ව කෞශල්‍යයේ පහන් සිල උපසම්පදා අපේක්ෂාවෙන් තමන්ගේ ශිෂ්‍යවරයන් සමඟ ද, තමන් සමඟ එකට හිඳ මහා සටන් මැද සටන් කළ කල්‍යාණ මිත්‍රයන් තිදෙනා ද සමඟ බලා සිටියහ. ඒ, වැලිවිට සරණංකර, වේහැල්ලේලේ ධම්මදින්න, කඹුරුපිටියේ සඟිධර ඉණරතන සිල්වතුන් සමඟය.

එහෙත් පුදුමය. සියලු දෙනාටම උපසම්පදාව හිමි විය. නූතන ශාසන පුනර්ජීවනයේ අසමසමයන් සිව්දෙනාගෙන්, සිටිනාමළුවේ ධම්මජෝති සාමණේරයන්ගේ උපසම්පදා ශීලය පිරිනැමීම ප්‍රතික්ෂේප විය. ඒ, ලක් සසුන ඉරිතළා ගිය දවසය. රාජකීය පාලකයා පවා නිශ්ශබ්දව මේ මහා ශාසනික අයුක්තිය ඉවසා සිටියේය. සිටිනාමළුවේ ධම්මජෝති සාමණේරයන් වහන්සේ පෝය මැදුරින් නික්ම, සෙංකඩගල වැව් තලාවට පියමැන, හන්තාන කඳු වැටිය දෙස බැලීය. ඝන මීදුම තුනී කර, කඳු වැටිය මැදින් ඉර එළිය ඝනට එබුණේය. බෞද්ධ ශාසන ඉතිහාසයේ දීර්ඝතම උපසම්පදා උත්සාහය ජයගත් මොහොත, ශීලවන්ත තපෝ වෘද්ධයා තනිකර දමාය. මහත් කම්පිත වැලිවිට සරණංකර මහ තෙරිඳු, කඹුරුපිටියේ මහ තෙරිඳු සමඟ සෙංකඩගල වීදි පුරා සිටිනාමළුවේ ධම්මජෝති සාමණේර මහා ප්‍රාඥා වෘද්ධයන් සොයන්නට වූහ. උන්වහන්සේ උඩවත්ත වනවාසයට වඩිනු දුටු වගක් කීවේ, නාථ දේවාලේ මාලකම්මාවූ 'තංගාමාධ'ය.

නික්ම වැඩිය මඟ දිගේම අසරණ සරණ සඟරජ වැලිවිටියේ සරණංකර මහ තෙරිඳු මේ සොයා වඩින්නේ, තමාට ද භාෂා ශාස්ත්‍ර දීපනයේ ශිල්ප තැනූ ආචාර්යාණන්, සිංහල යති සසුන පිහිටුවූ දා පිටමං කළ ප්‍රඥා පහන් ටැඹ සොයාය. උඩවත්ත වනවාසයේ, සෙංකඩ ගුහාවේ එරම්ණිය ගොතා බවුන් වඩන තම කල්‍යාණ මිත්‍ර ආචාර්යයන් වහන්සේ දුටු වැලිවිට මහ තෙරිඳු, වහා උන්වහන්සේට උපසම්පදා පැවිද්ද දෙන්නට තීරණය කළේය. ලක් ශාසන ඉතිහාසයේ සම්මත සංඝ ගණ සභාව වූක්ත උපසම්පදාවට පත් වූ එකම මහ තෙරිඳු හිමිනම, සිටිනාමළුවේ ධම්මජෝති හිමියන් වූයේ එලෙසය. ඒ, නූතන ශාසනයේ මහ ශාස්ත්‍රවන්තයන්ය. ශාස්ත්‍රවන්තයන් පසෙක තැබීම පිළිවෙත වූයේ ඉන් පසුවය. ඒත්, වැලිවිට සිරි සරණංකර සඟරජුවන් මහ ගුණැති මහ තෙරක් නොවන්නට, සිටිනාමළුවේ හිමි අපවත් වන්නේ සාමණේර ලෙසමය. උන්වහන්සේ ඉතිහාස නමකට සීමාවී පිටමං වූයේ එබැවිනි. නූතන සිංහල ශාස්ත්‍ර සම්ප්‍රදායේ ආරම්භකයා වූ, රුහුණු සංඝ සම්ප්‍රදායේ ආරම්භකයා වූ සිටිනාමළුවේ ධම්මජෝති හිමියන්ගේ විශේෂත්වය, තමා පෙළෑ අයුක්තියට සසුන කඩා නොයා, පිළිවෙත් සරු මඟ පිවිස නික්ම වැඩීමය. උන්වහන්සේ නිෂ්ක්‍රමණය කරන මොහොතේ දෙපස වැඩ සිටියේ, වැලිවිටියේ සඟරජු හා කඹුරුපිටියේ මහ තෙරිඳුය.

සුජිත් අක්කරවත්ත

සිරි ලක ධජ පුරාණය

ඉර හඳ කොඩිය



සමන් දෙවි කොඩිය

මෙරට ධජ පූජාවේ ඉතිහාසය රාවණා යුගය දක්වා දිව යන බව පැවසෙයි. රාවණා රජු භාවිත කළ කොඩිය රාවණා කොඩියයි. එය රජුගේ පෞද්ගලික කොඩිය මෙන්ම, රටේ ජාතික කොඩිය ද වේ. ඒ හෙයින් එය ලක්දිව මුල්ම ජාතික කොඩිය ලෙස සැලකිය හැකිය. රාවණා කොඩියේ සිටි මානව රූපයකින් (රජ - දෙවියන්) හා එහි හිසට ඉහළින් දෙපස සූර්යයා හා චන්ද්‍රයාගේ සංකේතවලින් යුක්ත විය. ඉන් අනතුරුව ක්‍රි.පූ 544දී විජය කුමරු ලක්දිවට පැමිණ තම්මැන්නාවේ සිංහ රූපය සහිත කොඩිය නිර්මාණය කරන ලද බව මහාවංසයේ සඳහන් වෙයි. ඉන්දියාවේ සාංචි සෙල් කැටයම් අතර, සිංහ කොඩිය රැගෙන සිය පිරිසත් සමඟ ලක්දිවට එන විජය (විජයාගමනය) දැක්වෙන සෙල් කැටයමක් ද තිබේ. මේ කරුණු ශ්‍රී ලංකාවේ සිංහ කොඩිය හෙවත් ජාතික කොඩියේ ආරම්භය ලෙස සැලකිය හැකිය.

විෂ්ණු ධර්මෝත්තර නම් පැරණි ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථයේ සිංහල ධජයේ සිංහ රූපය පැවැති බව සඳහන් වෙයි. විජයට පසුව ක්‍රි.පූ. 3 වැනි සියවසේ දේවානම් පියතිස්ස රජු සිංහ කොඩිය රාජකීය ධජය වශයෙන් භාවිතා කළ බව සඳහන් වේ. පැරණි ලක්දිව ජාතික ධජය ලෙස සිංහ කොඩිය පිළිබඳව වඩාත් ප්‍රකටව මහාවංසයේ සඳහන් වන්නේ දුටුගැමුණු රාජ්‍ය සමයේදීය. ඒ රජු සෑම සම්භාවනීය අවස්ථාවකදීම සිංහ කොඩිය ජාතික කොඩිය වශයෙන් ගෞරව බහුමානයෙන් පරිහරණය කර තිබේ. කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේ සිතුවම් කරන ලද රන්ගිරි දඹුලු විහාරයේ සිතුවම් අතර දුටුගැමුණු රජුගේ ජාතික ධජය නිරූපණය වේ. චතුරශ්‍රයකින් හා එහි කෙළවර එක් පසක දිගැටි ත්‍රිකෝණ දෙකකින් යුක්ත හැඩය සහිත කොඩියේ චතුරශ්‍ර කොටසේ ඉහළින් ඉර සඳ සංකේත දෙක ද පහළින් ඉදිරි දකුණු පාදයෙන් කඩුවක් ගත් සිංහයා ද නිරූපණය වේ. රාවණා කොඩියේ ඉර - සඳත් විජය රජුගේ කොඩියේ සිංහ රුවත් සංකලනය කර දුටුගැමුණු රජුගේ කොඩිය නිර්මාණය කර ඇති බව අනුමාන කළ හැකිය.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන තන්ත්‍රය හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කොඩි සම්බන්ධ පැරණිතම අවස්ථාව ලෙස සඳහන් කළ හැක්කේ රාවණා යුගයයි. රාවණා රජු සිය රාජ්‍ය තාන්ත්‍රික කටයුතු මෙන්ම යුද්ධවලදී ඉහත සඳහන් රාවණා කොඩිය භාවිත කරන ලද නිර්භීත, අති දක්ෂ, රණශූරයකු වූ රාවණා රජු, ධජය පෙරටු කරගෙන කළ සියලු සටන්වලදී ජයග්‍රහණය ලැබුවේය. රාවණා ධජය ලෙළදෙනු දකින සතුරෝ, අතිශය භීතියට පත් වූහ. ඒ අනුව එම කොඩියට මහත් බලයක් තිබිණි. ඊට හේතුව වූයේ, එයට දෙවියන්ගේත් ආශීර්වාදය ලබා දීමයි. ධජග්ග සූත්‍රයේ සඳහන් වන පරිදි ඒ ඒ දෙවියන් තම කොඩිවලට ලබා දුන් ආශීර්වාදය නිසා, මිත්‍ර පාර්ශ්වයන්ගේ සියලු බිය දුරුවී, ජයග්‍රහණය අත්පත්කර දුන්න ද, සතුරු සේනාව පරාජය වූවා සේ දේවාශීර්වාදය ලබා දෙන ලද රාවණා කොඩිය මඟින් ද රාවණා රජු ජයග්‍රහණය කළේය.

මෙසේ කොඩිවලට දේවාශීර්වාදය ලබාදීමේ සම්ප්‍රදාය එදා සිට නූතන යුගය දක්වාම පැවැත එන බව, ඌව සබරගමුව පළාත්වල දේවාලවල වර්තමානයේ ද රාවණා කොඩියට පුද පූජා පවත්වමින් දේවාශීර්වාදය ලබා දීමෙන් යාතුකර්ම පවත්වන ආකාරයෙන් අනාවරණයවේ. මේ සම්බන්ධ එක නිදසුනක් නම්, සබරගමුව මහා සමන් දේවාලයේ දේවාභරණ තැන්පත් කර තිබෙන බළන්ගොඩ බොල්තුඹේ නම් ගමේ පුරාණ මහා සමන් දේවාලයේ රාවණා ධජය තැන්පත් කර තිබෙන බවට පුරාවෘත්තයේ සඳහන්ව තිබීමය. ඒ පිළිබඳ දැඩි විශ්වාසයකින් පසුවන පළාතේ ජනතාව, රාවණා කොඩිය මහා හාස්කම් ඇති උතුම් පූජාර්ච වස්තුවක් ලෙස සලකා පුද පූජා පවා පවත්වති. දැඩි නියම සමයකදී වුව ද, කොඩිය පිටතට ගෙන එසවුව හොත්, මහා වැසි වසින බවට විශ්වාසයක් පවතී. වාර්ෂිකව එහි රාවණා පූජාවක් පවත්වා, ධජයට ද පුෂ්පෝපහාර පවත්වා, ඊට දෙවියන්ගේ ආශීර්වාදය ලබා ගැනීම පුරාණයේ සිට කෙරෙන ආගමික චාරිත්‍රයකි. මෙරට සියලු දේවොලකම පාහේ ඒ ඒ දෙවියන්ගේ වස්ත්‍රාභරණ මෙන්ම, පෙරහරවලින් ධජ පතාක ගෙන ගොස් උත්සවාකාරයෙන් පූජෝපහාර පවත්වා දේවාශීර්වාදය ලබා දීම, වසරක් පාසා සම්ප්‍රදායානුකූලව කෙරෙන ආගමික චාරිත්‍රයකි. මහනුවර ශ්‍රී දළදා පෙරහරේ සතර මහා දේවාලවල දේවාභරණ හා දෙවියන්ගේ ධජ ගෙන ගොස් ආගමික චාරිත්‍ර පවත්වා දේවාශීර්වාදය ලබාදීම සිදු කෙරේ.

ලංකාවේ පෞරාණික යුගයේ සිට භාවිත වන සුවිශේෂී කොඩි වර්ගය වන්නේ, රජුගේ හෙවත් රාජ්‍ය ධජය හා ආරක්ෂක හමුදා සේනාංක සතු ධජය. මුල් යුගයේ රජුගේ ධජය ජාතික හ

සුරංගි විජේසුන්දර මහතාගේ සිතුවමක්

මහාවංසයේ තිබෙන්නේ හෙළයන්ගේ ඉතිහාසයම ද?

ශ්‍රී ලාංකේය ඉතිහාසය අඛණ්ඩව වාර්තා කර ඇති මහාවංසය පිළිබඳ සඳහන් කළ සැණින් ඇතැමුන් හට එය නයාට අඳුකොළ වැනිය. එයට හේතුව, මීට වසර අටකට, දහයකට පෙර සිට ලාංකේය සමාජය තුළ මහාවංසය පිළිබඳ නිර්මාණය කර ඇති වැරැදි මතවාදය. මේ වැරැදි මත දේව භාෂිත විදිහට පිළිගන්නා පිරිසක්, කිසිදු විමසීමකින් තොරව මහාවංසයට පමණක් නොව, මහාවංසය රචනා කරන ලද මහානාම හිමියන්ට ද දෙස් දෙවොල් තැබීම අරඹා ඇත.

ඒ අයුරින් චෝදනා කරන පිරිස් පවසන්නේ, මහානාම හිමියන් ඉන්දීයයකු බවත්, එවැන්නකු රචනා කළ ප්‍රලාප සහිත ඉතිහාසය ඉවත් කර, හෙළයන්ගේ ඉතිහාසය නිර්මාණය කළ යුතු බවත්ය. මේ අයුරින් චෝදනා එල්ල කරන කිසිවෙක්, මහාවංසය පිළිබඳ හෝ ඉතිහාසය පිළිබඳ නිවැරැදි අවබෝධයකින් යුතුව සිටින බවක් නොපෙනෙයි.

මහාවංසය පිළිබඳත්, එහි කතුවරයා වන මහානාම හිමියන් පිළිබඳත් සමාජයෙහි ඇතැම් පිරිස් තුළ පවත්නා නොදනුවත් භාවය දුරු කිරීම සඳහා, මහාවංසය සහ එහි අන්තර්ගතය පිළිබඳත්, ඒ ඔස්සේ කියැවෙන ශ්‍රී ලංකාවේ ඓතිහාසික දැක්ම කුමන ආකාර වන්නේ ද? යන්නත් ඉතා සරලව මේ ලිපිය ඔස්සේ පැහැදිලි කෙරෙයි.

මහින්දාගමනය සහ අප රටේ ඉතිහාස සම්ප්‍රදාය මහින්දාගමනය යනු ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරය විශාල වශයෙන් වෙනස් කිරීමට සමත් වූ සංසිද්ධියකි. දේශපාලන, සමාජ, සංස්කෘතික මෙන්ම ආර්ථික වශයෙන් යනාදීවූ සෑම අංශයකින්ම මහින්දාගමනය ශ්‍රී ලංකාවේ ජන ජීවිතයට බලපෑම් එල්ල කරන ලදී. බුදු දහමෙහි මූලික හර පද්ධතියම, මහින්දාගමනයෙන් වසර දෙතුන්සියයක් ඇවෑමේදී, ලාංකේය ජන සමාජය තුළ මුල්බැස ගැනිණි. මේ වෙනස්කම හේතුවෙන් ගෝත්‍ර වශයෙන් සහ කණ්ඩායම් වශයෙන් වෙන්ව සිටි අපේ මිනිසුන්, එකම ජාතියක් වශයෙන් එකතු වීමට පටන් ගන්නා ලදි. යක්ෂ, නාග, දේව සහ රාක්ෂ ලෙස ගෝත්‍රික මෙන්ම ප්‍රදේශ මූලිකකර ගන්නා ලද නාම අත්හැර 'සිංහල' යන නාමය අපගේ ජාතියේ මුද්‍රාව බවට පත් විය.

එසේම, මහින්දාගමනයත් සමඟ ලංකාවේ ඉතිහාස මතක සම්ප්‍රදායක් ද නිර්මාණය වීම ආරම්භ විය. මෙතෙක් කාලයක් තමන්ගේ කුටුම්බය තුළ, එහෙමත් නැත්නම් ගෝත්‍රයේ පැරණියන් පිළිබඳ මතක සටහන් තබාගෙන පැමිණි මිනිසුන්ට, ජාතියක් වශයෙන් ඉතිහාසය මතක තබා ගැනීමට සිදුව ඇත.

■ ඉතිහාසය ලිවීමට මූලපිරීම

පවුලක හෝ ගෝත්‍රයක ඉතිහාසය මතක තබා ගන්නවාට වඩා, ජාතියක ඉතිහාසය මතක තබා ගැනීම අපහසු කාර්යයකි. මුළු මහත් ජාතියේම සිදු වන සෑම දෙයම මතක තබා ගැනීමට යාම, බැරෑරුම් කර්තව්‍යයකි.එබැවින්, මුළු ජාතියේම ගමන් මඟ වෙනස් කළ, එසේත් නොමැති නම්, මුළු ජාතියටම බලපෑ සිදුවීම් පමණක් අනුපිළිවෙළින් මතක තබා ගැනීමට ක්‍රමවේදයක් සකස් කර ගැනිණි. මේ ක්‍රමය බුදු දහමත් සමඟ බද්ධ වූවකි. මිහිඳු මහ රහතන් වහන්සේ ඇතුළු මෙහි පැමිණි ධර්ම දූතයන් වහන්සේලා විසින් දේශනා කරන ලද ත්‍රිපිටක ධර්මය, ස්වභාෂාවෙන් දේශනා කළ ධර්මයකි. මේ දේශනා සෑම එකක් තුළ ම ඒ ඒ ත්‍රිපිටක කොටස් කටපාඩම්න් පවත්වාගෙන ආ භික්ෂු පරම්පරා පිළිබඳ මතක ද එක්ව ඇත. බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණෙන් පසුව පවත්වන ලද පළමු වැනි ධර්ම සංගායනාවේදී සූත්‍ර - විනය පිටකවල කොටස් ප්‍රධාන මහ රහතන් වහන්සේ නමකට සහ උන් වහන්සේගේ ශිෂ්‍ය අනු ශිෂ්‍ය පරම්පරාවට භාර දුනි.

මේ අයුරින් සූත්‍ර - විනය කොටස් කටපාඩම්න් පවත්වාගෙන පැමිණි භික්ෂු පරම්පරා භාණකවරුන් ලෙස හඳුන්වයි. මේ භාණක පරම්පරාවල භික්ෂූන් වහන්සේලා සෑම විටෙකම තමන්ට ඒ ඒ කොටස් කටපාඩම්න් පවත්වාගෙන යන ලෙස පවරා දෙන ලද මුල් භික්ෂූන් වහන්සේලාගේ නාම මෙන්ම, වැදගත් සිදුවීම් මතකයේ තබාගෙන සිට ඇත.

මේ ආකාරයෙන් ඉන්දියාවේ නිර්මාණය වී තිබුණු භාණක පරම්පරා, මිහිඳු මහ රහතන් වහන්සේ විසින් ලංකාව තුළ ද ඇති කළහ. ඒ, අරිට්ඨ ඇමැතිතුමන්ගේ මහණ උපසම්පදාවත් සමඟය.

එලෙස ආරම්භ වූ ලාංකේය භික්ෂු ශාසනය තුළ වැඩවාසය කළ භික්ෂූන් වහන්සේලා, ත්‍රිපිටකයට අමතරව ලංකාවෙහි ඉතිහාසය සිදු වූ වැදගත් සංසිද්ධි ද මතකයේ රඳවා ගත්හ. එහිදී මහා විහාර සම්ප්‍රදායේ ඉතිහාස මූලික විය. මෙහිදී ලාංකේය ඉතිහාසය යනු මහා විහාර සම්ප්‍රදායේ ඉතිහාසය ද යන ගැටලුව මතු වන නමුත්, මහා විහාරය යනු ලංකාවේ ජාතියෙහි තොට්ල්ල බඳුවන බැවින්, එහි එතරම් ගැටලුකාරී බවක් නොපෙනෙයි. ඒ සඳහා හේතු සාධක කිහිපයක් ඇත. දේවානම්පියතිස්ස රජු මහමෙව්නා උයන මිහිඳු මහ රහතන් වහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේලාට සඟසතු කර පූජා කිරීමෙන් අනතුරුව, එම භූමිය තුළ ලංකාවේ පළමු විහාරය ලෙස මහා විහාරය නිර්මාණය විය. මහා විහාරය අනුරාධපුර පිහිටිය ද, ලංකාව වටාම එම සම්ප්‍රදාය හා අනුගත වූ විහාරාරාම රැසක් මේ කාල සීමාව තුළදී නිර්මාණය විය. එම විහාරාරාම හා සම්බන්ධ සියලු භික්ෂූන්, මහා විහාර සම්ප්‍රදාය අනුගමනය කරන්නන් වූ බැවින්, මහා විහාර සම්ප්‍රදාය යනු අනුරාධපුරයට පමණක් සීමා වූවක් නොවන බව පැහැදිලිය.

■ පළමු නිකාය භේදය

මහා විහාරය පිහිටුවා වසර එකසිය පනහක් පමණ ගත වන තුරු අප රට තුළ වෙනත් භික්ෂු සම්ප්‍රදායක් නොතිබුණි. එනමුදු, අප කවුරුත් දන්නා පරිදි වලගම්බා රජුගේ කාලයේදී මහා විහාරය දෙකඩ වන සිදුවීමක් සිදු විණි. වලගම්බා රජතුමා යනු, සද්ධාතිස්ස රජුගේ පුත් කුමාරවරු හතරදෙනාගෙන් එක අයෙකි. බලයට පත්ව මාස පහක් ඇවෑමෙන් රජුට විරුද්ධව එකම දිනයකදී ආක්‍රමණ දිවිත්වයක් එල්ල විය. ඉන් පළමුවැන්න, දකුණු ඉන්දියාවේ සිට පැමිණි දෙමළ කුමාරවරුන් සත් දෙනකු විසින් එල්ල කරන ලද ආක්‍රමණයකි. දෙවැන්න, රුහුණේ නකුල ග්‍රාමයෙහි විසූ තීය, නැත්නම් තිස්ස නම් බ්‍රාහ්මණයා විසින් මෙහෙයවන ලද ආක්‍රමණයකි.

මේ ආක්‍රමණවලින් පරාජය වූ වලගම්බා රජු සිහසුන අත්හැර වනගත විය. ආක්‍රමණ මෙහෙයවන ලද තීය බ්‍රාහ්මණ හා දමිළ කුමාරවරුන් අතර ඇති වූ සටනකින් පසුව තීය බ්‍රාහ්මණයා පැරද, නැවතත් රුහුණට පලා ගියේය.

මේ සියලු ආක්‍රමණ හේතුවෙන් පරාජය වූ රජු, පලා යාම සඳහා අනුරාධපුර උතුරු මාර්ගය තෝරා ගත්තේය. එහිදී හමු වන ගිරි නිගණ්ඨ ආරාමය පසුකර යෑමේදී, "මහ කළු සිංහලයා පැනල යනවා" යනුවෙන් ගිරි නිගණ්ඨයා රජුට අවමන් කරන ලද බව සඳහන් වෙයි.

උපහාසය මතකයේ රඳවා ගනිමින්, වලගම්බා රජතුමා පලා යැමේදී රථයේ බර වැඩි වූ බැවින්, අගමෙහෙසිය වූ සෝමාදේවිය රථයෙන් බැස, දමිළ කුමාරවරුන්ට යටත්ව ඇත. සෝමා දේවිය පැහැර ගන්නා ලද එක් දමිළ කුමාරයකු, නැවතත් ඉන්දියාව වෙත පලාගොස් තිබේ.

එසේම, බුදුරජාණන් වහන්සේගේ පාත්‍රා ධාතූන් වහන්සේ පැහැර ගත් තවත් දමිළ කුමාරයෙක්, ඉන්දියාවට පැනගොස් ඇත. එබැවින්, දෙමළ කුමාරවරු හත් දෙනකු ලංකාව ආක්‍රමණය කළ ද, පාලනය ගෙනයන ලද්දේ කුමාරවරුන් පස් දෙනකු පමණි. මේ හේතුවෙන් මේ ආක්‍රමණය පංච ද්‍රවිඩ ආක්‍රමණය ලෙස ද ඉතිහාසය තුළ සටහන්ව ඇත.

1. පුලහත්ථ
2. භාහිය
3. පණයමාර
4. පිළයමාර
5. දාඨිය

නම් වූ මේ දමිළ කුමාරවරු එකිනෙකා මරා ගනිමින් වසර දහහතරකුත් මාස හතක කාලයක් රජකම් කර ඇති නමුත්, මේ වසර දහ හතරකුත් මාස හතක කාලය තුළ මුළු ලංකාවම මේ දමිළ කුමාරවරුන්ට යටත්ව නොතිබුණි. මලය දේශය මෙන්ම, රෝහණය ද මේ සතුරු ග්‍රහණවලින් නිදහස්ව පැවතුණි.

> බුදු දහමෙහි මූලික හර පද්ධතියම, මහින්දාගමනයෙන් වසර දෙතුන්සියයක් ඇවෑමේදී, ලාංකේය ජන සමාජය තුළ මුල්බැස ගැනිණි. මේ වෙනස්කම හේතුවෙන් ගෝත්‍ර වශයෙන් සහ කණ්ඩායම් වශයෙන් වෙන්ව සිටි අපේ මිනිසුන්, එකම ජාතියක් වශයෙන් එකතු වීමට පටන් ගන්නා ලදි. යක්ෂ, නාග, දේව සහ රාක්ෂ ලෙස ගෝත්‍රික මෙන්ම ප්‍රදේශ මූලිකකර ගන්නා ලද නාම අත්හැර 'සිංහල' යන නාමය අපගේ ජාතියේ මුද්‍රාව බවට පත් විය.

වංශකථාවෙහි සඳහන් පරිදි යුද්ධයෙන් පැරද පලා ගිය තීය බ්‍රාහ්මණයා, රෝහණයේ සිට ඉතා දුර්දාන්ත අයුරින් ප්‍රදේශය තුළ පාලනය ගෙනගොස් ඇත. එම අභාග්‍යසම්පන්න පාලනය හේතු කර ගනිමින්, රට තුළ දුර්භික්ෂයක් ආරම්භ වූ බව සඳහන් වෙයි. එම දුර්භික්ෂය 'බැමිණිතියාසාය' ලෙස හැඳින්වේ. එම දුර්භික්ෂයෙහි නාමය තුළ "බමුණු තීයගේ ආගතය" යන අරුත් ගැබ්ව ඇත.

මේ දුර්භික්ෂයෙන් සුළු වශයෙන් හෝ සුරකී පැවතුණේ, මලය දේශය පමණි. වලගම්බා රජු වසර දහහතරක් පුරා ආක්‍රමණවලින් පැරද සැඟවී සිට ඇත්තේ මලය දේශය ආශ්‍රිතවය. තම පාත්‍රයට ලැබෙන දානයෙන් එලෙස වනගතව, කටුක දිවි පෙවතක් ගෙනහිය රජතුමා පෝෂණය කරමින්, ආරක්ෂා කරන ලද්දේ කුපික්කලතිස්ස තෙරුන්, නැතිනම් මහා තිස්ස නමැති භික්ෂූන් වහන්සේය.

වසර දහ හතරකුත් මාස හතකට පසුව, අවසන් දමිළ කුමාරයා වූ දාඨිය මරා දමමින්, වලගම්බා රජු නැවතත් අනුරාධපුර සිහසුනට පත් වෙයි. රාජ්‍යත්වයට පත් වීමෙන් අනතුරුව, තමා අනුරාධපුර උතුරු දිග මාර්ගය ඔස්සේ පලා යාමේදී, උපහාසයෙන් හිනැහුණ 'ගිරි' නම් නිගණ්ඨයා, ඝාතනය කර දැමීමේය. ඉන් අනතුරුව ඔහුගේ නිගණ්ඨාරාමය ඉවත් කර, එතැන්හි ආරාමයක් ඉදිකර, තමන් වනගතව සිටි අවධියේදී, තමා පෝෂණය කළ කුපික්කලතිස්ස තෙරුන් වෙත පෞද්ගලික පූජාවක් වශයෙන් ආරාමය පූජා කළේය.

■ කුල සංසර්ග චෝදනා

මේ අයුරින් නිර්මාණය කළ ආරාමය, අභයගිරිය නමින් ප්‍රචලිත විය. පෞද්ගලික ආරාම පූජාවක් වශයෙන් කුපික්කලතිස්ස හිමියන් අභයගිරිය භාර ගැනීම සම්බන්ධව, මහා විහාරික භික්ෂූන් උන් වහන්සේ හා විරසකව ඇත. එහි ප්‍රතිඵල වශයෙන්, කුපික්කලතිස්ස හිමියන් කුල සංසර්ග චෝදනා මත මහා විහාරයෙන් නෙරපා හැරිණි.

මේ අයුරින් කුපික්කලතිස්ස හිමියන් මහා විහාරයෙන් නෙරපා හැරීමට විරුද්ධ වූ කුපික්කලතිස්ස හිමියන්ගේ ශිෂ්‍ය හිමි නමක් වූ බාල මස්සුතිස්ස හිමියන් මහා විහාරය අතහැර, තවත් පන්සියයක් භික්ෂූන් සමඟ අභයගිරිය වෙත පැමිණීමත් සමඟ, මෙතෙක් කලක් මහාවිහාරයට සීමාවී තිබූ ආරාම සම්ප්‍රදාය, කොටස් දිවිත්වයකට බෙදී ගියේය. එනම්, මහා විහාරය සහ අභයගිරිය වශයෙනි. මෙලෙස, සම්ප්‍රදාය දිවිත්වයක් වශයෙන් බෙදී ගිය ද, මුල් වසර තුන්සියයක් පමණ ගතවන තුරු, මේ සම්ප්‍රදාය දිවිත්වය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවිය.

එහෙත්, පසු කාලයේදී මහා විහාර සහ අභයගිරි සම්ප්‍රදාය දිවිත්වය අතර විශාල තරගකාරී ස්වරූපයක් නිර්මාණය විය. මුල් කාලීනව මේ සම්ප්‍රදාය අතර ඉගැන්වූ ධර්ම කරුණුවල ද වෙනසක් නොතිබුණු නමුදු, පසුකාලීනව මහායාන අදහස් පෝෂණය කරන සහ ආරක්ෂා කරන ආරාමයක් වශයෙන් අභයගිරිය පෙරට ආවේය.

චෝහාරිකතිස්ස රජුගේ කාලයේ (ක්‍රි.ව. 214-236) වෛතුල්‍යවාදය යනුවෙන් මහායාන මතවාදයක් අභයගිරිය විහාරය මුල් කර ගනිමින් මතුව ඇත. මේ වෛතුල්‍යවාදී මතයට විරුද්ධව, මහා විහාරීය භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් චෝහාරිකතිස්ස රජු විසින් පැවැත්වීමට කටයුතු කරන ලද පරීක්ෂණයේ ප්‍රධානියා වශයෙන් 'කපිල' නම් වූ බුද්ධිමත් ඇමැතිවරයෙක් පත් කිරීමට රජු කටයුතු කර ඇත.

එම පරීක්ෂණයේදී, වෛතුල්‍යවාදී අදහස් තුළ දැඩි ලෙස එළඹගත් භික්ෂූන් වහන්සේලා පිරිසක් තෝරගෙන, රටින් පිටුවහල් කිරීමටත්, තවත් භික්ෂූන් වහන්සේලා පිරිසක් උපැවිදි කරවීමටත් කටයුතු කර ඇත. ඊට අමතරව, වෛතුල්‍යවාදී පොතපත ගිනිබත් කරන්නටත්, කටයුතු සම්පාදනය කෙරුණි.

චෝහාරිකතිස්ස රජුගේ ඇවෑමෙන් වසර දහ නවයකට පසුව රජ වූ ගෝඨාභය රජුගේ කාලයේදී, නැවතත් අභයගිරිය මුල් කර ගනිමින් වෛතුල්‍යවාදය පැනනැඟී ඇත. එහෙත්, පෙර අවස්ථාවේදී වෛතුල්‍යවාදී අදහස්වලට විරුද්ධවූ රජු විසින් දෙන ලද දඬුවම් පිළිබඳ අවධානය යොමු කළ උස්සීලියාතිස්ස භික්ෂුව ඇතුළු භික්ෂූන් වහන්සේලා තුන්සිය නමක්, අභයගිරිය අත්හැර, දක්ඛිණගිරි විහාරය වෙත පැන යෑමට කටයුතු කළහ. මේ පිරිස මහා විහාරය පිළිගත් කොටසක් නොවිය. වර්තමානයේදී හඳුනාගත හැකි ඇතැම් පිරිස් සේම, ත්‍රිපිටක ධර්මය වෙත නොයෙකුත් අර්ථකථන සැපයුවන් වන බැවින්, ඔවුන් 'සාගලිය' වශයෙන් හැඳින්විය.

පෙර අවස්ථාවේදී සේම ගෝඨාභය රජු ද, වෛතුල්‍යවාදය මැඩලීම සඳහා කටයුතු කර තිබේ. වෛතුල්‍යවාද වෙත වැඩි වශයෙන් නැඹුරුව සිටි භික්ෂූන් වහන්සේලා හැට නමක් තෝරාගත් ගෝඨාභය රජු, උන් වහන්සේලාගේ පිටෙහි හණ ලකුණ, නැත්නම් හංවඩු යොදා රටින් නෙරපා දැමීමට කටයුතු කර ඇත. එසේම, වෛතුල්‍යවාදී පොත පත ද ගිනිතබා විනාශ කර ඇත.

මේ අයුරින් දිගින් දිගටම මූල ථේරවාදයට විරුද්ධව බලවේග මතුවීමේදී, එම බලවේග මැඩලීම උදෙසා නිර්භයව ඉදිරිපත් වූයේ, මහා විහාරවාසී භික්ෂූන් වහන්සේලාය. කෙසේ නමුත්,ගෝඨාභය රජුගේ ක්‍රියාකලාපය හමුවේ, අභයගිරියෙන් එල්ලවූ තර්ජන නතර නොවිය.

■ මහා විහාරයෙන් පළි ගනියි

ලංකාව තුළ වෛතුල්‍යවාදී මතවාද දරමින් සිට, ගෝඨාභය රජුගේ දඬුවමට ලක්ව හණ ලකුණ සහිතව දකුණු ඉන්දියාවට පිටුවහල් කරන ලද භික්ෂූන් වහන්සේ නමක් යටතේ හැදී වැඩුණු දකුණු ඉන්දියානු භික්ෂූන් වහන්සේ නමක වූ සංඝමිත්‍ර නමැති භික්ෂූන් වහන්සේ, තම ගුරු හිමියන් වෙත සිදු වූ අසාධාරණයට පළි ගැනීමේ චේතනා සහිතව, ගෝඨාභය රජුගේ පාලන කාලය තුළදීම ලංකාවට පැමිණියහ.

මෙලෙස පැමිණි සංඝමිත්‍ර තෙරුන් රජතුමාගේ ප්‍රසාදය දිනා ගනිමින්, පුත් කුමාරවරු දෙදෙනාගේ රාජගුරු තනතුරට පත් වන අතර, රාජ කුමාරවරුන් අතරින් බාල කුමාරයාවූ මහසෙන් කුමාරයා, මහායාන අදහස් වෙත නැඹුරු කර ගැනීමට, ඔහු සමත් විය.

සංඝමිත්‍ර භික්ෂු ලබා දුන් වැරැදි උපදෙස් පිළිගත් මහසෙන් රජු, බලයට පත් වූ සැණින් මහා විහාර භික්ෂූන් වෙත දානය ලබා දීම සම්පූර්ණයෙන්ම තහනම් කළේය. එම නියෝගයට පරිබාහිරව යමින්, යමෙක් දානය පූජා කරන්නේ ද, ඔවුන්ගෙන් කහවණු සියයක දඩයක් අය කර ගැනීමට කටයුතු කර ඇත. එයින්ද නොනැවතී මහසෙන් රජු මහා විහාරය සතු වස්තු සම්පත් රැගෙන ගොස්, අභයගිරි විහාරයට පූජා කිරීමට ද කටයුතු කළ බව, මහාවංසය සඳහන් කරයි. අවසානයේදී සංඝමිත්‍ර භික්ෂුවගේ උපදෙස් මත කටයුතු කරමින්, මහා විහාරය පොළොවට සමතලා කර, එබිම මත උඳු වැපිරීමට ද මහසෙන් රජු ක්‍රියා කර ඇත. මේ කාලය තුළදී, මහා විහාර සීමාව උල්ලංඝනය කරමින්, ජේතවනය නමැති විශාල ආරාම සංකීර්ණයක් නිර්මාණය කර, තම පිය රජුගේ කාලයේදී අභයගිරිය අත්හැර, දක්ඛිණගිරි විහාරයට පැනගිය සාගලිය භික්ෂූන් වහන්සේලා වෙත පූජා කිරීමට කටයුතු කර තිබේ. මෙබඳු කරුණු කාරණා හේතුවෙන්, මහසෙන් රජුගේ පාලන කාලය අවසන් වන විට, මහා විහාරය වෙත විපක්ෂව බලවේග දිවිත්වයක් නිර්මාණය වී පැවතුණි. ආරාම සම්ප්‍රදාය ත්‍රිත්වය අතර වූ තරගයේදී, මහා විහාරයට වඩා, අභයගිරිය සහ ජේතවනය යන සම්ප්‍රදාය දිවිත්වය ඉදිරියෙන් පසු විය. මෙබඳු අභියෝගකාරී තත්ත්වයට සාර්ථකව පිළිතුරු සැපයීම සඳහා, එකල පැවැති වඩාත් ම සුදුසු ක්‍රමය වූයේ, ඓතිහාසික තොරතුරු අලළා ග්‍රන්ථයක් රචනා කිරීමය. මේ පසුබිම යටතේ, දීපවංශය සහ මහාවංශය රචනා කෙරිණි.

සමීර ප්‍රසංග
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සැකසුම
ඩබ්. සිතුමි බොතේජු
පුරාවිද්‍යා හා උරුම අධ්‍යයන ආයතනය, කළුතර



ශ්‍රී වික්‍රම රාජසිංහ සැහැසි පාලකයෙක්?

ශ්‍රීලංකාවේ මධ්‍යම කඳුකරයේ පිහිටා ඇති මහනුවර රාජධානිය, ලංකා ඉතිහාසයෙහි කඩඉමක් ලෙස සඳහන් කළ හැකිය. එහි පදනම වැටුණේ පහළොස් වැනි ශත වර්ෂය තරම් මෑත කාලයකදීය. එහි අගනුවර වූයේ සෙන්කඩගල නුවරයි. මෙහි රාජත්වයට පත් වූ රජවරු, ලංකා ඉතිහාසය අධ්‍යනයෙහි දී ඉතා වැදගත්කමක් දරති. 'කුණ්ඩසාලේ දෙයියෝ' යැයි තම රට වැසියන් අතර ප්‍රකට වූ ද, සේනා සම්මත වික්‍රමබාහුගෙන් පැවතෙන සිංහල රාජ පෙළපතේ අවසාන රජු වූ ද, ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ 1739 දී දිවංගත විය. ඔහුගේ සුහුරුබඩු වූ ශ්‍රී විජය රාජසිංහ පසුව රාජ්‍යත්වයට පත් විය. ඔහුගෙන් පසු රජ පැමිණි, 1815 වසර තෙක් උඩරට පාලනය කළ රජුන් තිදෙනාගෙන් නායක්කර් පෙළපත සමන්විත විය. නායක්කර් වංශය, දකුණු ඉන්දීය පෙළපතකින් ප්‍රභවය විය. ඉන් පසුව, කීර්ති ශ්‍රී රාජසිංහ ද, ශ්‍රී රාජාධිරාජසිංහ ද රාජත්වය දැරූහ.

ශ්‍රී රාජාධිරාජසිංහ රජුගේ අභාවයෙන් පුරප්පාඩු වූ ලංකා රාජ්‍යය සඳහා රජකු පත් කර ගැනීමේ අවශ්‍යතාව පැනනැඟුණු අවස්ථාවේ, එම තනතුර සඳහා නම නියම කිරීමේ අයිතිය එවකට යටෝක්ත රජුගේ අග්‍රාමාත්‍ය තනතුර දැරූ පිළිමතලවිවේ මහ අධිකාරම්තුමාට සම්පූර්ණ බලය ලැබිණි. එහෙයින්, පිළිමතලවිවේ මහ අධිකාරමට රජ වීම සඳහා දැඩි ආසාවක් තිබුණ ද, ඒ සඳහා මහජන මතයක් ගොඩනැඟීමට තරම් ඔහු ගැන කිසිවකුගේ දැඩි කැමැත්තක් නොතිබුණි. මේ හේතුව නිසා, තමා පසුව හෝ රජ වීමේ බලාපොරොත්තුවෙන්, තාවකාලික රජකම සඳහා පුද්ගලයකු ලෙස, රාජාධිරාජසිංහ රජුගේ දෙවැනි බිසවගේ සහෝදරියකගේ පුත්‍රයාවූ කන්නසාමි නම් දහඅට හැවිරිදි කුමරුවා, ක්‍රි. ව. 1798 දී ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් රජ තනතුර සඳහා පත් කර ගත්තේය. ඉහත සඳහන් අධිකාරමට අවශ්‍යව තිබුණේ, ළාබාල කෙනකු රජ කරවා, පසුව තමා රජ වීමේ බලාපොරොත්තුවයි. මේ නිසා, රජතුමා රූකඩයක් ලෙස තබාගෙන, තමාට අවශ්‍ය විධියට රාජකාරී කටයුතු කර ගැනීමට ඔහු තැත් කළේය. මේ කාලය තුළ දී එවකට දෙවැනි අධිකාරම තනතුර දරූ ඇරැව්වාල නිලමේ හොර රහසේ මරා දැමුවේය. පිළිමතලවිවේගේ කුට උපක්‍රම හොඳින් තේරුම් ගත් ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා, මොහු ගැන මුල දී තිබූ කැමැත්ත හා විශ්වාසය අත්හළේය. මේ නිසා, රාජසිංහ රජතුමා රාජ්‍යයෙන් නෙරපා, ඉංග්‍රීසීන්ගේ උදව්ව මත, පිළිමතලවිවේ රජ වීමට අදහස් කළේය. මෙයට ඉංග්‍රීසීහු කැමැත්තක් නොදැක්වූ අතර, පසුව රජතුමා සමඟ සාමකාමී ගිවිසුමක් අස්සන් කිරීමට ජෙනරාල් මැක්ඩොවල් මහනුවරට යැවීය. ඒත් එම උත්සාහය ද නිෂ්ඵල විය. මේ කාලයේ දී සිංහල පිරිසක්, පුත්තලම ප්‍රදේශයෙහි දී මුස්ලිම් වෙළෙඳුන්ගේ බඩු කොල්ල කෑ නිසා, ඔවුන්ගේ පාඩුව පිරිමසා ගැනීමට වන්දි මුදලක් ලබා දෙන ලෙස ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගෙන් ඉංග්‍රීසීහු ඉල්ලා සිටියහ. මෙය පිළිගත් රජතුමා, පසුව එය එතරම් සැලකිල්ලකට නොගෙන අමතක කර දැමීය. පොරොන්දුව ඉටු නොකළ නිසා, ඉංග්‍රීසීහු කීප වරක්ම වන්දි මුදල් ගෙවන ලෙසට රජතුමාට බල කළහ. ඉංග්‍රීසීන්ගේ මේ ඉල්ලීමට කන් නොදුන් නිසා, රජු හා යුද වැදීමට මැක්ඩොවල් ජෙනරාල්වරයා කොළඹ සහ ත්‍රිකුණාමලයේ සිට හය දහසකින් යුත් යුද සේනා දෙකක් සමඟ මහනුවරට යෑමට පිටත් විය. මොවුන්ගේ ළඟා වීමත් සමඟම රජතුමා මාලිගයෙන් පැන, ඈත පිටිසර ප්‍රදේශයකට ගිය බවත්, යුද්ධ සේනාව මහනුවර රජ මාලිගයට කඩා වැදී, වටිනා බඩුබාහිරාදිය කොල්ල කා, මුළු මාලිගයටම ගිනි තැබූ බවත් සඳහන් වේ. රජතුමා හඟුරන්කෙත ප්‍රදේශයේ සැඟවී සිටින බව පිළිමතලවිවේ අධිකාරම්ගෙන් දැන ගන්නට ලැබුණ නිසා, යුද සේනාව හඟුරන්කෙතට පිටත් කර හැරිය නමුත්, රජතුමා එහි නොසිටියේය.

ඉංග්‍රීසීන් කෙරෙහි දැඩිසේ වෛර බැඳගත් රජතුමා, ඔවුන් සහමුලින්ම ලංකාද්වීපයෙන් නෙරපා දැමිය යුතු යැයි තීරණය කර, සිංහල යුද්ධ සේනාවක් සමඟ කොළඹට නුදුරු හංවැල්ලේ දී ඉංග්‍රීසීන් සමඟ මුහුණට මුහුණලා සටන් කළ අතර, දෙපිරිස අතින් බොහෝ පිරිසක් මරුමුවට පත් විය. තවත් පිරිසක් රජතුමාගේ අණ පරිදි අත්අඩංගුවට ගෙන, උල තියා මැරීමට තීරණය කළේය. මේ යුද්ධය නිෂ්ඵල වූ බැවින්, ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ආපසු මහනුවරට පැමිණියේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 1803 දී පමණ ඉංග්‍රීසීන් විසින් විශාල යුද්ධ සේනාවක් සමඟ මධ්‍යම පළාතට පැමිණ, එම ප්‍රදේශය යටත් කර ගැනීමට උත්සාහ කළේය. එම පිරිසගේ ගමන නැවැත්වීම සඳහා, සිංහල සේනාව නොයෙක් උපක්‍රම යොදා, ඔවුන්ගේ පැමිණීම ටික කලකට මැඩපැවැත්වීය. මේ නිසා, නෝර්ත් ආණ්ඩුකාරවරයා සිය තනතුරෙන් ඉල්ලා අස්වීමත් සමඟම, ජෙනරාල් මේටිලන්ඩ්, ලංකාවේ ආණ්ඩුකාරවරයා වශයෙන් පත් වී, රජතුමා සමඟ සාමයෙන් සිටීමට තීරණය කර ගත් නමුත්, මධ්‍යම පළාතේ කෝලාහල කීපයක් ඇති විය. මේ කෝලාහල, පිළිමතලවිවේ විසින් ඇති කරන ලද්දක් යැයි සමහරුන්ගේ මතයයි.

මේ කාලය තුළ රාජසිංහ රජතුමා, මහනුවර වැව සහ දළදා මාලිගාවේ පත්තිරිප්පුව තැනීමට පටන් ගත් බැවින්, පිළිමතලවිවේ මෙයට ද විරුද්ධ විය. මේ නිසා, පිළිමතලවිවේ අධිකාරම්ගේ සියලු නිල තනතුරු තහනම් කළේය. දැඩි ලෙස කෝපයට පත් පිළිමතලවිවේ අධිකාරම, රජතුමා මැරීමට නොයෙක් උපක්‍රම යෙදුවත්, එය නිෂ්ඵල විය. මින් පසු අධිකාරමගේ බෑනා කෙනෙක් ඇතුළුව තවත් සත් දෙනෙක් එල්ලා මැරීමට රජතුමා නියෝග කළේය. මෙයට ටික කාලයකට පසුව, පිළිමතලවිවේ අධිකාරම මිය පරලොව ගියේය.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ දෙවැනි අධිකාරම්ව සිටි ඇහැළේපොළ, ප්‍රධාන අධිකාරම් තනතුරට පත් කළේය. මේ කාලය තුළ රජතුමාගේ දේවිය හදිසියේ මිය ගිය බැවින්, නැවතත් බිසෝවරු දෙදෙනෙක් සරණ පාවා ගත්තේය. විවාහ මංගල්‍යයෙන් පසුව රජතුමා බැහැදැකීම සඳහා, අධිකාරම්වරු තුටු පඬුරුත් රැගෙන රජ මාලිගයට ගියහ. එහි දී ඇහැළේපොළ කෙරෙහි රජතුමා දැඩි කැමැත්තක් නොදැක්වූ බව පෙනේ. ඇහැළේපොළ කලකිරීමෙන් යුතුව, තම රාජකාරී කටයුතු සඳහා සබරගමු දිසාවට ගියේය. එහි දී රජුට විරුද්ධව කැරලි ගැසීය. මේ බව දැනගත් රජතුමා, ඔහුගේ සියලු තනතුරු මාරු කර, මොල්ලිගොඩ අධිකාරමට පළමු අධිකාරම් තනතුර භාර දී, සබරගමු ප්‍රදේශයට ගොස්, ඇහැළේපොළගේ කැරැල්ල මැඩපැවැත්වීමට නියෝග කළේය. මහ රජුගේ නියෝගය පිළිගත් මොල්ලිගොඩ අධිකාරම සබරගමුවට ළඟා වෙත්ම, ඇහැළේපොළ කොළඹ ප්‍රදේශයට පලා ගියෙන්, ඔහුගේ සගයන් අත්අඩංගුවට ගෙන, මහනුවරට ගෙන ආවේය. මේ සියලු දෙනාටම භයානක වධ දී, උල තියා මැරුවිය. පසුව රජු හට විරුද්ධවූ සියලු දෙනා මැරීමට නියෝග කර, දිනපතා සිය ගණන් මිනිසුන් අමු අමුවේ මරවන ලද බව ඉතිහාසයේ සඳහන් වේ. මේ නිසා රජතුමා කෙරෙහි ජනතාවගේ දැඩි අප්‍රසාදය හා වෛරය උග්‍ර වූ බැවින්, ඇහැළේපොළ පවුලේ සියලු දෙනාම මැරීමට නියෝග කළේය. නියෝගය අකුරට පිළිපැද්ද වධකයෝ, ඇහැළේපොළ පවුල සමූල ඝාතනය කළහ. මෙය සිදු වූයේ රජ මාලිගය ඉදිරිපිටවූ විෂ්ණු දේවාලය හා නාථ දේවාලය අතර, වර්තමාන රජ වීදියත්, දේව වීදියත් අතර භූමි භාගයේ දී බව සඳහන් වේ. මේ මහා ඛේදවාචකය සියැසින් දුටු මහනුවර වැසියෝ, දින ගණනක් නිරාහාරව, ශෝකයෙන් හා බියෙන් යුතුව කල් ගත කළ බව සඳහන්වේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු මෙතරම් දරුණු තීරණ ගැනීමට හේතුව, අධික ලෙස මත්පැන් පානය කර සිටීම බව ඉංග්‍රීසීන්ගේ වාර්තාවල සඳහන් වේ. මේ මහා ශෝකය දැනගත් ඇහැළේපොළ කොළඹට ගොස්, රොබර්ට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා හමු වී, තමාට සිදු වූ විපත සැළ කර, කෙසේ හෝ රජුගෙන් පළි ගැනීමට ආධාර උපකාර ඉල්ලීය. ඔහු සියල්ල දෙන බවට පොරොන්දු විය. මේ කාලය තුළ වෙළෙඳාම පිණිස මහනුවරට පැමිණි වෙළෙඳ පිරිසක් අත්අඩංගුවට ගත් රජතුමා, ඔවුන් ඉංග්‍රීසීන්ගේ ඔත්තුකරුවන් යැයි සැකකර, ඔවුන්ගේ අත්, කන්, නාසා කපා, බෙල්ලේ එල්ලා, භයානක වධහිංසා පමුණුවා, කොළඹට ආපසු යැවීය. මොවුන්ගෙන් අට දෙනකු මග දී මළ බවත්, දෙදෙනකු කොළඹට ගොස් ආණ්ඩුකාරවරයා වෙත සිදු වූ සියලු සිද්ධි විස්තර කළ බවත් සඳහන් වේ. එයින් කෝපයට පත් ආණ්ඩුකාරවරයා, තමන් රජතුමා සමඟ යුද්ධ කරන බවට 1815 ජනවාරි 10 වැනි දින ප්‍රසිද්ධියට පත් කළේය. පසුව ඉංග්‍රීසී යුද්ධ හමුදාව කණ්ඩායම් අටකට බෙදී, ලංකාවේ අට කොනින් පිටත් වූහ. ඔවුහු ක්‍රම ක්‍රමයෙන් මහනුවරට ළඟා වූහ.

මොල්ලිගොඩ ඇතුළු පිරිස යුද්ධයට සූදානම්ව සිටි නමුත්, ඉංග්‍රීසි සේනාවේ ප්‍රබලතාව දැක පසුබැස පලා ගියෝය. ඉංග්‍රීසිහු ටිකෙන් ටික මහනුවර වටකොට රජතුමා ඇල්ලීමට මාලිගයට කඩා පැන්නෝය. මේ වන විට රජතුමා හොර රහසේම මාලිගයෙන් පිට වී, දුම්බර මිටියාවතට ගොස් සිටියේය. ඉංග්‍රීසි හමුදාව සමඟ ඇහැළේපොළගේ සිංහල හමුදාව රජතුමා සෙවීමට දැඩි උත්සාහයක් දැරීය. එහෙත් එම උත්සාහය සඵල නොවූයෙන්, ආපසු මහනුවර බලා ඒමට ඔවුන් සූදානම් විය. අතරමඟ නිවෙසක සිටි කුඩා දරුවකුගේ කලබල ස්වභාවය දුටු හමුදා නිලධාරීන්, ඔහු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කළේය. එම අවස්ථාවේ මේ කුඩා දරුවා කියා සිටියේ, මැද මහනුවරට ආසන්න මීමුරේ ප්‍රදේශයේ තම නිවෙසේ අටුවක රජතුමා සැඟව සිටින බවයි. වහා එම නිවෙස වට කළ හමුදාව, දොරගුළු කඩා, රජතුමා ජීවග්‍රහණයෙන් අල්ලා ගත්තේය. මේ අවස්ථාවේ රජතුමා, ඇහැළේපොළගේ සිංහල හමුදාවෙන් නොයෙක් අතවරවලට ලක් විය. ඒනිස, ඉංග්‍රීසි හමුදාවේ සහයෝගය ඇතිව, සිංහල සේනාව මැඩපැවැත්වීය.

ක්‍රි. ව. 1815 පෙබරවාරි 18 වැනි දින ඉංග්‍රීසීන් විසින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා අල්ලා ගැනීමෙන් පසු, වසර 2358ක් පුරා ලංකාවේ පැවැති සිංහල රාජ්‍ය පරම්පරාව සදහටම අවසන් විය.

පසුව, ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බලසම්පන්න හේවා කණ්ඩායමක් භාරයෙහි කොළඹට ගෙන එන ලද්දේය. රජුගේ වාසය පිණිස කොළඹ කොටුවේ ගාලු දොරකඩ අසල මනාසේ සැරසිලි කරන ලද ගෙයක් පිළියෙල කර තිබුණි. රජතෙම මේ ගෙට ඇතුළුව, විල්ලූද රෙද්දකින් වසා තිබූ ඔටෝමැන් නම් ආසනයක එරමිණිය ගොතා හිඳගෙන, ගෙය වටපිට බලා, "රජ කරන්නට මට අවසර නැති බැවින්, මේ ලැබෙන සුවපහසු ගැන ඉංග්‍රීසීන්ට ස්තුති කරන්නට වටනේ" යැයි කීවේය. රජු, ඉංග්‍රීසින්ට අසු වී සති දෙකකට පසු, මහනුවර මඟුල්මඩුවේ සභාවක් රැස් විය. මේ සභාවෙහි, ඉංග්‍රීසි ආණ්ඩුකාරයා ඉංග්‍රීසි රජු වෙනුවට ද, සිංහල රදළවරු වැසියන් වෙනුවට ද පෙනී සිටියෝය. ඉංග්‍රීසි ආණ්ඩුකාරයා මඟුල් මඩුවේ ඉහළ කොනේ හිඳගත් පසු, ඇහැළේපොළ නිලමේ පළමුවෙන්ම එහි තනිව පැමිණියේය. ආණ්ඩුකාරවරයා ඔහු ගෞරවයෙන් පිළිගෙන, තමාගේ දකුණු පැත්තේ පුටුවක ඔහු වාඩි කරවා ගත්තේය. ඉන් පසු මොල්ලිගොඩ අධිකාරම් තැන දිසාපතිවරුන් සහ අවශේෂ රදළවරුන් පිරිවරාගෙන පැමිණියේය. ඉක්බිති කලින් පිළියෙල කර තිබුණු ගිවිසුම් පත්‍රයක් ඉංග්‍රීසියෙන් ද, සිංහලෙන් ද කියවා භාර ගන්නා ලද්දේය. මේ ගිවිසුමේ දෙවැනි වගන්තියෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු රාජාසනයෙන් පහ කරන ලද බව ද, ඔහුගෙන් පැවතෙන්නන්ට කිසි කලෙකවත් රාජ්‍යය උරුමය නැති බවට ද ප්‍රකාශ කරන ලද්දේය. තුන්වැනි වගන්තියෙන් ශ්‍රී වික්‍රම රාජසිංහයන්ගෙන් පැවැත එන්නන්ට හෝ ඒ රජුගේ බන්ධුවරයන්ට හෝ ඉංග්‍රීසී ආණ්ඩුවෙන් අවසර නැතිව කිසි කලෙක සිංහල රටට එන්නට බැරි ලෙස තහනම් කරන ලද්දේය. පස්වැනි වගන්තියෙන් බුද්ධ ශාසනය ආරක්ෂා කරන හැටියට ද, අටවැනි වගන්තියෙන් රටේ පැවැති රාජ නීතියේ ප්‍රකාර රාජ්‍ය කරන හැටියට ද ගිවිස ගන්නා ලද්දේය. වගන්ති 11කින් යුත් මේ ගිවිසුම් පත්‍රය කියවූ පසු, ඉංග්‍රීසි කොඩිය ඔසොවන ලද්දේය. තුන්වැනි ජෝර්ජ් රජු වර්ෂ 1815 මාර්තු මස දෙවැනි දින පටන් ලංකාවෙහි රජු වූ බව ප්‍රකාශ කිරීම් වශයෙන්, කාලතුවක්කු වෙඩි ශබ්ද පවත්වන ලද්දේය.

05. නියමිත ක්‍රමවේදය අනුව ඉල්ලුම් කිරීමෙන් පසු පළමු පිටපත හා දෙවන පිටපත වශයෙන් නම්කර ඔබ වෙත නිකුත් කරනු ලබන ප්‍රසම්පාදන පෝරම නිසි පරිදි සම්පූර්ණ කර අත්සන් තබා ඔබ වෙත ලබා දෙනු ලබන කවරවල උපදෙස් පරිදි බහා එම පිටපත් දෙකම ඔබ වෙත ලබා දෙනු ලබන ලොකු කවරයේ බහා නියමිත දින නියමිත වේලාවට ප්‍රථම **සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය, ප්‍රාදේශීය සභාව, වැල්ලවාය** වෙත ලැබෙන සේ, ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ මෙම සභා කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ කළ යුතුය. තැපැලේදී නැතිවන හෝ ප්‍රමාද වන හෝ නියමිත වේලාවට පසුව ලැබෙන ප්‍රසම්පාදන ඉල්ලුම්පත් සඳහා වගකියනු නොලැබේ.

06. බදු ගැනීමට අපේක්ෂා කරන දේපළ ප්‍රාදේශීය සභාවේ අවසරය මත ලංසුකරුවන්ට පැමිණ පරීක්ෂා කළ හැකිය.

07. අවම ලංසුවට වඩා අඩුවෙන් ඉදිරිපත් කර ඇති හෝ නියමිත වේලාවට ප්‍රථම ඉදිරිපත් නොකරන ලද ප්‍රසම්පාදන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එවන් අවස්ථාවක දී ඒ සඳහා තබන ලද ප්‍රසම්පාදන ඇප තැන්පත් මුදල් ආපසු නොගෙවනු ලබන අතර, එම ඇප තැන්පත් මුදල් සභාව සතු කෙරේ.

08. දේපළ කිහිපයක් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ඉල්ලුම්පත් ලබාදීමේ දී එක් එක් දේපළ සඳහා වෙන වෙනම ප්‍රසම්පාදන ඉල්ලුම්පත්‍ර ඉල්ලුම් කිරීමට වගබලා ගත යුතුය.

09. ප්‍රසම්පාදන ලංසු විවෘත කිරීම පත්කරන ලද ප්‍රසම්පාදන මණ්ඩලයක් ඉදිරිපිට වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී සිදු කරනු ලබන අතර, මෙම අවස්ථාවට ඉල්ලුම්කරුට හෝ ඔහුගේ ලිඛිත බලයලත් නියෝජිතයෙකුට පැමිණීමට අවසර දෙනු ලැබේ.

10. ප්‍රසම්පාදන කමිටුව විසින් පිළිගනු ලබන ප්‍රසම්පාදන ලංසුකරුවන් වෙත ඒ බව දැනුම්දීම ලිඛිතව සිදු කරනු ලබන අතර, එකී ලිපියේ දින සිට දින 14 ක් ඇතුළත නියම කරනු ලබන ගිවිසුම් ඇප තැන්පතුව හා ඊට අදළ මුද්දර ගාස්තු ගෙවීමෙන් අනතුරුව බදු ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. නියම කරනු ලබන දින හෝ එදිනට පෙර ගිවිසුම් ඇප තැන්පතු හා ඊට අදළ මුද්දර ගාස්තු ගෙවා ගිවිසුම් අත්සන් කිරීමට අපොහොසත් වන ප්‍රසම්පාදන ලංසුකරුවන් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඔවුන්ගේ ප්‍රසම්පාදන ඇප තැන්පතුව ආපසු නොගෙවන අතර,එම මුදල් සභාව සතු කරනු ලැබේ. තවද ඔවුන්ගේ නම් අසාධු ලේඛන ගත කිරීමට ද කටයුතු කරනු ලැබේ.

11. ප්‍රසම්පාදන ඉල්ලුම්පත්‍ර ලබාගෙන ප්‍රසම්පාදන ලංසු ඉදිරිපත් නොකරන අයගේ ප්‍රසම්පාදන ඇප තැන්පත් ආපසු නොගෙවනු ලබන අතර, එම ඇප තැන්පතු ද සභාව සතු කරනු ලැබේ. තවද ඔවුන්ගේ නම් අසාධු ලේඛන ගත කරනු ලැබේ.

12. ඒ ඒ දේපළ බදු දීම සම්බන්ධයෙන් පිළිගත් ප්‍රසම්පාදන ලංසුකරුවන් ගිවිසුම් ඇප තැන්පත් ගෙවා ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු ඒ ඒ ප්‍රසම්පාදනයට අදළ අනෙකුත් ප්‍රසම්පාදන ලංසුකරුවන්ගේ ප්‍රසම්පාදන ඇප තැන්පතු ආපසු ගෙවීමට කටයුතු කරනු ලැබේ. ඒ සඳහා ඔවුන් විසින් අදළ ලදුපත සමග සභා ලේකම් වෙතින් ඉල්ලීම් කළ යුතුය.

13. එක් වර්ෂයක් සඳහා බදු දෙන ඉහත සඳහන් දේපළ සඳහා පිළිගත් ප්‍රසම්පාදන ලංසුකරු මාසික වාරික තුනකට සමාන ගාස්තු එකවර තැන්පත් කළ යුතුය.

14. ප්‍රසම්පාදන ලංසු පිළිබඳව අවසන් තීරණ ගැනීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපතිවරයා සතුය.

15. සිංහල හා දෙමළ භාෂාවලින් ප්‍රසිද්ධ කරන ලද මෙම ප්‍රසම්පාදන දැන්වීම්වල පරිවර්තන ගැටලුවල දී සිංහල දැන්වීමේ වගන්ති බල පැවැත්වේ.

I. ප්‍රසම්පාදන ඉල්ලුම්පත් නිකුත් කිරීම - 2020-10-15 දින සිට 2020-10-29 දින පෙ.ව. 10.00 දක්වා කාර්යාල වේලාව තුළ පමණක් නිකුත් කරනු ලැබේ.

II. ප්‍රසම්පාදන ඉල්ලුම්පත් භාරගැනීම - 2020-10-15 දින සිට 2020-10-29 දින ප.ව. 1.00 දක්වා පමණි.

III. ප්‍රසම්පාදන ඉල්ලුම්පත් විවෘත කිරීම - 2020-10-29 දින ප.ව. 1.00 ට වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී සිදුකරනු ලැබේ.

උපලේඛන අංක 01

2021 වර්ෂය සඳහා බදු දෙන දේපළ

අනු අංකය	දේපළ විස්තරය	ප්‍රසම්පාදන ඇප තැන්පත් මුදල රු. ශත	පෝරම ගාස්තුව රු. ශත	අවම ලංසුව රු. ශත
01	ඌව කුඩාඔය සතිපොළ	30,000.00	750.00	700,000.00
02	ඇතිලිවැව හා වෙහෙරයාය සතිපොළ	40,000.00	750.00	800,000.00
03	බලහරුව සතිපොළ	1200.00	750.00	20,000.00
04	වැල්ලවාය කරදිය මිරිදිය මාළු කඩය	30,000.00	750.00	700,000.00

2020-10-15 දින
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.
දුරකථන අංකය : 055-2274875

ආර්. කී. හරමානිස්
සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
මහාමාර්ග අමාත්‍යාංශය
මාර්ග සංවර්ධන අධිකාරිය

කොම්පඤ්ඤ විදියේ ගුවන් පාලම් දෙකක් සැලසුම් කිරීම හා ඉදිකිරීම සඳහා ලංසු කැඳවීම.

(තනි අදියර - ලිපි කවර 2යි)

ශ්‍රී ලංකා රජය යටතේ අරමුදල් සපයනු ලැබේ. (GOSL)

1.) මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, පාලම් ක්ෂේත්‍රයේ පහත දැක්වෙන කොන්ත්‍රාත් සඳහා ඉදිකිරීම් සාර්ථාන්න සංවර්ධන අධිකාරියේ C1, CS1, CS2 හා ශ්‍රේණි යටතේ ලියාපදිංචි දේශීය කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලබයි.

2.)

අංක.	වැඩ විස්තරය	සුදුසුකම් මිනුම් දණ්ඩ	ලංසු ආරක්ෂණ මුදල (රු.)
1.	කොම්පඤ්ඤ විදිය විතිසුරු අත්මාවු මාවත හා උත්තරානන්ද මාවතේ දුම්රිය පාරට ඉහළින් ගුවන් පාලම් දෙකක් සැලසුම් කිරීම හා ඉදි කිරීම. **කොන්ත්‍රාත් අංකය : RDA/MFAP/GOSL/SI/FO/01** අ. පාලම් පාදම් හා උප ව්‍යුහය ඉදි කිරීම. ආ. වානේ වළින් සමන්විත උපරි ව්‍යුහය ඉදි කිරීම. ඇ. ග්‍රහණික ප්‍රවේශමාර්ග, සැපයුම් මාර්ග ඉදිකිරීම්, මංසන්ධිය වැඩිදියුණු කිරීම, මාර්ග සංඥා එළි එළි ආලෝකදීප්ත සවිකිරීම හා අනෙකුත් මාර්ග උපාංග සවිකිරීම. **කොන්ත්‍රාත් කාලය දින 365 යි.**	CIDA ලියාපදිංචිය C1, CS1, CS2 යෝග්‍යතාව මූල්‍ය ධාරිතාව හා පසුපුරුද්ද ලංසු ලේඛනයේ සඳහන් පරිදි විය යුතුය.	ලංසු ලේඛනයේ සඳහන් පරිදි
2.	කොම්පඤ්ඤ විදිය මෙමරි වැව හා බාල දක්ෂ මාවත හා විජේසුන්දරලම් ඒ. ගාඩිනර් මාවත සම්බන්ධකර දුම්රිය පාරට ඉහළින් ගුවන් පාලම් සැලසුම් කිරීම හා ඉදිකිරීම. **කොන්ත්‍රාත් අංකය : RDA/MFAP/GOSL/SI/FO/02** අ. පාලම් පාදම හා උප ව්‍යුහය ඉදි කිරීම. ආ. කොන්ක්‍රීට්, වානේ, වානේ අන්තර්ගත උපරි ව්‍යුහය ඉදි කිරීම. ඇ. ග්‍රහණික ප්‍රවේශ මාර්ග, සැපයුම් මාර්ග ඉදි කිරීම, මංසන්ධිය වැඩි දියුණු කිරීම, මාර්ග සංඥා එළි සවිකිරීම, වීදි ආලෝකදීප්ත සවිකිරීම සහ අනෙකුත් මාර්ග උපාංග සවිකිරීම. **කොන්ත්‍රාත් කාලය දින 365 යි.**	CIDA ලියාපදිංචිය C1, CS1, CS2 යෝග්‍යතාව මූල්‍ය ධාරිතාව හා පසුපුරුද්ද ලංසු ලේඛනයේ සඳහන් පරිදි විය යුතුය.	ලංසු ලේඛනයේ සඳහන් පරිදි

3. මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත දේශීය කොන්ත්‍රාත්කරුවන්ට මාර්ග සංවර්ධන අධිකාරියේ විභාගපති අධ්‍යක්ෂ, විවිධ විෂය ආධාර විභාගය, 12 වන මහල, "C" කොටස, සෙත්සිරිපාය දෙවැනි අදියර, බත්තරමුල්ල, ශ්‍රී ලංකා, දූ.ක : 0112187062/63 විද්‍යුත් තැපෑල mfapeng@yahoo.com මඟින් 9.00 පෙය සිට 15.00 පෙය දක්වා කාර්යාල වැඩ පිණ සතුවී වැඩිදුර විස්තර ලබාගත හැකිය.

4. ලංසු ලේඛණ ඉංග්‍රීසි භාෂාවෙන් වන අතර 2020 ඔක්තෝම්බර් 15 දින සිට 2020 නොවැම්බර් 4 දින දක්වා 9.00 පෙය සිට 15.00 පෙය දක්වා කාර්යාල දිනවලදී ගාස්තුවකින් තොරව ලංසු ලේඛණ පරීක්ෂා කළ හැක. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ආපසු නොගෙවනු ලබන රුපියල් ඉස්සෙන (රු.100,000.00) ගාස්තුවක් සමඟ ඉල්ලීම අයදුම්පතක් බත්තරමුල්ල, සෙත්සිරිපාය දෙවන අදියරේ, 12 වන මහල, "C" කොටසේ පිහිටි විවිධ විෂය ආධාර විභාගයේ අංශයේ විභාගපති අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසු ලේඛණ මිලදී ගත හැක. අදාල ගාස්තුව "ලේකම් මහාමාර්ග අමාත්‍යාංශය" යන නමින් ලියන ලදු බැංකු අණකරයක් මඟින් කෙවිය යුතුය.

5. ලංසු යෝජනා 2020 නොවැම්බර් 13 වැනි දින 14.00 පෙයට හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, ස්ථාවර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව වෙත, සහකාර ලේකම් බාරේ, මහාමාර්ග අමාත්‍යාංශය, 8 වන මහල, "මහ නැගුම මහ මැදුර", අංක.216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට යොමු කළ යුතුය.

6. ලංසු යෝජනා 2020 නොවැම්බර් 13 වන දින 14.00 පෙයට හෝ ඊට පෙර ප්‍රසම්පාදන අංශය, තන්වන, මහල මහාමාර්ග අමාත්‍යාංශය, "මහ නැගුම මහ මැදුර", අංක. 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට භාර දිය යුතුය. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර කැබීම අවසන් වූ විගාම ලංසුකරුවන්ගේ හිතෝපිතයන් ඉදිරියේ එකී ලංසු විවෘත කරනු ලැබේ.

7. පූර්ව ලංසු යෝජනා සාකච්ඡාව 2020 ඔක්තෝම්බර් මස 28 වන දින 10.00 පෙයට බත්තරමුල්ල, සෙත්සිරිපාය දෙවන අදියරේ, 12 වන මහල, "C" කොටසේ පිහිටි විවිධ විෂය ආධාර විභාගයේ විභාගපති අංශයේ විභාගපති අධ්‍යක්ෂ කාර්යාලයේදී පැවැත්වේ.

සභාපති,
ස්ථාවර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව
මහාමාර්ග අමාත්‍යාංශය

මහජන බැංකුව

බේරා නොගත් උකස් භාණ්ඩ වෙන්දේසිය

මහජන බැංකුවේ 2019.03.31 දින දක්වා උකස් තබා ශාඛා හා සේවා මධ්‍යස්ථාන වලදී බේරා නොගත් රන් භාණ්ඩ පහත සඳහන් දිනයන්හි මහජන වෙන්දේසියේ අලෙවි කරනු ඇත. වෙන්දේසිය පෙ.ව. 9.00 සිට පහත සඳහන් දිනයන් හා ස්ථානයන් හිදී පවත්වනු ලබන බව මෙයින් දන්වමු.

ශාඛාව		පහත දිනට බේරා නොගත්	වෙන්දේසි දිනය සහ ස්ථානය
හැටන් ගිතිගත්හේන මස්කෙළිය බගවන්තලාව තලවකැලේ පුඩුඔමය ශාඛාව	දික්ඔය කොටගල වටවල අප්කොට් ආගරපතන තවලන්තැන්න හපුගස්තලාව	2020.10.25	2020.10.26 හැටන් ශාඛාව
හඟුරන්කෙත රිකිල්ලගස්කඩ නිල්දණ්ඩාහින්න	හේවාහැට පදියපැලැල්ල අධිකාරිගම වලපනේ	2020.10.26	2020.10.27 හඟුරන්කෙත ශාඛාව
රාගල උඩපුස්සැල්ලාව නුවරඑළිය	රාගල උඩපුස්සැල්ලාව කඳපොල නානුඔය	2020.10.27	2020.10.28 රාගල ශාඛාව

ඉහත සඳහන් පරිදි දිනයන් හා කාල වකවානු ප්‍රසිද්ධ කර තිබුණද, බැංකුවේ අභිමතය පරිදි වෙනත් දැනුම් දීමකින් තොරව වෙන්දේසි අවලංගු කිරීම, ඒකාබද්ධ කිරීම හෝ කල් දැමීමේ අයිතිය මහජන බැංකුව සතුය.

ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නුවරඑළිය.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

ලංසු ආරාධනය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා ආරක්ෂක සේවා සැපයීම

කොන්ත්‍රාත් අංකය : DIE/PRO/08/2020/27

01. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත කාර්යාල සඳහා ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් යෝග්‍යතාපූර්ණ සැපයුම්කරුවන්ගෙන් හා පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි ආයතනයකින් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ.

02.

01.	ප්‍රධාන කාර්යාලය, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල
02	ත්‍රිකුණාමලය වරායේ නිලධාරී විවේකාගාරය
03	කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපොළ නිලධාරී විවේකාගාරය
04	හම්බන්තොට වරාය නිලධාරී විවේකාගාරය
05	මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විවේකාගාරය
06	මහනුවර ප්‍රාදේශීය කාර්යාලය
07	වව්නියාව ප්‍රාදේශීය කාර්යාලය
08	කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය
09	මාතර ප්‍රාදේශීය කාර්යාලය
10	මිරිහාන රැඳවුම් කඳවුර
11	යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ විවේකාගාරය

03. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය යටතේ පැවැත්වේ.

04. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර බත්තරමුල්ල ශ්‍රී සුභූතිපුර පාරේ පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 5 වන මහලේ "බී" පර්යන්තයේ ප්‍රසම්පාදන අංශයේ සහකාර පාලක (ප්‍රසම්පාදන) වෙතින් ලබාගත හැකි අතර, එම ලිපිනයේදීම ලංසු ලිපිලේඛන පරීක්ෂාව ඕනෑම වැඩ කරන දිනයකදී පෙ.ව. 9.00 සිට පස්වරු 3.00 දක්වා සිදු කළ හැක.

ඇමතුම් අංක : දුරකථන : 011-5329530 / 011-5329535 ෆැක්ස් අංක : 011-2885358

05. රුපියල් පන්දහස් පන්සීයක (රු. 5,500.00) ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් සහකාර පාලක (ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන අංශය, B පර්යන්තය, 5 වෙනි මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, **"සුහුරුපාය"**, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙත ඉදිරිපත් කිරීමෙන් පසු **2020.10.15 දින සිට 2020.11.06** දක්වා කාල පරිච්ඡේදයේ දී **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා මුද්‍රිත සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

06. සම්පූර්ණ කරන ලද ලංසු, **"මුල්පිටපත"** (Original) හා **"අනුපිටපත"** (Duplicate) ලෙස පිටපත් 2කින් යුතුව සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන අංශය, B පර්යන්තය, 5 වන මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, **සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** යන ලිපිනයට **2020.11.06** වැනි දින **ප.ව. 2.00** ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම සිදු කළ හැක. ලංසු කැඳවීම අවසන් වූ වහාම ඉහත දක්වා ඇති ලිපිනයේ දී පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගන්නා අතර, එම ලංසු විවෘත නොකර ආපසු භාරදීම සිදු කරනු ලැබේ.

07. ලංසුකරු විසින් භාරදෙනු ලබන ලංසුව ලංසු භාරගන්නා අවසාන දින සිට දින 105 කාල සීමාවකට හෝ ඕනෑම දිගුකරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගු භාවයෙන් යුක්ත විය යුතුය.

08. සියලුම ලංසු, ලංසු ලේඛනයේ 3.4 හි දක්වා ඇති ආකෘතියේ පරිදි ලංසු සුරක්ෂණයක් සමග ආගමන හා විගමන පාලක ජනරාල් වෙත (ලිපිනයට) එවිය යුතු අතර ලංසු සුරක්ෂණය රුපියල් 400,000.00 ක වටිනාකමකින් යුතු 2021.02.22 දින තෙක් වලංගු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද්දක් විය යුතුය.

09. පූර්ව ලංසු රැස්වීම 2020.10.29 වැනි දින ප.ව. 2.00 ට **"සුහුරුපායෙහි"** 5 වන මහලෙහි A පර්යන්තයේ පිහිටි ආගමන හා විගමන පාලක ජනරාල් කාර්යාලයේදී පැවැත්වේ.

යූ. වී. සරත් රූපසිරි,
ආගමන හා විගමන පාලක ජනරාල්,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගීශාලාව

CTOT හි පාටිෂන් කිරීම හා මලනොබැඳෙන වානේ දොර සපයා සවිකිරීම සඳහා ලංසු කැඳවීමයි

කොන්ත්‍රාත් අංකය : Q691/20

01. ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගීශාලාවේ, අධ්‍යක්ෂක වෙනුවෙන්, ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගීශාලාවේ, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් (බදු රහිතව හා අවිනිශ්චිත හා හදිසි වියදම් හැර) රුපියල් මිලියන 3.8 කට පිරිවැය ඇස්තමේන්තුගත කර ඇති හා පහත විස්තර දක්වා ඇති පරිදි වන ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගීශාලාවේ, CTOT හි පාටිෂන් කිරීම් හා මල නොබැඳෙන වානේ දෙර සැපයීම හා සවිකිරීම සඳහා ඔබ වෙතින් හෝ තෝරාගනු ලබන වෙනත් ලංසුකරුවන් වෙතින් මුදු, තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

වැඩබිම ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගීශාලාවේ පරිශ්‍රයේ පිහිටා ඇති අතර, ඉටුකිරීමට ඇති ප්‍රධාන කාර්ය කර්මාන්ත අතරට, "CTOT හි පාටිෂන් කිරීම් හා මල නොබැඳෙන වානේ දෙර සපයා, සවිකිරීම සඳහා ප්‍රමාණපත්‍ර (BOQ) හි විස්තර දක්වා ඇති පරිදි, 'පිත්තාරු වැඩ, පාටිෂන් කිරීම්, මල නොබැඳෙන වානේ දෙරවල් සැපයීම හා සවිකිරීම කඩා බිඳ හෙළා ඉවත් කිරීම' අන්තර්ගතය. කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය දින 91 ක් දක්වා වනු ඇත.

02. ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ (NCB) ක්‍රියා පටිපාටිය යටතේ මෙහෙය වනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා යෝග්‍ය වීමට (සුදුසුකම් ලැබීමට) සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු වන අතර, පහත සඳහන් අවශ්‍යතාද සපුරාලිය යුතුය.

අවශ්‍ය සමාගමේ ලියාපදිංචිය :

විශේෂඥතාව : **ගොඩනැගිලි ඉදිකිරීම්**

ශ්‍රේණිය : C8 හෝ ඉහළ

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය වන සුදුසුකම් අවශ්‍යතා අතරට, පහත කරුණුද අන්තර්ගතය.

තාක්ෂණික :

අධ්‍යක්ෂණ (සිවිල්) - NCT හෝ සමාන සුදුසුකම් සමග සමාන ස්වභාවයේ වැඩ හා කාර්ය පිළිබඳ වසර තුනක (03) ක ක්ෂේත්‍ර පළපුරුද්ද.

05. අභිලාෂී ලංසුකරුවන් හට, වැඩිදුර තොරතුරු විස්තර දුරකථන අංක 0112-778624 මඟින් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගීශාලාවේ, අධ්‍යක්ෂක වෙතින් විමසා ලබා ගත හැකි වන අතර, ලංසු ලිපි ලේඛන **ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගීශාලාවේ සැපයුම් කාර්යාලයේදී පැය 09.00 සිට පැය 15.00 දක්වා** අතරතුරු පරීක්ෂාකර බැලිය හැකිය.

06. අභිලාෂී ලංසුකරුවන්වන ඔබ හට, අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන, කට්ටලයක් (ඉංග්‍රීසි භාෂාවෙන් වන), ආපසු ගෙවනු නොලබන, **රුපියල් 3,000.00 ක් වන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, 2020-10-15 වන දින සිට 2020-11-04 වන දින දක්වා පැය 09.00 සිට පැය 15.00 දක්වා අතරතුර ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගීශාලාවේ අධ්‍යක්ෂක වෙත** ලිඛිත අයදුම්පතක් ද ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මිලදී ගත හැකිය.

07. අනු පිටපතකින් යුක්තව සම්පූර්ණ කරන ලද ලංසු (පිටපත් 2), **2020-11-05 වන දින පැය 10.00 ට හෝ ඊට පෙර** ලැබෙනසේ පහත දක්වෙන ලිපිනයට ලියාපදිංචි කළ (ලේඛන ගත කළ) තැපැලෙන් හාරදීම හෝ අතින් ගෙනැවිත් භාර දීම හෝ කළ යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේදී ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගීශාලාවේ දේශන ශාලාවේදී විවෘත කරනු ලැබේ.

08. සියලුම ලංසු සමග, **රුපියල් 55,000.00 ක් වන (රුපියල් පනස් පන් දහසක් වන වටිනාකමින් යුත්, ලංසු සුරක්ෂණ ඇපකරයක්ද** ඉදිරිපත් කළ යුතුය. ලංසු **දින 91 ක්** දක්වා වලංගු විය යුතුය. ලංසු සුරක්ෂණ ඇපකරය ලංසු භාරගන්නා අවසාන දින සිට **දින 119ක්** දක්වා වලංගු විය යුතුය.

අධ්‍යක්ෂක,
ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගීශාලාව,
තලපත්පිටිය, නුගේගොඩ.

දෙහිවල ප්‍රෙස්බිටීරියන් බාලිකා ආපන ශාලාව

ටෙන්ඩර් අයදුම්පත් 2020-10-15 සිට 2020-10-30 දක්වා 500/- ගෙවා විද්‍යාලයෙන් ලබා ගන්න.

විදුහල්පති - 0112-714494

දැන්වීමයි

සී/ස ඌවපරණගම උතුර වි.සේ.සේ. සමිතියට අයත් **ගොඩනැගිලි අංශයේ හා සිල්ලර අංශයේ භාණ්ඩ** 2020.11.27 දින පෙ.ව. 9.00 ට ප්‍රධාන ශාලාව ඉදිරිපිටදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඇමතීම : 0572232735, 0755900625

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වන වගන්තිය යටතේ දැන්වීම

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : **DSO/HOM/LAC/86**

ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/6/2013/එච්ඩබ්/ 161 (එච්)

මහජන කටයුත්තක් සඳහා පහත උපලේඛනයේ විස්තර කරන ඉඩම/ඉඩම් රජයට අත්කර ගැනීමට අදහස් කර ඇත. ඊට අදාළව පැවැත්වීමට නියමිත 9 වන වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණ සම්බන්ධයෙන් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7වන වගන්තිය යටතේ දැන්වීමක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2028/7 සහ 2017/07/17 දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත. වැඩි විස්තර සඳහා එම ගැසට් පත්‍රය බලන්න.

උපලේඛනය

පළාත	:	බස්නාහිර
දිස්ත්‍රික්කය	:	කොළඹ
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	:	හෝමාගම
ග්‍රාම නිලධාරී කොට්ඨාසය	:	486/ඒ, හෝමාගම නගරය,
ගම	:	හෝමාගම
කැඩැස්තර සිතියම් අංක	:	520001-21-31 (388 සිට 457 දක්වා) - හෙක්. 0.1282
කැබලි අංක සහ ප්‍රමාණය	:	520001-24-13(310 සිට 372 දක්වා) - හෙක්. 0.1053 520001-27-11(143 සිට 163 දක්වා)- හෙක්. 0.0678 520001-29-06(102 සිට 109 දක්වා) - හෙක්.0.0195 520001-31-13 (234 සිට 343 දක්වා) - හෙක්. 0.3215 520001-28-13 (314 සිට 386 දක්වා) - හෙක්. 0.1125 520001-32-03 (20 සිට 29 දක්වා) - හෙක්. 0.0732 520001-25-15 (293 සිට 318 දක්වා) - හෙක්. 0.0633 520001-30-23 (434 සිට 489 දක්වා) හෙක්. 0.1801 520001-22-21 (336 සිට 344 දක්වා) - හෙක්. 0.0303

බුද්ධි තරංගා කරුණාසේන
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

ලංසු සඳහා ආරාධනයයි

ජාතික ලොතරැයි මණ්ඩලය

මුදල් අමාත්‍යාංශය

ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් කුලියට / බද්දට ලබාගැනීම සඳහා වන ප්‍රසම්පාදනය

ජාතික ලොතරැයි මණ්ඩලය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් කුලියට / බද්දට ලබා ගැනීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුදු, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

1. ලංසුව සඳහා සුදුසුකම් ලැබීමට පහත අවම අවශ්‍යතාවන් සපුරාලිය යුතුය.
   - ✓ **ගොඩනැගිල්ල, අවම වශයෙන් වසර දෙකක (2) කාලයක් සඳහා බදු පදනම මත ලබා දිය යුතුය.**
   - ✓ ගොඩනැගිල්ලේ අයිතිකරු හෝ නිසි බලය පවරන ලද පුද්ගලයෙකු විසින් ඍජුව ලංසු ඉදිරිපත් කළ යුතුය. අතර මැදි පාර්ශ්වයන්ට ලංසු ඉදිරිපත් කිරීම සඳහා අවසර නොමැත.
   - ✓ ගොඩනැගිල්ල, කොළඹ මහා නගර සභා සීමාව තුළ ප්‍රධාන දුම්රිය ස්ථානයන්ට නුදුරුව පිහිටා තිබිය යුතුය.
   - ✓ භාවිතයට ගතහැකි බිම් ප්‍රමාණය (තරප්පු පෙළවල්, වැසිකිළි, බැල්කනි හා සෝපාන භාවිතය සඳහා වෙන් කර ඇති ප්‍රදේශය හැර) වර්ග අඩි 40,000 ට අඩු නොවිය යුතුය.
   - ✓ බර වාහන සඳහා (ලොරි රථ) ගොඩනැගිල්ල වෙත පහසුවෙන් ලගාවීමේ හැකියාවක් තිබිය යුතුය.
   - ✓ වාහන 35 ක් නැවැත්වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් වසර 2 ක කාලය තුළ පැවතිය යුතුය.
   - ✓ ගොඩනැගිල්ල අයිතිකරු විසින් වරිපනම් බදු ගෙවිය යුතුය.
   - ✓ ගිනි නිවීම් එකක / අංශ විසින් අනුමත කරන ලද සම්මත ගිනි නිවීම් පද්ධතියකින් ගොඩනැගිල්ල සමන්විය යුතුය.
   - ✓ ප්‍රධාන විදුලිබල සම්බන්ධතාවයට අමතරව අවම වශයෙන් 300KVA ක ධාරිතාවයෙන් යුත් විදුලි ජනක යන්ත්‍රයක් තිබිය යුතුය.
   - ✓ එක් විදුලි සෝපානයක අවම වශයෙන් මගීන් 10 දෙනෙකුට ගමන් කළ හැකි විදුලි සෝපාන දෙකක් තිබිය යුතුය.
   - ✓ සම්පූර්ණ කාර්යාල ප්‍රදේශ සඳහා වායුසමීකරණ පහසුකම් තිබිය යුතුය.
   - ✓ පුද්ගලයන් 400 කගේ දෛනික ජල අවශ්‍යතාවය සපුරාලීමට හැකි වන පරිදි භූගත ජල ටැංකියක් සහ ලීටර් 15,000 ක අවම ධාරිතාවයක් ගබඩාකර තැබිය හැකි ඉහලින් පිහිටි ජල ටැංකියක් තිබිය යුතුය.
   - ✓ ගොඩනැගිල්ල සඳහා රක්ෂණ ආවරණයක් තිබිය යුතුය. (උදා : ගිනි, ත්‍රස්තවාදී)
   - ✓ නියමිත අධිකාරීන් මගින් ගොඩනැගිල්ල සඳහා වන වැඩිනිමකිරීමේ සහතිකය (COC) ලබා තිබිය යුතුය.
2. ජාතික තරඟකාරී ලංසු ක්‍රමවේදය යටතේ ලංසු මෙහෙයවනු ලැබේ.
3. මේ සඳහා උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු හෝ පැහැදිළිකිරීම් කොළඹ 01, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවතේ අංක 32, ජාතික ලොතරැයි මණ්ඩලයේ, 1 වන මහලේ ප්‍රසම්පාදන අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් (දුරකථනය : 0114607020) ලබාගත හැකි අතර 2020-10-15 වෙනි දින සිට 2020-11-04 වැනි දින දක්වා ඕනෑම රාජකාරී දිනයක **පෙ.ව. 9.00 හා ප.ව. 3.00** අතර කාලය තුළ පහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂාකර බැලිය හැකිය.
4. ආපසු ගෙවනු නොලබන රු. 30,000.00 ක (VAT බදු ඇතුලුව) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2020-10-15 වෙනි දින සිට 2020-11-04 වෙනි දින දක්වා ඕනෑම රාජකාරී දිනයක **පෙ.ව. 09.00 හා ප.ව. 3.00** අතර කාලය තුළ පහත සඳහන් ලිපිනය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් සිදු කළ යුතුය.
5. මුදු, තබන ලද ලංසු, 2020-11-05 **වෙනි දින ප.ව. 2.30 ට පෙර ලැබෙන පරිදී පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ එම ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය.** ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 01, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවතේ, අංක 32, ජාතික ලොතරැයි මණ්ඩලයේ 5 වන මහලේ පරිපාලන අංශයේදී එම අවස්ථාවට පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. සියලුම ලංසු සමග රුපියල් විසි අට ලක්ෂ අසූ දහසක (රු. 2,880,000.00) වටිනාකමින් යුත් ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. ලංසු ඇපකරය 2021-03-02 වෙනි දින දක්වා වලංගුව පැවතිය යුතුය.
6. ලංසු, මුදු, තබන ලද කවරයක බහා, එහි වම් පස ඉහළ කෙළවරේ **"ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් කුලියට / බද්දට ලබා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු අතර සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, ජාතික ලොතරැයි මණ්ඩලය, අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවත, කොළඹ 01 යන ලිපිනය සඳහන් කළ යුතුය.
7. පූර්ව ලංසු රැස්වීමක් 2020-10-28 වෙනි දින පෙ.ව. 10.00 ට කොළඹ 01, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවතේ, අංක 32, ජාතික ලොතරැයි මණ්ඩලයේ දී පැවැත්වේ.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ජාතික ලොතරැයි මණ්ඩලය,
අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
2020-10-15

www.adz.lk
it's what you want

wadz.lk

it's what you want

සීමාසහිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියට අනුකූලව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බවට දැනුම් දීමයි.

සමාගමේ නම :
ඩී.වී. සිලෝන් හෝල්ඩින් (පිවිටි) එල්ටිඩ්
ලියාපදිංචි අංකය : පී.වී. 00222930
සංස්ථාපිත දිනය : 2020 ජූනි 15
ලියාපදිංචි කාර්යාලය :
අංක. 8/12, වැව පාර,
පතිරගොඩ, මහරගම.

සමාගම් ලේකම්.

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කුලීගොඩ, අඳුරන්ගොඩ, අංක 349/බී දරන ස්ථානයේ පදිංචි මුතුවාහන්දි උෂාන්ත කුමාර සහ පමුණුගම, සෙත්තප්පාඩුව, අංක 96/3 දරන ස්ථානයේ පදිංචි අදිකාරි මුදියන්සේලාගේ නලීනා ජානි ප්‍රසිඩා ප්‍රනාන්දු වන අප විසින් කුලීගොඩ, අඳුරන්ගොඩ, අංක 349/බී දරන ස්ථානයේ පදිංචි මුතුවාහන්දි තුෂාන්ත කුමාර වෙත ප්‍රදානය කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් ටී.පී. ගෝතමී මහත්මිය විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2020.01.16 වන දිනැති අංක 2602 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. මෙදින සිට ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවකට සහ පියවර වලට අප වගකියනු නොලැබේ.

මුතුවාහන්දි උෂාන්ත කුමාර සහ
අදිකාරි මුදියන්සේලාගේ නලීනා ජානි ප්‍රසිඩා ප්‍රනාන්දු
2020 ක්වූ ඔක්තෝබර් මස 12 වන දින දීය.

වරකාපොල ප්‍රාදේශීය සභාව

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021 වර්ෂය

2021 වර්ෂයට පහත සඳහන් ලිපිද්‍රව්‍ය, භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා 2020/11/27 දිනට පෙර සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට අයදුම්පත් භාරගනු ලැබේ.

02. අදාළ අයදුම්පත් තමන් විසින්ම සකස්කර ගත යුතු අතර, අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2021 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම" යනුවෙන් සඳහන් කර තිබිය යුතුයි. සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් භාරදිය යුතුයි. ලියාපදිංචි කිරීම සඳහා එක් එක් කාරණය වෙනුවෙන් රු. 1500.00 ක මුදලක් "සභාපති, ප්‍රාදේශීය සභාව, වරකාපොල" යන ලිපිනයට ලැබීමට සලස්වන මෙන් දන්වා සිටිමි.

A-**භාණ්ඩ සැපයීම**

අයිතම අංකය	සැපයීම	ලියාපදිංචි ගාස්තුව (රු.)
A 01	සියලුම වර්ගයේ ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	1,500.00
A 02	සතිපාරක්ෂක උපකරණ (හිස් ආවරණ, මුඛ ආවරණ, අත් ආවරණ, ගම්බූට්ස් සබත්, සේදීම් දියර වර්ග, ආදී) හා විෂබීජ නාශක ද්‍රව්‍ය	1,500.00
A 03	යතුරු ලියන, රෝතියෝ යන්ත්‍ර, පරිගණක, ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර ඩුප්ලෝ යන්ත්‍ර, චෙක්පත් මුද්‍රණ යන්ත්‍ර සැපයීම, වායු සම්කරණ යන්ත්‍ර හා අමතර කොටස් සැපයීම	1,500.00
A 04	කාර්යාලීය ලී බඩු හා උපකරණ (යකඩ, දැව, වානේ, ප්ලාස්ටික් ආදී)	1,500.00
A 05	වැලි, කළුගල්, ගඩොල්, කුට්ටිගල්, බ්ලොක් ගල් ආදී ගොඩනැගිලි ද්‍රව්‍ය	1,500.00
A 06	සිමෙන්ති	1,500.00
A 07	හියුම් පයිප්ප හා සිමෙන්ති නිෂ්පාදන	1,500.00
A 08	තාර හා කෝලාස්	1,500.00
A 09	වාහන තහඩු, වාහන අමතර කොටස්, ටයර්, ටියුබ්, කාපට් ආදී වාහන අමතර කොටස්	1,500.00
A 10	නාමපුවරු, දැන්වීම් පුවරු, බැනර් ඇඳීම හා සැකසීම	1,500.00
A 11	විථිපහන්, වෙනත් බල්බ් වර්ග හා විදුලි උපකරණ	1,500.00
A 12	තිල ඇඳුම් රෙදි, වෙනත් රෙදි, වැහිකබා, පාවහන් හා කාර්යාලීය හම්බෑග්	1,500.00
A 13	ඉඩම් මැනුම් කටයුතු	1,500.00
A 14	මුද්‍රණ කටයුතු	1,500.00

B- **සේවාවන්**

B 01	වාහන සර්විස් කිරීම	1,500.00
B 02	පහත සඳහන් උපකරණ අලුත් වැඩියාව යතුරු ලියන ඡායාපිටපත් යන්ත්‍ර රෝතියෝ යන්ත්‍ර පරිගණක යන්ත්‍ර ෆැක්ස් යන්ත්‍ර ඩුප්ලෝ යන්ත්‍ර මුද්‍රණ යන්ත්‍ර වායු සම්කරණ යන්ත්‍ර	1,500.00
B 03	ටයර් තැවත පිරවීම	1,500.00
B 04	වාහන සැපයීම	1,500.00
B 05	වාහන අළුත්වැඩියාව	1,500.00
B 06	සියලු උපදේශක සේවා	1,500.00
B 07	සැලසුම් සේවා (ඉදිකිරීම් හා නිර්මාණ)	1,500.00
B 08	ඉංජිනේරු සේවා නීතිඥ සේවා, මිනින්දෝරු සේවා, තාක්ෂණික සේවා ආදී සේවා සැපයීම	1,500.00
B 09	පුස්තකාල පොත් සැපයීම	1,500.00
B 10	පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් සැපයීම (වඩු කාර්මික, පෙදරේරු, කාර්මික)	1,500.00
B 11	කම්කරු ආවුද හා උපකරණ (උදැළු, රේක්ක, විල්බැරෝ හා වෙනත්)	1,500.00
B 12	ජල නළ හා ජල සම්පාදන උපකරණ (ජල මෝටර්, ජල මීටර් ආදී)	1,500.00
B 13	ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපාංග (තිත්ත, වානේ, යකඩ, යකඩ උපකරණ, විදුලි උපකරණ ආදී)	1,500.00
B 14	පෙරපාසල් උපකරණ (ක්‍රීඩාභාණ්ඩ ඇතුළු)	1,500.00
B 15	පරිගණක මෘදුකාංග සේවා සැපයීම	1,500.00
B 16	පරිගණක උපදේශනාත්මක සේවාවන්	1,500.00
B 17	ආහාර සැපයීම (අවශ්‍ය අවස්ථාවන් හිදී පමණක්)	

කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය

අනු අංකය	ගාස්තු සීමා	ලියාපදිංචි ගාස්තුව (රු.)
01	රු. 100,000.00 දක්වා	500.00
02	රු. 100,001.00 සිට 500,000.00 දක්වා	1,000.00
03	රු. 500,001.00 සිට 1,000,000.00 දක්වා	1,500.00
04	රු. 1,000,001.00 ට වැඩි	2,000.00

පොදු කොන්දේසි හා නිර්ණායක

01. හදිසි සේවා අවශ්‍යතාවය මත සභාවේ අභිමතය පරිදි ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් පරිබාහිරව භාණ්ඩ මිලදී ගැනීමට සභාවට අයිතියක් ඇත.

02. මිල ගණන් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවීම හා එහි නියමයන් පිළිගැනීම.

03. සියලුම සැපයුම් සඳහා **අවම වශයෙන් දින 60 ක කාල සීමාවකට** සභාව වෙත ණය පහසුකම් ලබාදිය යුතුය.

04. සියලුම සැපයුම්කරුවන් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්, සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික ලියාපදිංචි වන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය.

05. අවශ්‍යතාවය නිසි පරිදි දැන් වූ පසු මිල ගණන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඇණවුම් කිරීමෙන් පසු නියම කරන කාලය තුලදී සැපයීමට අපොහොසත් වන හෝ සිය සැපයුම් අදළ පිරිවිතර හා නියදිවලට අනුකූල නොවන විට අදළ සැපයුම්කරුවන් අසාදුලේඛන ගත කරනු ලැබේ.

06. මෙහි සඳහන් නොවන කොන්දේසි පැනවීමට හා මිල ගණන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය සභාව සතු වන අතර, වරකාපොල ප්‍රාදේශීය සභාවේ තීරණය අවසාන තීරණය වේ.

07. වැඩි විස්තර සඳහා විමසන්න. 035-2267275

එන්. සරත් සුමනසූරිය, සභාපති,
ප්‍රාදේශීය සභාව, වරකාපොල

2020/10/08

මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

GIRTI

වාහන විකිණීම සඳහා
ටෙන්ඩර් කැඳවීම

අංක. 73/5 ඒ, රුවන් සෙවන, වැලිවිට, කඩුවෙල හි පිහිටි මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයට අයත් භාවිතයෙන් ඉවත් කර ඇති පහත අංක දරණ වාහනය විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

මයික්‍රෝ කැබ් රථය SG PB-7848

ටෙන්ඩර් කැඳවීමට උපදෙස් -

01 වාහනය පරීක්ෂා කිරීම සඳහා 2020.10.15 දින සිට 2020.10.27 දින දක්වා සෑම සතියේ දිනකම පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා කාර්යාල පරිශ්‍ර භූමියේදී ඉඩකඩ සලසා ඇත.

02 ටෙන්ඩර්කරුවන් විසින් මෙම වාහනය සඳහා ආපසු නොගෙවෙන රු. 1000/- ක මුදලක් අංක. 73/5 ඒ, රුවන් සෙවන, වැලිවිට, කඩුවෙල හි පිහිටි මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ ගිණුම් අංශයේ සරප් වෙත මුදලින් ගෙවා ටෙන්ඩර් ඉල්ලුම්පතක් ලබා ගත යුතු අතර ආපසු ගෙවන ලබන රුපියල් 10,000/- ක ඇප තැන්පතුවක් ද ගෙවා ලබා ගන්නා කුවිතාන්සියේ ඡායා පිටපතක් ටෙන්ඩර් පත්‍රිකාව සමග ඉදිරිපත් කල යුතුය. (ටෙන්ඩර් පනු මිලදී ගැනීම හා ඇප තැන්පත් කිරීම 2020.10.27 දින ප.ව. 3.00 ට අවසන් වේ.)

03 ටෙන්ඩර් බාර ගැනීම 2020.10.28 දින පෙ.ව.10.00ට අවසන් වන අතර එදින පෙ.ව.10.00ට ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන් ඉදිරියේ ආයතනයේ ටෙන්ඩර් විවෘත කිරීමේ මණ්ඩලය විසින් ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ.

04 වැඩිදුර විස්තර ටෙන්ඩර් පත්‍රිකාවෙහි සඳහන් වන අතර ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීමේ හෝ පිළිනොගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුවන අතර ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

අධ්‍යක්ෂ ජනරාල්
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය
අංක. 73/5 ඒ, රුවන් සෙවන, වැලිවිට, කඩුවෙල
011-2579188? /011-4324679

බලපිටිය ප්‍රාදේශීය සභාව

ප්‍රසම්පාදන දැන්වීම

වායු සම්කරණ යන්ත්‍ර සපයා සවිකිරීම

බලපිටිය ප්‍රාදේශීය සභාවට වායු සම්කරණ යන්ත්‍ර සපයා සවිකිරීම වෙනුවෙන් සුදුසුකම්ලත් සැපයුම්කරුවන් හා නිෂ්පාදන ආයතන වෙතින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. සියලුම මිල ගණන් බලපිටිය ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය වෙත මුදල් ගෙවා ලබා ගන්නා ලද ආකෘති පත්‍රයක් මගින් සම්පූර්ණ කොට **සභාපති, බලපිටිය ප්‍රාදේශීය සභාව, බලපිටිය** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑල මගින් හෝ එම ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනැවිත් බහලිය යුතුය.

මිල ගණන් එවනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"වායු සම්කරණ යන්ත්‍ර සඳහා මිල ගණන්"** යනුවෙන් සඳහන් කරන්න.

ටෙන්ඩර් පෝරම ගාස්තු	-	රු. 3,000.00
ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදල	-	රු. 500.00
ටෙන්ඩර් නිකුත් කිරීම	-	2020-10-15 පෙ.ව. 9.00 සිට 2020-11-05 පෙ.ව. 10.00 දක්වා
ටෙන්ඩර් භාර ගැනීම	-	2020-11-05 පෙ.ව. 10.30 දක්වා
ටෙන්ඩර් විවෘත කිරීම	-	2020-11-05 පෙ.ව. 11.00

දුරකථන අංකය : 091-2258738, 091-4946516

එන්. සමන් ද සිල්වා
සභාපති,
බලපිටිය ප්‍රාදේශීය සභාව.

ලංසු කැඳවීමේ ආරාධනා

වැවිලි අමාත්‍යාංශය
පොල් වගාකිරීමේ මණ්ඩලය

පොලි බෑග් මිලිදී ගැනීම - 2020

ප්‍රසම්පාදන අංකය : E/7/G/PB/2020

01. පොල් වගාකිරීමේ මණ්ඩලය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් 2020 වර්ෂය සඳහා පහත සඳහන් පොලි බෑග් ප්‍රමාණය මිලදී ගැනීම වෙනුවෙන් සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසුපත් කැඳවනු ලැබේ.

අංකය	විස්තරය	ප්‍රමාණය
01	පොලි බෑග්	1,500,000

02. ලංසුපත් කැඳවීම ජාතික තරගකාරී ලංසු ක්‍රමය (NCB) මගින් සිදු කරයි.

03. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසුකරුවන්ට පොල් වගාකිරීමේ මණ්ඩලයේ සැපයුම් නිලධාරී මගින් වැඩිමනත් තොරතුරු ලබාගත හැකි අතර, පහත දක්වෙන ලිපිනයේ දී සතියේ රාජකාරී දිනවල 2020.10.15 දින සිට 2020.11.04 දින දක්වා පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු කැඳවීමේ පෝරම ඇතුළු විස්තර පත්‍රිකා ලබාගත හැකිය.

04. සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ නිෂ්පාදකයන්ට හෝ සැපයුම්කරුවන්ට පමණක් ලංසු ඉදිරිපත් කළ හැක.

05. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් සමග ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආපසු නොගෙවන රු. 5,000.00 ක මුදලක් පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමි වෙත ගෙවීමෙන් පසු ඉංග්‍රීසි භාෂාවෙන් සකස් වී ඇති අදාළ ලංසු කැඳවීමේ ලේඛන කට්ටලයක් 2020.11.04 දින තෙක් ලබාගත හැකිය.

06. සම්පූර්ණ කරන ලද ලංසුපත් 2020.11.05 දින ප.ව. 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කෙරේ. වර්ෂ 2020.11.05 වන දින ප.ව. 2.00 ට ලංසුපත් භාර ගැනීම අවසන් වූ වහාම ලංසුපත් විවෘත කරනු ලැබේ. ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය. සියලුම ලංසුපත් සමග ලංසුවේ වටිනාකමින් 1% ක වටිනාකමකට නොඅඩු ශ්‍රී ලංකාවේ පිළිගත් ඕනෑම වාණිජ බැංකුවකින් ලබාගත්තා ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. (රක්ෂණ ආවරණ පිළිගනු නොලැබේ)

07. ඔබගේ ලංසු ලිපි ලේඛන මුද්‍රා තැබූ කවරයක බහා, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර **"පොලි බෑග් මිලදී ගැනීම - 2020"** යනුවෙන් සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්, 2020.11.05 දින ප.ව. 2.00 ට පෙර ලැබෙනසේ හෝ 2020.11.05 දින ප.ව. 2.00 ට පෙර පහත ලිපිනයේ පළමු මහලේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය හැකිය.

එවිය යුතු ලිපිනය :

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
පොල් වගාකිරීමේ මණ්ඩලය,
9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
දු.ක. 011-2193457, ෆැක්ස් : 011-2861332

ප්‍රසිද්ධ වෙන්දේසිය

එල් බී ෆිනෑන්ස් පී එල් සී වෙතින් ලබාගත් ණය මුදල් නිවැසියන් පාර්ශ්වයන් නොගෙවීම හේතුවෙන් එසි ණය පහසුකම් සඳහා සුරකුම් ලෙස උකස් තබන ලද රන් භාණ්ඩ පහත සඳහන් දිනයන් හිදී හා එම ස්ථානයන් හිදී පෙ.ව 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දිනය		වෙන්දේසි ස්ථානය
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 755/1, සෝමිසිරිය පාර , බිහිරගමුව.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 91, හයිලෙවල් පාර, හිරගුපන, කොළඹ 05.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 92, ස්ථාවේදී සිලාරෙත්න මාවත, බුලත්ගොඩ.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 434, E.W. පෙරේරා මාවත, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 595, හයිලෙවල් පාර, ගංගොඩවිල, බුලත්ගොඩ.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 61/2, කුවර පාර, කිරිවත්ත.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 594/3, කුවර පාර, කිරිවත්තුව.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 19, ඕක විදිය, කඩුවෙල්ල.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 18, මෙඳවිටාගෙවත්ත මාවත, රුක්ගහය.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 81, කුවර පාර, විරසාපොල.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 282, අතපත්තුව ධම්මසාර මාවත, මිරිහාන.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 13, දුම්රියගෙදර පාර, මිරිහාන.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 66, හිත්ස පාර, අංගල්ල.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 83, දෙනියාය පාර, අතුරුගිරිය.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 2, ඒබීසී මැන්සිල්, දෙල්ගුවා පාර, හෙන්ෂෝ.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 149, ඕක විදිය, දෙමියාය.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 137/D, නව පුවිසා පාර, මහළුගාවත්ත , කොළඹ 10.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 282, කාසල්ගොඩ විදිය, හෙනපුල්ල 14.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 52/17, මොහට්ටිවත්ත නව නගරය, මොහට්ටිවත්ත.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 21, ගලහිත පෙරේරා විදිය, කොළඹ 14.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 371/1, වේරුල්ල විදිය, හෙනපුල්ල 12.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 551, දෙමිරියගොඩ පාර, කොළඹ 05.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 66, ජනීපරා විදිය, කොළඹ 13.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 197, කෙෆිටි විදිය, කොළඹ 11.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 256, නව කතාරය, තණ්ඩුගේවත්ත.
02/09/16/23	නොවැම්බර් 2020	රජරට මිල්ටින්, කොල්ල විදිය, පදුරාගෙදර, පොළොන්නරුව
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 137, කොලින් විදිය, අනුරාධපුර.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 514/A, නව නගරය, අනුරාධපුර.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 26, කුඩාර පාර, ඔළුවලිවිය.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 38, තුරන්ගනගමු හෙට්ටිය, දුම්බර.
02/09/16/23	නොවැම්බර් 2020	ඕක විදිය, මැදිරිගිරිය.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 15, සතුරුව පාර, තඹෙරාව.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 24, කලුවේන පාර, ආනමඩුව.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 98, අලගුවත්ත පාර, පිත්තුගම.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 87, හෙල්ලින් විදිය, පිටකොටු.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 14, කොලින් විදිය, ඇතුම්පිටිය.
02/09/16/23	නොවැම්බර් 2020	අංක. 48,රත්නපුර පාර, බිදුරාළිය.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 134, ඕක විදිය, වේවැඩන්දුව.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 106C, කුරුණෑගල පාර, පුත්තලම.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 356, කොලින් විදිය, මීගමුව.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 40A, කොළඹ පාර, කඳාවත.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 110, කඳාවත පාර, කොච්චිකඩේ.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 57,කිරියන්ගොඩ පාර, හිතුවක්ගොඩ.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 229/1, කඩවත පාර, හෙට්ටිගුව.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 69, හිරිඳගුව පාර, වියඹගිරිය.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 107, ගාන්ත ජෝසප් විදිය, මීගමුව.
03/10/17/24	නොවැම්බර් 2020	අංක.75/A , කඳාවත පාර, මාරවිල.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 661/A, හේවාහින පාර, රාගම.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 671/1, පරණ මීගමුව පාර, ජා-ඇල.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 39, කොළඹ පාර, කඳාන.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 18, ඇළුතගේදර, කඳාන, වත්තල.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 17, දුම්රියානල පාර, කඳාන හන්දිය, වත්තල.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 350/ඒ, කොළඹ පාර, දෙල්ගොඩ.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 484, අවිස්සාවේල්ල පාර, කඩුවෙල.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 722, වරාගොඩ පාර, වීතාර හන්දිය, තලංගිය.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 44, කිතලෙල පාර, කිරිවත්තාගොඩ.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 175, කුවර පාර, කිරිවත්තාගොඩ.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 139/6, කුවර පාර, කඩුවෙල.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 145, ඔංකල් විදිය, කොළඹ 02.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 66, ගාලු පාර, කාලිබද්ද
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 11, කැප්පෙට්ටිපු පාර, මොරටුව
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 20, ධර්මපොල මාවත, කොළඹ 03.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 245, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 54, ඩී එස් සේනානායක මාවත, බොරැල්ල.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 197, විහාර පාර, කොළඹ 10.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 556,558, මරදාන පාර, කොළඹ 10.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 239, කිරුළු පාර, කාරාගෙන්පිට.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 10, දුම්රියානල පාර, බොරැල්ල.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 68, හොරණ පාර, පිළියන්දල.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 28, දෙවිවිල පාර, බොරාලැස්ගමුව.
03/10/17/24	නොවැම්බර් 2020	අංක. 227, ද කොස්තා පාර, මොරටුවත්තුව, මොරටුව.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 118A, කොළඹ පාර, කුරුණෑගල.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 103A, කොළඹ පාර, කුරුණෑගල.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 21, දමුණුව පාර, කුරුණෑගල.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 12, කොලින් විදිය, කුලියාපිටිය.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 35, සරසවි හෙට්ටිගේවත්ත, කොලින් විදිය, කාරගිනිය.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 835/2A, සතොසම් උතුර, මාතලේ.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 365, හයිලෙවල් පාර, කොට්ටාව.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 76, හයිලෙවල් පාර, හෙමිළිගම.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 347A, කොට්ටේ පාර, රාජගිරිය.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 69, දෙවිවිල පාර, නිකරෑවට.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 227/A, හයිලෙවල් පාර,වත්තෙගෙදර,නිකරෑවට.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 124/A, පුටුගෙදුණු විදිය ,කොළඹවල.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 165, ධර්මපාල මාවත, කොළඹ 07.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 04, සානසර පාර, බිෂප්ස්ගාර්ඩන්.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 18, සෙනෙවි වත්ත, පානදුර.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 508, ගාලු පාර, පානදුර.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 103, පානදුර පාර, හොරණ.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 634 , ගාලු පාර, වාද්දුව.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 334, කොලින් විදිය, කළුතර දකුණ.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 358/D, මිතුගම පාර, දරිසා නගරය.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 175/A, ගාලු පාර, කොරවල.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 185, ගාලු පාර, අළුත්ගම.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 84A, ගාලු පාර, දෙමිරිය.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 124, ගාලු පාර, දෙමිරිය.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 224, ගාලු පාර, වික්‍රමසිංහ.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 269, ඕක විදිය, අහිමිසිය.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 275/75, ඕගොඩාවිත ස්ටොනලි විජේසුන්දර මාවත, කොළඹ 07.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 675, ගාලු පාර, කොළඹ 03.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 150, කොලින් විදිය, ගාල්ල.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 96/2, ගාලු පාර, අම්බලංගොඩ.
04/11/18/25	නොවැම්බර් 2020	අංක. 598E, හිරිමුර පාර, කරාපිටිය.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 56,57, ඒඩිවිහාර විහාරස්ථාන කාන්තා සංවිධානය, නව නගරය, මහියංගනය
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 44/1, නව බස් නැවතුම්පොළ පාර, මොණරාගල.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 10/2, ළඟට මිරිසුවිල ඉදිරි පිට,නව නගරය, දෙනිඅස්තැන්නිය.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 226, ඩී එස් සේනානායක විදිය, මහනුවර.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 153, මඩවල පාර, නාවලපිටිය.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 251, ඕක විදිය, මිහතලේ.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 55, පහළ විදිය, බදුල්ල.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 167, ඕක විදිය, බණ්ඩාරවෙල.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 03, කුඩාර එළිය පාර, වැල්ලවීට.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 26, බිංගඳු පාර, බදුල්ල.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 71, චිත්‍රසමන් රැමිණ මාවත, කුඩාරවිලිය.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 473, කුඩාරවිලිය පාර, පුස්සැල්ලාව
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 22, කුඩාරවිලිය පාර, හාලිඉල.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 115, කොටුහොඩගුව විදිය, මිහතලේ
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 13A, කුඩාර පාර, හෙල්ලිය.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 52, වැලිමාරා පාර, හෝටන්.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 175, ඕක විදිය, කිරිබත්ගොඩ.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 66, හාවලපිටිය පාර, හාලිඉල.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 258, කොළඹ පාර, පිළිමතලාව.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 3A, නගරසභා පාර, හාවලපිටිය.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 396, ශ්‍රෙස්ඩිපාත් පාර, කොළඹ 14.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 367/1, අරක්ක මාවත, කොළඹ 15.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 81, කේදාර විදිය, කොළඹ 15.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 03, සාන්ත ෆ්‍රැන්සිස් විදිය, කොටහේන.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 3/729, රාණි පාර, කොළඹ 15.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 47, ප්‍රෙස්ටිපාත් පාර, කොළඹ 14.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 04, මිරගුවිල සණ්ඩුව ඉදිරිපිට, අම්පාර.
05/12/19/26	නොවැම්බර් 2020	MPCS කොඩාගෙගිල්ල, ඕක විදිය, සමිඳපිටිය 09.
05/12/19/26	නොවැම්බර් 2020	කොලින් විදිය, ඕඩානලන්ද පාර, කැස්බිතේ.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 25, හිල්ටා හවිදිය, කැස්බිතේ පාර, කඹිරිගමුව.
05/12/19/26	නොවැම්බර් 2020	අංක. 28, කඹගම පාර, අත්තනගල්ලපිටිය 08,
05/12/19/26	නොවැම්බර් 2020	ප්‍රධාන පාර, කොතුවිල්ල.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 24/A, ඕක විදිය, කංචනගුණ.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 25, යටියන්ගොට පාර, අත්තනගල්ලපිටිය.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 141/A, කොළඹන්නාව පාර, කොළඹන්නාව.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 25A, ඕක විදිය, අහසවිටියගොඩ.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 49, මේතානන්දන මාවත, රත්නපුර.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 34, ඕක විදිය, සිස්සකමනරාමය.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 43, කොලින් විදිය, අත්තිඉලපටිය.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 10, සංඝරාජ මාවත, කිරිබත්ගොඩ.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 275, මිදෑ පාර, ගිනිගණමුල්ල.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 175, ගිනිගණමුල්ල පාර, මිඩිගෙදරවුව.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 301, ඡොහොන්ගේ අල්ෆාඩ් මල්ලිගේ, ඕක විදිය, කාන්තගන්දුව-01.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 50/2, ඕක විදිය, කිරිබත්ගොඩ.
06/13/20/27	නොවැම්බර් 2020	ඕක විදිය, අලුත්ත 10, හොන්ඩාඩොලේ
06/13/20/27	නොවැම්බර් 2020	"මේඛලාභාග" ඉඩිපහිට, ප්‍රධාන පාර, මාතුවිලිවිහාර
06/13/20/27	නොවැම්බර් 2020	පාතහු ඉඩිපහිට, රෙහෙහු පාර, පහුවිලිවිහාර.
06/13/20/27	නොවැම්බර් 2020	"මේඛලාභ සංඝවිහාර" ඉඩිපහිට, ප්‍රධාන පාර, මොත්තලුව
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 69, ඕක විදිය, අම්බලංගොඩ.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 138, කුවර පාර, වාරිසම්මරිය
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 440, රෙහෙහු පාර, යාපනය.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 111, හේවහනු පාර, යාපනය.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 406, රෙහෙහු පාර, යාපනය.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 10, පේදුරු තුඩුව පාර, නෙලුඩුගඩ.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 187, ඕක විදිය, ඔන්ගංගම.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 497, කුවර පාර, බිළිඳෙණිය.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 32B, 02 වරක් පාර, වවුනියා
06/13/20/27	නොවැම්බර් 2020	කොට්ඨාස අංක 1, පුදුකුඩුගොන්ද, මුතූර්.
06/13/20/27	නොවැම්බර් 2020	පී ඩබ්ලිව් පාර, මුලතිව්.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 55, ඒබේ බෙදි පාර, වුන්නාගමු.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 171, යාපනය පාර, මිහිලාපිටි.
06/13/20/27	නොවැම්බර් 2020	අංක. 95, පල්ලාමි පාර, පිරිවෙන්ගම්පිටි.
06/13/20/27	නොවැම්බර් 2020	ප්‍රධාන විදිය,මාල්දූව.

කිසිදු දැනුම්දීමකින් තොරව වෙන්දේසි කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය එල් බී ෆිනෑන්ස් පී එල් සී සතුවේ.

LB FINANCE

ජෙනෙරාල් සඳුමිණාපරාරු - රන් ණය අංශය, එල් බී ෆිනෑන්ස් පී එල් සී
275/75, ඕගොඩාවිත ස්ටොනලි විජේසුන්දර මාවත, කොළඹ 07.

ශ්‍රී ලංකා ජාතික රෝහල (NHSL)

කොළඹ 10

ප්‍රසම්පාදන දැන්වීමයි

ශ්‍රී ලංකා ජාතික රෝහලේ (NHSL) හි පවතින පහත සඳහන් කාර්ය කර්මාන්ත ඉෂ්ට සිද්ධ කිරීම සඳහා ICTAD (ඉක්ටාඩ්) ලියාපදිංචිය සහිත කොන්ත්‍රාත්කරුවන් වෙතින් මුද්‍රා, තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ. ලංසු ලිපිලේඛන **2020.10.15 වන දින සිට 2020.10.21 වන දින** ප.ව. 3.00 **දක්වා** අතරතුර, ශ්‍රී ලංකා ජාතික රෝහලේ, සරප් අංශය වෙත, ආපසු ගෙවනු නොලබන **රුපියල් 2,500.00 / රු. 4,000.00** වන ලංසු ආකෘතිපත්‍ර ගාස්තුවක් (අදළ පරිදි) ගෙවීමෙන් අනතුරුව ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලය වෙතින් ලබාගත හැකිය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද මුද්‍රා තැබූ ලංසු අදළ පරිදි ලිපි කවරවල බහා මුද්‍රා, තබා අදළ කාර්ය කර්මාන්තයේ නම අදළ පරිදි කවරවල වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර 2020.10.22 වන දින පෙ.ව. 10.00 ටහෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලේඛනගත තැපැලෙන් එවීම හෝ රෝහලේ, ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතු වන්නේය. ලංසු භාර ගන්නා එකී අවසාන වේලාව ඉක්මවූ වහාම පැමිණ සිටින කොන්ත්‍රාත්කරුවන් (ලංසුකරුවන්) හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී එම ලංසු විවෘත කරනු ලැබේ.

අංකය	කර්මාන්තය	ඇස්තමේන්තු ගත පිරිවැය රු. ශත	ශ්‍රේණිය	ආපසු ගෙවනු ලබන ලංසු සුරක්ෂණ ඇපකරය රු. ශත	ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් පෝරම (ආකෘති පත්‍ර) ගාස්තුව රු. ශත	පොදු කරුණු (Remarks)
01	'D' ශල්‍යාගාරය සඳහා වායු සම්කරණ (A/C) යන්ත්‍රයක් සහ වාට්ටු අංක 65 සඳහා විදුලිබල සැපයුම ලබා දීම. AC-1/67/2020	7,287,826.00	විශේෂිතතාව විදුලි වැට EM 04 හෝ ඉහළ	109,000.00	2,500.00	ලංසු ලිපිලේඛන ලබා ගන්නා අවස්ථාවේදී ඇස්තමේන්තු ගත ලංසු අගය රු. 5,000,000/- ඉක්මවන කොන්ත්‍රාත්තු සඳහා පොදු කොන්ත්‍රාත්තු රෙජිස්ට්‍රාර් (PCR) වෙතින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.
02	වාට්ටු අංක 30 හි විදුලි පද්ධතිය සිවිලිම හා වහළ නවීකරණය / අලුත්වැඩියා කිරීම. AC-1/69/2020	10,310,824.50	විශේෂඥතාව : ඉදිකිරීම් C6 හෝ ඉහළ සහ විදුලි හා යාන්ත්‍රික සේවා EM 04 හෝ ඉහළ	155,000.00	4,000.00	

වෛද්‍ය W.K. වික්‍රමසිංහ
සභාපති, ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා ජාතික රෝහල (NHSL), කොළඹ 10.

ලංසු සඳහා ආරාධනය

කෘෂිකර්ම අමාත්‍යාංශය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ව්‍යාප්ති සහ පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත උපකරණ මිලදී ගැනීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

2020.10.15 දින සිට 2020.11.04 දින ප.ව. 2.00 දක්වා කාර්යාල වේලාව තුළදී මෙම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයෙන් ලංසු ලේඛන හා අනෙකුත් විස්තර නොමිලේ පරීක්ෂා කර බලා වගුවේ දක්වා ඇති ආපසු නොගෙවන තැන්පතු මුදල ගෙවීමෙන් පසු ලබාගත හැකි අතර, 2020.11.05 දින වගුවේ සඳහන් වේලාවට පෙර මෙම කාර්යාලයේ තබා ඇති ලංසු ලේඛනයේ සටහන් කර එහි තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් එවීම මගින් ලංසු භාරදිය හැක. ලංසු භාරගෙන අවසන් වූ මොහොතේම ව්‍යාප්ති සහ පුහුණු මධ්‍යස්ථානයේදී ලංසු විවෘත කරනු ලැබේ. ඒ සඳහා ලංසුකරුට හෝ ඔහුගේ ලිඛිත බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය. පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 2020.10.28 දින පෙ.ව. 10.00 ට ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

ප්‍ර.මා.සං 13 වන ව්‍යාතිරේඛයේ 8.1 න් පෙන්වා දී ඇති පරිදි අදළ වන අයදුම්කරුවන් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ වන රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියාපදිංචි වී සිටිය යුතු අතර, එහි ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය.

උක්ත කාර්යය සම්බන්ධව වැඩිදුරටත් අවශ්‍ය තොරතුරු වෙතොත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයට පැමිණ හෝ පහත සඳහන් දුරකථන අංක මගින් විමසා දැනගත හැක. ලංසු ලේඛනය බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම සහ විවෘත කරන දිනය, වේලාව සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

	ලංසු අංකය	මිලදී ගන්නා භාණ්ඩය / සේවාව	ලංසු භාර ගැනීම අවසන් වන වේලාව	ලංසු තැන්පතු			ලංසු වලංගු කාල සීමාව	ලංසු සුරක්ෂණය වලංගු කාල සීමාව
				ආපසු නොගෙවන	ආපසු ගෙවන			
					මුදලින් ගෙවන්නේ නම්	බැංකු සුරක්ෂණයක් ඉදිරිපත් කරන්නේ නම්		
01	ව්‍යා/පු/06/ 02/2020-50	පළතුරු වගාව සඳහා අවශ්‍ය සෙකටියර, කප්පාදු කියත්, දම්වැල් කියත්, බහු කාර්යය තණකොළ කපන යන්ත්‍ර මිලදී ගැනීම	පෙ.ව. 10.00	රු. 3,000.00	රු. 38,400.00	රු. 76,800.00	2021.01.07	2021.02.04
02	ව්‍යා/පු/06/ 02/2020-51	වැසි ආවරණ පොලිතීන් මිලදී ගැනීම	පෙ.ව. 10.15	රු. 3,000.00	රු. 32,000.00	රු. 64,000.00	2021.01.07	2021.02.04
03	ව්‍යා/පු/06/ 02/2020-52	ලොකු ලූනු මල් ආධාරක දැල් මිලදී ගැනීම	පෙ.ව. 10.30	රු. 3,000.00	රු. 28,000.00	රු. 56,000.00	2021.01.07	2021.02.04
04	ව්‍යා/පු/06/ 02/2020-54	හෙළ බොජුන් අලෙවිසැල් සඳහා කෑම් රෙජිස්ට්‍රර් මිලදී ගැනීම	පෙ.ව. 10.45	රු. 3,000.00	රු. 19,500.00	රු. 39,000.00	2020.12.24	2021.01.21
05	ව්‍යා/පු/06/ 02/2020-55	බිම්මල් ඇසුරුම්කරණය සඳහා මේස මිලදී ගැනීම	පෙ.ව. 11.00	රු. 5,000.00	රු. 120,000.00	රු. 240,000.00	2021.01.21	2021.02.18
06	ව්‍යා/පු/06/ 02/2020-56	පොලි සීලර් යන්ත්‍ර මිලදී ගැනීම	පෙ.ව. 11.15	රු. 3,000.00	රු. 30,000.00	රු. 60,000.00	2021.01.07	2021.02.04

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
ව්‍යාප්ති සහ පුහුණු මධ්‍යස්ථානය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
දුරකථන අංකය : 081-2085340



ඔබගේ ලුහුඬු දැන්වීම් ලඟම ඇති අපගේ ශාඛා කාර්යාලය වෙත භාරදෙන්න

ලුහුඬු දැන්වීමක් සඳහා නවතම ගාස්තු... (වචන 15ක් සඳහා)

සිනෑම එක් පුවත්පතක් සඳහා	සිනෑම පුවත්පත් දෙකක් සඳහා	පුවත්පත් තුනම සඳහා
රු. 300/- * තිනකරන් වාරමන්ජරි හැර	රු. 500/- * තිනකරන් වාරමන්ජරි හැර	රු. 650/-

අනුරාධපුර - TEL : 025 22 22 370 FAX : 025 22 35 411 / මහනුවර - TEL : 081 22 34 200 FAX : 081 22 38 910
කතරගම - TEL : 047 22 35 291 FAX : 047 22 35 291 / මරදන - TEL : 011 2 429 336 FAX : 011 2 429 335
මාතර - TEL : 041 22 35 412 FAX : 041 22 29 728 / නුගේගොඩ - TEL : 011 2 828 114 FAX : 011 4300860 / යාපනය - TEL : 021 22 25 361 FAX : 021 22 25 361

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

දැන්වීමයි

2021 වර්ෂය සඳහා

වරායේ නැවිබඩු නිෂ්කාශන නියෝජිත ආයතන බලපත්‍ර සහ වාප්පු ලිපිකරුවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම

2020 වර්ෂය සඳහා නිකුත් කර ඇති වරාය නිෂ්කාශන නියෝජිත බලපත්‍ර සහ වාප්පු ලිපිකරු බලපත්‍ර 2021 වසර සඳහා අලුත් කිරීම සහ නව බලපත්‍ර නිකුත් කිරීම් මේ වන විට ආරම්භ කර ඇති අතර, මෙම බලපත්‍ර අලුත් කිරීම සඳහා අදළ අයදුම්පත්, ආකෘති පත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කැනල් අංගනයේ සේවා සැපයුම් කොට්ඨාසය වේත සාමාන්‍ය කාර්යාලීය දිනවල රාජකාරී වේලාවන් තුළදී භාරදිය හැක.

මෙම බලපත්‍ර ලබා ගැනීමට ඉකුත් වසර 03 සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන ලද රේගු නිවාරණ, ප්‍රාදේශීය පොලිස් ස්ථානය හා සහකාර පොලිස් අධිකාරී (වරාය) මගින් ලබා ගන්නා සහතිකවල වලංගු කාලය අවසන්වී ඇත්නම් නව වසරේ බලපත් සඳහා අදළ සහතික ලබාගෙන අප්‍රමාදව ඉදිරිපත් කළ යුතුය.

